# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2319/26 - 2023 පෙබරවාරි මස 13 වැනි සඳුදා - 2023.02.13**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ
2 වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ
123 වගන්තිය යටතේ කරනු ලබන නිවේදනය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 122 (1) උප වගන්තිය යටතේ සඳහන් බලතල ප්‍රකාරව කළුතර ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද මෙහි පහත උපලේඛනයෙහි විස්තර වන අතුරු ව්‍යවස්ථා සඳහා බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවර රොෂාන් ගුණතිලක වන මම 1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වගන්තිය සමඟ කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 123 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අනුමත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

**රොෂාන් ගුණතිලක,**
ආර්ඩබ්පී ඇන්ඩ් බාර් වීඑස්වී යූඑස්පී
පීඑච්ඩී (ගෞරව),
එෆ්අයිඑම් (ශ්‍රී ලංකා) එන්ඩීසී පීඑස්සී,
මාර්ෂල් ඔෆ් ද ශ්‍රී ලංකා එයාර් ෆෝස්,
ආණ්ඩුකාරවර,
බස්නාහිර පළාත.

2022 නොවැම්බර් මස 30 වැනි දින,
බත්තරමුල්ල, බස්නාහිර පළාත් සභා
ගොඩනැගිල්ලේ පිහිටි,
බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

## උපලේඛනය

### පොදු නාන ස්ථාන සම්බන්ධ අතුරු ව්‍යවස්ථාව

1. මෙම අතුරු ව්‍යවස්ථාව කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පවත්වාගෙන යන පොදු නාන ස්ථාන විධිමත් කිරීම සහ පාලනය කිරීම සඳහා පවත්වනු ලබයි.

*ලුහුඬු නාමය* 2. මෙම අතුරු ව්‍යවස්ථාව කළුතර ප්‍රාදේශීය සභාවේ පොදු නාන ස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

*නෛතික බලය* 3. මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (IX) වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 122 උපවගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට බලය ලැබී ඇත.

4. කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ (මෙහි මින්මතු බල ප්‍රදේශය යනුවෙන් හඳුන්වනු ලබන) පිහිටියා වූ පොදු මහ ජනයාට ස්නානය සඳහා පොදු නාන ස්ථාන වශයෙන් පවතින්නා වූ හෝ පවත්වාගෙන යනු ලබන ගඟකට, ඇළකට, දොළකට අදාළ නාන තොටුපොළක්, ළිඳක් හෝ ජල තටාකයක් මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ වූ කාර්යයන් සඳහා අදාළ විය යුතුය.

*පොදු නාන තොටුපොළ පවත්වාගෙන යාම* 5. බල ප්‍රදේශය තුළ පිහිටා ඇති ගඟකට, ඇළකට, දොළකට අදාළ පොදු නාන තොටුපොළක් වන විටදී, ඒ සෑම පොදු නාන තොටුපොළක් සම්බන්ධයෙන්ම,

(1) ස්ථානය පොදු නාන ස්ථානයක් බව ප්‍රකාශ වන වචන ඇතුළත් දැන්වීම් පුවරුවක් යටතේ පවත්වාගත යුතුය.

(2) නාන තොටුපොළ වශයෙන් ආරක්ෂිතව භාවිතයට ගත හැකි වපසරිය පිළිබඳව හා ආරක්ෂාව සඳහා සැළකිලිමත් විය යුතු කරුණු පිළිබඳව පොදු නාන තොටුපොළ භාවිතයට ගන්නන්ට පහසුවෙන් පෙනෙන පරිදි දැන්වීම් ප්‍රදර්ශනය කර තිබිය යුතුය.

(3) ස්නානය සඳහා ජලයට ආරක්ෂිතව පිවිසීමට හැකි පරිදි අවශ්‍ය තැන් සඳහා පඩිපෙල සකස් කර තිබිය යුතු අතර එය සිමෙන්ති යොදා ලිස්සා නොයන පරිදි සකස් කර තිබිය යුතුය.

(4) හැකි සෑම විටම ස්ත්‍රීන් හා පුරුෂයින් සඳහා ජලයට බැහීම සඳහා වෙන් වෙන්ව ප්‍රවේශයන් තිබිය යුතුය.

(5) අදාළ තොටුපොළ පිහිටි ගඟෙහි, ඇළෙහි, දොළෙහි හෝ වැවෙහි රක්ෂිතයෙහි කිසිදු ගසකට ස්වභාවික පිහිටීමකට නාන තොටුපොළ පවත්වාගෙන යාම හේතුවෙන් උපද්‍රවයක් නොවිය යුතුය.

(6) සාමාන්‍ය වශයෙන් තොටුපොළ භාවිතයට ගැනීම පෙ.ව 06.00 සිට ප.ව. 07.00 දක්වා විය යුතු අතර රාත්‍රී කාලයෙහි තොටුපොළ භාවිතයට ගත හැක්කේ එම ස්ථානයට ප්‍රමාණවත් විදුලි ආලෝකය සපයා ඇත්තේනම් පමණක් විය යුතුය.

(7) ස්ත්‍රීන් හා පුරුෂයින් සඳහා ඇඳුම් මාරු කිරීමට වෙන් වෙන් වූ ස්ථාන පිහිටුවා තිබිය යුතුය.

(8) තොටුපොළ අවට කිසිදු ආකාරයකින් මත්පැන් භාවිතය තහනම් විය යුතු අතර, ඒ පිළිබඳව වූ දැන්වීම් ප්‍රකටව පෙනෙන පරිදි සවිකර තිබිය යුතුය.

6. තොටුපොළ පරිහරණය කරන්නන් සඳහා ප්‍රාදේශීය සභාව විසින් අතිරේක සේවාවන් හා පහසුකම් සම්පාදනය කර පවත්වා ගත හැකි අතර, එසේ සපයන සේවාවන් සහ පහසුකම් සඳහා ප්‍රාදේශීය සභාව විසින් තීරණය කර ප්‍රකාශයට පත්කරනු ලබන ගාස්තුවක් අය කිරීමට නීත්‍යානුකූල විය යුතුය. *ගාස්තුවක් නියම කිරීම*

7. බල ප්‍රදේශය තුළ පිහිටා ඇති පොදු නාන ළිඳක් හෝ තටාකයක් වන විටදී, ඒ සෑම පොදු නාන ළිඳකට, තටාක සම්බන්ධයෙන්ම, *පොදු නාන ළිඳක් හෝ තටාකයක් වන විට*

(1) පොදු නාන ස්ථානයක් බව ප්‍රකාශ වන වචන ඇතුළත් දැන්වීම් පුවරුවක් යටතේ එය පවත්වාගෙන යා යුතුය.

(2) ළිඳ හෝ තටාකය වටා අවම වශයෙන් මීටර් 0.6096 ක් පමණ පොළොව මට්ටමේ උසකට ආරක්ෂිත තාප්පයක් විය යුතු අතර පොළොව මට්ටමේ සිට පහළට අවම වශයෙන් ඒ හා සමාන ගැඹුරක් දක්වා ළිඳ හෝ තටාකය වටා ස්ථිර ලෙස සිමෙන්තියෙන් හෝ කළු ගලින් ආරක්ෂිතව තනා තිබිය යුතුය.

(3) හැකි සෑම විටම ස්ත්‍රීන් හා පුරුෂයින් සඳහා වෙන්ව භාවිතයට ගත හැකි පරිදි පොදු නාන ස්ථානය පවත්වා ගත යුතු අතරම, ඇඳුම් මාරු කිරීම සඳහා ස්ත්‍රීන් හා පුරුෂයින් වෙනුවෙන් වෙන් වූ ස්ථාන පවත්වා ගත යුතුය.

(4) ස්නානය සඳහා භාවිතයට ගැනෙන ජලය නාන ළිඳට හෝ තටාකයට පහසුවෙන් කාන්දු වීම වැළැක්වෙන පරිදි හා එය පහසුවෙන් බැහැරට ගලා යන පරිදි කාණු සකස් කර තිබිය යුතුය.

(5) ජලය ස්නානය සඳහා භාවිතයට ගැනීමට බාල්දි හා ලණු අවශ්‍ය පරිදි තිබිය යුතු අතර, බාල්දිවල මල නොබැඳෙන ලෙස තීන්ත ආලේප කර තිබිය යුතුය.

8. ඉහත 5 වන සහ 7 වන වගන්තිය යටතේ සඳහන් විධිවිධානයන්ට අනුකූල වන පරිදි පොදු නාන ස්ථාන පවත්වාගෙන යාම සඳහා ප්‍රාදේශීය සභාව මගින් ගනු ලබන ක්‍රියාමාර්ගයන්ට සහය වීම සඳහා ඒ හා සම්බන්ධයෙන් සභාපති වෙත අවශ්‍ය උපදෙස් දීම සඳහා පොදු නාන ස්ථානය අවට පදිංචි කරුවන්ගේ නියෝජිත තත්වයෙන් සැදුම්ලත් කමිටු සෑම පොදු නාන ස්ථානයක් සඳහාම සභාපති විසින් පත් කිරීම නීත්‍යානුකූල වන්නේය. *කමිටු පත් කිරීම*

9. (1) ඉහත 8 වන වගන්තිය යටතේ පවත්වන කමිටුවක කාර්යය පහත ආකාරයට විය යුතුය. *කමිටුවක කාර්යය*

(අ) පොදු නාන ස්ථානය පරිහරණය කරන්නන් මෙම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානයන්ට අනුකූල නොවන බව නිරීක්ෂණය වන අවස්ථා ඇත්නම්, ඒ පිළිබඳව සභාපති වෙත වාර්තා කිරීම.

(ආ) පොදු ජනතාවගේ යහපත සඳහා අදාළ ස්ථානය සම්බන්ධයෙන් විය යුතු අවශ්‍යතා සොයා බලා සභාපති වෙත උපදෙස් දීම හා වාර්තා කිරීම.

(ඇ) මහජන සෞඛ්‍යයෙහි යහපත සඳහා නාන තටාකයක්, ළිඳක් පිරිසිදු කිරීමේ අවශ්‍යතාවයන් උද්ගත වූ අවස්ථාවන්හිදී ශ්‍රම සහභාගීත්වයෙන් අදාළ කාර්යයන් ඉටු කරවාලීම.

(ඈ) ජල මූලාශ්‍රයන් හා ඒ වටා ඇති ශාක පද්ධතිය ආරක්ෂා කිරීමට හැකි සෑම පියවරක්ම ගැනීම, හා ඒ හා සම්බන්ධව සභාපති වෙත උපදෙස් දීම.

(2) (I) වන උප වගන්තිය යටතේ වූ කාර්යය සඳහා පත්වන කමිටු අවස්ථාවෝචිත පරිදි රැස්විය යුතු අතර රැස් වී ගනු ලබන තීරණ පිළිබඳ සභාපතිවරයා දැනුවත් කළ යුතුය.

10. බල ප්‍රදේශය තුළ පිහිටියා වූ පොදු නාන ස්ථාන විධිමත්ව පවත්වාගෙන යාම සඳහා වූ හැකි සෑම පියවරක්ම ගැනීම ප්‍රාදේශීය සභාවේ කාර්යය වන්නේය.

11. (1) ශ්‍රී ලංකාව පුරාම හෝ ඉන් කොටසකට හෝ බලප්‍රදේශයකට අදාළව, නිරෝධායන හා රෝග වැළැක්වීමේ ආඥාපනත සමඟ හා ඒ යටතේ සාදන ලද රෙගුලාසි යටතේ හෝ කවර හෝ, වසංගත තත්වයකට කරුණු යෙදී ඇති අවස්ථාවක සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී උපදෙස් මත සභාපතිවරයා විසින් කවර හෝ පොදු නාන ස්ථානයක් නිශ්චිත කාල සීමාවක් සඳහා භාවිතය තහනම් කිරීම නීත්‍යානුකූල විය යුතුය. *වසංගත තත්ත්වයක් ප්‍රකාශයට පත් කළ විට භාවිතය තහනම් කිරීම*

(2) එවැනි වූ නියමයක් පොදු නාන ස්ථානයකය ප්‍රකටව පෙනෙන පරිදි ප්‍රදර්ශනය කළ යුතුය.

12. සභාපතිවරයා විසින් මෙම අතුරු ව්‍යවස්ථාවේ 11 වන වගන්තිය යටතේ භාවිතය තහනම් කරන ලද පොදු නාන ස්ථානයකින් එසේ තහනම් කර ඇති කාල සීමාව තුළ කිසියම් තැනැත්තෙකු විසින් ස්නානය කිරීම හෝ වෙනත් කවර හෝ කාර්යයක් සඳහා පොදු නාන ස්ථානය භාවිතයට ගැනීම නොකළ යුතුය.

*වසංගත තත්ත්වයකට අදාළව නියමයන් ප්‍රකාශයට පත් කිරීම*

13. (1) බල ප්‍රදේශය තුළ ශ්වසනයෙන් හෝ ස්පර්ශයෙන් හෝ බෝවිය හැකි කිසියම් වසංගත තත්වයක් පැතිර යාමට හේතු වන පරිදි කරුණු යෙදී ඇති අවස්ථාවක ඒ පිළිබඳව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී ලබාදෙන උපදෙස් සැලකිල්ලට ගනිමින් පොදු නාන ස්ථානයක ස්නානය කරන්නකු හෝ එය භාවිතයට ගන්නෙකු විසින් අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් වූ නියමයන් සභාපතිවරයා විසින් ප්‍රකාශයට පත් කළ යුතුය.

(2) ඉහත (1) උප වගන්තිය යටතේ වූ සෑම නියමයක්ම පොදු නාන ස්ථානයේ ප්‍රකටව පෙනෙන පරිදි ප්‍රදර්ශනය කළ යුතු අතර පොදු නාන ස්ථානය භාවිතයට ගනු ලබන සෑම අයෙකුම එම නියමයන්ට අනුකූලව ක්‍රියා කළ යුතුය.

14. කිසියම් වසංගත රෝගයකින් පෙලෙන හෝ වසංගත රෝගයකින් පසු නිරෝධායන කාලසීමාවක් ගත කරන හෝ එවන් රෝගී තත්වයක් සම්බන්ධයෙන් වන සැකය මත නිරෝධායන කාලසීමාවක් ගතකරන කවර හෝ තැනැත්තෙකු පොදු නාන ස්ථානයක් භාවිතයට ගැනීම නොකළ යුතුය.

15. පොදු නාන ස්ථානයක,

(අ) ජනනය වන අපද්‍රව්‍ය බැහැර කිරීම සභාපති විසින් නිශ්චිතව නියම කර ඇති ආකාරයට කළ යුතු අතර කිසිදු අපද්‍රව්‍යයක් බාහිර පරිසරයට මුදා හැරීම නොකළ යුතුය.

*අපද්‍රව්‍ය බැහැර කිරීම*

(ආ) කිසියම් තැනැත්තෙකු විසින් පැලද සිටි මුව ආවරණයක් හෝ අත්වැස්මක් වැනි දේ, බැහැර කිරීම සඳහා ඒ සඳහාම නිශ්චිතව වෙන්කර ස්ථානයේ තබා ඇති කසල රැඳවුමක් පවත්වා ගත යුතු අතර, එයටම පමණක් බැහැර කිරීම කළ යුතුය.

(ඇ) එක් රැස්වන අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාව විසින් ක්‍රියාත්මක කරන කසළ කළමනාකරණ වැඩසටහනට අනුව ස්ථානයෙන් බැහැර කිරීම කළ යුතුය.

16. පොදු නාන ස්ථානයකින් කිසිදු අවස්ථාවක බීමට ජලය ලබා ගැනීම නොකළ යුතුය.

17. පොදු නාන ස්ථානයක් වශයෙන් වෙන් කර ඇති භූමි ප්‍රදේශයක ප්‍රාදේශීය සභාව මගින් සපයා ඇති වැසිකිළි හා කැසිකිළි පහසුකම් ඇත්තේනම්, එහිම මිස, කිසිදු තැනැත්තෙකු පොදු නාන ස්ථානයක් අවට මුත්‍රා කිරීම හෝ මලපහ කිරීම නොකළ යුතුය.

18. පොදු නාන ස්ථානයක් වශයෙන් පවත්වාගෙන යන ස්ථානයක වාහනයක් සේදීම, යන්ත්‍රෝපකරණ සේදීම කෘෂි රසායන ඉසීමට ගන්නා යන්ත්‍ර වැනි දේ සේදීම නොකළ යුතුය.

*සතුන් නැහැවීම සහ සතුන් ඇතුළත් කිරීම තහනම් බව*

19. පොදු නාන ස්ථානයක් වශයෙන් වෙන් කර ඇති කවර හෝ ස්ථානයක හෝ ඒ ආසන්නයේ කිසිදු සතෙකු නැහැවීම, සේදීම හෝ එවැනි ස්ථානයකට සතෙකු ඇතුළු කිරීම කිසිදු තැනැත්තෙකු විසින් නොකළ යුතුය.

20. පොදු නාන ස්ථානයක් අසල නිකරුනේ හැසිරීම එහා මෙහා යාම කිසිදු තැනැත්තෙකු විසින් නොකළ යුතුය.

21. කිසියම් පොදු නාන ස්ථානයක් මෙම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානයන්ට අනුකූලව පවතින්නේද යන්න සභාපතිවරයා නිශ්චිතව බලය පවරන ලද නිලධාරියකු විසින් නිරන්තරව පරීක්ෂා කළ යුතුය.

22. මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කර ඇති විධිවිධානයන්ට පටහැනිව පොදු නාන ස්ථානයක ක්‍රියාකිරීම හෝ එහි විධිවිධාන උල්ලංඝණය කිරීම වරදක්වන අතර එම වරද සම්බන්ධව නිසි අධිකාරි බලය සහිත අධිකරණයක් විසින් වරදකරු කිරීමෙන් අනතුරුව, එකී වරද සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(2) උපවගන්තිය යටතේ සඳහන් දඩයකට යටත් විය යුතුය. *දණ්ඩනය*

23. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, *අර්ථ නිරූපනය*

"ප්‍රාදේශීය සභාව" යන්නෙන් කළුතර ප්‍රාදේශීය සභාවද;

"සභාපති" යන්නෙන් කළුතර ප්‍රාදේශීය සභාවේ තත්කාලය සඳහා සභාපති ධූරයට පත්ව ඇති තැනැත්තා හෝ එම ධූරයේ කාර්යය කටයුතු ඉටු කරන තැනැත්තෙකු;

"සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී" යන්නෙන් තත්කාලයේ කළුතර ප්‍රාදේශීය බල ප්‍රදේශයෙහි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාසය සඳහා එම ධූරය දරන තැනැත්තාද;

"බලයලත් නිලධාරියා" යන්නෙන් තත්කාලයෙහි සභාපතිවරයා විසින් ලිඛිතව බලය පවරන නිලධාරියෙකුද අදහස් වෙති.

24. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර අනනුකූලතාවයක් වුවහොත් සිංහල පාඨය ප්‍රමුඛ වෙයි. *පාඨ අතර අනනුකූලතාව*

**ලොන්ඩරි, රෙදි සේදීමේ ස්ථාන පවත්වාගෙන යාම පිළිබඳ අතුරුව්‍යවස්ථාව**

1. මෙම අතුරු ව්‍යවස්ථාව කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පවත්වාගෙන යන ලොන්ඩරි, රෙදි සේදීමේ ස්ථාන පවත්වාගෙන යාම විධිමත් කිරීම හා අධීක්ෂණය කිරීම සඳහා මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලබයි.

2. මෙම අතුරු ව්‍යවස්ථාව කළුතර ප්‍රාදේශීය සභාවේ ලොන්ඩරි, රෙදි සේදීමේ ස්ථාන පවත්වාගෙන යාම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ. *ලුහුඬු නාමය*

3. මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීමට **1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (IX)** වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 122 වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට බලය ලැබී ඇත.

4. කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය (මෙහි මින්මතු බල ප්‍රදේශය යනුවෙන් හඳුන්වනු ලබන) තුල කිසිදු නැතැත්තෙකු සභාපතිවරයා වෙතින් මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ලබාගත් බලපත්‍රයක් යටතේ මිස ලොන්ඩරියක් හෝ රෙදි සේදීමේ මධ්‍යස්ථානයක් (මෙහි මින්මතු පරිශ්‍රයක් යනුවෙන් හඳුවන්වනු ලබන) පවත්වාගෙන යාම නොකළ යුතුය.

5. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ඉල්ලුම් කරන සෑම තැනැත්තෙක්ම මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ වූ උපලේඛනයට අනුව පිළියෙල කරන ඉල්ලුම් පත්‍රයක් යටතේ ඒ සඳහා ඉල්ලුම් කළ යුතුය. *බලපත්‍රයක් ඉල්ලුම් කිරීම*

6. ඉහත වගන්තිය යටතේ ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කිරීම ඒ සඳහා වන අවශ්‍යතා සම්පූර්ණ කර ලියාපදිංචි තැපැලෙන් **සභාපති** වෙත යොමු කිරීමෙන්, ගෙනවිත් භාරදීමෙන් හෝ සභාව අවසර දී ඇති ප්‍රමාණයට විද්‍යුත් තැපැලෙන් යොමු කිරීමෙන් ඉදිරිපත් කළ හැකිය.

7. මෙම අතුරු ව්‍යස්ථාව යටතේ බලපත්‍රයක් ඉල්ලුම් කරන සෑම තැනැත්තෙක්ම මෙහි පහත සඳහන් කොන්දේසි සම්පූර්ණ කර ඇත්තේ නම් මිස **සභාපතිවරයා** විසින් බලපත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතුය. *බලපත්‍රයක් සඳහා*

(1) පරිශ්‍රයට අදාළ වන ඉදිකිරීම් ස්ථිර ඉදිකිරීම් වේ නම්, ඒ සෑම ඉදිකිරීමක්ම 1978 අංක 41දරන නාගරික සංවර්ධන අධිකාරි පනතට හෝ නිවාස හා නගර සංවර්ධන ආඥා පනතේ විධිවිධානයට අනුකූලව ඉදිකරන ලද ඉදිකිරීම් විය යුතුය.

(2) පරිශ්‍රය තුළ පිරිසිදු කිරීම සඳහා රැගෙන එන රෙදි, පිරිසිදු කරන තෙක් තාවකාලිකව රඳවාගැනීම සඳහා වෙන්වූ කාමර පහසුකම් විය යුතුය.

(3) පරිශ්‍රය තුළ පිරිසිදු කිරීම සඳහා රෙදි භාර ගැනීම හා පිරිසිදු කරන ලද රෙදි ආපසු භාරදීමේ කාර්ය එකම අයෙකු එකවර නොකළ යුතුය.

(4) රෙදි සේදීම වියලීම සහ භාවිතය සඳහා නැවත සකස් කිරීම එකම පරිශ්‍රයක සිදුවන විටදී,

(අ) පරිශ්‍රයට අදාළ කාණු පහසුවෙන් ජලය බැස යන ආකාරයට පවත්වාගත යුතු අතර, අපජලය අනුමත ක්‍රමවේදයන්ට පූතික වළකට, උරාගැනීමේ වළකට හෝ මධ්‍ය ප්‍රතිකාර ඒකකයකට යොමු කර තිබිය යුතුය.

(ආ) රෙදි සේදීම සහ වියලීම සඳහා යොදා ගැනෙන යන්ත්‍ර මනා ක්‍රියාකාරීත්වයෙන් යුතු ඒවා විය යුතු අතර, පොළොවට නිසි පරිදි සවිකිරීම් සහිතව හා ක්‍රියාකාරීත්වයේදී ජනිත වන ශබ්දය බාහිරව ව්‍යාප්ත නොවන පරිදි පිහිටුවා තිබිය යුතුය.

(ඇ) පරිශ්‍රයෙහි විදුලි පරිපථය ස්ථිර ලෙස සකස් කරනු ලැබුවක් විය යුතු අතර, අවශ්‍යවන විදුලි ධාරිතාවයක් සඳහා නිවැරදිව පේනු සවිකර තිබිය යුතුය.

(ඈ) රෙදි සේදීමේදී මුදාහැරෙන ජලය කිසිදු ආකාරයකින් බාහිරව ගලාඒමකින් තොරව අවසන් බැහැර කිරීම සිදුකර තිබිය යුතුය.

(ඉ) පරිශ්‍රය තුලට පහසුවෙන් ආලෝකය සහ වාතාශ්‍රය ගලා ඒමට හැකිවන පරිදි ජනේල හා කවුළු යොදා තිබිය යුතු අතර, නැතහොත් කෘත්‍රිමව ආලෝකය සපයා වායු සමනය කර තිබිය යුතුය.

(ඊ) රෙදි මැදීමේ කාර්යය සඳහා වන මේස හා අනෙකුත් උපකරණ නිසි භාවිතයට හැකි වන පරිදි ප්‍රමාණවත් දුරස්ථභාවයක් සහිතව පිහිටුවා තිබිය යුතුය.

(උ) පරිශ්‍රයෙහි සේවයෙහි යොදවා ඇති සේවකයින් සඳහා ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් සපයා තිබිය යුතුයි, ස්ත්‍රී සහ පුරුෂයින් වෙනුවෙන් ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් සපයා තිබිය යුතුය.

(ඌ) පිරිසිදු කරන ලද පරිදි සහ තාවකාලිකව රඳවාගැනීම සඳහා සෞඛ්‍ය ආරක්ෂිත බහාලුම් තිබිය යුතු අතර, කිසිදු ආකාරයකින් එය කිළිටි රෙදි සමඟ ගැටීමක් නොවිය යුතුය.

(එ) රෙදි මැදීමෙන් පසු ආපසු භාරදීම දක්වා තබාගැනීමට වසා තැබිය හැකි දොරවල් සහිත කාමර හෝ කුටීර තිබිය යුතුය.

(ඒ) අවශ්‍ය අවස්ථාවක නිසි දුරස්ථභාවයක් රඳවා ගැනීමට හැකිවන පරිදි පරිශ්‍රය අභ්‍යන්තරය පිරිසැකසුම් කර තිබිය යුතුය.

(5) රෙදි සේදීම පරිශ්‍රයට පරිභාහිරව සිදුකරන අවස්ථාවක පොදු ජල මූලාශ්‍රයක් ඒ සඳහා භාවිතා නොකළ යුතු අතර,

(අ) එම කාර්යය සඳහාම නිශ්චිත වූ ස්ථානයක රෙදි සේදීම සිදු කරන බවට ඒ ස්ථානය කවර ස්ථානයක් ද යන වග, අවස්ථානුකූලව සනාථ කරන බවට,

(ආ) රෙදි පිරිසිදු කිරීම සඳහා යොදාගැනෙන කිසිදු රසායනික ද්‍රව්‍යයක් භාවිතයෙන් පසු කිසිදු ජල මූලාශ්‍රයකට මුදා නොහැරෙන බවට,

ඉල්ලුම්කරු සහතික වී තිබිය යුතුය.

(6) පරිශ්‍රයට පරිභාහිරව රෙදි සේදීම සිදුකිරීමේදී පරිශ්‍රයෙන් ඒ සඳහා කිළිටි රෙදි රැගෙනයාම සහ පිරිසිදු කරන ලද රෙදි රැගෙන ඒමේදී කවර ආකාරයකින් හෝ පිරිසිදු කරන ලද රෙදි කිළිටි රෙදි සමඟ මිශ්‍ර වීමක්, ගැටීමක් සිදුනොවන පරිදි කටයුතු කිරීමට අවශ්‍ය පහසුකම් සපුරා තිබිය යුතුය.

(8) පාරිභෝගිකයින්ගේ  වාහන නවතා තැබීම සඳහා ප්‍රමාණවත් ඉඩ පහසුකම් තිබිය යුතුය.

(9) හදිසි විදුලි බිඳවැටීම් හා ජල සම්බන්ධතාවය බිඳවැටීම් සම්බන්ධයෙන්  ප්‍රයෝජනයට ගත හැකි ප්‍රමානවත් ධාරිතාවයකින් යුත් විදුලි බිඳ වැටීමකදී ස්වයංක්‍රීයව ක්‍රියා කරවන විදුලි ජනක යන්ත්‍ර හා ජලය ගබඩා කිරීමේ පහසුකම් තිබිය යුතුය.

(10) පරිශ්‍රයෙහි අභ්‍යාන්තර කාණු හා අපද්‍රව්‍ය බැහැර කිරීම් පූතික වළකට හෝ උරා ගැනීමේ වළකට යොමු කර තිබිය යුතු අතර, එම පූතික වළ හෝ උරා ගැනීමේ වළ ජල මූලාශ්‍රයක  ඇත්නම් එයට  මීටර් 15.25 කට වඩා වැඩි දුරකින් විය යුතුය.

8. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ඉදිරිපත්වන ඉල්ලුම් පත්‍රයකට අදාළව ඉල්ලුම් පත්‍රය ලැබී දින දහහතරක් ඇතුලත සභාපතිවරයා විසින්  ;

(1) 7 වන වගන්තියෙහි සඳහන් කොන්දේසිවලට අනුකූල වන විටදී පරිශ්‍රයට අදාළ බලපත්‍රයක් ඉල්ලුම්කරු වෙත නිකුත් කල යුතුය.

(2) 7 වන වගන්තියෙහි සඳහන් කොන්දේසිවලට අනුකූල නොවන්නේනම්, හේතු දන්වා අදාළ ඉල්ලුම්පත්‍රය ප්‍රතික්ෂේප කල යුතුය.

***බලපත්‍රයක් සඳහා ගාස්තු***

9. (1) මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රයක් සඳහා අයකල යුතු ගාස්තු **මූලික නීතියේ** සඳහන් විධිවිධානයන්ට යටත්ව සභාව විසින් තීරණය කර ප්‍රකාශයට පත් කරනු ලබන ගාස්තු විය යුතුය.

(2) බලපත්‍රයක් නිකුත් කිරීමට අදාළව ස්ථාන පරීක්ෂාවන් සඳහා වන පරීක්ෂණ ගාස්තුවක් සභාව විසින් තීරණය කර අය කිරීම නීත්‍යානුකූල විය යුතුය.

10. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන බලපත්‍රයක් මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධාන අනුව කලින් අවලංගු නොකලහොත් බලපත්‍රයට අදාළ වර්ෂයෙහි දෙසැම්බර් තිස් එක දක්වා වලංගු විය යුතුය.

11. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලත් සෑම තැනැත්තෙක්ම මෙහි පහත සඳහන් කොන්දේසිවලට අදාළව ක්‍රියා කළ යුතුය.

(1) පිරිසිදු කිරීම සඳහා භාරදෙන ලද රෙදි පරිශ්‍රයෙහි පිරිසිදු කරන තෙක් පරිශ්‍රයෙහි ඒ සඳහා වූ නිශ්චිත කාමරයක බහාලුමක තබා තිබිය යුතුය.

(2) පරිශ්‍රය තුල රෙදි පිරිසිදු කිරීම සඳහා යොදා ගැනෙන රසායනික ද්‍රව්‍ය ඇත්නම් ඒවා බැහැර කිරීම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂක නිර්දේශයන්ට අනුකූලව සිදු කළ යුතුය.

(3) පරිශ්‍රය තුල රෙදි පිරිසිදු කිරීම හේතුකොටගෙන බැහැර කරන අපජලය බැහැර කරන කානු හෝ නල පොලොව මතුපිට විවෘත නොවන සේ පූතික වළකට හෝ උරාගැනීමේ වළකට යොමු කර තිබිය යුතුය.

(4) පරිශ්‍රය තුල සේවකයින් සඳහා වන වැසිකිළි විෂබීජ නාශක යොදා පිරිසිදු කර පවත්වාගත යුතුය.

(5) රෙදි මැදීම සඳහා දැවුනු අඟුරු දැල්වීම කරයි නම්, ඒවා භාවිතයෙන් පසු හොඳින් නිවා නිශ්චිත බඳුනකට එක්රැස් කර අපද්‍රව්‍ය වශයෙන් බැහැර කිරීම කළ යුතුය.

(6) පරිශ්‍රය තුල නේවාසිකව සේවකයින් සිටින්නේ නම් ඔවුන් සඳහා;

(අ) ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් යටතේ වෙන්වූ නේවාසික පහසුකම් තිබිය යුතුය.

(ආ) පරිශ්‍රයෙහි නවාතැන් සහ ආහාර ගැනීම ආදි කාර්යයන් සඳහා වන ප්‍රදේශය, බලපත්‍රයට අදාළ ක්‍රියාවලිය සිදුවන කොටසින් වෙන්වී පවත්වාගත යුතුය.

(7) කිසිදු ආකාරයකින් කිසියම් බෝවන රෝගයකින් පෙලෙන හෝ එවැනි රෝගයක් වැළඳී ඇති බවට සැක කරනු ලබන හෝ එවැනි රෝග වාහකයෙකු හෝ ආසාධිතයෙකු පරිශ්‍රය තුල සේවය සඳහා නොයෙදිය යුතු අතර, සෑම විටම එවැනි අයකු සේවයෙහි නොයෙදෙන බවට බලපත්‍රලාභියා සෑහීමකට පත්විය යුතුය.

(8) ශ්‍රී ලංකාව පුරාම හෝ ඉන් කොටසකට හෝ බලප්‍රදේශයට අදාළව හෝ නිරෝධායන හා රෝග වැළැක්වීමේ ආඥා පනත යටතේ හෝ ඒ යටතේ සාදන රෙගුලාසි යටතට අදාළ වන වසංගත තත්ත්වයකට කරුණු යෙදී ඇති කවර හෝ අවස්ථාවක හෝ බලප්‍රදේශය තුල වසංගත තත්ත්වයක් කරුණු යෙදිය හැකි බවට සෑහීමකට පත් වෙමින් එය පාලනය කිරීම සඳහා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී උපදෙස් මත සභාපතිවරයා කලින් කළ නියම කරන නියමයන් ඇත්නම්, ඒ සෑම නියමයකටම යටත්ව පරිශ්‍රය පවත්වා ගත යුතුය.

(9) බලප්‍රදේශය තුල නිරෝධායන හා රෝග වැළැක්වීමේ ආඥා පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද රෙගුලාසියන් යටතේ කිසියම් වසංගත තත්ත්වයකට අදාළව නියමයන් ක්‍රියාත්මක කර ඇති විටකදී, පරිශ්‍රය බලපත්‍රයට අදාළ කාර්යයන් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් පහත සඳහන් ක්‍රියාමාර්ග සියල්ලම හෝ කිහිපයක් හෝ ක්‍රියාත්මක කරන ලෙසට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී උපදෙස් පරිදි සභාපතිවරයා විසින් නියම කිරීම නීත්‍යානුකූල වන්නේය.

(අ) බලපත්‍රය යටතේ පරිශ්‍රයෙහි කටයුතු ඉටු කිරීම තාවකාලිකව කිසියම් කාලයක් සඳහා අත්හිටුවිය යුතු බව.

(ආ) පරිශ්‍රය තුල කටයුතු කිරීමේදී නිශ්චිත පුද්ගල දුරස්ථභාවයකින් යුතුව කටයුතු පවත්වාගත යුතු බව

(ඇ) කිළිටි රෙදි භාරදීමේදී, පිරිසිදු කර ආපසු භාරදීමේදී නිශ්චිත ක්‍රමවේදයක් අදාළ කර ගත යුතු බව.

(ඈ) පරිශ්‍රය තුල කටයුතු වෙනුවෙන් අදාළ විය යුතු සෞඛ්‍ය නියමයන් මහජනයාට හා සේවකයන්ට දැකගත හැකි වන පරිදි ප්‍රදර්ශනය කර තිබිය යුතු බව.

(ඉ) පරිශ්‍රය අවස්ථානුකූලව අදාළ විය යුතු සෞඛ්‍ය නියමයන්ට අනුකූලව පවත්වාගෙන යන බවට සභාපතිවරයා සමඟ එකඟතා ප්‍රකාශයකට ඇතුළත් විය යුතු බව.

(ඊ) පරිශ්‍රය තුල සේවයෙහි යෙදෙන්නන් නිශ්චිත කාර්යයන් සඳහා අත්වැසුම් සහ මුඛ වැසුම් භාවිතා කරමින් කාර්යයෙහි නිරත විය යුතු බව.

(උ) පරිශ්‍රය විෂබීජ හරණයකට ලක්කල යුතු බව.

(12) පරිශ්‍රය තුළ එක්රැස් වන අපද්‍රව්‍ය ඒ සඳහා නිශ්චිතව පවත්වාගෙන යන සංවෘත කසළ බඳුන් තුලට බැහැර කළ යුතු අතර, පරිශ්‍රය තුල භාවිතයෙන් පසු ඉවත් කරන මුඛ වැසුම්, අත් වැසුම් වේ නම් ඒ සියල්ල ඒ සඳහාම පරිශ්‍රය තුල පවත්වාගෙන යා යුතු පාදයෙන් විවෘත කල හැකි බඳුන් තුලට පමණක් බැහැර කළ යුතුය.

(13) පරිශ්‍රයෙහි එක්රැස් වන අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාව ක්‍රියාත්මක කරන අපද්‍රව්‍ය කළ මනාකරණ වැඩසටහනට අනුකූලව බැහැර කිරීම කළ යුතුය.

(14) සෑම පරිශ්‍රයකට මෙම අතුරු ව්‍යවස්ථාව හා මේ යටතේ ලබා ගත් බලපත්‍රය හෝ එහි පිටපතක් ප්‍රදර්ශණය කර තිබිය යුතුය. *බලපත්‍රය ප්‍රදර්ශනය කළ යුතු බව*

(15) මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධානයන්ට අනුකූලව පරිශ්‍රය පවතින්නේද යන්න පරික්ෂා කිරීම සඳහා සභාපතිවරයා විසින් හෝ ඒ සඳහා බලය පවරන ලද මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකු හෝ වෙනත් යම් නිලධාරියෙකු ඕනෑම සාධාරණ වෙලාවක පරිශ්‍රයට ඇතුළු වීමට, අවශ්‍ය නියැදි ලබා ගැනීම නීත්‍යානුකූල වන්නේය. *පරිශ්‍රයකට ඇතුළු වීමේ බලය*

(16) (1) මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලත් පරිශ්‍රයක් යටතේ මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කොන්දේසි උල්ලංඝනය කරමින් හෝ ඊට පටහැනි වන පරිදි කටයුතු සිදුවන අවස්ථාවක අතුරු ව්‍යවස්ථාවට අනුකූල වීම සඳහා දින තිහකට නොවැඩි නිශ්චිත කාලයක් දක්වමින් දැන්වීමක් සභාපතිවරයා විසින් බලපත්‍රලාභියා වෙත භාරදිය යුතුය.

(2) මෙම වගන්තිය යටතේ වූ දැන්වීමක් බලපත්‍ර ලාභියා වෙත භාරදීමෙන් පසු ,අදාළ දැන්වීමේ සඳහන් නියමයන්ට අනුකූලව ක්‍රියාකිරීම සඳහා තවදුරටත් අතිරේක කාලයක් ලබාදෙන ලෙසට සාධාරණ හේතු දක්වමින් කරනු ලබන ඉල්ලීමක් මත සභාපතිවරයා විසින් අතිරේක කාලයක් ලබාදිය හැකිය.එසේ ලබාදෙන කාලය පළමු දැන්වීමේ සඳහන් කාලයට අතිරේකව දින දහ හතරක උපරිම කාලයකට යටත්ව විය යුතුය.

(17) ඉහත 16 වගන්තිය යටතේ ලබාදෙන කාල සීමාව තුළ හෝ අතිරේක කාල සීමාව තුළ දැන්වීමට අනුකූලව ක්‍රියා කිරීම බලපත්‍ර ලාභියා විසින් පැහැර හැර ඇති අවස්ථාවක සභාපතිවරයා විසින් අදාළ බලපත්‍රය අවලංගු කල යුතුය. *බලපත්‍රය අවලංගු කිරීම*

(18) මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ලබා ගත යුතු බලපත්‍රයකින් තොරව හෝ අතුරු ව්‍යවස්ථාව යටතේ කරනු ලබන නියමයන් කඩකරමින් පරිශ්‍රයක් පවත්වාගෙන යාම වරදක් වන අතර එම වරද සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් වරදකරුවෙකු කිරීමෙන් පසු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (2) උප වගන්තිය යටතේ දඩුවමකට යටත් විය යුතුය.තවද එලෙස වරදකරුවෙකු වීමෙන් පසු තව දුරටත් එකී කඩකිරීම, උල්ලංඝණය නිරන්තරයෙන්ම කරගෙන යනු ලබන විට සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් දැන්වීමක් භාර දීමෙන් පසු උල්ලංඝණ තව දුරටත් සිදු කරන්නේ නම් එසේ සිදු කරන සෑම දිනකට අදාළව එම උප වගන්තියේ සඳහන් අතිරේක දඩයකට යටත් විය යුතුය. *දණ්ඩනය*

(19) මෙම අතුරු ව්‍යවස්ථාවේ පද සම්බන්ධයෙන් අන්‍ය අර්ථයක් අවශ්‍ය වන්නේනම් මිස මෙම අතුරුව්‍යවස්ථාවේ, *අර්ථ නිරූපණය*

"සභාව" යන්නෙන් කළුතර ප්‍රාදේශීය සභාවද

"සභාපති" යන්නෙන් කළුතර ප්‍රාදේශීය සභාවේ තත්කාලයෙහි සභාපති ධූරය දරන හෝ එම ධූරයේ කාර්යය කර්තව්‍ය ඉටුකරණ අයද ,

"සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී" යන්නෙන් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අදාළ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාසය සඳහා එම තනතුර දරන අයද,

"මහජන සෞඛ්‍ය පරීක්ෂක" යන්නෙන් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අදාළව සේවයේ යෙදෙන ප්‍රාදේශීය සභාවේ හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයට අනුයුක්තව මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුර දරන අයෙක්ද,

" මූලික නීතිය" යන්නෙන් **1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත** අදහස් වෙයි.

(20) මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල හා ඉංග්‍රීසි, දෙමළ පාඨ අතර අනනුකූලතාවයන් හටගතහොත් සිංහල පාඨය අනුව වෙයි. *පාඨ අතර අනනුකූලතාව*

**පළමුවන උපලේඛනය**

**.......................... වර්ෂය සඳහා බලපත්‍රය ලබාගැනීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය.**

01. ඉල්ලුම්කරුගේ නම : -
02. පෞද්ගලික ලිපිනය : -
03. ජාතික හැඳුනුම්පත් අංකය : -
04. දුරකථන අංකය : -
05. ආරම්භක වර්ෂය : -
06. ලොන්ඩ්‍රිය රෙදි සේදීමේ ස්ථානය පවත්වාගෙන යන ලිපිනය : -
07. ග්‍රාම නිලධාරී කොට්ඨාසය : -
08. වරිපනම් අංකය: -
09. අනුමත ගොඩනැගිලි සැලැසුම් අංකය හා දිනය :-

ඉහත තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

ඉහත තොරතුරු සඳහන් තොරතුරු නිවැරදි බව සහතික වෙමි. ............................ වර්ෂය වෙනුවෙන් බලපත්‍රයක් මා වෙත නිකුත් කරන ලෙස ඉල්ලමි.

දිනය:- ......................................

ඉල්ලුම්කරුගේ අත්සන

---

*කාර්යාලීය ප්‍රයෝජනය සඳහා*

ආදායම් පරීක්ෂක,

පසුපිටේ සඳහන් ඉල්ලුම්පත්‍රයට අදාළව බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා වන ඔබගේ නිරීක්ෂණ හා නිර්දේශ කඩිනමින් මා වෙත ලබා දෙන ලෙස කාරුණිකව ඉල්ලමි.

දිනය:- .............................................

ලේකම්

---

ලේකම්,

බලපත්‍රය ලබා දීම නිර්දේශ කරමි./නොකරමි.

දිනය :- ..................................

ආදායම් පරීක්ෂක

සභාපති,
පසුපිටේ සඳහන් ඉල්ලුම් පත්‍රයට අදාළව බලපත්‍රයක් නිකුත් කිරීම නිර්දේශ කරමි.

දිනය :- ……………………………
ලේකම්

ලේකම්,

බලපත්‍රයක් නිකුත් කිරීම අනුමත කරමි.

දිනය :- ……………………………
සභාපති

**කොණ්ඩා කපන ස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

1. මෙම අතුරු ව්‍යවස්ථාව කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල කොණ්ඩා කපන ස්ථාන හා බාබර් සාප්පු විධිමත් කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා පනවනු ලබයි.

2. මෙම අතුරුව්‍යවස්ථාව කළුතර ප්‍රාදේශීය සභාවේ කොණ්ඩා කපන ස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ. *ලුහුඬු නාමය*

3. මෙම අතුරු ව්‍යවස්ථාව පැනවීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126(XXIII) වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 122 උප වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට බලය ලැබී ඇත. *නෛතික බලය*

4. කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය (මෙහි මින්මතු බල ප්‍රදේශය යනුවෙන් හඳුන්වනු ලබන) තුළ කිසිදු තැනැත්තෙකු විසින් සභාපතිවරයා වෙතින් මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ලබාගත් බලපත්‍රයක් යටතේ මිස කොණ්ඩා කපන ස්ථානයක් හෝ බාබර් සාප්පුවක් (මෙහි මින් මතු පරිශ්‍රය යනුවෙන් හඳුන්වනු ලබන) පවත්වාගෙන යාම නොකළ යුතුය.

5. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ඉල්ලුම් කරන සෑම තැනැත්තෙක්ම මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ වූ උපලේඛනයට අනුව පිළියෙල කරන ලද ඉල්ලුම් පත්‍රයක් යටතේ ඒ සඳහා ඉල්ලුම් කළ යුතුය. *බලපත්‍රයක් ඉල්ලුම් කිරීම*

6. ඉහත වගන්තිය යටතේ වූ ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කිරීම ඒ සඳහා වන අවශ්‍යතා සම්පූර්ණ කර ලියාපදිංචි තැපෑලෙන් සභාපති වෙත යොමුකිරීමෙන්, ගෙනවිත් භාරදීමෙන් හෝ සභාව අවසර දී ඇති ප්‍රමාණයට විද්‍යුත් තැපෑලෙන් යොමුකිරීමෙන් ඉදිරිපත් කළ හැකිය.

7. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ඉල්ලුම්කරන සෑම තැනැත්තෙක්ම මෙහි පහත සඳහන් කොන්දේසි සම්පූර්ණ කර ඇත්තේ නම් මිස සභාපතිවරයා විසින් බලපත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතුය. *බලපත්‍රයකට අදාළ තොරතුරු*

(1) පරිශ්‍රයට අදාළ ඉදිකිරීම් 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනත යටතේ හෝ නිවාස හා නගර සංවර්ධන ආඥා පනතේ විධිවිධානයන්ට අනුකූලව ඉදිකරන ලද ඉදිකිරීම් විය යුතුය.

(2) පරිශ්‍රය සිය ව්‍යාපාර නාමය, යටතේ පවත්වා ගත යුතුය.

(3) පරිශ්‍රය තුල සේවයෙහි නියුතු අය කොණ්ඩා කැපීම සම්බන්ධයෙන් නිපුණතාවයක් ලද අය වශයෙන් වන බවට තහවුරුවක් ඉදිරිපත් කල යුතුය.

(4) පරිශ්‍රය තුල ඉදිකිරීම් ස්ථිර ඉදිකිරීම් ද්‍රව්‍යයන්ගෙන් මනා ලෙස ඉදිකර තිබිය යුතු අතර එය යහපත් සහ සෞඛ්‍ය ආරක්ෂිත තත්ත්වයෙන් පැවතිය යුතුය.

(5) එක් සේවාලාභියෙකුට සේවා සැපයීම සඳහා වෙන් වෙන් වශයෙන් පොළවේ ඉඩ ප්‍රමාණය අවම වශයෙන් වර්ග මීටර් 2.25 කට නොඅඩු වන සේ එකවර සේවා සපයන සේවාලාභීන් සංඛ්‍යාවට අනුරූපීව ප්‍රමාණවත් ඉඩකඩ සපයා තිබිය යුතුය.

(6) සේවා සපයා ගැනීමේ අපේක්ෂාවෙන් පැමිණෙන කිසියම් සේවාලාභියෙකුට; ඒ වන විටත් සේවය ලබමින් සිටින සේවාලාභියා රැඳී සිටින ස්ථානයේ සිට අවම වශයෙන් මීටර් 1.5 ක් දුරින් වනසේ පහසුවෙන් අසුන්ගෙන සිටීමට ප්‍රමාණවත් ඉඩකඩ කිබිය යුතුය.

(7) පරිශ්‍රයට අදාළ සියළු බිත්ති මීටර් 2.7 කට නොඅඩු උසකින් යුක්ත විය යුතු අතර එය තීන්ත ආලේප කරවා තිබිය යුතුය.

(8) පරිශ්‍රයෙහි සෑම කොටසකම සිවිලිමක් හෝ කොන්ක්‍රීට් තහඩුවකින් නිමවී තිබිය යුතු අතර එය පොළොව මට්ටමේ සිට අවම මීටර් 2.7 කට නොඅඩු උසකින් විය යුතුය.

(9) පරිශ්‍රය වායුසමීකරණය කර හෝ පිටතින් වාතය පහසුවෙන් ගලා ඒමට හැකිවන පරිදි ප්‍රමාණවත් ලෙස විවෘත කල හැකි පරිදි වූ ජනේල යොදා තිබිය යුතුය.

(10) පරිශ්‍රයට අදාළ ආලෝකය හොඳින් ලැබෙන පරිදි නිමවා තිබිය යුතුය.

(11) පරිශ්‍රයෙහි භාවිතය සඳහා බීමට ගන්නා ජලය ප්‍රමාණවත් ලෙස සම්පාදන කර තිබිය යුතු අතර, ජලය ගබඩා කර ගතහැකි පහසුකම් වලින් යුක්ත විය යුතුය.

(12) සේවාලාභීන්ගේ කොන්ඩය සැකසීමෙන් පසු ස්නානය අවශ්‍යවන විටදී ඒ සඳහා පහුසකම් සපයා තිබිය යුතුය.

(13) සේවාලාභීන්ගේ පාවිච්චියට ගනු ලැබූ උපකරණ, භාජන සේදීම සඳහා පරිශ්‍රයෙහි වෙනම කොටසක් පවත්වාගත යුතුය.

(14) ආයතනයේ සේවකයින් හා පාරිභෝගිකයින් සඳහා ප්‍රමාණවත් පරිදි වැසිකිළි පහසුකම් විය යුතු අතර එය මනා ලෙස හා සෞඛ්‍ය ආරක්ෂිත ලෙස තනා තිබිය යුතුය.

(15) පාරිභෝගිකයන්ගේ හිස සේදීම සඳහා නිශ්චිත උපකරණ සවිකර තිබිය යුතු අතර ඒවා එහි අයකුගේ පරිහරණයෙන් පසු තවත් කෙනෙකුගේ පරිහරණය සඳහා යෙදවීමට පෙර විෂබීජ නාශක යොදා පිරිසිදු කරමින් පවත්වාගත යුතුය.

(16) පරිශ්‍රය තුලින් බැහැර කරන අපජලය පොදු කාණුවලට හෝ විවෘත භූමියකට ගලා නොයන පරිදි ප්‍රමාණවත් පියවර ගෙන තිබිය යුතු අතර, එය පූනීක වළකට හෝ උරාගැනීමේ වළකට හෝ නිසිලෙස යොමුකර තිබිය යුතුය.

(17) පරිශ්‍රයට අදාළ පූනීක වළක් හෝ උරාගැනීමේ වළක් බාහිරට විවෘත නොවන පරිදි විය යුතු අතර එය ජල මූලාශ්‍රයක් අසල ඇත්නම් එයට අවම වශයෙන් මීටර් 15.25 ක දුරකින් ඉදිකර තිබිය යුතුය.

(18) සේවා අපේක්ෂාවෙන් රැඳී සිටින පාරිභෝගිකයන් සඳහා රැඳී සිටීමට පරිශ්‍රයෙහි වෙන්වූ ස්ථානයක් ප්‍රමාණවත් පහසුකම් යටතේ පිහිටුවා තිබිය යුතුය.

(19) පරිශ්‍රය තුල විදුලි පරිපථය ඒ හා සම්බන්ධයෙන් වෘත්තීමය දැනුම ඇති අයකු විසින් පරීක්ෂා කර කාන්දුවීම් වලින් තොර ආරක්ෂිත තත්ත්වයෙන් පවතින බවට සහතික කර තිබිය යුතුය.

(20) පරිශ්‍රයෙහි භාවිතයට ගන්නා උපකරණ, භාජන පිරිසිදු කිරීම සඳහා වෙන්වූ ස්ථානයක් පවත්වාගත යුතුය.

8. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් සඳහා ඉදිරිපත් වන ඉල්ලුම් පත්‍රයකට අදාළව ඉල්ලුම්පත්‍රය ලැබී දින දාහතරක් ඇතුලත සභාපතිවරයා විසින්, *බලපත්‍රයක් නිකුත් කිරීම*

(1) 7 වන වගන්තිය යටතේ වූ කොන්දේසිවලට අනුකූල විටදී පරිශ්‍රයට අදාළ බලපත්‍රයක් ඉල්ලුම්කරු වෙත නිකුත් කල යුතුය.

(2) 7 වන වගන්තිය යටතේ වූ කොන්දේසිවලට අනුකූල නොවන්නේ නම් හේතු දක්වා අදාළ ඉල්ලුම්පත්‍රය ප්‍රතික්ෂේප කල යුතුය.

9. (1) මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රයක් සඳහා අයකල යුතු ගාස්තු මූලික නීතියේ සඳහන් විධිවිධානයන්ට යටත්ව සභාව විසින් වාර්ෂිකව තීරණය කර ප්‍රකාශයට පත්කරන ගාස්තු විය යුතුය. *බලපත්‍රයක් සඳහා ගාස්තු*

(2) බලපත්‍රයක් නිකුත් කිරීමට අදාළව ස්ථාන පරීක්ෂාවක් සඳහා වන පරීක්ෂණ ගාස්තුවක් සභාව විසින් තීරණය කර අයකිරීම නීත්‍යානුකූල වන්නේය.

10. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන බලපත්‍රයක් මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධාන අනුව කලින් අවලංගු නොකලහොත් බලපත්‍රයට අදාළ වර්ෂයෙහි දෙසැම්බර් තිස්එක දින දක්වා වලංගු විය යුතුය. *බලපත්‍රයකට අදාළ වලංගු කාලසීමාව*

11 මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලත් සෑම තැනැත්තෙක්ම මෙහි පහත සඳහන් කොන්දේසීන්ට අනුකූලව ක්‍රියාකල යුතුය.

(1) ශ්‍රී ලංකාව පුරාම හෝ ඉන් කොටසකට හෝ බල ප්‍රදේශයට අදාළව හෝ නිරෝධායක හා රෝග වැලැක්වීමේ ආඥා පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද රෙගුලාසි යටතට අදාළ වසංගත තත්ත්වයක් ප්‍රකාශයට පත්කර ඇති කවර හෝ අවස්ථාවක හෝ බල ප්‍රදේශය තුල යම් වසංගත තත්වයකට කරුණු යෙදී ඇති බවට සෑහීමට පත්වෙමින් එය පාලනය කිරීම සඳහා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී උපදෙස් මත සභාපතිවරයා කලින් කල නියම කරනු ලබන නියමයන් ඇත්නම් ඒ සෑම නියමයකටම යටත්ව පරිශ්‍රය පවත්වා ගත යුතුය.

(2) පරිශ්‍රයෙහි සේවය සඳහා යොදවා ඇති සෑම තැනැත්තෙකු විසින්ම නිරෝධායක හා රෝග වැලැක්වීමේ ආඥා පනත යටතේ සාදන ලද රෙගුලාසි යටතට අදාළ වන වසංගත තත්ත්වයක් ප්‍රකාශයට පත්කර ඇති කවර හෝ අවස්ථාවක ඊට අදාළව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී උපදෙස් මත සභාපතිවරයා විසින් කරනු ලබන සෑම නියමයකටම යටත්ව ක්‍රියා කල යුතුය.

(3) බල ප්‍රදේශය තුල වසංගත රෝගී තත්ත්වයක් සඳහා අවදානමක් ඇති බවට සැක කිරීමට කරුණු යෙදී ඇති සෑම අවස්ථාවකම සේවා අපේක්ෂාවෙන් පරිශ්‍රයට පැමිණෙන සෑම තැනැත්තෙකුටම අදාළව, ඊට අදාළ නිකුත් කර ඇති සෞඛ්‍ය උපදෙස් වලට අනුකූලව පැමිණෙන්නේනම් මිස එම පරිශ්‍රයෙහි සේවා පහසුකම් සලසා නොදිය යුතුය.

(4) බල ප්‍රදේශය තුල කිසියම් වසංගත රෝගී තත්ත්වයකට කරුණු යෙදී ඇති විට හෝ ඒ සඳහා අවදානමක් ඇති විට එයින් ආරක්ෂා වීම සඳහා අනුගමනය කල යුතුයැයි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක ජෙනරාල් හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් හෝ ඔවුන්ගේ උපදෙස් පරිදි සභාපතිවරයා විසින් හෝ නියම කර ඇති සෞඛ්‍ය ආරක්ෂිත උපදෙස් නිසියාකාරයෙන් පරිශ්‍රය තුල ක්‍රියාත්මක කල යුතුවා මෙන්ම, එසේ වන බවට බලපත්‍රලාභියා සෑහීමට පත් විය යුතුය.

(5) පාරිභෝගිකයන්ගේ හිස කෙස් කැපීම, හිස කෙස් සායම් කිරීම, රැවුල කැපීම සහ රෝම ඉවත්කිරීම යන කාර්යන්හි නියැලෙන සෑම අවස්ථාවකම, එසේ නියැලෙන සෑම තැනැත්තෙක්ම හැකිතාක් මුහුණු ආවරණය සහ අත්වැසුම් පැලඳ කාර්යන්හි නිරත විය යුතුය.

(6) සේවාව ලබාගන්නා සෑම ගණුදෙණුකරුවෙකුටම අදාළව තොරතුරු ඇතුලත් ලේඛනයක් පවත්වා ගත යුතුය.

(7) පාරිභෝගිකයින් සඳහා සේවා ලබාදීමේදී උඩුකය ආවරණය කර ගැනීම සඳහා අවශ්‍ය රෙදි පාරිභෝගිකයාටම රැගෙන ඒම සඳහා උනන්දු කල යුතු අතර එසේ නොවන අවස්ථාවකදී ඒ සඳහා භාවිතයට ගනු ලබන රෙදි එක් පාරිභෝගිකයෙකු සඳහා භාවිතයට ගැනීමෙන් පසු සෝදා වියලා පිරිසිදු කරගන්නා තෙක් වෙනත් පාරිභෝගිකයෙකු වෙත භාවිතය සඳහා නොගත යුතුය.

(8) සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී, මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් නිර්දේශ කර ඇති පරිදි හිසකෙස් කැපීම ඇතුළු කාර්යයන් සඳහා භාවිතයට ගන්නා උපකරණ, පනා, බුරුසු ඇතුළු සියළු දේ එක් පාරිභෝගිකයෙකු සඳහා භාවිතා කිරීමෙන් පසු විෂබීජහරණය කිරීමකින් තොරව වෙනත් පාරිභෝගිකයකු සඳහා භාවිතා නොකළ යුතුය.

(9) පරිශ්‍රය තුල වාතය හොඳින් සංසරණය වීම සඳහා ජනේල විවෘත කර පවත්වාගත යුතු අතර, වායු සමීකරණය කර ඇත්නම්, සෑම වායුසමීකරණ යන්ත්‍රයක්ම නියමිත උෂ්ණත්වය යටතේ නිරන්තරයෙන් පවත්වා ගත යුතුය.

(10) පරිශ්‍රය තුළ වායුසමීකරණ යන්ත්‍රයන්හි පෙරනයන් නිරන්තරයෙන් පිරිසිදු කර පවත්වාගත යුතුය.

(11) පාරිභෝගිකයෙකු සඳහා සේවා ලබාදීමට පූර්වයෙන් දෙඅත් සබන් හෝ විෂබීජනාශක යොදා පිරිසිදු කරගැනීමෙන් පසුව පමණක් අදාළ සේවාව ලබාදිය යුතුය.

(12) පරිශ්‍රය තුල සේවයෙහි යෙදීමේදී, සේවයේ යෙදීමට පූර්වයෙන් වැසිකිළි භාවිතයෙන් පසු, කිසියම් අපද්‍රව්‍ය ස්පර්ශ වීමකින් පසු ප්‍රමාණවත් පිරිසිදුවීමකින් තොරව පාරිභෝගිකයෙකු වෙත සේවාව ලබාදීම නොකළ යුතුය.

(13) පරිශ්‍රය තුල පාරිභෝගිකයින් සඳහා සේවාව ලබාදීමේදී, සෑම සේවා සපයන කෙනෙක්ම ඒප්‍රනයක් හැඳ සිටිය යුතු අතර, එය ඉතා පිරිසිදු තත්ත්වයෙන් විය යුතුය.

(14) පරිශ්‍රය සෑම සේවා සැපයීමකින් පසු දූවිලි සහ කපන ලද කෙස් හා රෝම අතුගා ඉවත් කළ යුතු අතර, ඒ සියල්ල සංවෘත කසළ බඳුනකට තාවකාලිකව බැහැර කළ යුතුය.

(15) පරිශ්‍රයෙහි ගෙබිම, පුටු, සහ මේස සෑම දිනකම වැඩ ආරම්භ කිරීමට පෙර විෂබීජ නාශක යොදා පිරිසිදු කළ යුතුය.

(16) පරිශ්‍රයෙහි සේවා සපයන කොටසෙහි ආහාර ගැනීම හෝ වෙනත් කාර්යයක් සඳහා කවර අයෙකු විසින් හෝ යොදා නොගත යුතුය.

(17) පරිශ්‍රය තුළ රැස්වන අපද්‍රව්‍ය වෙන් වෙන්ව රැස්කිරීම සඳහා පාදයෙන් විවෘත කළ හැකි පියන් සහිත කසළ බඳුන් තබා තිබිය යුතු අතර, ඒ සඳහාම අපද්‍රව්‍ය එක් රැස්කිරීම කළ යුතුය.

(18) පරිශ්‍රයට අදාළව එක් රැස්වන අපද්‍රව්‍ය කළමනාකරණයේදී පහත ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය.

(අ) ඉවත් වන හිස කෙස් කැබලි හෝ රෝම සෑම සේවා සැපයීමක් අවසානයේ එක්රැස් කර ඒ සඳහාම තබා ඇති කසළ බඳුනකට දැමිය යුතුය.

(ආ) පරිශ්‍රය තුළ ක්‍රියාකාරකම් තුලින් ජනිත වන වෙනත් අපද්‍රව්‍ය, ඉවත්වන හිසකෙස් සමඟ මිශ්‍රවීමකින් තොරව වෙන්වෙන් වශයෙන් එක් රැස් කළ යුතුය.

(ඇ) පරිශ්‍රයට අදාළ අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාව ක්‍රියාත්මක කරන කසළ කළමනාකරණ වැඩසටහනට අනුකූලව හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් එකඟවන බලපත්‍රලාභියා විසින් ක්‍රියාත්මක කරන අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රමෝපායකට අනුව බැහැර කිරීම කළ යුතුය.

(19) පරිශ්‍රයට අදාළ වැසිකිළි අවම වශයෙන් දිනකට දෙවරක් පිරිසිදු කර විෂබීජ නාශක යොදා දුර්ගන්ධයෙන් තොරව පවත්වා ගත යුතු අතර, බලප්‍රදේශයෙහි වසංගත තත්ත්වයකට කරුණු යෙදී ඇති තත්ත්වයක හෝ එසේ වේ යැයි සැක සිතිය හැකි තත්ත්වයකට කරුණු යෙදී ඇති විට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී උපදෙස් පරිදි සභාපතිවරයා විසින් නියම කරනු ලබන උපදෙස් වලට අනුකූල වෙමින් පරිශ්‍රයෙහි වැසිකිළි පිරිසිදු කිරීම සහ පවත්වාගෙන යාම කළ යුතුය.

(20) පරිශ්‍රය තුළ සේවය කරන සියළු අය සඳහා උපකරණ භාවිතය පිළිබඳ නිසි පුහුණුවක් තිබිය යුතු අතර, සෞඛ්‍ය අධිකාරීත්වය විසින් පිළිගැනීමට ලක් නොකළ කිසිදු රසායනික ද්‍රව්‍යයක් වර්ණ ගැන්වීම සඳහා භාවිතා නොකළ යුතුය.

(21) කිසියම් ආසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතදී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තකු මෑතදී සාත්තු කිරීමේ යෙදී සිටි කවර හෝ තැනැත්තකුගේ එකී රෝග ආසාදන හා බීජෞෂණ කාල සීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස කවර හෝ බලපත්‍රලත් ස්ථානයක කවර හෝ කාර්යක හෝ කාර්ය සහයකයකු වශයෙන් හෝ නියුක්ත වීම හෝ නියුත්ක කරවීම නොකළ යුතුය.

(22) කිසියම් ආසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන තැනැත්තකු බවට හඳුනා ගනු ලබන කිසිදු තැනැත්තකු සේවා සැපයීම සඳහා සාමාන්‍ය වශයෙන් පරිශ්‍රයට ඇතුලත් කර නොගත යුතුය.

(23) බලපත්‍ර ලාභියා තීරණය කරන අවස්ථාවක හෝ එසේ කල යුතු යැයි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී උපදෙස් පරිදි සභාපති විසින් හෝ වෙනත් නිසි අධිකාරයක් විසින් නියම කර ඇති අවස්ථාවක පරිශ්‍රයට සේවා අපේක්ෂාවෙන් පැමිණෙන සියළු අයවලුන්ගේ ශරීර උෂ්ණත්වය සාමාන්‍ය අගයක පවතින්නේද යන්න පරීක්ෂා කර පරිශ්‍රයට ඇතුළු කර ගත යුතු අතර, ඒ සඳහා ස්පර්ශයෙන් තොරව ශරීර උෂ්ණත්වය පරීක්ෂා කිරීම සඳහා අවශ්‍ය උෂ්ණත්වමාන පවත්වා ගත යුතුය.

(24) සෑම සේවාලාභියකුම පරිශ්‍රය තුල අනුගමනය කළ යුතු සෞඛ්‍ය උපදෙස් පරිශ්‍රය තුළ ප්‍රදර්ශනය කළ යුතු අතර එම උපදෙස් මාලාවට අනුකූලව සියළු කටයුතු සිදු වන බවට බලපත්‍රලාභියා සහතික විය යුතුය.

(25) පරිශ්‍රය තුළ ප්‍රථමාධාර පහසුකම් පවත්වා ගත යුතු අතර ඒ සඳහාද කාර්යය මණ්ඩලයෙහි සේවයේ යොදවා ඇති අයට පුහුණුවක් තිබිය යුතුය.

(26) පරිශ්‍රයෙහි සේවයේ නිතුත් කර ඇති සෑම අයෙකුටම අදාළව

(අ) කාර්යයයෙහි නිරත වීමේදී අදින ඇඳුම පිරිසිදුව හා මනා සෞඛ්‍ය තත්වයෙන් පවතින බවට.

(ආ) තම නියපොතු හා පැලඳ සිටින ආභරණ සේවාලාභියාට අනතුරුදායක නොවන ලෙසට පවත්වා ගන්නා බවට.

(ඇ) සේවා සැපයීමට ප්‍රථම දෙඅත් විෂබීජ නාශක යොදා පිරිසිදු කර ගන්නා බවට, බලපත්‍රලාභියා සහතික විය යුතුය.

(27) පරිශ්‍රයෙහි සේවයේ යෙදෙන්නන් අවම වශයෙන් වසරකට වරක්වත් වෛද්‍ය පරීක්ෂණයන්ට භාජනය කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය වන්නේය.

(28) සෑම පරිශ්‍රයකම මෙම අතුරු ව්‍යවස්ථාවේ සහ බලපත්‍රයෙහි පිටපතක් ප්‍රදර්ශනය වන පරිදි පවත්වා ගත යුතුය.

12. මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධානයන්ට අනුකූලව පරිශ්‍රය පවතින්නේද යන්න පරීක්ෂා කිරීම සඳහා සභාපතිවරයා විසින් ඒ සඳහා නිශ්චිතව බලය පවරන ලද මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකු හෝ වෙනත් යම් නිලධාරියකු ඕනෑම සාධාරණ වේලාවක පරිශ්‍රයට ඇතුළු වීම නීත්‍යානුකූල වන්නේය.

13. බලප්‍රදේශය තුල වසංගත තත්වයක් පැතිර යාමට හේතුවිය හැකි කරුණු සැලකිල්ලට ගනිමින් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී උපදෙස් පරිදි පරිශ්‍රය පවත්වාගෙන යාමට අදාළව බලපත්‍රලාභියා විසින් එකඟතා ප්‍රකාශයකට ඇතුලත් විය යුතුයැයි සභාපතිවරයා විසින් නියමකර ඇති විටකදී බලපත්‍රලත් තැනැත්තා සභාපතිවරයා සමඟ එකඟතා ප්‍රකාශයකට ඇතුලත් විය යුතු අතර සභාපතිවරයා විසින් එහි පිටපතක් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත යොමුකල යුතුය.

14. බල ප්‍රදේශයට අදාළව කිසියම් වසංගත රෝගී තත්වයක් සම්බන්ධයෙන් නිරෝධායක හා රෝග වැලැක්වීමේ ආඥා පනත යටතේ නියෝගයක් බලපැවැත්වෙන අවස්ථාවක එම නියෝගයෙහි සඳහන් සෑම නියමයකටම අනුකූලව පරිශ්‍රය පවත්වා ගත යුතුය.

*පරිශ්‍රයට ඇතුළත් වීමේ බලය*

15. මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධානයන්ට අනුකූලව පරිශ්‍රය පවතින්නේද යන්න පරීක්ෂා කිරීම සඳහා සභාපතිවරයා විසින් ඒ සඳහා බලය පවරන ලද මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකු හෝ වෙනත් යම් නිලධාරියෙකු ඕනෑම සාධාරණ වෙලාවක පරිශ්‍රයට ඇතුළු වීමට, අවශ්‍ය නියැදි ලබා ගැනීම නීත්‍යානුකූල වන්නේය.

*බලපත්‍රය අවලංගු කිරීම*

16. (1) මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලත් පරිශ්‍රයක් යටතේ මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කොන්දේසි උල්ලංඝනය කරමින් හෝ ඊට පටහැනි වන පරිදි කටයුතු වන අවස්ථාවක අතුරු ව්‍යවස්ථාවට අනුකූල වීම සඳහා දින තිහකට නොවැඩි නිශ්චිත කාලයක් දන්වමින් දැන්වීමක් සභාපතිවරයා විසින් බලපත්‍රලාභියා වෙත භාරදිය යුතුය.

(2) මෙම වගන්තිය යටතේ වූ දැන්වීමක් බලපත්‍රලාභියා වෙත භාරදීමෙන් පසු, අදාළ දැන්වීමේ සඳහන් නියමයන්ට අනුකූලව ක්‍රියාකිරීම සඳහා තවදුරටත් අතිරේක කාලයක් ලබාදෙන ලෙසට සාධාරණ හේතු දක්වමින් කරනු ලබන ඉල්ලීමක් මත සභාපතිවරයා විසින් අතිරේක කාලයක් ලබාදිය හැකිය. එසේ ලබාදෙන කාලය පළමු දැන්වීමේ සඳහන් කාලයට අතිරේකව දින දහ හතරක උපරිම කාලයකට යටත්ව විය යුතුය.

17. ඉහත 16 වගන්තිය යටතේ ලබාදෙන කාල සීමාව තුළ හෝ අතිරේක කාල සීමාව තුළ දැන්වීමට අනුකූලව ක්‍රියා කිරීම බලපත්‍රලාභියා විසින් පැහැර හැර ඇති අවස්ථාවක සභාපතිවරයා විසින් අදාළ බලපත්‍රය අවලංගු කල යුතුය.

*දණ්ඩනය*

18. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ලබා ගත යුතු බලපත්‍රයකින් තොරව හෝ අතුරු ව්‍යවස්ථාව යටතේ කරනු ලබන නියමයන් කඩකරමින් පරිශ්‍රයක් පවත්වාගෙන යාම වරදක් වන අතර එම වරද සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් වරදකරුවෙකු කිරීමෙන් පසු **1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (2)** උප වගන්තිය යටතේ දඬුවමකට යටත් විය යුතුය.තවද එලෙස වරදකරුවෙකු වීමෙන් පසු තව දුරටත් එකී කඩකිරීම, උල්ලංඝණය නිරන්තරයෙන්ම කරගෙන යනු ලබන විට සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් දැන්වීමක් භාර දීමෙන් පසු උල්ලංඝණ තව දුරටත් නොකඩවා කරගෙන යන සෑම දිනකට ඉහත කී 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 122(2) උප වගන්තියේ සඳහන් අතිරේක දඩයකට යටත් විය යුතුය.

*අර්ථ නිරූපණය*

19. මෙම අතුරු ව්‍යවස්ථාවේ පද සම්බන්ධයෙන් අන්‍ය අර්ථයක් අවශ්‍ය වන්නේනම් මිස මෙම අතුරුව්‍යවස්ථාවේ,

"සභාව" යන්නෙන් කළුතර ප්‍රාදේශීය සභාවද,

"සභාපති" යන්නෙන් කළුතර ප්‍රාදේශීය සභාවේ තත්කාලයෙහි සභාපති ධූරය දරන හෝ එම ධූරයේ කාර්යය කර්තව්‍ය ඉටුකරන අයද ,

"සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී" යන්නෙන් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අදාළ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාසය සඳහා එම තනතුර දරන අයද,

"මහජන සෞඛ්‍ය පරීක්ෂක" යන්නෙන් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අදාළව සේවයේ යෙදෙන ප්‍රාදේශීය සභාවේ හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයට අනුයුක්තව මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුර දරන අයෙක්ද,

" විෂබීජ නාශක" යන්නෙන් ආරක්ෂාව හෝ යෝග්‍ය බව අඩු නොකර මට්ටමකට පරිසරයේ ඇති ක්ෂුද්‍රජීවීන් ප්‍රමාණය රසායනික කාරකයක් මගින් හෝ භෞතික ක්‍රමයකින් අඩු කිරීමටද;

" සාධාරණ වේලාව" යන්නෙන් බලපත්‍රලත් කර්තව්‍ය හෝ ඊට අදාළ කාර්යයන්හි නිරතවන වේලාවන්ද අදහස්වේ.

20. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල හා ඉංග්‍රීසි,දෙමළ පාඨ අතර අනනුකූලතාවයන් හටගතහොත් එවිට සිංහල පාඨය ප්‍රමුඛ වෙයි. *පාඨ අතර අනනුකූලතාවය*

**උපලේඛනය**

**.......................... වර්ෂය සඳහා බලපත්‍රය ලබාගැනීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය.**

01. ඉල්ලුම්කරුගේ නම : -

02. පෞද්ගලික ලිපිනය : -

03. ජාතික හැඳුනුම්පත් අංකය : -

04. දුරකථන අංකය : -

05. වෙළඳ ව්‍යාපාරයේ ස්වභාවය : -

06. ආරම්භක වර්ෂය : -

07. කොණ්ඩා කපන ස්ථානය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ ලිපිනය : -

08. ග්‍රාම නිලධාරී කොට්ඨාසය : -

09. වරිපනම් අංකය: -

10. ව්‍යාපාරය නාම ලියාපදිංචිය ලබාගෙන ඇත්නම් එහි යොමු අංකය :-

11. ව්‍යාපාර ස්ථානයේ කළමණාකරුගේ හෝ නියෝජිතයාගේ,

I. නම හා පෞද්ගලික ලිපිනය

II. ජාතික හැඳුනුම්පත් අංකය

III. දුරකථන අංකය ජංගම : - ස්ථාවර : -

10. ව්‍යාපාරයට අදාළ ඉදිකිරීම් අනුමත කරන සැළැස්මේ අංකය හා දිනය : -
(පිටපත් ඇමිණිය යුතුය)

ඉහත තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

ඉහත තොරතුරු සඳහන් කර්මාන්තය, වෙළඳාම පවත්වාගෙන යන ස්ථානය සඳහා ............................ වර්ෂය වෙනුවෙන් වෙළඳ බලපත්‍රයක් මා වෙත නිකුත් කරන ලෙස ඉල්ලමි. මේ පිළිබඳ පනවන නීති රීතිවලට මම එකඟ වෙමි.

දිනය:- ......................................

ඉල්ලුම්කරුගේ අත්සන

---

<u>කාර්යාලීය ප්‍රයෝජනය සඳහා</u>

ආදායම් පරීක්ෂක,

පසුපිටේ සඳහන් ඉල්ලුම්පත්‍රයට අදාළව බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා වන ඔබගේ නිරීක්ෂණ හා නිර්දේශ කඩිනමින් මා වෙත ලබා දෙන ලෙස කාරුණිකව ඉල්ලමි.

දිනය:- ..............................................

ලේකම්

---

ලේකම්,

බලපත්‍රය ලබා දීම නිර්දේශ කරමි./නොකරමි.

දිනය :- ..................................

ආදායම් පරීක්ෂක

---

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී,

පසුපිටේ සඳහන් ඉල්ලුම් පත්‍රයට අදාළව බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා වන ඔබගේ නිරීක්ෂණ හා නිර්දේශ කඩිනමින් ලබාදෙන මෙන් කාරුණිකව ඉල්ලමි.

දිනය :- ..................................

ලේකම්

---

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී,

අතුරු ව්‍යවස්ථා හා අනෙකුත් නීති රීතිවලට අනුකූලව සුදුසුකම් සපුරා ඇත. බලපත්‍ර නිකුත් කිරීම නිර්දේශ කිරීම සඳහා වාර්තා කරමි.

දිනය :- ..................................

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි

ලේකම්,

ඉහත ඉල්ලුම්පත්‍රයට අනුව අදාළ ස්ථානය සඳහා බලපත්‍රයක් නිකුත් කිරීම නිර්දේශ කරමි. / නොකරමි.
(නිර්දේශ නොකරන්නේ නම් ඊට අදාළ හේතුව සඳහන් කරන්න).

දිනය :- ……………………………
සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී

---

**පීඩාකාරී හා අන්තරාදායක වෙළඳාම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

1. මෙම අතුරු ව්‍යවස්ථාව කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන පීඩාකාරී අන්තරාදායක වෙළඳාම් විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම සඳහා පනවනු ලබයි.

2. මෙම අතුරු ව්‍යවස්ථාව කළුතර ප්‍රාදේශීය සභාවේ පීඩාකාරී හා අන්තරාදායක වෙළඳාම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැදින්වේ. *ලුහුඬු නාමය*

3. මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීමට **1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (ix) වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 122** වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට බලය ලැබී ඇත.

4. කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ (මෙහි මින්මතු බලප්‍රදේශය යනුවෙන් හඳුන්වනු ලබන) පිහිටුවා පවත්වාගෙන යන වෙළඳාම් අතරින් මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යය සඳහා අදාළ විය යුතු පීඩාකාරී වෙළඳාම්, අන්තරාදායක වෙළඳාම්, පීඩාකාරී හා අන්තරාදායක වෙළඳාම් කවරේ ද යන්න ප්‍රාදේශීය සභාව විසින් කලින් කල තීරණය කර ප්‍රකාශයට පත් කිරීම නීත්‍යානුකූල විය යුතුය.

5. කිසිදු තැනැත්තෙකු විසින් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගෙන් ලබාගත් බලපත්‍රයක් යටතේ මිස බල ප්‍රදේශය තුළ පිහිටියා වූ කිසිදු පරිශ්‍රයක ඉහත 4 වන වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කරනු ලැබුවා වූ කිසියම් පීඩාකාරී වෙළඳාමක්, අන්තරාදායක වෙළඳාමක් හෝ පීඩාකාරී හා අන්තරාදායක වෙළඳාමක් (මෙහි මින්මතු වෙළඳාමක් යනුවෙන් හඳුන්වනු ලබන) නොකළ යුතුය. *බලපත්‍රයක් ලබාගත යුතු බව*

6. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ඉල්ලුම් කරන සෑම තැනැත්තෙක්ම, මෙම අතුරු ව්‍යවස්ථාවේ උපලේඛනයට සාරානුකූලව පිළියෙල කරන ලද අයදුම්පත්‍රයක් යටතේ ඒ සඳහා ඉල්ලුම් කල යුතුය. *බලපත්‍රයක් ඉල්ලුම් කිරීම*

7. ඉහත වගන්තිය යටතේ ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කිරීම, ඒ සඳහා වන අවශ්‍යතා සම්පූර්ණකර ලියාපදිංචි තැපෑලෙන් යොමු කිරීමෙන්,ප්‍රාදේශීය සභාව වෙත ගෙනැවිත් භාරදීමෙන් හෝ ප්‍රාදේශීය සභාව අවසර දී ඇති ප්‍රමාණයට විද්‍යුත් තැපෑලෙන් යොමු කිරීමෙන් ඉදිරිපත් කළ හැකිය.

8. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ඉදිරිපත් වන සෑම ඉල්ලුම් පත්‍රයකටම අදාළව බලපත්‍රයක් නිකුත් කිරීමට පූර්වයෙන් සිදුකළ යුතු ස්ථාන පරික්ෂා කිරීම් සඳහා ස්ථාවර පරික්ෂණ ගාස්තුවක් සභාව විසින් තීරණය කර අයකිරීම නීත්‍යානුකූල විය යුතුය. *පරීක්ෂණ ගාස්තු*

9. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ඉල්ලුම් කරන සෑම තැනැත්තෙක්ම මෙහි පහත සඳහන් කොන්දේසි සම්පූර්ණ **කර ඇත්තේ නම් මිස සභාපතිවරයා විසින් බලපත්‍රයක් නිකුත් කිරීම නොකල යුතුය.** *බලපත්‍රයක් සඳහා කොන්දේසි*

(1) වෙළඳාම කරගෙන යන පරිශ්‍රය (මෙහි මින්මතු පරිශ්‍රය යනුවෙන් හඳුන්වනු ලබන) යටතේ වන ස්ථිර ඉදිකිරීම් ඇත්නම් අදාළ ඉදිකිරීම් 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනත යටතේ හෝ නිවාස හා සංවර්ධන ආඥා පනත යටතේ වූ විධිවිධානයන්ට අනුකූලව කළ ඉදිකිරීම් විය යුතුය.

(2) බල ප්‍රදේශය 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරි පනත යටතේ හෝ නිවාස හා නගර සංවර්ධන ආඥා පනත යටතේ වූ විධිවිධානයන්ට අනුකූලව කලාපකරණයක් සිදුව ඇත්නම්, පරිශ්‍රය ඊට අනුකූලව පිහිටුවා තිබිය යුතුය.

(3) අදාළ සියළු ඉදිකිරීම් නිසි නිමාවකින් යුක්ත වූද, පරිශ්‍රය තුළ කරගෙන යනු ලබන වෙළඳාම කෙරෙහි කිසිදු ආකාරයකින් අහිතකර බලපෑමක් ඇති නොවන පරිදි ඉදිකරණු ලැබූවක් විය යුතුය.

(4) පරිශ්‍රය තුළ අදාළ මෙහෙයුම් කටයුතු ප්‍රමාණවත් දුරස්ථභාවක් සහිතව පවත්වාගෙන යාමට හැකි පරිදි ඉඩ පහසුකම් තිබිය යුතුය.

(5) පරිශ්‍රයෙහි සියළු තැන් නිසි පවිත්‍රතාවයෙන් යුතුව පවත්වාගෙන යාමට හැකිවන පරිදි සකස් වී තිබිය යුතුය.

(6) පරිශ්‍රය තුළ නිෂ්පාදන ක්‍රියාවලියක් වේනම්, ඒ සඳහා වන කොටස නිශ්චිතව වෙන් වී තිබිය යුතු අතරම, කිසිදු ආකාරයකින් ඊට අදාළ කාර්යයන්හි නියුතු අයට හැර පාරිභෝගිකයින්ට ඒ සඳහා ඇතුළ්වීම වැළැක්වෙන පරිදි වෙන්ව පරිශ්‍රය සකස් වී තිබිය යුතුය.

(7) පරිශ්‍රය තුළ ගබඩා පහසුකම් ඇත්නම් අදාළ ගබඩා ඒ සඳහා වන නිසි ආරක්ෂණ ප්‍රමිතීන්ට අනුකූලව හා එම කාර්යය සඳහා යෝග්‍යවන පරිදි සකස් කර තිබිය යුතු අතර, නිසි ඉඩකඩකින් යුත් අවදානම් රහිත තත්වයකින් විය යුතුය.

(8) පරිශ්‍රය නිසි ආලෝකය සහ වාතාශ්‍රය ගලා එන පරිදි සකස් වී තිබිය යුතු අතර, නැතහොත් කෘත්‍රිමව ඒ සඳහා වන අවශ්‍යතා සම්පූර්ණ කර තිබිය යුතුය.

(9) ඉදිකිරීම් සහිත කොටස හා ඉදිකිරීම් රහිත කොටසට අදාළ බිම පහසුවෙන් පිරිසිදු කළ හැකි ආකාරයෙන් හා ද්‍රව පහසුවෙන් ගලා යන පරිදි වූ සුදුසු බෑවුමක් සහිතව සකස් කර තිබිය යුතුය.

(10) පරිශ්‍රයෙහි ගොඩනැගිලිවල බිත්ති පහසුවෙන් පිරිසිදු කළ හැකි ජලය අවශෝෂණය නොවන ද්‍රව්‍යවලින් සාදා තිබිය යුතු අතර, මෙහෙයුම් සඳහා භාවිතාවන කොටස් හැර වෙළඳාම සිදුවන සෙසු කොටස් යටතේ සිවිලිම සාදා තිබිය යුතුය.

(11) පරිශ්‍රයෙහි ගොඩනැගිලි සඳහා යොදා ඇති දොරවල්, ජනෙල් ජලය අවශෝෂණය නොවන පරිදි හා සුමට මතුපිටක් සහිත විය යුතු අතර, ජනතාව සීමා වන ප්‍රදේශ සඳහා වන දොරවල් ස්වයංක්‍රීයව වැසීයන ආකාරයට සවිකර තිබිය යුතුය.

(12) පරිශ්‍රයට අදාළ ගිණි ආරක්ෂණ වැඩපිළිවෙලක් යොදා තිබිය යුතු අතර, අදාළ වන පරිදි ගිණි ආරක්ෂණ සහතිකය ලබා තිබිය යුතුය.

(13) පරිශ්‍රය තුළ හා පරිශ්‍රයට අදාළව පිහිටුවා ඇති සියළුම කාණු අපජලය පහසුවෙන් ගලා යාහැකි පරිදි සකස් කර තිබිය යුතු අතර, එය පරිසරයට විවෘත නොවන පරිදි පූතික වළවල් හෝ මධ්‍ය ප්‍රතිකාර ඒකකයට යොමුකර තිබිය යුතුය.

(14) පරිශ්‍රය තුල පිහිටුවා ඇති පූතික වළවල්, උරා ගැනීමේ වළවල්, අනුමත සැලැස්මකට අනුකූලව පිහිටා තිබිය යුතු අතර,එය ජල මූලාශ්‍රයක් ඇත්නම් එයට අවම වශයෙන් මීටර් 15.25 ක පමණ දුරකින් පිහිටුවා තිබිය යුතු අතරම එය වාතයට නිරාවරණය නොවිය යුතුය.

(15) පරිශ්‍රය තුළ අප ද්‍රව්‍ය හා මල ද්‍රව්‍ය බැහැර කිරීමේදී,

(අ) කිසිදු ආකාරයකින් පොදු ජල මාර්ගයකට, පොදු කාණුවට, මාර්ගයකට හෝ වෙනත් කවර හෝ විවෘත භූමියකට ගලා යාම වළක්වා තිබිය යුතුය.

(ආ) අදාළ යොමු කිරීම සිදුකර ඇති පූතික වළ හෝ උරා ගැනීම් වළ වාතයට නිරාවරණය නොකළ යුතු අතර, එම වළ හේතුකොටගෙන භූගත ජලය දූෂණය නොවන ආකාරයට සකස්කර තිබිය යුතුය.

(ඇ) අදාළ පූතික වළ හෝ උරා ගැනීමේ වළ කිසියම් ජල මූලාශ්‍රයක් ඇත්නම් එයට අවම වශයෙන් මීටර් 15.25 ක අඩු නොවන දුරකින් විය යුතුය.

(16) පරිශ්‍රය තුළ සිදුවන නිෂ්පාදන ක්‍රියාවලියක් හේතුකොටගෙන හටගන්නා වූ රසායනික අපජලය වේනම්, එය ඒ සඳහා නිශ්චිත අධිකාරියක උපදෙස් මත සිදු කරන පිරිපහදුවකින් තොරව බැහැර නොකළ යුතුය.

(17) (අ) පරිශ්‍රයට පානීය ජලය ප්‍රමාණවත් පරිදි සපයා තිබිය යුතු අතර, ජලය ගබඩා කිරීමේ පහසුකම් විය යුතුය.

(ආ) ජලය ගබඩා කරන ජල ටැංකි ප්‍රමාණවත් උසකින් පිහිටා තිබිය යුතු අතර, එහි ගබඩා කරන ජලය කිසිදු ආකාරයකින් දූහනය නොවිය යුතුය.

(ඇ) පානීය ජලය හා පානීය නොවන ජලය වශයෙන් පරිශ්‍රය තුළ භාවිතයට ගනු ලබන්නේනම් පානීය ජලය, පානීය නොවන ජලය සමඟ මිශ්‍රවීමකට කරුණු නොයෙදෙන පරිදි වෙන් වෙන් වශයෙන් වූ නළ මාර්ගවලින් රැගෙන යා යුතු අතර, එවැනි නළ එකිනෙකට වෙනස් වර්ණයන්ගෙන් වර්ණ ගන්වා තිබිය යුතුය.

(18) පරිශ්‍රය තුළ සේවයේ නියුතු සේවකයින් සඳහා,

(අ) නේවාසිකයින් වශයෙන් සේවයේ යොදවන්නේ නම් ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් සහිත නවාතැන් පහසුකම් තිබිය යුතුය.

(ආ) නේවාසික පහසුකම් සැපයීමේදී එක් අයකුට අවම වශයෙන් වර්ගමීටර් හතරක ඉඩ ප්‍රමාණයක් වන පරිදි නේවාසික පහසුකම් විය යුතුය.

(ඇ) නේවාසිකයින් සඳහා ප්‍රමාණවත් වැසිකිලි පහසුකම් විය යුතු අතර, ඒවා ස්ත්‍රී හා පුරුෂ වශයෙන් වෙන්කර පවත්වාගත යුතු අතරම නිසි ප්‍රමිතියෙන් යුතුව තනා තිබිය යුතුය.

(ඈ) පරිශ්‍රයෙහි නේවාසිකයින් සඳහා වන කොටස ව්‍යාපාර කාර්යයට අදාළව හා නිෂ්පාදන කාර්යයන් ඇත්නම් ඒ කොටසට පරිභාහිරව පවත්වා ගත යුතුය.

(19) පරිශ්‍රයට පැමිණෙන පාරිභෝගිකයින් සඳහා අවශ්‍ය අවස්ථාවක ශාරීරික දුරස්ථභාවය පවත්වා ගැනීමට හැකිවන පරිදි ප්‍රමාණවත් අවකාශයක් විය යුතුය.

(20) බල ප්‍රදේශය තුළ නිරෝධායක හා රෝග වැළැක්වීමේ ආඥාපනත යටතේ හා ඒ යටතේ සාදන ලද රෙගුලාසි යටතේ ප්‍රකාශිත වසංගත තත්ත්වයකට කරුණු යෙදුනහොත්, එවන් අවස්ථාවක අනුගමනය කළයුතු නියමයන් අදාළ කර ගැනීමට හැකිවන පරිදි ප්‍රමාණවත් සෞඛ්‍ය ආරක්ෂක පහසුකම්වලින් යුක්ත විය යුතුය.

*බලපත්‍රයක් නිකුත් කිරීම*

10. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රයක් සඳහා ඉදිරිපත්වන ඉල්ලුම් පත්‍රයකට අදාළව ඉල්ලුම් පත්‍රය ලැබී දින දහහතරක් ඇතුළත සභාපතිවරයා විසින්,

(1) 9 වන වගන්තිය යටතේ වූ කොන්දේසි වලට අනුකූල විටදී පරිශ්‍රයට අදාළ බලපත්‍රයක් ඉල්ලුම්කරුවෙකු වෙත නිකුත් කළ යුතුය.

(2) 9 වන වගන්තිය යටතේ වූ කොන්දේසි වලට අනුකූල නොවන්නේ නම්, හේතු දක්වා අදාළ ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කළ යුතුය.

*බලපත්‍රයක් සඳහා ගාස්තු*

11. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් සඳහා අයකල යුතු ගාස්තු මූලික නීතිය යටතේ සඳහන් විධිවිධානයන්ට යටත්ව සභාව විසින් වාර්ෂිකව තීරණය කර ප්‍රකාශයට පත් කරන ගාස්තු විය යුතුය.

12. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධාන අනුව කලින් අවලංගු නොකලහොත් බලපත්‍රයට අදාළ වර්ෂයෙහි දෙසැම්බර් තිස් එක්වන දින දක්වා වලංගු විය යුතුය.

13. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලත් සෑම තැනැත්තෙක්ම මෙහි සඳහන් කොන්දේසි වලට අනුකූලව ක්‍රියා කල යුතුය.

(1) ශ්‍රී ලංකාව පුරාම හෝ ඉන් කොටසකට හෝ බල ප්‍රදේශයට අදාළව හෝ නිරෝධායක හා රෝග වැලැක්වීමේ ආඥාපනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද රෙගුලාසි යටතට අදාළ වන වසංගත තත්වයක් ප්‍රකාශයට පත්කර ඇති කවර හෝ අවස්ථාවක හෝ බල ප්‍රදේශය තුළ වසංගත තත්වයකට කරුණු යෙදී ඇති බවට සෑහීමට පත්වෙමින් එය පාලනය කිරීම සඳහා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී උපදෙස් මත සභාපතිවරයා කලින් කල නියම කරනු ලබන නියමයන් ඇත්නම් ඒ සෑම නියමයකටම යටත්ව පරිශ්‍රය පවත්වා ගත යුතුය.

(2) පරිශ්‍රයෙහි සේවය සඳහා යොදවා ඇති සෑම තැනැත්තෙකු විසින්ම නිරෝධායක හා රෝග වැළැක්වීමේ ආඥාපනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද රෙගුලාසි යටතට අදාළ වසංගත තත්වයක් ප්‍රකාශයට පත්කර ඇති කවර හෝ අවස්ථාවක ඊට අදාළව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී උපදෙස් මත සභාපතිවරයා විසින් කරනු ලබන සෑම නියමයකට යටත්ව ක්‍රියා කළ යුතුය.

(3) බල ප්‍රදේශය තුළ වසංගත රෝගී තත්වයක් සඳහා අවදානමක් ඇති බවට සැක කිරීමට කරුණු යෙදී ඇති සෑම අවස්ථාවකම සේවා අපේක්ෂාවෙන් පරිශ්‍රයට පැමිණෙන සෑම තැනැත්තෙකු ටම එම රෝගී තත්ත්වය පැතිරීම පාලනය කිරීම සඳහා නිකුත් කර ඇති සෞඛ්‍ය උපදෙස්වලට අනුකූලව පැමිණෙන්නේ නම් මිස එම පරිශ්‍රයෙහි සේවා පහසුකම් සලසා නොදිය යුතුය.

(4) බල ප්‍රදේශය තුළ කිසියම් වසංගත රෝගී තත්වයකට කරුණු යෙදී ඇති විට හෝ ඒ සඳහා අවදානමක් ඇති විට එයින් ආරක්ෂා වීම සඳහා අනුගමනය කළ යුතු යැයි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක ජෙනරාල් හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් හෝ ඔවුන්ගේ උපදෙස් පරිදි සභාපතිවරයා විසින් හෝ නියමකර ඇති සෞඛ්‍ය ආරක්ෂිත උපදෙස් නිසියාකාරව පරිශ්‍රය තුළ ක්‍රියාත්මක කළ යුතුවා මෙන්ම එසේ වන බවට බලපත්‍රලාභියා සෑහීමට පත්විය යුතුය.

(5) සෑම පරිශ්‍රයකටම අදාළව හදිසි අවශ්‍යතාවයක් සඳහා උපයෝගී කරගත හැකි පරිදි ප්‍රථමාධාර පහසුකම් සපයා තිබිය යුතු අතර, ඒ සඳහා කාර්යය මණ්ඩලය පුහුණුකර තිබිය යුතුය.

(6) පරිශ්‍රය තුළ ප්‍රමාණවත් ගිණි ආරක්ෂණ පද්ධතියක් සවිකර තිබිය යුතු අතර, එය නිසි පරික්ෂාවක් යටතේ ක්‍රියාත්මක වන තත්ත්වයෙන් පවත්වා ගත යුතුය.පරිශ්‍රය තුළ පවතින ගිණි ආරක්ෂණ පද්ධතියෙහි ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් පරිශ්‍රය තුළ සේවය කරන සෑම අයකුම දැනුවත්ව සිටිය යුතු අතර, හදිසි ගිණි ගැනීමක් වුවහොත් ඊට අදාළ ප්‍රතිචාර දක්වන ආකාරය පිළිබඳව පෙරහුරු මගින් අවබෝධයක් ලබාදී තිබිය යුතුය.

(7) පරිශ්‍රය හා පරිශ්‍රයෙහි සේවකයින් සුදුසු රක්ෂණයක් යටතේ රක්ෂණය කර තිබිය යුතුය.

(8) පරිශ්‍රයෙහි සේවයේ නියුතු සෑම සේවකයෙකුටම අදාළව ඔහු පදිංචි ප්‍රදේශය, සම්පූර්ණ නම, හැඳුනුම්පත් අංකය හා දුරකතන අංකය පිළිබඳ නිවැරදි තොරතුරු පවත්වාගත යුතු අතර, ඒ සෑම තොරතුරක් සභාපතිවරයා නියම කරන ආකාරයට ඉදිරිපත් කළ යුතුය.

(9) බල ප්‍රදේශය තුළ වසංගත රෝග තත්ත්වයකට කරුණු යෙදෙන කවර හෝ අවස්ථාවක වුවද, ඒ සම්බන්ධයෙන් වූ පොදු සෞඛ්‍ය ආරක්ෂණ උපදෙස් හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී උපදෙස් පරිදි සභාපතිවරයා ලබාදෙන සෞඛ්‍ය උපදෙස්වලට අනුකූලව පරිශ්‍රය තුළ සේවයෙහි යෙදෙන සෑම අයකුම කටයුතු කළ යුතු අතර, ඒ එසේ වන බවට බලපත්‍රලාභියා වගබලාගත යුතුය.

(10) පරිශ්‍රය තුළ භාවිතා කරන අත්වැසුම්, මුව ආවරණ ආදී දේ භාවිතයෙන් පසු බැහැර කිරීම සඳහා නිසි වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය.

(11) එසේ භාවිතා කිරීම අවශ්‍යයයි සෞඛ්‍ය උපදෙස් ලබාදෙන අවස්ථාවක භාවිතා කිරීමට හැකි පරිදි පරිශ්‍රයට පැමිණෙන සියළු දෙනාගේ ශරීර උෂ්ණත්වය ස්පර්ශයකින් තොරව මැනිය හැකි ආකාරයේ උෂ්ණත්වමාන පවත්වාගත යුතුය.

(12) පරිශ්‍රය සෑම විටම පිරිසිදු තත්ත්වයෙන් පවත්වාගත යුතු අතර විෂබීජ නාශක යෙදීම ඇතුළු ඊට අදාළ කටයුතු නිසි කළමණාකරණයක් යටතේ පවත්වා ගත යුතුය.

(13) පරිශ්‍රය තුළ අවදානම් ස්ථාන ඇත්නම් ඒ සම්බන්ධයෙන් වූ සංඥා පුවරු පැහැදිළිව දැකගත හැකි පරිදි ප්‍රදර්ශනය කළ යුතුය.

(14) වෙළඳාම් ස්වභාවය අනුව සෞඛ්‍යයට අහිතකර යම් රසායන හෝ වෙනත් ද්‍රව්‍ය ඇත්නම් ඒවායේ අවදානම් බව පිළිබඳවත්, ඒවායේ භාවිතය පිළිබඳවත්, දැන්වීම් අලවා තිබිය යුතුය.

(15) පරිශ්‍රය තුළ භාවිතයට ගනු ලබන හා වෙළඳාම සඳහා වන රසායන ද්‍රව්‍ය ඇත්නම්, ඒවා ආරක්ෂිතව ඇසුරුම් කර තිබිය යුතුය.

(16) පරිශ්‍රය තුළ ඇති මෙවලම්, උපකරණ, පිරිසිදු කිරීමේ දී ඒ සඳහා යොදාගනු ලබන තෙල් හෝ විෂබීජ නාශක හෝ වෙනත් එවැනි දේ නිසාවෙන් පරිශ්‍රය තුළ වෙනත් දේ බලපෑමකට ලක් නොවිය යුතුය.

(17) පරිශ්‍රය තුළ කටයුතු කිරීමේදී නිතර අල්ලන මතුපිටවල් නිරන්තරයෙන් විෂබීජ නාශක යොදා පවිත්‍ර කළ යුතුය.

(18) පරිශ්‍රයට අයත් භූමිය තුළ කිසිවෙකුත් කෙළ ගැසීම වැනි දේ නොකළ යුතුය.

(19) පරිශ්‍රය තුළ පැමිණෙන්නන්ට හා සේවයේ යෙදෙන්නන්ට සෞඛ්‍ය ආරක්ෂිත පියවරක් ලෙස, දෙඅත් සේදීම හේතුවන්නේ නම් ඒ සඳහා පහසුකම් සපයා තිබිය යුතුය.

(20) (අ) පරිශ්‍රය තුළ අන්තරායකර ද්‍රව්‍ය අසුරා තැබීමක් හෝ එහා මෙහා ගෙනයාමක් සිදුවේ නම්, එය විශේෂිත ආරක්ෂිත රැඳවුම් තුළ බහා සිදු කළ යුතුය.

(ආ) ඉහත අ සඳහා පුහුණු ශ්‍රමිකයින් යෙදවා තිබිය යුතුය.

(21) පරිශ්‍රය තුළ සේවය කරන සේවකයින් සඳහා,

(අ) ස්ත්‍රී පුරුෂ වශයෙන් ප්‍රමාණවත් නාන කාමර හා වැසිකිළි පහසුකම් සපයා තිබිය යුතු අතර, ඒවා නිසි පරිදි සකස් කරන ලද ඒවා විය යුතුය.

(ආ) වෙළඳාම් ස්වරූපය අනුව අන්තරාකාරී තත්ත්වයකට කරුණු යෙදෙන පරිශ්‍රයක නේවාසිකයින්ගේ ක්‍රියාකාරකම් සඳහා වන සීමාකිරීම් බලපත්‍රලාභීන් විසින් ක්‍රියාත්මක කර තිබිය යුතු අතර, ඒ සම්බන්ධයෙන් වන දැන්වීම් පරිශ්‍රයෙහි ප්‍රකටව පෙනෙන පරිදි ප්‍රදර්ශනය කර තිබිය යුතුය.

(ඇ) වෙළඳාම් ස්වරූපය අනුව ප්‍රමාණවත් පරිදි අදාළ ආරක්ෂක උපකරණ හා මෙවලම් ලබාදී තිබිය යුතුය.

(ඈ) ප්‍රදේශය තුළ හෝ ශ්‍රී ලංකාව පුරාම හෝ කොටසක කිසියම් වසංගත තත්ත්වයක් ව්‍යාප්ත වෙමින් පවතින අවස්ථාවක හෝ ප්‍රදේශය තුළ කිසියම් වසංගත තත්ත්වයකට කරුණු යෙදිය හැකි බවට, සැක කරන අවස්ථාවක සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී උපදෙස් පරිදි සභාපතිවරයා විසින් නියම කරනු ලබන සෑම උපදේශයකට හා නියමයන්ට යටත්ව ක්‍රියා කිරීම සඳහා අවශ්‍ය කරන පුහුණුව සහ උපදෙස් බලපත්‍රලාභීන් විසින් ලබා දී තිබිය යුතුය.

(ඉ) සෞඛ්‍ය නිරීක්ෂණ පද්ධතියක් පරිශ්‍රය තුළ පිහිටුවා සේවකයින්ට අවශ්‍ය උපදෙස් ලබා ගැනීම සඳහා ක්‍රියාවලියක් ඇති කිරීම කළ යුතුය.

(22) බල ප්‍රදේශය තුළ ස්පර්ශයෙන් හෝ ශ්වසනයෙන් බෝවිය හැකි වසංගත තත්ත්වයකට කරුණු යෙදී ඇති අවස්ථාවක හෝ එසේ වීමට හේතුවිය හැකි බවට කරුණු යෙදී ඇති අවස්ථාවක සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී නිර්දේශ අනුව සභාපතිවරයා විසින් පහත සඳහන් පියවර එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම පරිශ්‍රය යටතේ ක්‍රියාත්මක විය යුතු බවට උපදෙස් දිය හැකි අතර එසේ ලබා දෙන උපදෙස් බලපත්‍රලාභීන් විසින් ක්‍රියාත්මක කළ යුතුය.

(අ) පරිශ්‍රය තුළ සේවයේ යෙදීමේ දී එකිනෙකා අතර දුරස්ථ භාවයක් පවත්වා ගනිමින් සේවයේ යෙදිය යුතු බවට,

(ආ) සේවය සඳහා අවශ්‍ය අවම සේවක පිරිස කුඩා කණ්ඩායම් වශයෙන් සේවා මුර කිහිපයක් යටතේ සේවයේ යෙදිය යුතු බවට,

(ඇ) පරිශ්‍රය තුළ නියම කරන කාල සීමාවක් සඳහා සමූහ මුණගැසීම්, රැස්වීම් නොපැවැත් විය යුතු බවට,

(ඈ) පරිශ්‍රයට ඇතුළුවීමේදී ශරීර උෂ්ණත්වය සාමාන්‍ය අගය යටතේ පවතින්නේ ද යන්න තහවුරු කර ගනිමින් පරිශ්‍රයට ඇතුලත් කර ගත යුතු බවට,

(ඉ) පරිශ්‍රය තුළ ආහාර ගැනීමේ දී කුඩා කණ්ඩායම් වශයෙන් ආහාර ගැනීම සඳහා අවස්ථා සලසා දිය යුතු බවට,

(ඊ) පරිශ්‍රය තුළ සේවකයින්ගේ, පරිශ්‍රයට පැමිණෙන්නන්ගේ, දෙඅත් පිරිසිදු කර ගැනීම සඳහා ප්‍රමාණවත් පරිදි විෂබීජ නාශක,සබන් ඇතුළු අත් සේදීමේ පහසුකම් සපයා දී ඇති බවට,

(උ) අවශ්‍යතාවය සැළකිල්ලට ගනිමින් පරිශ්‍රය තුළ කාර්යයන්හි යෙදී සිටියදී මුඛ ආවරණ භාවිත කළ යුතු බවට,

(ඌ) පරිශ්‍රය තුළ සෑම තැනැත්තෙක්ම ස්වසන ආචාර විධි නිසි ආකාරව ක්‍රියාත්මක කළ යුතු බවට,

(එ) පරිශ්‍රය තුළ කාර්යය කටයුතු කිසියම් නිශ්චිත කාලයකට සීමා කළ යුතු බවට,

(ඒ) පරිශ්‍රයෙහි සේවයෙහි යෙදෙන්නන් නිශ්චිත කාල ප්‍රාන්තරයක් යටතේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී නිර්දේශිත පරිදි සෞඛ්‍ය පරීක්ෂණයන්ට ලක් කළ යුතු බවට,

(23) පරිශ්‍රය දිනපතා පිරිසිදු කළ යුතු අතර අවස්ථාවෝචිත පරිදි විෂබීජ නාශක ක්‍රියාවලිය නිශ්චිත කාලසටහනකට අනුව සිදු කළ යුතු අතර, එය එසේ වන බවට බලපත්‍රලාභියා විසින් සහතික විය යුතුය.

(24) පරිශ්‍රය තුළ අදාළ වෙළදාම පවත්වාගෙන යාමේදී ඇති විය හැකි අවදානම් පිළිබඳ නිශ්චය කිරීම, ඊට අදාළ ප්‍රතිකර්ම නියම කිරීම ආදී කරුණු පිළිබඳ බලපත්‍රලාභියා අවබෝධයෙන් යුතුව, අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

(25) පරිශ්‍රයෙහි අපද්‍රව්‍ය කළමනාකරණයට අදාළව පහත සඳහන් ක්‍රියා මාර්ග ගත යුතුය.

(අ) පරිශ්‍රයෙහි අපද්‍රව්‍ය බැහැර කිරීම නිසි වැඩ පිළිවෙලක් යටතේ ක්‍රියාත්මක කල යුතු අතර ප්‍රාදේශීය සභාව විසින් ක්‍රියාත්මක කරන ලද කසල කළමනාකරණ වැඩසටහනට අනුකූලව පරිශ්‍රයෙහි කසළ බැහැර කරන්නේ නම්, ඊට අදාළ උපදෙස් හා නියමයන්ට අනුකූල වෙමින් අපද්‍රව්‍ය භාර දීම කළ යුතුය.

(ආ) බලපත්‍රලාභියා විසින් කිසිදු අවස්ථාවක අන්තරායක කසළ වෙනත් කසළ සමග මිශ්‍රකර භාර දීමක් නොකළ යුතුය.

(ඇ) ප්‍රාදේශිය සභාව විසින් ක්‍රියාත්මක කරන ඝණ අපද්‍රව්‍ය කළමණාකරණ සේවාවෙන් ආවරණය නොවන පරිශ්‍රයක් සම්බන්ධයෙන් බලපත්‍රලාභියා විසින් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් නිර්දේශිත කොන්දේසි වලට යටත්ව කසළ බැහැර කිරීම කල යුතුය.

(ඇ) පරිශ්‍රය තුළ ජනනය වන අන්තරායකාරී අපද්‍රව්‍ය වේ නම් එම අපද්‍රව්‍ය ඒ සම්බන්ධයෙන් බල පැවැත්වෙන රෙගුලාසි හා නියමයන්ට අනුකූලව බැහැර කිරීම සඳහා ක්‍රියා කළ යුතුය.

(26) පරිශ්‍රයට අදාළ බලපත්‍රය ක්‍රියාත්මක වන විටදී පරිශ්‍රයෙහි සේවකයින්ගේ සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමෝපායන් වෙනුවෙන් හා පරිශ්‍රයට සේවා අපේක්ෂාවෙන් පැමිණෙන්නන්ගේ සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමෝපායන් සම්බන්ධයෙන් ක්‍රියාත්මක කළ යුතුයැයි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි නිර්දේශ මත සභාපතිවරයා දෙනු ලබන සෑම උපදේශයකටම අනුකූලව බලපත්‍රලාභියා විසින් පරිශ්‍රය පවත්වාගත යුතුය.

(27) පරිශ්‍රයට අදාළ වන කිසියම් අමුද්‍රව්‍යකින් හෝ නිෂ්පාදනයකින් හෝ එහි අතුරුඵලයකින් දුගඳක් හෝ වෙනත් කවර හෝ පීඩාවක් ඇති නොවන පරිදි පරිශ්‍රය පවත්වා ගත යුතුය.

(28) පරිශ්‍රය තුළ නිෂ්පාදන ද්‍රව්‍ය හෝ අළෙවිය සඳහා තබා ඇති ද්‍රව්‍ය තැන්පත් කිරීමේදි ප්‍රමාණවත් ආරක්ෂක විධි යොදා ඇත්තේ නම් මිස ඇසුරුම් කළ යුතු උස, බිම් මට්ටමේ සිට මීටර් 1.5 ක් නොඉක්මවිය යුතුය.

(29) පරිශ්‍රය තුළ අළෙවි කරනු ලබන දේ කෘෂි රසායන හෝ රසායනික ද්‍රව්‍ය හෝ ඖෂධ වැනි වෙනත් කවර හෝ ලිඛිත නීතියකින් පාලනය වන දෙයක් වන විටදී ඊට අදාළ බලපත්‍රය පාරිභෝගිකයන්ට නිසි පරිදි පෙනෙන ලෙස පරිශ්‍රය තුළ ප්‍රදර්ශනය කර තිබිය යුතුය.

(30) පරිශ්‍රය තුළ අළෙවිය සඳහා ඇති සෑම භාණ්ඩයක්ම ද්‍රව්‍යක්ම වෙන් වෙන්ව අසුරා තිබිය යුතුය.

(31) පරිශ්‍රය තුළ අළෙවිය සඳහා වන නිෂ්පාදන යටතේ පරිසරයට වායු විමෝචනය වේ නම්, එය මුදා හැරීම මධ්‍යම පරිසර අධිකාරියෙහි නියමයන්ට අනුකූල විය යුතුය.

(32) පරිශ්‍රය තුළ සිදුකරන ක්‍රියාකාරකම් යටතේ ශබ්දය ජනනය වේනම් එය මධ්‍යම පරිසර අධිකාරියෙහි නියමයන්ට අනුකූලව පාලනය කළ යුතුය.

(33) පරිශ්‍රය තුළ පරිහරණය කරන මෙවලම්, ජල ටැංකි, උදුන් හා වෙනත් උපකරණ භාවිතයෙන් පසුව නිසි පරිදි පිරිසිදු කර පවත්වාගත යුතුය.

(34) පරිශ්‍රය තුළ කවර හෝ කාර්යන් සඳහා භාවිතය තහනම් කරන ලද කිසිදු රසායන ද්‍රව්‍යක් භාවිත නොකළ යුතුය.

(35) පරිශ්‍රය තුළ ඇති සියලු විදුලි රැහැන් සම්බන්ධතාවයන් නිසි නඩත්තුවක් යටතේ පවත්වාගත යුතු අතර, එය එසේ වන බවට අවම වශයෙන් වර්ෂ දෙකකට වරක්වත් ඒ පිළිබඳ විදුලි ඉංජිනේරුවරයෙකුගෙන් හෝ වෘත්තීය සුදුසුකම් සපුරා ඇති අයකු වෙතින් වාර්තාවක් ලබා ගත යුතුය.

(36) පරිශ්‍රය පාරිභෝගිකයන් සඳහා වෙන් කළ ප්‍රමාණය වෙනත් කිසිදු භාවිතයක් සඳහා යොදා නොගත යුතුය.

(37) පරිශ්‍රයෙහි සෑම ස්ථානයක්ම, මෙවලමක්ම, භාජනයක්ම, මදුරුවන් හෝ වෙනත් කවර හෝ කීටයන්, කෘමීන් බෝවන ස්වභාවයෙන් පවත්වා නොගත යුතුය.

(38) කිසියම් බෝවන රෝගයකින් පෙළෙන හෝ එවැනි රෝගයක් වැළඳී ඇති බවට සැක කරනු ලබන හෝ එවැනි රෝග වාහකයෙකු හෝ ආසාධිත අයෙකු පරිශ්‍රය තුළ සේවයෙහි නොයෙදිය යුතු අතර, එවැනි අයෙකු සේවයේ නොයෙදෙන බවට බලපත්‍රලාභියා විසින් සෑහීමට පත්විය යුතුය.

14. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රයක් හා මෙම අතුරු ව්‍යවස්ථාවේ භාෂාත්‍රයෙන් වූ පිටපත් බලපත්‍රලාභී සෑම පරිශ්‍රයකම ප්‍රදර්ශනය කර තැබිය යුතුය. *බලපත්‍රය ප්‍රදර්ශනය කළ යුතු බව*

*එකඟතා ප්‍රකාශයකට ඇතුළත් වීම*

15. බලප්‍රදේශය තුල වසංගත තත්වයක් පැතිර යාමට හේතුවිය හැකි කරුණු සැලකිල්ලට ගන්මින් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී උපදෙස් පරිදි පරිශ්‍රය පවත්වාගෙන යාමට අදාළව බලපත්‍රලාභියා විසින් එකඟතා ප්‍රකාශයකට ඇතුලත් විය යුතුයැයි සභාපතිවරයා විසින් නියමකර ඇති විටකදී බලපත්‍රලත් තැනැත්තා සභාපතිවරයා සමඟ එකඟතා ප්‍රකාශයකට ඇතුලත් විය යුතු අතර සභාපතිවරයා විසින් එහි පිටපතක් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත යොමුකල යුතුය.

*පරිශ්‍රයකට ඇතුල්වීම හා නියදි ලබාගැනීම*

16. මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධානයන්ට අනුකූලව පරිශ්‍රය පවතින්නේද යන්න පරික්ෂා කිරීම සඳහා සභාපතිවරයා විසින් හෝ ඒ සඳහා බලය පවරන ලද මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකු හෝ වෙනත් යම් නිලධාරියෙකු ඕනෑම සාධාරණ වෙලාවක පරිශ්‍රයට ඇතුළු වීමට, අවශ්‍ය නියැදි ලබා ගැනීම නීත්‍යානුකූල වන්නේය.

17. (1) මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලත් පරිශ්‍රයක් යටතේ මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කොන්දේසි උල්ලංගනය කරමින් හෝ ඊට පටහැනි වන පරිදි කටයුතු වන අවස්ථාවක අතුරු ව්‍යවස්ථාවට අනුකූල වීම සඳහා දින තිහකට නොවැඩි නිශ්චිත කාලයක් දක්වමින් දැන්වීමක් සභාපතිවරයා විසින් බලපත්‍රලාභියා වෙත භාරදිය යුතුය.

(2) මෙම වගන්තිය යටතේ වූ දැන්වීමක් බලපත්‍ර ලාභියා වෙත භාරදීමෙන් පසු ,අදාළ දැන්වීමේ සඳහන් නියමයන්ට අනුකූලව ක්‍රියාකිරීම සඳහා තවදුරටත් අතිරේක කාලයක් ලබාදෙන ලෙසට සාධාරණ හේතු දක්වමින් කරනු ලබන ඉල්ලීමක් මත සභාපතිවරයා විසින් අතිරේක කාලයක් ලබාදිය හැකිය.එසේ ලබාදෙන කාලය පළමු දැන්වීමේ සඳහන් කාලයට අතිරේකව දින දහ හතරක උපරිම කාලයකට යටත්ව විය යුතුය.

*බලපත්‍රය අවලංගු කිරීම*

18. ඉහත 17 වගන්තිය යටතේ ලබාදෙන කාල සීමාව තුළ හෝ අතිරේක කාල සීමාව තුළ දැන්වීමට අනුකූලව ක්‍රියා කිරීම බලපත්‍රලාභියා විසින් පැහැර හැර ඇති අවස්ථාවක සභාපතිවරයා විසින් අදාළ බලපත්‍රය අවලංගු කල යුතුය.

*දණ්ඩනය*

19. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ලබා ගත යුතු බලපත්‍රයකින් තොරව හෝ අතුරු ව්‍යවස්ථාව යටතේ කරනු ලබන නියමයන් කඩකරමින් පරිශ්‍රයක් පවත්වාගෙන යාම වරදක් වන අතර එම වරද සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් වරදකරුවෙකු කිරීමෙන් පසු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (2) උප වගන්තිය යටතේ දඩුවමකට යටත් විය යුතුය.තවද එලෙස වරදකරුවෙකු වීමෙන් පසු තව දුරටත් එකී කඩකිරීම, උල්ලංඝණය නිරන්තරයෙන්ම කරගෙන යනු ලබන විට සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් දැන්වීමක් භාර දීමෙන් පසු උල්ලංඝණ තව දුරටත් නොකඩවා කරගෙන යන සෑම දිනකට ඉහතකී 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (2) උප වගන්තියේ සඳහන් අතිරේක දඩයකට යටත් විය යුතුය.

*අර්ථ නිරූපණය*

20. මෙම අතුරු ව්‍යවස්ථාවේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මෙම අතුරු ව්‍යවස්ථාවේ;

"ප්‍රාදේශීය සභාව" යන්නෙන් කළුතර ප්‍රාදේශීය සභාව ද,

"සභාපතිවරයා"යන්නෙන් කළුතර ප්‍රාදේශීය සභාවේ තත්කාලය සඳහා සභාපතිධුරයට පත්ව ඇති තැනැත්තා හෝ එම ධුරයේ කාර්යය කටයුතු ඉටු කරන තැනැත්තා ද,

"සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී" යන්නෙන් තත්කාලයෙහි කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙහි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශය සඳහා එම ධූරය දරන තැනැත්තකු ද,

"බලයලත් නිලධරයා" යන්නෙන් තත්කාලයෙහි සභාපතිවරයා විසින් ලිඛිතව බලය පවරන ලද යම් නිලධාරියෙක් ද,

"සාධාරණ වේලාව" යන්නෙන් බලපත්‍රලත් කර්තව්‍ය හෝ ඊට අදාළ කාර්යයන්හි නිරතවන වේලාවන් ද,

"වෙළදාම" යන්නෙන් කිසියම් දෙයක් හෝ ද්‍රව්‍යයක් පිටතින් රැගෙනවිත් මුදලකට අළෙවි කිරීමක් ද, නැතහොත් අළෙවිය සඳහා සූදානම් කිරීමක් ද, නැතහොත් අළෙවියක් සඳහා නිෂ්පාදනය කිරීමක් ද අදහස් වෙයි.

*පාඨ අතර අනනුකූලතාවය*

21. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල ,දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර අනනුකූලතාවයන් හටගතහොත් සිංහල පාඨය ප්‍රමුඛ වෙයි.

**පළමුවන උපලේඛනය**

**.......................... වර්ෂය සඳහා බලපත්‍රය ලබාගැනීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය.**

01. ඉල්ලුම්කරුගේ නම : -
02. පෞද්ගලික ලිපිනය : -
03. ජාතික හැඳුනුම්පත් අංකය : -
04. දුරකථන අංකය : -
05. වෙළඳ ව්‍යාපාරයේ ස්වභාවය : -
06. ආරම්භක වර්ෂය : -
07. ව්‍යාපාරික ස්ථානයේ ලිපිනය : -
08. ග්‍රාම නිලධාරී කොට්ඨාසය : -
09. වරිපනම් අංකය: -
10. ව්‍යාපාරය නාම ලියාපදිංචිය ලබාගෙන ඇත්නම් එහි යොමු අංකය :-
11. ව්‍යාපාර ස්ථානයේ කළමණාකරුගේ හෝ නියෝජිතයාගේ,
    I. නම හා පෞද්ගලික ලිපිනය
    II. ජාතික හැඳුනුම්පත් අංකය
    III. දුරකථන අංකය ජංගම :- ස්ථාවර :-

ඉහත තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

........................... වර්ෂය වෙනුවෙන් බලපත්‍රයක් මා වෙත නිකුත් කරන ලෙස ඉල්ලමි.

දිනය:- .....................................

ඉල්ලුම්කරුගේ අත්සන

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

ආදායම් පරීක්ෂක,

පසුපිටේ සඳහන් ඉල්ලුම්පත්‍රයට අදාළව බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා වන ඔබගේ නිරීක්ෂණ හා නිර්දේශ කඩිනමින් මා වෙත ලබා දෙන ලෙස කාරුණිකව ඉල්ලමි.

දිනය:- .....................................

ලේකම්

ලේකම්,
බලපත්‍රය ලබා දීම නිර්දේශ කරමි./නොකරමි.

දිනය:- .....................................

ආදායම් පරීක්ෂක

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී,

පසුපිටේ සඳහන් ඉල්ලුම් පත්‍රයට අදාළව බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා වන ඔබගේ නිරීක්ෂණ හා නිර්දේශ කඩිනමින් ලබාදෙන මෙන් කාරුණිකව ඉල්ලමි.

දිනය:- ....................................

ලේකම්

---

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී,

අතුරු ව්‍යවස්ථා හා අනෙකුත් නීති රීතිවලට අනුකූලව සුදුසුකම් සපුරා ඇත. බලපත්‍ර නිකුත් කිරීම නිර්දේශ කිරීම සඳහා වාර්තා කරමි.

දිනය:- ....................................

මහජන සෞඛ්‍ය පරීක්ෂක

---

ලේකම්,

ඉහත ඉල්ලුම්පත්‍රයට අනුව අදාළ ස්ථානය සඳහා බලපත්‍රයක් නිකුත් කිරීම නිර්දේශ කරමි. / නොකරමි.
(නිර්දේශ නොකරන්නේ නම් ඊට අදාළ හේතුව සඳහන් කරන්න).

දිනය:- ....................................

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී

---

## සංචාරක වෙළෙන්දන් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1. මෙම අතුරු ව්‍යවස්ථාව කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල සංචාරය කරමින් වෙළදාමේ යෙදෙන වෙළෙන්දන් අධීක්ෂණය කිරීම ඇතුළු ඊට අනුශාංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස පනවනු ලබයි.

2. මෙම අතුරු ව්‍යවස්ථාව කළුතර ප්‍රාදේශීය සභාවේ සංචාරක වෙළෙන්දන් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ. ***ලුහුඬු නාමය***

3. මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126(X) වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 122 වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට බලය ලැබී ඇත.

4. කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ (මෙහි මින්මතු බල ප්‍රදේශය යනුවෙන් හඳුන්වනු ලබන ) සංචාරය කරමින් භාණ්ඩ හෝ ආහාර ඇතුළු කවර හෝ ද්‍රව්‍යයක් අලෙවි කරන තැනැත්තෙකු ඒ සඳහා සභාපතිවරයා වෙතින් මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලබාගත යුතුය. ***බලපත්‍ර ලබා ගැනීම***

5. (1) ඉහත 4 වන වගන්තිය යටතේ වූ බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කරන සෑම තැනැත්තෙක්ම ප්‍රාදේශීය සභාව වෙතින් ලබා ගත් ඉල්ලුම් පත්‍රයක් මගින් ඒ සඳහා ඉල්ලුම් කල යුතුය. ***බලපත්‍ර සඳහා ඉල්ලුම් කිරීම***

(2) මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් ප්‍රාදේශීය සභාව වෙතින් නිකුත් කිරීමේදී ඒ සඳහා අයකල යුතු ගාස්තු සභාව විසින් තීරණය කරන පරිදි විය යුතුය.

6. සංචාරක වෙළෙන්දකු වශයෙන් මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ඉල්ලුම් කරන සෑම තැනැත්තෙක් විසින්ම පහත සඳහන් කොන්දේසි සම්පූර්ණ කර ඇත්තේ නම් මිස සභාපතිවරයා ඊට අදාළව බලපත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතුය. ***බලපත්‍රයක් නිකුත් කිරීමට අදාළ කොන්දේසි***

(1) සංචාරක වෙළදාමේ යෙදෙන්නා හෝ යෙදෙන්නන් පිළිබඳව අනන්‍යතාවයන් පිළිගත හැකි ආකාරයට තහවුරු කළ යුතුය.

(2) වෙළදාමේ යෙදීම සඳහා බයිසිකලයක්, ට්‍රයිසිකලයක්, කරත්තයක් හෝ මෝටර් වාහනයක් යොදාගනු ලබයි නම්;එය තමන් වෙනුවෙන් එවැනි කාර්යයන් සඳහා යොදාගත හැකි ආකාරයට සකස් කරන ලද හෝ සූදානම් කර ඇති බවට සාක්ෂි ඉදිරිපත් කල යුතුය.

(3) සංචාරක වෙළදාමේ යෙදීමේදී ශබ්ද වාහිනී යන්ත්‍ර යොදාගනු ලබයි නම්, ඊට අදාළව බලපත්‍රයක් ගතයුතු තත්ත්වයකදී ඊට අදාළ නිසි අධිකාරිය වෙතින් බලපත්‍රයක් ලබා ඇති බව තහවුරු කළ යුතුය.

(4) බල ප්‍රදේශය තුළ සංචාරක වෙළදාමේ යෙදීමට අපේක්ෂිත ප්‍රදේශ පිළිබඳ දළ විස්තරයක් ඉදිරිපත් කළ යුතුය.

(5) සංචාරක වෙළදාමේ යෙදෙමින් පිසින ලද ආහාර අලෙවි කිරීම සිදුකරයි නම් ඊට අදාළ ආහාර පරිහරණය කිරීම සම්බන්ධයෙන් කටයුතු කරන සෑම අයෙකුම සුදුසු සෞඛ්‍ය තත්ත්වයන් ඇති බවට ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී මෙම අතුරු ව්‍යවස්ථාවේ දෙවන උපලේඛණයෙහි දක්වා ඇති ආකෘතියට අනුකූල වූ සහතිකයක් ලබා තිබිය යුතුය.

7. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන බලපත්‍රයක් සඳහා අයකළ යුතු ගාස්තු බලපත්‍රය ඉල්ලා සිටිනු ලබන කාලයට අනුපාතිකව අයකළ යුතු අතර එම ගාස්තු සභාව විසින් යෝජනා සම්මුතියක් මගින් තීරණය කර ප්‍රකාශයට පත්කරන ලද ගාස්තු විය යුතුය. ***බලපත්‍රයක් සඳහා ගාස්තු***

8. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රයක් උපරිම වලංගු කාලය බලපත්‍රය නිකුත් කරනු ලබන වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන්විය යුතු අතර, ලිත් වර්ෂය තුල බලපත්‍රය ඉල්ලුම්කරනු ලබන කිසියම් කාලසීමාවක් වෙනුවෙන් අදාළ බලපත්‍ර නිකුත් කරනු ලැබිය හැකිය.

**බලපත්‍රය සන්තකයේ තබාගත යුතු බව**

9. සෑම සංචාරක වෙළෙන්දෙක්ම සංචාරක වෙළදාමේ යෙදෙද්දී අදාළ බලපත්‍රය සන්තකයේ තබා ගත යුතුය.

10. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් මෙම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානයන්ට අනුකූලව අවලංගු කලහොත් මිස නිකුත් කරන ලද කාලසීමාව දක්වා පමණක් වලංගු විය යුතුය.

**බලපත්‍රයට අදාළ කොන්දේසි**

11. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ලබාගත් බලපත්‍රයක් ලත් සෑම තැනැත්තෙක්ම පහත සඳහන් කොන්දේසිවලට අනුකූලව වෙළදාම පවත්වාගත යුතුය.

(1) සංචාරක වෙළදාම හෝ එහි ප්‍රචාරණය හේතුවෙන් ශබ්ද හෝ වායු දූෂණයක් නොවිය යුතුය.

(2) (i) සංචාරක වෙළදාම අතරතුර ජනනය වන කිසිඳු අපද්‍රව්‍යයක් අවට පරිසරයට මුදාහැරීම නොකල යුතු අතර ; අපද්‍රව්‍ය සියල්ල බලප්‍රදේශය තුළ ප්‍රාදේශීය සභාව ක්‍රියාත්මක වන කසළ කළමනාකරණ වැඩසටහනට අනුකූල වන පරිදි භාරදීම කළ යුතුය.

(ii) බලපත්‍රලාභියා විසින්ම ජනනය වන අපද්‍රව්‍ය කළමනාකරණය කරයි නම් ඒ සම්බන්ධයෙන් වූ තහවුරුවක් බල ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂක වෙත ඉදිරිපත් කර එකඟතාවය ලබාගත යුතුය.

(3) ශ්‍රී ලංකාව පුරාම හෝ කොටසක හෝ බල ප්‍රදේශය තුළ කිසියම් වසංගත තත්ත්වයකට කරුණු යෙදී ඇති බවට හෝ එසේ වේයැයි අවදානමක් ඇති අවස්ථාවක සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් හෝ ඔහුගේ උපදෙස් මත සභාපතිවරයා විසින් ක්‍රියාත්මක කරන උපදෙස් හා නිර්ණායකයන්ට අනුකූලවන පරිදි අදාළ වෙළදාම සිදුකළ යුතුය.

(4) මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද බලපත්‍රය සංචාරක වෙළදාමේ නියුක්ත සෑම අවස්ථාවකදීම සන්තකයේ තබා ගත යුතු අතර සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියෙකු විසින්, පොලිස් නිලධාරියෙකු විසින් ඉල්ලා සිටින ඕනෑම අවස්ථාවක එය පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

(5) බල ප්‍රදේශය තුළ හෝ ශ්‍රී ලංකාවේ පුරාම හෝ ඉන් කොටසක නිරෝධායන හා රෝග වැලැක්වීමේ ආඥාපනත යටතේ හා ඒ යටතේ සාදන ලද රෙගුලාසීන්ට අදාළ හෝ කවර හෝ වසංගත තත්ත්වයක් හෝ බෝවන රෝගයක් ව්‍යාප්ත වීමට කරුණු යෙදී ඇති අවස්ථාවක ඒ හා සම්බන්ධයෙන් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් ලබා දෙන උපදෙස් අනුව බලපත්‍රලාභියා ක්‍රියාකල යුතු අතර සිය සේවකයන් ඊට අනුකූලව ක්‍රියා කරන බවට බලපත්‍රලාභියා සෑහීමට පත්විය යුතුය.

(6) සංචාරක වෙළදාම යටතේ පිසින ලද ආහාර විකිණීම සඳහා ක්‍රියාකරයි නම්,

(i) ආහාර විකිණීමට භාවිතා කරනු ලබන සියළු උපකරණ හා මෙවලම් කිසිඳු විෂ ද්‍රව්‍යයක්, දුගඳක්, රසයක් ප්‍රේශණය නොකරන ද්‍රව්‍ය වලින් සාදා තිබිය යුතුය. එවැනි උපකරණ හා මෙවලම් අවශෝෂණය නොවන සහ මළ නොබැඳෙන ද්‍රව්‍යවලින් සාදා තිබිය යුතු අතර ඒවා දිගින් දිගටම පිරිසිදුකිරීම් වලට හා විෂබීජ නාශක වලට ඔරොත්තු දෙන ද්‍රව්‍යවලින් සාදා තිබිය යුතුය.

(ii) ස්වස්ථතායික අනතුරු වලක්වන පරිදි සියළු උපකරණ හා මෙවලම් පහසුවෙන් පිරිසිදු කිරීමට විෂබීජනාශක යෙදවීමට සලස්වන ආකාරයෙන් නිර්මාණයකර සාදා තිබිය යුතුය.

(iii) ශීත කල ද්‍රව්‍ය අලෙවි කරනු ලබයි නම්, ඊට අනුකූල වූ ගබඩා කිරීම් හා උෂ්ණත්වය මැනීමේ උපකරණ හෝ උෂ්ණත්ව වාර්තා කිරීමේ උපකරණ සවිකර තිබිය යුතුය.

(iv) වෙළදාමේදී එක්රැස්වන අපද්‍රව්‍ය එක්රැස්කිරීම සඳහා වෙනම සංවෘත කසල රැඳවුම් පවත්වාගත යුතුය. එසේ වුවද කවර හෝ තැනැත්තෙකු මුව ආවරණ අත් වැසුම් වැනි දේ බැහැර කිරීමේදී ඒ සියල්ල වෙනම වෙනත් අපද්‍රව්‍ය සමඟ මිශ්‍ර නොවන පරිදි බැහැර කිරීම සඳහා සංවෘත භාජන තබා තිබිය යුතුය.

(v) භාවිතයට ගනු ලබන සියළු උපකරණ මෙවලම් හොඳ තත්ත්වයෙන් නඩත්තු කර තිබිය යුතුය.

(vi) අලෙවි කිරීමේදී ඇසුරුම් ආහාර දූහනය වීම වැලැක්වෙන පරිදි සහ පළිබෝධකයන් ආහාරවලට එකතු නොවන පරිදි නිර්මාණය කර පවත්වාගත යුතුය.

(vii) ආහාර පාරිභෝගිකයන්ට පිරිනැමීම සඳහා යොදාගනු ලබන දේ නැවත එම අවස්ථාවේ භාවිතයට නොගන්නා දෙයින් සකස්කරන ලද ඒවා විය යුතුය.

(viii) අලෙවිය සඳහා තබා ඇති ආහාර කිසිදු ආකාරයකින් දූහනය වීමකට ලක් නොවිය යුතුය.

(ix) මුදල් පරිහරණය කරමින් ආහාර ඇල්ලීම නොකළ යුතු අතර මුදල් ගණු දෙණු සඳහා වෙනම අයෙකු සේවයේ යොදවා තිබිය යුතුය.

(iv) ආහාර ඇල්ලීම සඳහා ලෝහයෙන් තැනූ ඇල්ලුම් භාවිතා කල යුතුය.

(7) සංචාරක වෙළඳාම කිසිදු ආකාරයකින් මගී හෝ වාහන ගමනාගමනයට බාධා නොවන ආකාරයට විය යුතු අතර,

(8) බලපත්‍රය සඳහා වලංගු ප්‍රදේශයක් තුළ පමණක් වෙළඳාමේ යෙදිය යුතු අතර කිසිදු ආකාරයකින් බලපත්‍රයේ සඳහන් අවසර ඇති කාලසීමාව ඉක්මවා වෙළඳාමේ නොයෙදිය යුතුය.

(9) කිසිදු ආකාරයකින් බෝවන රෝගයකින් පෙළෙන අයෙකු හෝ ආසාධිත අයෙකු හෝ එවැනි තැනැත්තෙකුට උවටැන් කල අයෙකු වෙළඳාමේ හෝ වෙළඳාමට අදාළ සහාය කටයුතු සඳහා නොයෙදිය යුතු අතර අවශ්‍ය අවස්ථාවන්හිදී ප්‍රයෝජනයට ගැනීම සඳහා විෂබීජ නාශක ද්‍රව්‍ය පවත්වා ගත යුතුය.

(10) ගෝඝාතක ආඥාපනත යටතට අදාළ කිසිදු සතකුගේ මාංශය සංචාරක වෙළඳාම යටතේ විකිණීම නොකළ යුතුය.

(11) කිසිදු සංචාරක වෙළෙන්දෙකු දීර්ඝ කාලයක් එක තැන රැඳී සිටිමින් වෙළඳාම නොකළ යුතුය.

12. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් ඇත්තේ වුවද, බල ප්‍රදේශ තුල හෝ ඉන් කොටසක හෝ යම් මාර්ගයක හෝ බෝවන හෝ වසංගත රෝගයක් පැතිරෙමින් පවතින හෝ පැතිරයාමට හේතු වන තත්ත්වයක අවධානමක් ඇති බවට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී උපදෙස් පරිදි සභාපතිවරයා විසින් තීරණය කර ඇති විටක සභාපතිවරයා විසින්,

(i) නිකුත් කර ඇති බලපත්‍රයක් යටතේ ක්‍රියාත්මක වීම ස්ථිරව තහනම් කළ හැකිය.
(ii) නිකුත් කර ඇති බලපත්‍රය යටතේ වෙළඳාමේ යෙදිය හැකි ප්‍රදේශ සීමා කල හැකිය.
(iii) බලපත්‍රය යටතේ ක්‍රියා කිරීම තාවකාලිකව නවතාලිය හැකිය.

13. සංචාරක වෙළෙන්දන් විසින් අලෙවි කරන ආහාරයක, භාණ්ඩයක හෝ ද්‍රව්‍යයක සාම්පලයක් සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියෙකු එහි මිල ගෙවා ලබාගැනීම නිත්‍යානුකූල අතර, කිසිදු බලපත්‍රලාභියෙකු එය ප්‍රතික්ෂේප කිරීම හෝ ඊට බාධා කිරීම නොකළ යුතුය. **සාම්පල් ලබා ගැනීම**

14. මෙම අතුරුව්‍යවස්ථාවෙහි විධිවිධානයන්ට පටහැනිව හෝ උල්ලංඝනය කරමින් කිසියම් අයෙකු සංචාරක වෙළඳාමෙහි යෙදෙයි නම් හා අතුරු ව්‍යවස්ථාවට අනුකූලවීම සඳහා දෙනු ලබන උපදෙස් නොසලකා ක්‍රියා කරයි නම්, සභාපතිවරයා විසින් මෙම අතුරුව්‍යවස්ථාවේ 4 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් සභාපතිවරයා විසින් අවලංගු කිරීම නිත්‍යානුකූල වන්නේය.

15. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ලබාගත යුතු බලපත්‍රයක් ලබාගැනීමෙන් තොරව සංචාරක වෙළඳාමෙහි යෙදීම හා වලංගු බලපත්‍රයකින් තොරව සංචාරක වෙළඳාමේ යෙදීම වරදක් වන අතර, එම වරදකරු සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් වරදකරු කිරීමෙන් පසු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(2) උප වගන්තියෙහි සඳහන් දඩයකට යටත් විය යුතුය. ***උල්ලංඝනයන් සම්බන්ධයෙන් දණ්ඩනය***

*අර්ථ නිරූපණය* 16. මෙම අතුරු ව්‍යවස්ථාවෙහි පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් එය මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ,
" ප්‍රාදේශීය සභාව " යන්නෙන් කළුතර ප්‍රාදේශීය සභාවද,

" සභාපති " යන්නෙන් කළුතර ප්‍රාදේශීය සභාවේ තත්ත්කාලයෙහි සභාපති ධූරය දරණ තැනැත්තා හෝ එම ධූරයේ කාර්යය කර්තව්‍ය ඉටුකරන පුද්ගලයාද ,

"සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී" යන්නෙන් තත්කාලයෙහි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි කිසියම් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශයක එම ධූරය දරන තැනැත්තකු ද

"මහජන සෞඛ්‍ය පරීක්ෂක" යන්නෙන් තත්කාලයෙහි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි කිසියම් මහජන සෞඛ්‍ය පරීක්ෂක කොට්ඨාශයක එම ධූරය දරන තැනැත්තකු ද

"දූහනය" යන්නෙන් ආහාර හෝ ආහාර පසුබිමකට දූහන ද්‍රව්‍යයක් ඇතුල්වීම හෝ හටගැනීමටද

"ආහාර ස්වස්ථතාවය" ආහාර දාමයේ සියලු අවස්ථාවලදී ආහාරවල සුරක්ෂිත බව සහ සුදුසු බව සහතික කිරීම සඳහා අවශ්‍ය සියලු තත්වයන් පියවර සහ පරිවයද;

"සංචාරක වෙළඳාම" යන්නෙන් තමා විසින්ම හෝ සතකුගේ ආධාරයෙන් හෝ මෝටර් රථයකින් හෝ කරත්තයකින් හෝ බයිසිකලයකින් හෝ ට්‍රයිසිකලයක් මගින් භාණ්ඩ ආහාර හෝ වෙනත් කවර හෝ ද්‍රව්‍යයක් රැගෙන යමින් කරන වෙළඳාමක් ද

" මෝටර් වාහනය" යන්නෙන් මෝටර් වාහන ආඥාපනතේ දී ඇති අර්ථයද අදහස් වෙයි.

*පාඨ අතර අනනුකූලතාව* 17. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර අනනුකූලතාවයක් හටගතහොත් එවිට සිංහල පාඨය ප්‍රමුඛ වෙයි.

**පළමුවන උපලේඛනය**

**සංචාරක වෙළඳාම සඳහා බලපත්‍රය ලබාගැනීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය.**

01. ඉල්ලුම්කරුගේ නම : -
02. පෞද්ගලික ලිපිනය : -
03. ජාතික හැඳුනුම්පත් අංකය : -
04. දූරකථන අංකය : -
05. සංචාරක වෙළඳාමේ යෙදීමට අපේක්ෂිත ප්‍රදේශය : -
06. පදිංචි ග්‍රාම නිලධාරී කොට්ඨාසය : -
07. තමන් සමග සංචාරක වෙළඳාමේ යෙදෙන වෙනත් අයගේ නම්,
 ලිපිනයන් හා හැඳුනුම්පත් අංකය : -

ඉහත තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

දිනය:- ……………………………….
ඉල්ලුම්කරුගේ අත්සන

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

ආදායම් පරීක්ෂක,
පසුපිටේ සඳහන් ඉල්ලුම්පත්‍රයට අදාළව බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා වන ඔබගේ නිරීක්ෂණ හා නිර්දේශ කඩිනමින් මා වෙත ලබා දෙන ලෙස කාරුණිකව ඉල්ලමි.

දිනය:- ……………………………….
ලේකම්

---

ලේකම්,
බලපත්‍රය ලබා දීම නිර්දේශ කරමි./නොකරමි.

දිනය:- ……………………………….
ආදායම් පරීක්ෂක

---

සභාපති,
..................... ප්‍රාදේශීය සභාව,

බලපත්‍ර ලබා දීම නිර්දේශ කරමි./ නොකරමි.

දිනය:- ……………………………….
ලේකම්

---

බලපත්‍ර ලබා දීම අනුමත කරමි/ නොකරමි.

දිනය:- ……………………………….
සභාපති

ප්‍රාදේශීය සභාව

**දෙවන උපලේඛනය**

**ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සංචාරක වෙළන්දන් හට නිකුත් කරනු ලබන වෛද්‍ය සහතිකය**

............................ ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී ................................. වන මම ජාතික හැඳුනුම්පත් අංක ........................ දරන ................... මහතා/මිය උචිත පරිදි විද්‍යාගාර පරීක්ෂණයකින් පසු ශාරීරික වශයෙන් පරීක්ෂා කළ අතර ඔහු/ඇය ආහාරවල ආරක්ෂාවට තර්ජනයක් හෝ අනාගත තර්ජනයක් හෝ අනාගත තර්ජනයක් සංයුක්ත වන බෝවන රෝගයකින් හෝ යම් රෝග වාහකයකින් නොපෙළෙන බවත් ඔහුට/ ඇයට තුවාල සමේ ආසාදන වණ හෝ පාචනය යන රෝග තත්වයන් නොමැති බවත් සහතික කරමි.

දිනය:-

.....................................
සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී
(නිල මුද්‍රාව)

### හෝටල් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1. මෙම අතුරු ව්‍යවස්ථාව කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල හෝටල් පවත්වාගෙන යාම විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, පරීක්ෂා කිරීම හා පාලනය කිරීම සඳහා පනවනු ලබයි.

2. මෙම අතුරු ව්‍යවස්ථාව කළුතර ප්‍රාදේශීය සභාවේ හෝටල් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වෙයි. *ලුහුඬු නාමය*

3. මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (ix) වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 122 උපවගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට බලය ලැබී ඇත.

4. කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ (මෙහි මින්මතු බල ප්‍රදේශය යනුවෙන් හඳුන්වනු ලබන) කිසිදු තැනැත්තෙකු විසින් සභාපතිවරයා වෙතින් මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ලබාගත් බලපත්‍රයක් යටතේ මිස හෝටලයක් (මෙහි ඇතැම් තැනක පරිශ්‍රය යනුවෙන් හඳුන්වනු ලබන) පවත්වාගෙන යාම නොකළ යුතුය.

5. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ඉල්ලුම් කරන සෑම තැනැත්තෙක්ම මෙම අතුරු ව්‍යවස්ථාවේ පලවන උපලේඛණයට සාරානුකූලව පිළියෙල කරන ලද ඉල්ලුම් පත්‍රයක් යටතේ ඒ සඳහා ඉල්ලුම් කළ යුතුය. *බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කිරීම*

6. ඉහත 5 වන වගන්තිය යටතේ වූ ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කිරීම, ඒ සඳහා අවශ්‍යතා සම්පූර්ණ කර ලියාපදිංචි තැපෑලෙන් සභාපති වෙත යොමු කිරීමෙන්, ගෙනැවිත් භාරදීමෙන් හෝ සභාව අවසර දී ඇති ප්‍රමාණයට විද්‍යුත් තැපෑලෙන් යොමුකිරීමෙන් ඉදිරිපත් කළ හැකිය.

7. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ඉල්ලුම් කරන සෑම තැනැත්තෙක්ම මෙහි සඳහන් කොන්දේසි සම්පූර්ණ කර ඇත්තේ නම් මිස සභාපතිවරයා විසින් බලපත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතුය. *බලපත්‍රයක් සඳහා කොන්දේසි*

(1) පරිශ්‍රයට අදාල සියළු ඉදිකිරීම් අවස්ථාවෝචිත පරිදි 1978 අංක 41දරන නාගරික සංවර්ධන අධිකාරී පනත යටතේ හෝ නිවාස හා ප්‍රාදේශීය සංවර්ධන ආඥාපනතේ විධිවිධානයන්ට අනුකූලව කරන ලද ඉදිකිරීම් විය යුතු අතර එහි,

(අ) සියලුම ඉදිකිරීම් සඳහා යොදාගෙන ඇති ද්‍රව්‍ය විෂ සහිත ද්‍රව්‍ය බාහිරට මුදා නොහැරෙන හා විෂ සහිත වායූන් ප්‍රේෂණය නොවන ලෙස මෙන්ම සියළුම ඉදිකිරීම් ජීවීන්ට පහසුවෙන් රැදී සිටිය නොහැකි මතුපිට පෘෂ්ඨයන්ගෙන් සමන්විත පරිදි සකස්කර තිබිය යුතුය.

(ආ) අභ්‍යන්තර පිරිසැකැස්ම බාධාවකින් තොරව සේවාවන් ඉටු කිරීමට හැකිවන පරිදි , ප්‍රමාණවත් ඉඩ පහසුකම් සහිතව නිර්මාණය කර තිබිය යුතුය.

(ඇ) ආහාර අමුද්‍රව්‍ය හා පිසිනු ලබන ආහාර සඳහා දූහක ද්‍රව්‍ය ඇතුල්වීම වැලැක්වෙන පරිදි ආරක්ෂිත පිරිසැකසුමක් සහිතව නිර්මාණය කර තිබිය යුතුය.

(ඈ) පරිශ්‍රයෙහි අභ්‍යන්තර ආහාර වල ස්වස්ථතා තත්වයන් පරීක්ෂා කිරීමට හැකිවන පරිදි නිර්මාණය කර තිබිය යුතුය.

(ඉ) පරිශ්‍රයෙහි අභ්‍යන්තර පිරිසැකසුම් ක්‍රියාකාරකම් යටතේ බැහැර කරන දේ කිසිදු ආකාරයකින් ආපසු ගලා නොඑන පරිදි වූ යොමු කිරීම් සහිතව සකස්වී තිබිය යුතුය.

2 පරිශ්‍රයෙහි ආහාර පිරිසැකසුම් ස්ථානයෙහි,

(අ) බිම හා බිත්ති සේදිය හැකි, ලිස්සා නොයන හා ජලය අවශෝෂණය නොවන ද්‍රව්‍ය වලින් සකස් වී තිබිය යුතුය.

(ආ) සෑම මතුපිට පෘෂ්ඨයක්ම පහසුවෙන් පිරිසිදු කල හැකි සේදුම් කාරක ද්‍රව්‍යන්ට හා විෂබීජ නාශකවලට අක්‍රියව පැවතිය යුතුය.

(ඇ) සිවිලිම ඝණීභවනය අවම වන පරිදි හා පුස් සෑදීම, පතුරු ගැලවීම වැලැක්වෙන පරිදි ඉදිකරනු ලැබුවක් විය යුතුය.

(ඈ) ජනෙල් හා වෙනත් කවුළු ඇත්නම්, ඒවා කෘමීන්ට ඇතුළුවිය නොහැකි ආකාරයේ ආවරණයකින් ආවරණය කර තිබිය යුතුය.

(ඉ) පිටත වාතය පහසුවෙන් ගලා ඒමට හා අපහරිත වායුව පිටතට පහසුවෙන් ගලා යා හැකි පරිදි අවශෝෂක පංකා යොදා තිබිය යුතුය.

3 පරිශ්‍රයෙහි සේවයේ නියුතු කාර්ය මණ්ඩල සඳහා;

(අ) නේවාසිකයින් වශයෙන් කටයුතු කරයි නම්, එක් අයෙකුට අවම වශයෙන් වර්ග මීටර් 4ක ඉඩක් වෙන් වන පරිදි ප්‍රමාණවත් ඉඩක් සහිත කාමර පරිශ්‍රයෙහි පාරිභෝගිකයින් සඳහා වන සේවාවන්ට අදාළ කොටසින් පරිබාහිරව පිහිටුවා තිබිය යුතුය.

(ආ) ප්‍රමාණවත් පරිදි සනීපාරක්ෂක පහසුකම් සහිතව වැසිකිළි පහසුකම් සපයා තිබිය යුතු අතර, එය ස්ත්‍රී සහ පුරුෂ වශයෙන් වෙන් කර තිබිය යුතුය.

(ඇ) සපයා ඇති වැසිකිළි සහ නාන කාමර ස්ථිර ලෙස ඉදිකරන ලද ඒවා විය යුතු අතර, එය මනා නිමවුමක් සහිතව පරිශ්‍රයෙහි ගණුදෙනුකරුවන් සඳහා කොටසින් පරිබාහිරව ඉදිකර තිබිය යුතුය.

. 4 පරිශ්‍රය සඳහා අදාළ පරිදි ගිනි ආරක්ෂක සහතික ලබා තිබිය යුතු අතර, පරිශ්‍රයෙහි නියම කර ඇති පරිදි ගිනි ආරක්ෂක පහසුකම් සපයා තිබිය යුතුය.

5 පරිශ්‍රයෙහි සියළුම ගොඩනැගිලි ආබාධ සහිත හා විශේෂ අවශ්‍යතා ඇති අයට ඇතුල්වීමට හැකි වන පරිදි ඉදිකර තිබිය යුතුය.

6 පරිශ්‍රය තුල ජනනය වන අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාව ක්‍රියාත්මක කරන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහනට අනුකූලව බැහැර කළ යුතු අතර, බලපත්‍රලාභියා විසින්ම පරිශ්‍රය තුල අපද්‍රව්‍ය බැහැර කිරීම් සිදුකරයි නම්, ඒ සඳහා අදාළ කරගන්නා වූ ක්‍රමවේදය මහජන සෞඛ්‍ය පරීක්ෂක මඟින් අනුමත කරන ලද ක්‍රමවේදයක් විය යුතුය.

7 පරිශ්‍රයට ඇතුළත් වීමේදී ඇතුල්වන්නන්ගේ අනන්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා හා එය වාර්තා කර ගැනීම සඳහා නිශ්චිත ක්‍රමවේදයක් පවත්වාගත යුතුය

8 පරිශ්‍රයට පැමිණෙන්නන්ගේ වාහන නවතා තැබීම සඳහා ප්‍රමාණවත් ඉඩ පරිශ්‍රය තුල හෝ ඊට ආසන්නව පවත්වාගත යුතුය.

9 පරිශ්‍රයෙහි සපයා ඇති පහසුකම් සේවා සම්බන්ධයෙන් පාරිභෝගිකයන්ට දැන ගැනීමට හැකිවන පරිදි පුවරු සවිකර තිබිය යුතු අතර, එහි ලියාපදිංචි ව්‍යාපාර නාමයක් යටතේ හෝ සංස්ථාගත නාමයක්, ශ්‍රී ලංකා සංචාරක අධිකාරියෙහි ලියාපදිංචි ලබා ඇත්නම්, ඊට අදාළ ලියාපදිංචි අංකය ප්‍රකටව පෙනෙන පරිදි ප්‍රදර්ශනය කර තිබිය යුතුය.

10 පරිශ්‍රයෙහි අභ්‍යන්තර පිරිසැකැස්ම පාරිභෝගිකයාට වඩාත් හිතකර හා ප්‍රියමනාප අයුරින් සකසා තිබිය යුතු අතර, ඒ සඳහා කර ඇති ඉදිකිරීම්, සවිකිරීම් කිසිදු අයුරකින් පාරිභෝගිකයාගේ ආරක්ෂාවට බාධාවක් නොවිය යුතුය

11 පරිශ්‍රයෙහි ගනුදෙනුකරුවන්ගේ සේවය සඳහා යොදවා ඇති හෝ යොදවා ගනු ලබන කාර්ය මණ්ඩල ඒ සඳහා වෘත්තීමය සේවාවක් ලබාදීමට පිළිගත් ආයතන වෙතින් පුහුණුවක් ලබා ඇති අය විය යුතුය

ඉල්ලුම්පත්‍රයකට අනුව කටයුතු කිරීම

8 මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ඉදිරිපත්වන ඉල්ලුම් පත්‍රයකට අදාලව ඉල්ලුම් පත්‍රය ලැබී දින දහහතරක් ඇතුලත සභාපතිවරයා විසින් ;

(1) 7 වන වගන්තියෙහි සඳහන් කොන්දේසිවලට අනුකූල වන විටදී පරිශ්‍රයට අදාල බලපත්‍රයක් ඉල්ලුම්කරු වෙත නිකුත් කල යුතුය.

(2) 7 වන වගන්තියෙහි සඳහන් කොන්දේසිවලට අනුකූල නොවන්නේනම්, හේතු දන්වා අදාල ඉල්ලුම්පත්‍රය ප්‍රතික්ෂේප කල යුතුය

9 (1) මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රයක් සඳහා අයකල යුතු ගාස්තු **මූලික නීතියේ** සඳහන් විධිවිධානයන්ට යටත්ව සභාව විසින් තීරණය කර ප්‍රකාශයට පත් කරනු ලබන ගාස්තු විය යුතුය.

(2) බලපත්‍රයක් නිකුත් කිරීමට අදාලව ස්ථාන පරීක්ෂාවන් සඳහා වන පරීක්ෂණ ගාස්තුවක් සභාව විසින් තීරණය කර අය කිරීම නීත්‍යානුකූල විය යුතුය.

10 මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන බලපත්‍රයක් මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධාන අනුව කලින් අවලංගු නොකලහොත් බලපත්‍රයට අදාල වර්ෂයෙහි දෙසැම්බර් තිස් එක දක්වා වලංගු විය යුතුය.

11 මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලත් සෑම තැනැත්තෙක්ම මෙහි පහත සඳහන් කොන්දේසීන්ට අනුකූලව ක්‍රියා කළ යුතුය.

(1) බලපත්‍රලත් තැනැත්තා ආයතනයේ කළමනාකරු නොවන්නේ නම්, කළමනාකරු සම්බන්ධයෙන් සභාපති විසින් ඉල්ලා සිටින අනන්‍යතාව පිළිබඳ තොරතුරු ලබාදී තිබිය යුතු අතර, වෙනස්වන සෑම අවස්ථාවකම එය එසේ ලබාදිය යුතුය.

(2) පරිශ්‍රය තුල පැවැත්වෙන උත්සව, ප්‍රියසම්භාෂණ හෝ වෙනත් වැඩසටහන් සඳහා යොදා ගැනෙන ශබ්ද විකාශන යන්ත්‍ර මඟින් හෝ සංගීත භාණ්ඩ වාදනයෙන් අන්‍යයන්ට බාධාවක් නොවන පරිදි පාරිසරික රෙගුලාසි හා නියමයන්ට අනුව පවත්වාගත යුතුය.

(3) පරිශ්‍රයට පැමිණෙන වාහන කිසිවක් පොදු ප්‍රවේශයක නවතා නොතබන පරිදි වාහන නැවැත්වීම සඳහා ප්‍රමාණවත් ඉඩ පහසුකම් පවතින පරිදි පවත්වාගත යුතුය.

(4) නවාතන් සඳහා පැමිණෙන සෑම තැනැත්තෙකුටම අදාලව නම, ලිපිනය, හැඳුනුම්පත් අංකය, හා සම්බන්ධ කරගත හැකි දුරකතන අංක මෙන්ම සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක විසින් හෝ බල ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් හෝ සභාපති විසින් සේවා අපේක්ෂකයෙකු සම්බන්ධයෙන් බල ප්‍රදේශයේ සෞඛ්‍ය හේතු මත පවත්වාගත යුතුයැයි කලින් කල නියම කරන තොරතුරු ඇත්නම් ඒ සෑම තොරතුරක්ම ලේඛණගතව පවත්වාගත යුතුය.

(5) ශ්‍රී ලංකාව පුරාම හෝ ඉන් කොටසකට බල ප්‍රදේශයට අදාලව හෝ නිරෝධායක හා රෝග වැළැක්වීමේ ආඥාපනත යටතේ සාදන ලද රෙගුලාසි යටතේ වසංගත තත්වයක් ප්‍රකාශයට පත්කර ඇති කවර හෝ අවස්ථාවක හෝ බල ප්‍රදේශය තුල යම් වසංගත තත්වයකට කරුණු යෙදී ඇති බවට සෑහීමට පත් වෙමින් එය පාලනය කිරිම සඳහා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී උපදෙස් මත සභාපතිවරයා විසින් කලින් කල නියම කරණු ලබන නියමයක් ඇත්නම් ඒ සෑම නියමයකටම යටත්ව පරිශ්‍රය පවත්වාගත යුතුය.

(6) නවාතැන් සඳහා වන කාමරයක් සහ නවාතැන්කරුවන්ගේ පරිහරණය සඳහා වන සෑම අවකාශයක්ම වැසිකිළි නාන කාමර එක් නවාතැන්කරුවෙකුගේ පරිහරණයෙන් පසු වෙනත් තැනැත්තෙකුගේ පරිහරණය සඳහා ලබා දීමට පෙර විෂබීජ හරණයකල යුතු අතර ගණුදෙනු කරුවන් රැඳී සිටියදී වුවද වැසිකිළි හා නාන කාමර දිනපතා විෂබීජ හරණය කලයුතුය.

(7) බල ප්‍රදේශයේ වසංගත රෝගී තත්වයක් සඳහා අවදානමක් ඇති බවට සැක කිරීමට කරුණු යෙදී ඇති සෑම අවස්ථාවකම පරිශ්‍රයේ නවාතැන් සඳහා පැමිණෙන සෑම තැනැත්තෙකු සම්බන්ධයෙන්ම ශරීර උෂ්ණත්වයට නියමිත පරාසය තුල සිටින්නේද යන්න පරිශ්‍රයට ඇතුල්වීමට පූර්වයෙන් ඒ සඳහා නිශ්චිතව යොදවා ඇති අයකු විසින් මැන බැලිය යුතු අතර පරිශ්‍රයට ඇතුලත් කර ගැනීමට පූර්වයෙන් ඒ සෑම තැනැත්තෙකුගේ දෙඅත් සහ දෙපා විශබීජ නාශක යොදා පිරිසිදු කර ගැනීමට සැලැස්විය යුතුය.

(8) සෑම කාමරයකම ගණුදෙනුකරුවන්ගේ භාවිතය සඳහා තබා ඇති කොට්ට උර, ඇඳ ඇතිරිලි, පොරෝනා, තුවා ආදී නැවත භාවිතය සඳහා වන සියල්ල සෝදා පිරිසිදු කිරීමකින් තොරව තවත් ගණුදෙනුකරුවන්ගේ භාවිතය සඳහා යොදා නොගත යුතුය.

(9) කිසිදු ආකාරයකින් අදාල කාමරය තනි පුද්ගලයෙකු සඳහා වන කාමරයක් වනවිටදී වැඩිහිටි එක් අයකුට වඩා වැඩි සංඛ්‍යාවකට හෝ ද්විත්ව කාමරයක් වන විටදී වැඩිහිටි දෙදෙනෙකුට වඩා වැඩි සංඛ්‍යාවකටද ත්‍රිත්ව කාමරයක් වන විටදී වැඩිහිටි තිදෙනෙකුට වඩා වැඩි සංඛ්‍යාවකට හෝ සමූහ වශයෙන් රැඳීසිටිය හැකි කාමරයක් වන විටදී, එක් අයකුට වර්ග මීටර් හතරක් එක් අයකු සඳහා වන අවම ඉඩ වශයෙන් සැලකූ විට රැඳී සිටිය හැකි උපරිම සංඛ්‍යාව ඉක්මව යන පරිදි වූ සංඛාවකට කාමර පහසුකම් ලබා නොදිය යුතු අතර මෙම උප වගන්තියේ කාර්යය සඳහා වැඩිහිටි යන්න වයස අවුරුදු පහකට වැඩි අය සැලකිය යුතුය.

(10) කාමරයක් ඇතුලත ඇඳන් ඉහත (9) වන උපවගන්තියෙහි සඳහන් ප්‍රමාණයක් සැලකිල්ලට ගනිමින් පවත්වාගත යුතුය.

(11) දෙමව්පියන් හෝ නීත්‍යානුකූල භාරකාරීත්වයකින් හැර කිසිදු අවස්ථාවක ළමයෙක් සමඟ කවර හෝ තැනැත්තෙකුට ලැගුම් ගැනීම සඳහා අවසර නොදිය යුතුය.

(12) පරිශ්‍රයෙහි කාමර හැර විවෘත ප්‍රදේශයක කිසිදු අයකුට නිදා ගැනීම සඳහා භාවිතයට අවසර නොදිය යුතුය.

(13) අනන්‍යතාවය තහවුරු කිරීමට එකඟ නොවන්නේ නම් හෝ අනන්‍යතාවය තහවුරු කිරීමට නොහැකි කිසිදු තැනැත්තෙකුට පරිශ්‍රයෙහි නවාතැන් සඳහා අවසර නොදිය යුතු අතර නවාතැන් ලබන සියළුම අය සම්බන්ධයෙන් තොරතුරු ඔවුන්ගේ අත්සන් යටතේ වූ ප්‍රකාශයක් වශයෙන් විය යුතුය.

(14) වායු සමනය කරන ලද කාමරයක් නොවන විටදී සෑම කාමරයක් සඳහාම හොඳින් වාතාශ්‍රය ලැබෙන පරිදි කිසියම් කාලයක් දොර ජනෙල් විවෘත කර තැබීමෙන් පසු භාවිතය සඳහා ඉඩ දිය යුතුය.

(15) බල ප්‍රදේශයට අදාලව කිසියම් වසංගත තත්වයක් සම්බන්ධයෙන් නිරෝධායක හා රෝග වැලැක්වීමේ ආඥා පනත යටතේ රෙගුලාසියක් බලපැවැත්වෙන අවස්ථාවක එම රෙගුලාසියෙහි සඳහන් සෑම නියමයකටම අනුකූලව කාමර භාවිතය සඳහා පහසුකම් සළසා දිය යුතුය.

(16) ශ්‍රී ලංකාව පුරාම හෝ ඉන් කොටසකට හෝ බල ප්‍රදේශයට අදාලව හෝ නිරෝධායක හා රෝග වැලැක්වීමේ ආඥා පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද නියෝග යටතට අදාළ රෝගී තත්වයක් ප්‍රකාශයට පත්කර ඇති කවර හෝ අවස්ථාවක හෝ බල ප්‍රදේශය තුල යම් වසංගත තත්වයකට කරුණු යෙදී ඇති බවට සෑහීමට පත්වෙමින් එය පාලනය කිරීම සඳහා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී උපදෙස් මත සභාපතිවරයා කලින් කල නියම කරනු ලබන නියමයන් ඇත්නම් ඒ සෑම නියමයකටම යටත්ව පරිශ්‍රය පවත්වා ගත යුතුය.

(17) පරිශ්‍රයෙහි සේවය සඳහා යොදවා ඇති සෑම තැනැත්තෙකු විසින්ම නිරෝධායක හා රෝග වැලැක්වීමේ ආඥා පනත යටතේ සාදන ලද රෙගුලාසි යටතට අදාළ වන රෝගී තත්වයක් ප්‍රකාශයට පත්කර ඇති කවර හෝ අවස්ථාවක ඊට අදාළව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී උපදෙස් මත සභාපතිවරයා විසින් කරනු ලබන සෑම නියමයකටම යටත්ව ක්‍රියා කල යුතුය.

(18) බල ප්‍රදේශය තුල වසංගත රෝගී තත්වයක් සඳහා අවදානමක් ඇති බවට සැක කිරීමට කරුණු යෙදී ඇති සෑම අවස්ථාවකම සේවා අපේක්ෂාවෙන් පරිශ්‍රයට පැමිණෙන සෑම තැනැත්තෙකුටම අදාළව, ඊට අදාළ නිකුත් කර ඇති සෞඛ්‍ය උපදෙස් වලට අනුකූලව පැමිණෙන්නේ නම් මිස එම පරිශ්‍රයෙහි සේවා පහසුකම් සලසා නොදිය යුතුය

(19) බල ප්‍රදේශය තුල කිසියම් වසංගත රෝගී තත්වයකට කරුණු යෙදී ඇති විට හෝ ඒ සඳහා අවදානමක් ඇති විට එයින් ආරක්ෂා වීම සඳහා අනුගමනය කල යුතුයැයි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක ජෙනරාල් හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් හෝ ඔවුන්ගේ උපදෙස් පරිදි සභාපතිවරයා විසින් හෝ නියම කර ඇති සෞඛ්‍ය ආරක්ෂිත උපදෙස් නිසියාකාරයෙන් පරිශ්‍රය තුල ක්‍රියාත්මක කල යුතුවා මෙන්ම, එසේ වන බවට බලපත්‍රලාභියා සෑහීමට පත් විය යුතුය.

(20) පරිශ්‍රය තුල සියළුම කාණු, පහසුවෙන් ජලය බැසයන ආකාරයට පවත්වාගත යුතු අතර, අපජලය, මළ අපද්‍රව්‍ය, අනුමත ක්‍රමවේදයන්ට අනුව පූනික වලවල්, උරා ගැනීමේ වලවල් හෝ මධ්‍ය ප්‍රතිකාර ඒකකයට යොමුකර තිබිය යුතු අතර, එමඟින් දූෂනය වීම වැලැක්වීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන තිබිය යුතුය.

(21) පරිශ්‍රයෙහි සියළුම වැසිකිලි, දෙඅත් සෝදන ස්ථාන නිරන්තරයෙන් විෂබීජ නාශක යොදා පිරිසිදු කල යුතු අතර, ඒ සියල්ල එසේ වන බවට සෑහීමට පත්වීම පිණිස සුදුසු වැඩපිළිවෙලක් පවත්වාගත යුතුය.

(22) පරිශ්‍රයෙහි අභ්‍යන්තර පොළව පහසුවෙන් ලිස්සා නොයන පරිදි සකස්කර තිබිය යුතු අතර, පිරිසිදු කිරීම් සිදු කිරීමේදි ඊට යම් තාක් පහසු වන තත්වයකට කරුණු යෙදේ නම් එම ස්ථානයෙහි ඒ බව සඳහන් පුවරු පාරිභෝගිකයින්ට දැකගත හැකිවන පරිදි තබා තිබිය යුතුය.

(23) පරිශ්‍රය තුල පිහිටුවා ඇති කාණු ජලය රැදී නොසිටින පරිදි සකස් වී තිබිය යුතු අතරම එය සෑම දිනකම දෙවරක් විෂබීජ නාශක යොදා පිරිසිදු කල යුතුය.

(24) පරිශ්‍රය තුල කිසිදු කාණුවක්, අපද්‍රව්‍ය ගලා එන බටයක් ,හෝ කිසිදු ආකාරයකින් මාර්ගයෙහි පොදු කාණුවකට හෝ පිටත භූමියකට හෝ යොමු නොකල යුතුය.

(25) පරිශ්‍රය තුල අපජලය ගලායාම හේතුවෙන් හෝ අපද්‍රව්‍ය බැහැර කිරීම හේතුවෙන් බාහිරව කිසිදු දුර්ගන්ධයක් ඇති නොවන පරිදි පවත්වාගත යුතුය.

(26) ආහාර පිසීමේදී, ආහාර ශීත කිරීමේදී, ඒ සඳහා විය යුතු උෂ්නත්වය නියාමනය කිරීම සඳහා ප්‍රමාණවත් පහසුකම් තිබිය යුතු අතර එය එසේ වන බවට වාර්තා පවත්වාගත යුතුය.

(27) ආහාර සකස් කිරීම සඳහා භාවිතා කරන සියළු උපකරණ හා මෙවලම් පහත සඳහන් අවශ්‍යතාවන්ට අනුකූලවන පරිදි පවත්වා ගත යුතුය.

(අ) ආහාර සකස් කිරීමේදී භාවිතාවන සියළුම උපකරණ මෙවලම් කිසිදු විෂ ද්‍රව්‍යක්, රසක් හෝ දුගඳක් ප්‍රේෂණය නොවන අවශෝෂණය කර නොගන්නා ද්‍රව්‍ය වලින් සකස් වී තිබිය යුතු අතරම එය මල නොබැඳෙන ද්‍රව්‍ය වලින් සාදා තිබිය යුතුය.

(ආ) සියළුම උපකරණ හා මෙවලම් පහසුවෙන් පිරිසිදු කල හැකි ආකාරයේ ඒවා විය යුතුය.

(ඇ) අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා යොදා ඇති භාජන ලෝහ හෝ කාන්දු නොවන ද්‍රව්‍යයන්ගෙන් සකස් කරන ලද පියන සහිත ඒවා විය යුතුය.

(ඈ) පවත්වාගනු ලබන සෑම උපකරණයක්ම, මෙවලක්ම භාවිතා කිරීමට උචිත තත්වයේ ඒවා විය යුතුය.

(28) ආහාර බෙදා හැරීම සඳහා යොදාගනු ලබන දේ ආහාර වල රසයට හානි නොවන ආකාරයට බෙදා ගැනීම සිදු කිරීමට හැකිවන පරිදි වූ බහාලුම් විය යුතුය

(29) පරිශ්‍රය තුල ආහාර සකස් කිරීම සඳහා භාවිතාවන දේ තැබීම සඳහා හා පිසින ලද ආහාර හෝ එවැනි දේ තබා ගැනීම සඳහා වෙන් වෙන් වශයෙන් ප්‍රමාණවත් ශීතකරන පහසුකම් තිබිය යුතුය

(30) ආහාර සකස් කිරීමට ගන්නා පළතුරු ,එළවළු වැනි දේ ඉතා හොඳින් සෝදා පිරිසිදු කොට භාවිතයට ගත යුතුය.

(31) පරිශ්‍රයෙහි භාවිතය සඳහා යොදා ගැනෙන ජලය උපද්‍රවකාරී නොවන භාජනවල දූහනයෙන් තොරව පවත්වාගත යුතුය.

(32) පරිශ්‍රයෙහි භාවිතයට ගැනෙන අයිස් පානීය ජලයෙන් නිශ්පාදිත ඒවා විය යුතුය.

(33) පරිශ්‍රය තුල ජලය ගෙන යන නල මාර්ග වෙනත් වූ නල මාර්ගයකින් හෝ වෙන්කර හඳුනාගැනීමට හැකිවන පරිදි පවත්වා ගත යුතුය.

(34) පරිශ්‍රය තුල පිසින ලද සෑම ආහාර ද්‍රව්‍යක්ම උපද්‍රවයකින් තොරව පාරිභෝගිකයන් වෙත පත් කිරීම සඳහා නිශ්චිත අභ්‍යන්තරික වැඩ පිළිවෙලක් සකස්කර තිබිය යුතු අතර, එය නියාමනය කිරීම සඳහා නිශ්චිතව කාර්යය පවරන ලද අය සේවයේ යොදවා තිබිය යුතුය.

(35) ආහාරයට රැගෙන එන මස් මාළු පරිශ්‍රයෙහි වෙනම ශීතකරණයක ගබඩා කර තැබිය යුතු අතර භාවිතයට ගන්නා තෙක් සෑමවිටම සෙන්ටිග්‍රේඩ් අංශක දෙකක උෂ්ණත්වයකින් යුතුව දූෂනය නොවන පරිදි පවත්වාගත යුතුය.

(36) පරිශ්‍රය තුල ආහාර පිළිගැන්වීමේ හෝ පරිහරණය කිරීමේ හෝ එකලැස් කිරීමේ කාර්යයක නියැලී සිටින සෑම තැනැත්තෙකු විසින්ම;

(අ) තම අත්ල හෝ ඇඟිලි විවෘත භාවයෙන් ආහාර ඇල්ලීම හෝ ස්පර්ශ කිරීම නොකල යුතුයි.

(ආ) ආහාර ඇල්ලීම සඳහා භාවිතා කරන මෙවලම් හා අත්වැසුම් ආහාර සඳහා හිතකර භාවිතයක් විය යුතුය.

(ඇ) දෙඅත් පිසදමා ගැනීම සඳහා පිරිසිදු තුවායක් භාවිතයට ගත යුතුය.

(ඈ) භාවිතයට ගැනෙන පිඟානක කෝප්පයක හෝ වෙනත් භාජනයක යටිපැත්ත කිසිදු ආහාරයක නොගෑවෙන ලෙස සෑමවිටම පවත්වා ගත යුතුය.

(ඉ) ආහාර බෙදීම සඳහා භාවිතයට ගනුලබන සියළු උපකරණ මනා ලෙස පිරිසිදුව තබාගත යුතු අතර, ඒ සියල්ල වෙන් වෙන් වශයෙන් භාජනවල බහා තැබිය යුතුය.

(ඊ) කිසිදු ආකාරයකින් තම ක්‍රියාවකින්, භාවිතයකින් ආහාරයක් දූෂනයට ලක්වීමට හෝ ක්ෂුද්‍ර ජීවීන් ව්‍යාප්ත වීමට හේතු නොවන පරිදි ආහාර පරිහරණය කිරීමට, එකලැස් කිරීමට පිළිගැන්වීමට එසේ සේවයේ යෙදී සිටින්නන් ක්‍රියා කල යුතුය.

(37) බල ප්‍රදේශය තුළ නිරෝධායක හා රෝග වැලැක්වීමේ ආඥා පනත යටතේ හෝ ඒයටතේ සාදන ලද නියෝග යටතට අදාළ වන රෝගී තත්වයක් ප්‍රකාශයට පත්කර හෝ බල ප්‍රදේශය තුල කිසියම් වසංගත රෝගී තත්වයකට අවදානමක් ඇති බවට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී උපදෙස් පරිදි සභාපතිවරයා විසින් ප්‍රකාශයට පත්කර ඇති අවස්ථාවක පරිශ්‍රය තුල ආහාර සකස් කිරීමේ, පරිහරණය, පිළිගැන්වීම් කිරීමේ හෝ එකලැස් කිරීමේ කාර්යයෙහි නියැලී සිටින සෑම තැනැත්තෙක්ම මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් සෑම නියමයකට අතිරේකව අවස්ථාවොචිත පරිදි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකු හෝ ඔවුන්ගේ උපදෙස් පරිදි සභාපතිවරයා විසින් කරනු ලබන නියමයන්ට යටත්ව පරිශ්‍රය පවත්වාගත යුතුය.

(38) පරිශ්‍රය තුල ආහාර පිළිගැන්වීමේ හා පරිහරණය සඳහා වන මේස ඉතා පිරිසිදු තත්වයකින් විය යුතු අතර, සෑම පිළිගැන්වීමකින් හා පරිහරණයකින් පසු විශබීජ නාශක යොදා පිරිසිදු කල යුතු අතර ඒ සඳහා භාවිතාවන තුවා පිරිසිදු තත්වයෙන් තිබිය යුතුය

(39) පරිශ්‍රය තුල පාරිභෝගිකයින්ගේ අත ගැටෙන පෘෂ්ඨයක් නිතර විශබීජ නාශක යොදා පිරිසිදු කල යුතුය.

(40) පරිශ්‍රයෙහි පිරිසැකසුම් ස්ථානයෙහි හා ආහාර පරිභෝජනය සඳහා වන කොටස්වල ප්‍රමාණවත් පරිදි විශබීජ නාශක ද්‍රව්‍ය සමඟ අත්සේදීම් සඳහා, අත් වියලීම සඳහා ප්‍රමාණවත් සහසුකම් සලසා තිබිය යුතු අතර පරිශ්‍රය තුල ප්‍රමාණවත් ආලෝකයක් පවත්වාගත යුතුය.

41 පරිශ්‍රය තුල ඒකරාශිවන අපද්‍රව්‍ය බැහැර කිරීමට පූර්වයෙන්  රඳවා ගැනීමේදී කිසිදු ආකාරයකින් පරිශ්‍රයෙහි භාවිතයට ගැනෙන දේට බලපෑමක් ඇති නොවන පරිදි හා එමඟින් ආහාර දූහනයට කරුණු නොයෙදෙන පරිදි පවත්වාගත යුතුය.

42 පරිශ්‍රය තුල කිසිදු ආකාරයකින් බල්ලන්, පූසන් වැනි සුරතල් සතුන් ඇති නොකල යුතුය.

. 43 පරිශ්‍රයෙහි සේවය කරන පිරිස් සඳහා ආහාරවලට අදාල ස්වස්ථතා කටයුතු පිළිබඳ පුහුණුවක් ලබා තිබිය යුතු අතර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී නියම කරන කාල සීමාවක් යටතේ වෛද්‍ය පරීයේෂණයන්ට යොමුකර සුදුසු සෞඛ්‍ය තත්වයෙන් යුක්ත බවට පරික්ෂාකර ගත යුතුය. එසේම ඊට අදාළ වන වාර්තා පරිශ්‍රය තුල ඕනෑම අවස්ථාවක පරික්ෂා කිරීමට හැකිවන පරිදි පවත්වාගත යුතුය. තවද ඔවුන් සම්බන්ධයෙන් කරන සෞඛ්‍ය පරීක්ෂණ සායනික හා වසංගත යන දෙයාකාරයෙන්ම විය යුතුය.

44 පරිශ්‍රයෙහි සේවයේ යොදවා ඇති සේවකයින් සම්බන්ධයෙන් සෞඛ්‍ය නිරීක්ෂණ පද්ධතියක් පිහිටුවා ඔවුන්ට අවශ්‍ය සෞඛ්‍ය උපදෙස් ලබා ගැනීමට ක්‍රියාවලියක් ඇති කල යුතුය.

45 පරිශ්‍රයෙහි ජනිත වන අපද්‍රව්‍ය සභාව ක්‍රියාත්මක කරන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහනට අනුව හා ඊට අදාළ වන්නා වූ ලිඛිත නීතීන්ට අනුව සිදු කිරීමට කටයුතු කල යුතුය.

46 පරිශ්‍රය තුල ජනනය වන අපද්‍රව්‍ය බලපත්‍රලාභියා විසින්ම කළමනාකරණය කරගනු ලබන්නේ නම්, ඊට අදාළ ප්‍රදේශය භාර මහජන සෞඛ්‍ය පරීක්ෂක දැනුවත් කලයුතු අතර, ඔහු විසින් ඒ සඳහා ලබාදෙන උපදෙස් වලට අනුකූලව ඒ සම්බන්ධයෙන් ක්‍රියා කල යුතුය.

47 පරිශ්‍රය තුල ප්‍රමාණවත්  ප්‍රථමාධාර පහසුකම් සපයා තිබිය යුතුය.

48 කිසියම් වසංගත තත්වයක් මත සමාජය තුල අත් වැසුම් මුඛ වැසුම් භාවිතා කිරීමට උපදෙස් ලබාදී තත්වයකදී, පරිශ්‍රයට පැමිණෙන කිසියම් තැනැත්තෙකු තමන් පැලඳ සිටින මුඛ වැස්මක් හෝ අත් වැස්මක් පරිශ්‍රය තුල බැහැර කරනු ලබන්නේ නම් එසේ බැහැර කරන මුඛ වැස්ම හෝ අත් වැසුම් ඒ සඳහාම පරිශ්‍රය තුල නිශ්චිතව තබා ඇති සංවෘත බඳුන්වලට බැහැර කිරීමට සැලැස්විය යුතු අතර, එසේ බැහැර කරන අපද්‍රව්‍ය වෙනත් අපද්‍රව්‍ය සමඟ මිශ්‍ර කිරීමකින් තොරව සභාව ඊට අදාළව ක්‍රියාත්මක කරන කසල කලමනාකරණ වැඩසටහනට හා උපදෙස්වලට අනුකූලව බැහැර කිරීමට සැලැස්විය යුතුය.

49 පරිශ්‍රය තුල ආහාර පරිහරණයෙහි යෙදෙන සෑම අයෙක්ම එසේ ආහාර පරිහරණයෙහි යෙදීමේදී උපරිම පිරිසිදු භාවයකින් සිටිය යුතු අතර සෑම විටම හිස් ආවරණ අත් වැසුම් හා මුඛ ආවරණ, පාවහන් පැළඳ සිටිය යුතු අතර සුදුසු සෞඛ්‍ය ආරකෂිත ඇඳුමක් අ◌ැඳ සිටිය යුතුය.

50 කිසියම් බෝවන රෝගයකින් පෙලෙන හෝ එවැනි රෝගයක් වැළඳී ඇති බවට සැක කරන හෝ එවැනි රෝගවාහකයකු හෝ ආසාදනය වී ඇති තුවාල, සමේ ආසාදන හෝ වෙනත් බෝවන රෝගයකින් පෙළෙන තැනැත්තෙකුව පරිශ්‍රයෙහි සේවය සඳහා යොදවා නොගත යුතුය.

(51) උත්සව ශාලා පිහිටි පරිශ්‍රය තුල ආහාර පරිහරණය කිරීම සම්බන්ධයෙන් කටයුතු කරන සෑම තැනැත්තෙක්ම ආහාර දූෂනය වීමට හේතුවන ආකාරයට දුම්බීම, කෙල ගැසීම, කැස්ස, කිවිසුම් යැවීම, නාසය ස්පර්ශ කිරීම, වැනි ක්‍රියාවල නොයෙදිය යුතුය.

(52) පරිශ්‍රයෙහි උත්සව අවස්ථා සඳහා කිසිදු අවස්ථාවක යම් බෝවන රෝගී තත්වයකින් හෝ වසංගත රෝගී තත්වයකින් පෙළෙතැයි සිතිය හැකි තරම් කරුණු ඇති කවර හෝ තැනැත්තෙකු ඇතුලත් කර නොගත යුතුය.

(53) උත්සව ශාලා පිහිටි පරිශ්‍රයෙහි ආහාර පරිභොජනය සඳහා පැමිණෙන යම් තැනැත්තෙකුට හෝ පරිශ්‍රයෙහි සේවයෙහි යෙදෙන්නෙකුට බෝවන, ස්පර්ශයෙන් බෝවන, හෝ චර්මගත රෝගී තත්වයක් වැළඳුනහොත් ඒ බව බලපත්‍රලාභියා විසින් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත දැනුම් දිය යුතු අතර, එසේ දැනුම් දීමෙන් පසු සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී හෝ ඔහු විසින් බලය පවරන ලද මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකු විසින් ලබාදෙන නිරෝධායක උපදෙස්වලට අනුකූලව පරිශ්‍රයට අදාළ සියළුම අය ක්‍රියාකල යුතුය

(54) උත්සව ශාලා පිහිටි පරිශ්‍රය නිරෝධායක ක්‍රියාවලියට යටත්කර ඇති විටක එකී නිරෝධායක කාලය අවසන් බවට වූ සහතිකයක් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකයෙකු විසින් නිකුත් කරනු ලැබීමෙන් පසු හා පරිශ්‍රය සම්පූර්ණයෙන් විෂබීජ හරණය කරන තෙක් කිසිදු උත්සව කටයුත්තක් සඳහා පරිශ්‍රය යොදා නොගත යුතුය.

(55) උත්සව ශාලා තුල ආහාර පරිහරණයෙහි යෙදෙන හා ආහාර පරිභොජනයේ යෙදෙන සෑම තැනැත්තෙකුටම පරිශ්‍රය තුල ක්‍රියාත්මක වන සෞඛ්‍ය ආරක්ෂක පියවර සම්බන්ධව දැන ගැනීමට හැකිවන පරිදි, ඊට අදාළ උපදෙස් පරිශ්‍රය තුල ප්‍රකටව පෙනෙන පරිදි ප්‍රදර්ශනය කල යුතු අතර ඊට අනුකූලව ක්‍රියා කල යුතුය.

(56) පරිශ්‍රය තුල සේවයේ නියුතු සේවකයින් සම්බන්ධයෙන් සියලු තොරතුරු බලපත්‍රලාභියා විසින් සභාපතිවරයාට ඉදිරිපත් කර තිබිය යුතුය.

12 බලප්‍රදේශය තුල වසංගත තත්වයක් පැතිර යාමට හේතුවිය හැකි කරුණු සැලකිල්ලට ගනිමින් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී උපදෙස් පරිදි පරිශ්‍රය පවත්වාගෙන යාමට අදාළව බලපත්‍රලාභියා විසින් එකඟතා ප්‍රකාශයකට ඇතුලත් විය යුතුයැයි සභාපතිවරයා විසින් නියමකර ඇති විටකදී බලපත්‍රලත් තැනැත්තා සභාපතිවරයා සමඟ එකඟතා ප්‍රකාශයකට ඇතුලත් විය යුතු අතර සභාපතිවරයා විසින් එහි පිටපතක් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත යොමුකල යුතුය.

13 බල ප්‍රදේශයට අදාලව කිසියම් වසංගත රෝගී තත්වයක් සම්බන්ධයෙන් නිරෝධායක හා වසංගත රෝග ආඥා පනත යටතේ නියෝගයක් බලපැවැත්වෙන අවස්ථාවක එම නියෝගයෙහි සඳහන් සෑම නියමයකටම අනුකූලව පරිශ්‍රය පවත්වා ගත යුතුය.

*පරිශ්‍රයට ඇතුළත් වීමේ බලය*

14 මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධානයන්ට අනුකූලව පරිශ්‍රය පවතින්නේද යන්න පරීක්ෂා කිරීම සඳහා සභාපතිවරයා විසින් ඒ සඳහා බලය පවරන ලද මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකු හෝ වෙනත් යම් නිලධාරියෙකු ඕනෑම සාධාරණ වේලාවක පරිශ්‍රයට ඇතුළු වීමට, අවශ්‍ය නියැදි ලබා ගැනීම නීත්‍යානුකූල වන්නේය.

15 (1) මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලත් පරිශ්‍රයක් යටතේ මෙම අතුරු ව්‍යවස්ථාවේ සදහන් කොන්දේසි උල්ලංඝනය කරමින් හෝ ඊට පටහැනි වන පරිදි කටයුතු වන අවස්ථාවක අතුරු ව්‍යවස්ථාවට අනුකූල වීම සඳහා දින තිහකට නොවැඩි නිශ්චිත කාලයක් දන්වමින් දැන්වීමක් සභාපතිවරයා විසින් බලපත්‍රලාභියා වෙත භාරදිය යුතුය.

(2) මෙම වගන්තිය යටතේ වූ දැන්වීමක් බලපත්‍ර ලාභියා වෙත භාරදීමෙන් පසු, අදාල දැන්වීමේ සදහන් නියමයන්ට අනුකූලව ක්‍රියාකිරීම සඳහා තවදුරටත් අතිරේක කාලයක් ලබාදෙන ලෙසට සාධාරණ හේතු දක්වමින් කරනු ලබන ඉල්ලීමක් මත සභාපති වරයාවිසින් අතිරේක කාලයක් ලබාදිය හැකිය.එසේ ලබාදෙන කාලය පළමු දැන්වීමේ සදහන් කාලයට අතිරේකව දින දහ හතරක උපරිම කාලයකට යටත්ව විය යුතුය.

16 ඉහත 15 වගන්තිය යටතේ ලබාදෙන කාල සීමාව තුළ හෝ අතිරේක කාල සීමාව තුළ දැන්වීමට අනුකූලව ක්‍රියා කිරීම බලපත්‍රලාභියා විසින් පැහැර හැර ඇති අවස්ථාවක සභාපතිවරයා විසින් අදාල බලපත්‍රය අවලංගු කල යුතුය.

17 **මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ලබා ගත යුතු බලපත්‍රයකින් තොරව හෝ අතුරු ව්‍යවස්ථාව යටතේ කරනු ලබන නියමයන් කඩකරමින් පරිශ්‍රයක් පවත්වාගෙන යාම වරදක් වන අතර එම වරද සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් වරදකරුවෙකු කිරීමෙන් පසු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(2) උප වගන්තිය යටතේ දඩුවමකට යටත් විය යුතුය. තවද එලෙස වරදකරුවෙකු වීමෙන් පසු තවදුරටත් එකී කඩකිරීම, උල්ලංඝණය නිරන්තරයෙන්ම කරගෙන යනු ලබන විට සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් දැන්වීමක් භාර දීමෙන් පසු උල්ලංඝණ තව දුරටත් නොකඩවා කරගෙන යන සෑම දිනකට ඉහතකී 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(2) උප වගන්තියේ සදහන් අතිරේක දඩයකට යටත් විය යුතුය.** *දණ්ඩනය*

18. මෙම අතුරු ව්‍යවස්ථාවේ පද සම්බන්ධයෙන් අන්‍ය අර්ථයක් අවශ්‍ය වන්නේනම් මිස මෙම අතුරුව්‍යවස්ථාවේ,

"සභාව" යන්නෙන් කළුතර **ප්‍රාදේශීය** සභාවද,

"සභාපති" යන්නෙන් කළුතර **ප්‍රාදේශීය** සභාවේ තත්කාලයෙහි සභාපති ධූරය දරන හෝ එම ධූරයේ කාර්යය කර්තව්‍ය ඉටුකරන අයද,

"සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී" යන්නෙන් **ප්‍රාදේශීය** සභා බල ප්‍රදේශයට අදාල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාසය සඳහා එම තනතුර දරන අයද,

"මහජන සෞඛ්‍ය පරීක්ෂක" යන්නෙන් **ප්‍රාදේශීය** සභා බල ප්‍රදේශයට අදාලව සේවයේ යෙදෙන **ප්‍රාදේශීය** සභාවේ හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයට අනුයුක්තව මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුර දරන අයෙක්ද, *අර්ථ නිරූපනය*

"බලපත්‍රලාභියා" යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලබාගත් ආයතනයක් ,තැනැත්තෙක් හෝ පුද්ගලයෙක්ද ,

"බලයලත් නිලධාරියා" යන්නෙන් තත්කාලයෙහි **ප්‍රාදේශීය** සභාවේ සභාපතිවරයා විසින් බලය පවරන ලද නිලධාරීයාද,

"දූහනය වීම" යන්නෙන් ආහාර ද්‍රව්‍යකට කිසිදු දූහක ද්‍රව්‍යයක් ඇතුල්වීම හෝ හටගැනීමද,

"විෂබීජ නාශක" යන්නෙන් ආහාරවල ආරක්ෂාව හෝ යෝග්‍යබව අඩුනොකරන මට්ටමකට පරිසරයෙහි ඇති ක්ෂුද්‍ර ජීවීන් ප්‍රමාණය රසායනික කාරකයන් මගින් හෝ භෞතික ක්‍රමයකින් අඩු කිරීමද,

"ආහාර ස්වස්ථතාවය" යන්නෙන් ආහාරදාමයේ සියළු අවස්ථාවලදී ආහාරවල සුරක්ෂිතබව හා සුදුසු බව සහතික කිරීම සඳහා සියළු තත්වයන්, පියවර සහ පරිචයද,

"උපද්‍රව" යන්නෙන් අහිතකර සෞඛ්‍ය බලපෑමක් සිදු කිරීමේ ඉඩ ඇති යම් ජීව විද්‍යාත්මක , රසායනික විද්‍යාත්මක කාරකයක් හෝ තත්වයක්ද,

"ආහාරවේල ආරක්ෂාව" යන්නෙන් ආහාර සකස්කරන, පිරිසැකසුම් කරන, විකුණුම් කරන ගබඩා කරන ප්‍රවාහනය කරන, අවස්ථාවලදී හෝ අනුභව කරන විට පාරිභෝගිකයාට යම් උපද්‍රවයක් නොවීමේ වගකීමද,

" සාධාරණ වෙලාව" යන්නෙන් බලපත්‍රලත් කර්තව්‍ය හෝ ඊට අදාළ කාර්යයෙහි නිරතවන ඕනෑම වෙලාවක්ද,

" මූලික නීතිය" යන්නෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත අදහස් වෙයි.

*පාඨ අතර අනනුකූලතාවය*

19 මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල හා ඉංග්‍රීසි,දෙමළ පාඨ අතර අනනුකූලතාවයන් හටගතහොත් එවිට සිංහල පාඨය ප්‍රමුඛ වෙයි.

## උපලේඛනය

**.......................... වර්ෂය සඳහා හෝටලයක් පවත්වාගෙන යාමට අදාළ වු බලපත්‍රය ලබාගැනීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය.**

01. ඉල්ලුම්කරුගේ නම : -
02. පෞද්ගලික ලිපිනය : -
03. ජාතික හැඳුනුම්පත් අංකය : -
04. දුරකථන අංකය : -
05. ආරම්භක වර්ෂය : -
06. ව්‍යාපාරික ස්ථානයේ ලිපිනය : -
07. ග්‍රාම නිලධාරී කොට්ඨාසය : -
08. වරිපනම් අංකය: -
09. ව්‍යාපාරය නාම ලියාපදිංචිය ලබාගෙන ඇත්නම් එහි යොමු අංකය හා ව්‍යාපාර නාමය:-
10. ව්‍යාපාර ස්ථානයේ කළමනාකරුගේ හෝ නියෝජිතයාගේ,
    I. නම හා පෞද්ගලික ලිපිනය
    II. ජාතික හැඳුනුම්පත් අංකය
    III. දුරකථන අංකය ජංගම :- ස්ථාවර :-
11. ව්‍යාපාරයට අදාළ ඉදිකිරීම් අනුමත කරන සැළැස්මේ අංකය හා දිනය :-
    ( පිටපත් ඇමිණිය යුතුය )

ඉහත තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

දිනය:- .....................................

ඉල්ලුම්කරුගේ අත්සන

■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■

<u>කාර්යාලීය ප්‍රයෝජනය සඳහා</u>

ආදායම් පරීක්ෂක,

පසුපිටේ සඳහන් ඉල්ලුම්පත්‍රයට අදාළව බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා වන ඔබගේ නිරීක්ෂණ හා නිර්දේශ කඩිනමින් මා වෙත ලබා දෙන ලෙස කාරුණිකව ඉල්ලමි.

දිනය:- .................................

ලේකම්

---

ලේකම්,

බලපත්‍රය ලබා දීම නිර්දේශ කරමි./නොකරමි.

දිනය :- ……………………………….

ආදායම් පරීක්ෂක

---

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී,

පසුපිටේ සඳහන් ඉල්ලුම් පත්‍රයට අදාළව බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා වන ඔබගේ නිරීක්ෂණ හා නිර්දේශ කඩිනමින් ලබාදෙන මෙන් කාරුණිකව ඉල්ලමි.

දිනය :- .................................

ලේකම්

---

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී,

අතුරු ව්‍යවස්ථා හා අනෙකුත් නීති රීතිවලට අනුකූලව සුදුසුකම් සපුරා ඇත. බලපත්‍ර නිකුත් කිරීම නිර්දේශ කිරීම සඳහා වාර්තා කරමි.

දිනය :- .................................

---

ලේකම්,

ඉහත ඉල්ලුම්පත්‍රයට අනුව ස්ථානය සඳහා බලපත්‍රයක් නිකුත් කිරීම නිර්දේශ කරමි. (නිර්දේශ නොකරන්නේනම් ඊට අදාළ හේතුව සඳහන් කරන්න.

දිනය :- .................................

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී

## පොළ පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1. මෙම අතුරුව්‍යවස්ථාව කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන පොදු හෝ පෞද්ගලික වෙළඳ පොලවල් විධිමත් කිරීම හා අධීක්ෂණය කිරීම සඳහා පනවනු ලැබේ.

*ලුහුඬු නාමය*

2. මෙම අතුරුව්‍යවස්ථාව කළුතර ප්‍රාදේශීය සභාවේ පොළ පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වෙයි.

*නෛතික බලය*

3. මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීමට **1987 අංක 15** දරන ප්‍රාදේශීය **සභා ආඥා පනතේ 126 (XII) වගන්තිය සමඟ කිය විය යුතු එම පනතේ 122** උපවගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට ලැබී ඇත.

4. මෙම අතුරුව්‍යවස්ථාවේ කාර්යය සඳහා කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ තුළ ( මෙහි මින්මතු බල ප්‍රදේශය යනුවෙන් හඳුන්වනු ලබන ) පිහිටියා වූ කළුතර ප්‍රාදේශීය සභාව විසින් හෝ වෙනත් කවර හෝ පාර්ශවයක් විසින් හෝ පොදු මහජනයා වෙනුවෙන් භාණ්ඩ හෝ ද්‍රව්‍ය අලෙවිය හා මිලදී ගැනීම වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන පොදු හෝ පෞද්ගලික වෙළඳ පොලක් අදහස් කෙරේ.

*වෙළඳපොළ භාරකරුවකුගේ කළමනාකාරීත්වය යටතේ විය යුතු බව*

5. බල ප්‍රදේශය තුළ පිහිටියා වූ සෑම පොදු වෙළඳ පොළක් හා පෞද්ගලික වෙළඳ පොළක්ම, (මෙහි ඇතැම් තැනක පරිශ්‍රය යනුවෙන්ද හඳුන්වනු ලබන) වෙළඳ පොළ භාරකරුවකුගේ කළමනාකාරීත්වය යටතේ පවත්වාගත යුතුය.

*පොදු හා පෞද්ගලික පොළක් සඳහා අවශ්‍යතා*

6. බල ප්‍රදේශය තුළ පිහිටුවා පවත්වාගෙන යන සෑම පොදු වෙළඳ පොළක් හා පෞද්ගලික වෙළඳ පොළක් සම්බන්ධයෙන් ම පහත සඳහන් අවශ්‍යතා සම්පූර්ණ වන පරිදි ඉදිකර තිබිය යුතුය.

(1) පරිශ්‍රයට අදාල ස්ථිර ගොඩනැඟිලි 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනත යටතේ හෝ නිවාස හා නගර සංවර්ධන ආඥා පනතේ විධිවිධානයන්ට අනුකූල වන ලෙස කරන ලද ඉදිකිරීම් විය යුතුය.

(2) පරිශ්‍රය තුළ ඉදිකිරීම් ස්ථිර ඉදිකිරීම් ද්‍රව්‍යයන්ගෙන් මනා ලෙස තනා තිබිය යුතු අතර, එය යහපත් තත්ත්වයෙන් පවත්වාගෙන යා යුතුය.

(3) පරිශ්‍රය තුළ සෑම ස්ථිර ඉදිකිරීමකටම අදාළව භාණ්ඩ හා ද්‍රව්‍ය තබා අලෙවි කිරීම සඳහා වේදිකා තිබිය යුතු අතර, වේදිකා ඉදිරිපස භාණ්ඩ මිලදී ගන්නන් සඳහා ගමන් කළ හැකි වන පරිදි ප්‍රමාණවත් ඉඩක් සහිතව සකසා තිබිය යුතුය.

(4) පරිශ්‍රය තුළ ස්ථිර ලෙස ඉදිකර ඇති ඉදිකිරීම් යටතේ සෑම වෙළඳ කුටියක්ම අවම වශයෙන් වර්ග මීටර් දෙකක පළලකින් යුක්ත වන පරිදි විය යුතුය.

(5) පරිශ්‍රයට අදාළ සියළු ගොඩනැඟිලි ආබාධිත හා විශේෂ අවශ්‍යතා ඇති අයට පිවිසීමේ පහසුකම් සහිතව ඉදිකර තිබිය යුතුය.

(6) පරිශ්‍රය තුළ සියළු ඉදිකිරීම්, ආරක්ෂිතව ඉදිකරන ලද ඒවා විය යුතු අතර, පරිශ්‍රය තුළ සියළුම ඉදිකිරීම් ද්‍රව්‍ය වල ජීවීන් රඳා නොසිටිය යුතු අතරම, ආහාර හෝ වෙළඳ ද්‍රව්‍ය වලට නුසුදුසු ද ප්‍රේෂණය නොවන මෙන්ම විෂ වායු පිට නොවන ද්‍රව්‍යයන්ගෙන් තනා තිබිය යුතුය.

(7) පරිශ්‍රය තුළ හරස් දූෂනය වැලැක්වෙන පරිදි වෙන් කිරීමට, බෙදීමට, ස්ථානගත කිරීමට හැකිවන පරිදි පරිශ්‍රයෙහි ගොඩනැඟිලිවල අභ්‍යන්තර පිරිසැකැස්ම සකස් වී තිබිය යුතුය.

(8) පරිශ්‍රයට රැගෙන එන වෙළඳ ද්‍රව්‍ය ගෙන ඒමේ සිට විකිණීම දක්වා වූ ක්‍රියාවලියෙහි ස්වස්ථතායික මෙහෙයුම් විධිමත් පරිදි ක්‍රියාත්මක කිරීමට හැකිවන පරිදි පරිශ්‍රයෙහි අභ්‍යන්තර ව්‍යුහය සකස් වී තිබිය යුතුය.

(9) පරිශ්‍රයට වෙළඳ ද්‍රව්‍ය රැගෙන පැමිණෙන වාහන නිසි ආකාරයට පරිශ්‍රයට ඇතුළු වීමට පහසුකම් තිබිය යුතු අතර, පරිශ්‍රයට ඇතුළු කරන මෝටර් වාහන හේතුකොටගෙන පරිශ්‍රය තුළ ඇති ආහාරමය වෙළඳ ද්‍රව්‍ය කිසිදු ආකාරයකින් දූහනය නොවිය යුතුය.

(10) පරිශ්‍රය තුළට බඩු රැගෙන එන වාහන සහ පාරිභෝගිකයින් සඳහා වාහන නතර කර තැබීම සඳහා ප්‍රමාණවත් ඉඩ පහසුකම් තිබිය යුතුය.

(11) පරිශ්‍රය තුළ ජලය රැඳී නොසිටින ලෙස බිම සකස් කර තිබිය යුතු අතර, පරිශ්‍රය තුළ ඇති සියළුම කාණු අපජලය සහ වැසි ජලය පහසුවෙන් ගලායාහැකි පරිදි සකස් වී තිබිය යුතුය.

(12) පරිශ්‍රය තුළ අපජලය යොමු කිරීම සඳහා පූතික වළවල් උරාගැනීමේ වලවල් අනුමත සැළැස්මකට අනුව ඉදිකර තිබිය යුතු අතර, ඒවා ජල මූලාශ්‍රයක් ඇත්නම් එය අවම වශයෙන් මීටර් 15.25ක දුරකින් පිහිටා තිබිය යුතු අතර, එය පිටතට නිරාවරණය නොවිය යුතුය.

(13) පරිශ්‍රය තුළ ප්‍රමාණවත් පරිදි වැසිකිළි හා කැසිකිළි පහසුකම් සපයා තිබිය යුතු අතර, ඒවා ස්ත්‍රී හා පුරුෂ වශයෙන් වෙන් වෙන් ව පවත්වා ගත යුතුය. පරිශ්‍රය තුළ පවත්වාගෙන යනු ලබන පොදු වැසිකිළි සම්බන්ධයෙන් පොදු වැසිකිළි සම්බන්ධයෙන් වූ අතුරුව්‍යවස්ථාවේ විධිවිධාන අවශ්‍ය වූ මද වෙනස්කම් සහිතව අදාළ විය යුතුය.

(14) පරිශ්‍රය තුළ ප්‍රමාණවත් දුරස්ථභාවයක් පවත්වා ගනිමින් භාණ්ඩ අලෙවි කිරීමට හා භාණ්ඩ මිලදී ගැනීමට හැකිවන පරිදි අවශ්‍ය ඉඩ පැවතිය යුතු අතර, පරිශ්‍රය තුළ මෙහෙයුම් සිදුකිරීමේදී පාරිභෝගිකයින්ට අපහසුතාවයක් ඇති නොවන පරිදි භාණ්ඩ එහා මෙහා ගෙනයාමට හැකිවන පරිදි අභ්‍යන්තර ව්‍යුහය සකස් කර තිබිය යුතුය.

(15) භාණ්ඩ තබා අලෙවි කිරීමට සකස් කර ඇති සෑම වේදිකාවක්ම සියුම් විවර නොවන, ජලාවරෝධක සහිත, යෙදිය හැකි මතුපිටික් සහිත විය යුතු අතර එය විෂබීජනාශක යොදා පහසුවෙන් පිරිසිදු කිරීමේ හැකියාවෙන් යුක්ත විය යුතුය.

(16) පරිශ්‍රය අලෙවිය සඳහා වන දේ අනුව කලාපවලට වෙන්කර තිබිය යුතු අතර, අදාල කලාපය තුල ඊට අදාලවන අලෙවි ද්‍රව්‍ය හැර වෙනත් දේ ප්‍රධාන වශයෙන් අලෙවි කිරීම සඳහා ක්‍රියා නොකල යුතුය.

(17) විකිණීම සඳහා කිසිදු ද්‍රව්‍යයක් හෝ භාණ්ඩයක් ඍජුව පොළව ස්පර්ශවන පරිදි තබා නොගත යුතු අතර සෑම විටම විකිණීම සඳහා තබා ඇති භාණ්ඩ පොළවට ප්‍රමාණවත් උසකින් යුක්තව රුඳවුමක් මත තබා අලෙවි කල යුතුය.

(18) පරිශ්‍රය තුල පාරිභෝගිකයන්ට භාණ්ඩ මිලදී ගැනීම සඳහා එහා මෙහා යාමට ප්‍රමාණවත් ඉඩ පහසුකම් ඉතිරි වන පරිදි අලෙවිය සඳහා ඉඩ වෙන් කර දීම පොළ භාරකරුවන්ගේ කාර්ය විය යුතුය.

(19) පරිශ්‍රය තුල භාණ්ඩ කිරුම් මිණුම් කටයුතු සඳහා භාවිතා කරන උපකරණ නිසි ප්‍රමිතියෙන් යුක්ත ඒවා විය යුතුය.

(20) පරිශ්‍රය තුල බල්ලන් පූසන් වැනි සතුන් ඒකරාශී වීමට හෝ රැඳීසිටීමට අවකාශ නොතිබිය යුතුය.

7. පරිශ්‍රය තුල මාළු විකිණීම සඳහා වෙන් කල කලාපය තුල ඒ සඳහා නිශ්චිත වෙළඳ කුටි ඉදිකර තිබිය යුතු අතර ඊට අදාලව පහත සඳහන් කරුණු සම්පූර්ණ විය යුතුය. *පරිශ්‍රය තුල මාළු විකිණීම*

(1). මාළු අලෙවිය සඳහා තබා තිබීම පිණිස ස්ථිර ද්‍රව්‍යයෙන් සකස් කරන ලද වේදිකා ඉදිකර තිබිය යුතු අතර එහි ජලය පහසුවෙන් ගලා යා හැකි පරිදි කාණු සකස් කර තිබිය යුතුය.

(2). මාළු ගබඩා කිරීම, ප්‍රදර්ශනය කිරීම, හා විකිණීම සිදුකරනු ලබන ස්ථානයන්හි සියළුම උපකරණවල ජීවීන් රඳා නොසිටිය යුතු අතර එම උපකරණවලින් මාළුවලට නුසුදුසු ද්‍රව්‍ය ප්‍රේශණය වීම හෝ විෂ සහිත වායූන් පිට නොවිය යුතුය.

(3). විකිණීමට තබා ඇති මාළුවලට ඉහලින් එල්ලා ඇති විදුලි බුබුළු සහ අනෙකුත් සවිකිරීම් ආරක්ෂක තත්ත්වයේ ඒවා විය යුතු අතර ඒවා ආවරණය කර තිබිය යුතුය.

(4). මාළු තබා අලෙවි කරන කොටස විෂබීජ නාශක යොදා පිරිසිදු කල හැකි තත්ත්වයෙන් පවත්වා ගත යුතු අතර සෑම වෙළඳ කාර්යක් ආරම්භ කිරීමට පූර්වයෙන් විෂබීජ නාශක යොදා පිරිසිදු කල යුතුය.

(5). මාළු විකිණීම සඳහා තබා ඇති ස්ථානය හා ඊට ඉහලින් ඇති කොටස් සහ මාළු සමඟ ස්පර්ශ වන කොටස් තුලින් කිසිදු ද්‍රව්‍යයක්, ද්‍රවයක් හෝ වායුවක් කාන්දු නොවන තත්ත්වයෙන් විය යුතු අතර කිසිදු ආකාරයකින් එහි තබා ඇති මාළු දූෂනය වීමක් සිදු නොවිය යුතුය.

(6). මාළු අලෙවි කුටි පිරිසිදු කිරීමෙන් හා භාවිතයෙන් ගලා එන ජලය ඒ සඳහා වෙන්වූ කාණු පද්ධතියක් යටතේ පූනිත වළකට හෝ උරා ගැනීම් වළකට යොමුකර තිබිය යුතු අතර, එම කාණු පරිශ්‍රයෙහි සෙසු කාණු සමඟ සම්බන්ධතාවයක් නොතිබිය යුතුය.

(7). මාළු විකිණීමේදී එහි රැස්වන අපද්‍රව්‍ය, පරිශ්‍රයෙහි වෙනත් අපද්‍රව්‍ය සමඟ මිශ්‍ර නොවන පරිදි සංවෘත කසළ රැඳවුම් තුල තාවකාලිකව එක්රැස් කොට ප්‍රාදේශීය සභාව ක්‍රියාත්මක කරන කසළ කළමනාකරණ වැඩසටහනට අනුව හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ උපදෙස් අනුව බැහැර කිරීම කළ යුතුය.

(8). මාළු විකිණීමට තබා ඇති ප්‍රමාණයට අතිරේක ප්‍රමාණයන් ගබඩා කිරීම සඳහා ශීතකරණ තිබිය යුතුය.

(9). මාළු ගබඩා කිරීම එම ස්ථානයෙහිම සිදුකරයි නම් ඒ සඳහා ප්‍රමාණවත් ශීතකරණ තිබිය යුතු අතර අඛණ්ඩ විදුලි සම්බන්ධතාවයක් යටතේ අදාල ශීතකරණ පවත්වා ගත යුතුය.

(10). ශීතකරණයෙන් පිටතට ගත් මාළු පරිසර උෂ්ණත්වයක් යටතේ පවත්වාගනිමින් නැවත ශීතකරණ යටතේ තබා අලෙවි කිරීමක් නොකළ යුතුය.

(11). මාළු අලෙවියේදී ඇසුරුම් ද්‍රව්‍ය කිසිදු ආකාරයකින් මුද්‍රිත කඩදාසි හෝ මාළු සමඟ සෘජුව ගැටෙන ඇසුරුම් ද්‍රව්‍යයන් භාවිතා නොකළ යුතුය.

(12). මාළු විකුණුම් ස්ථාන තුල මාළු තබාගැනීම, විකිණීමට අදාල භාණ්ඩ ඇතුළු එම ස්ථානයට අදාල උපකරණයන් නොවන භාණ්ඩයන් තබා ගැනීම නොකල යුතුය.

(13). මාළු අලෙවි කාර්යයෙහි යෙදෙන සියළු දෙනා සෝදා පිරිසිදු කරන ලද ඇඳුම් ඇඳ සිටිය යුතුය.

(14). මාළු විකිණීමට අදාලව පරිශ්‍රයක් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් වෙනත් කවර හෝ ලිඛිත නීතියක් යටතේ ලබාගත යුතු බලපත්‍රයක් වේ නම්, ඒ සෑම බලපත්‍රයක්ම පරිශ්‍රය තුල මාළු අලෙවියේ යෙදෙන්නා විසින් උපයාගෙන තිබිය යුතු අතර, ඒ කිසිදු විධිවිධානයක් මෙම විධිවිධාන තුලින් යටපත් වීමක් සිදුවූවායැයි නොසැලකිය යුතුය.

8 පරිශ්‍රය තුල මස් විකිණීමට වෙන්කල කලාපයක් පවත්වාගෙන යන්නේ නම් ඊට අදාලව නිශ්චිත වෙළඳ කුටි ඉදිකර තිබිය යුතු අතර ඒ සඳහා පහත සඳහන් කරුණු සම්පූර්ණ විය යුතුය.

***පරිශ්‍රය තුල මස් විකිණීම***

(1). අදාල වෙළඳ කුටි ඒ සඳහා වූ නිශ්චිත පරිශ්‍රයක් වශයෙන් සැලකිය හැකි පරිදි ඉදිකරන ලද ඒවා විය යුතු අතර, අදාල සෑම වෙළඳ කුටියක්ම මස් විකිණීමට අදාල ස්ථාන පවත්වාගෙන යාම සම්බන්ධයෙන් වූ ලිඛිත නීතීන්ට අනුකූලව බලපත්‍රයක් යටතේ පවත්වාගෙන යන ඒවා විය යුතුය.

(2) මස් ගබඩා කිරීම, ප්‍රදර්ශනය කිරීම, හා විකිණීම සිදුකරනු ලබන ස්ථානයන්හි සියළුම උපකරණවල ජීවීන් රඳා නොසිටිය යුතු අතර එම උපකරණවලින් මස්වලට නුසුදුසු ද්‍රව්‍ය ප්‍රේෂණය වීම හෝ විෂ සහිත වායූන් පිට නොවිය යුතුය.

(3). විකිණීමට තබා ඇති මස්වලට ඉහලින් එල්ලා ඇති විදුලි බුබුළු සහ අනෙකුත් සවිකිරීම් ආරක්ෂක තත්ත්වයේ ඒවා විය යුතු අතර ඒවා ආවරණය කර තිබිය යුතුය.

(4). මස් තබා අලෙවි කරන කොටස විෂබීජ නාශක යොදා පිරිසිදු කල හැකි තත්ත්වයෙන් පවත්වා ගත යුතු අතර සෑම වෙළඳ කාර්යක් ආරම්භ කිරීමට පූර්වයෙන් විෂබීජ නාශක යොදා පිරිසිදු කළ යුතුය.

(5). මස් විකිණීම සඳහා තබා අති ස්ථානය හා ඊට ඉහලින් ඇති කොටස් සහ මස් සමඟ ස්පර්ශ වන කොටස් තුලින් කිසිදු ද්‍රව්‍යයක්, ද්‍රවයක් හෝ වායුවක් කාන්දු නොවන තත්ත්වයෙන් විය යුතු අතර කිසිදු ආකාරයකින් එහි තබා ඇති මස් දූෂනය වීමක් සිදු නොවිය යුතුය.

(6). මස් අලෙවි කුටි පිරිසිදු කිරීමෙන් හා භාවිතයෙන් ගලා එන ජලය ඒ සඳහා වෙන්වූ කාණු පද්ධතියක් යටතේ පූතික වළකට හෝ උරා ගැනීම් වළකටයොමුකර තිබිය යුතු අතර, එම කාණු පරිශ්‍රයෙහි සෙසු කාණු සමඟ සම්බන්ධතාවයක් නොතිබිය යුතුය.

(7). මස් විකිණීමේදී එහි රැස්වන අපද්‍රව්‍ය, පරිශ්‍රයෙහි වෙනත් අපද්‍රව්‍ය සමඟ මිශ්‍ර නොවන පරිදි සංවෘත කසළ රැඳවුම් තුල තාවකාලිකව එක්රැස් කොට ප්‍රාදේශීය සභාව ක්‍රියාත්මක කරන කසළ කළමනාකරණ වැඩසටහනට අනුව හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ උපදෙස් අනුව බැහැර කිරීම කල යුතුය.

(8). මස් විකිණීමට තබා ඇති ප්‍රමාණයට අතිරේක ප්‍රමාණයන් ගබඩා කිරීම සඳහා ශීතකරණ තිබිය යුතුය.

(9). මස් ගබඩා කිරීම එම ස්ථානයෙහිම සිදුකරයි නම් ඒ සඳහා ප්‍රමාණවත් ශීතකරණ තිබිය යුතු අතර අඛණ්ඩ විදුලි සම්බන්ධතාවයක් යටතේ අදාල ශීතකරණ පවත්වා ගත යුතුය.

(10). ශීතකරණයෙන් පිටතට ගත් මස් පරිසර උෂ්ණත්වයක් යටතේ පවත්වාගනිමින් නැවත ශීතකරණ යටතේ තබා අලෙවි කිරීමක් නොකළ යුතුය.

(11) මස් අලෙවියේදී ඇසුරුම් ද්‍රව්‍ය කිසිදු ආකාරයකින් මුද්‍රිත කඩදාසි හෝ මස් සමඟ ඍජුව ගැටෙන ඇසුරුම් ද්‍රව්‍යයන් භාවිතා නොකළ යුතුය.

(12) මස් විකුණුම් ස්ථාන තුල මස් තබාගැනීම, විකිණීමට අදාල භාණ්ඩ ඇතුළු එම ස්ථානයට අදාල උපකරණයන් නොවන භාණ්ඩයන් තබා ගැනීම නොකල යුතුය.

(13) මස් අලෙවි කාර්යයෙහි යෙදෙන සියළු දෙනා සෝදා පිරිසිදු කරන ලද ඇඳුම් ඇඳ සිටිය යුතුය.

(14) මස් විකිණීමට අදාලව පරිශ්‍රයක් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් වෙනත් කවර හෝ ලිඛිත නීතියක් යටතේ ලබාගත යුතු බලපත්‍රයක් වේ නම්, ඒ සෑම බලපත්‍රයක්ම පරිශ්‍රය තුල මස් අලෙවියේ යෙදෙන්නා විසින් උපයාගෙන තිබිය යුතු අතර, ඒ කිසිදු විධිවිධානයක් මෙම විධිවිධාන තුලින් යටපත් වීමක් සිදුවූවායැයි නොසැලකිය යුතුය.

*පොදු කොන්දේසි*

9. පරිශ්‍රය තුල එළවළු සහ පළතුරු විකිණීම සඳහා තබා ඇති වේදිකා පොලොව මට්ටමෙන් අවම වශයෙන් සෙන්ටි මීටර 45 ක උසකින් යුක්ත විය යුතු අතර ඒ වූ වේදිකා නොමැති අවස්ථාවක ප්‍රමාණවත් උසකින් යුක්ත ධාරකයක් මත තබා අලෙවි කිරීම කළ යුතුය.

10. පරිශ්‍රය තුල අලෙවිකරණයෙහි යෙදෙන සෑම අයෙක්ම ප්‍රමිතිගත කිරුම් හා මිණුම් උපකරණ භාවිතා කළ යුතුය.

11. අලෙවිය සඳහා තබා ඇති එළවළු හා පළතුරු කිසිදු විටක නරක්වූ එළවළු හා පළතුරු සමඟ මිශ්‍රවන පරිදි පවත්වා නොගත යුතු අතර සෑම විටම නරක්වූ එළවළු හා පළතුරු බැහැර කිරීම සඳහා තබා ඇති බහාලුම් තුලට පමණක් ඒවා බැහැර කිරීම කළ යුතුය.

12. කිසිදු අවස්ථාවක නරක්වීමට හේතු වී ඇති එළවළු හා පළතුරු පරිභෝජනය සඳහා වෙනයම් ආකාරයකට සූදානම් කර පවත්වා ගැනීමට කටයුතු නොයෙදෙන බවට වෙළඳාමේ යෙදෙන සෑම අයකුම වගබලාගත යුතුය.

13. පරිශ්‍රයෙහි එළවළු හා පළතුරු සේදීම සඳහා බීමට ගත හැකි ජලය පමණක් භාවිතයට ගත යුතු අතර, ඒ සඳහා නිශ්චිතව වෙන්කර ඇති ස්ථානයක පමණක් අදාල සේදීම කළ යුතුය.

14. වෙළඳාම හේතු කොටගෙන ඒකරාශී වන අපද්‍රව්‍ය වෙළඳාම අවසානයේ පරිශ්‍රය තුල අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා තබා ඇති බහාලුම් තුලට හෝ ඒ සඳහා නිශ්චිත කර ඇති ස්ථානයට පමණක් බැහැර කිරීම ඒ ඒ අය විසින් සිදුකල යුතුය.

15. කිසිදු ආකාරයකින් ආහාර පිසීමක් හෝ ගිනි දැල්වීමක් හෝ වෙනත් ආකාරයකින් ආහාර සකස් කිරීමක් පරිශ්‍රයේ කවර තැනැත්තෙකු විසින් හෝ නොකළ යුතුය.

16. සකස් කර රැගෙන එන ආහාර පරිශ්‍රය තුල විකිණීමක් සිදුකරන විටදී ;

(1). ආහාර දූෂනය වීමේ අවදානම් ඇති ස්ථානයක ආහාර විකිණීමක් සිදු නොකළ යුතුය.

(2) සෑම විටම මුද්‍රා තබන ලද හෝ වාතය කාන්දු විය නොහැකි පරිදි ආවරණය කරන ලද බහාලුම් තබා ඇති ආහාර ද්‍රව්‍ය පමණක් අලෙවි කිරීම සඳහා ක්‍රියා කළ යුතුය.

(3) කිසිදු ආකාරයකින් විවෘත අවකාශයක තබා ගනිමින් ආහාර අලෙවි කිරීමක් නොකළ යුතුය.

(4) සකස් කරන ලද ආහාර පරිශ්‍රය තුල එහා මෙහා රැගෙන යමින් අලෙවි කිරීමක් නොකළ යුතුය.

(5) ආහාර අලෙවියෙහි යෙදෙන සෑම අයෙක්ම අත්වැසුම් භාවිතා කරමින් හා ආහාර ඇල්ලීම සඳහා වන අල්ලුවක ආධාරයෙන් පමණක් ආහාර ස්පර්ශ වන පරිදි අලෙවියෙහි යෙදිය යුතුය.

17. පරිශ්‍රය තුල කිසිදු තැනැත්තෙකු කවර ආකාරයකින් මත්පැන් පානය කිරීම හෝ එසේ පානය කර කටයුතු කිරීම හෝ දුම්පානය කිරීම නොකළ යුතුය.

18. පරිශ්‍රය තුල කිසිදු තැනැත්තෙකු අසභ්‍ය වචන ප්‍රකාශ කිරීම හෝ අසභ්‍ය ආකාරයට හැසිරීම නොකළ යුතුය.

19. කිසියම් බෝවන රෝගයකින් පෙළෙන හෝ එවැනි රෝගයක් වැළදී ඇති බවට සැක කරනු ලබන හෝ එවැනි රෝග වාහකයෙකු හෝ ආසාදනය වී ඇති තුවාල , සමේ ආසාදන, වණ, පාචනය වැනි රෝග වලින් පෙළෙන හෝ එවැනි අයකුට උවටැන් කරන ලද කිසිවකු පරිශ්‍රය තුල වෙළදාමේ නොයෙදිය යුතුය.

20. පරිශ්‍රය තුල ශබ්දවාහිණී යන්ත්‍ර යොදාගනිමින් ප්‍රචාරණයන් කිරීම හෝ සංගීතමය වැඩසටහන් ඉදිරිපත් කිරීම නොකළ යුතුය.

21. පරිශ්‍රය තුල කිසිදු තැනැත්තෙකු විසින් සිඟමන් යැදීම, සංදර්ශන පැවැත්වීම හෝ නොකළ යුතුය.

*වසංගත තත්ත්වයක් තුල පොදු වෙළඳපොළ පවත්වාගෙන යාම*

22. මෙම අතුරු ව්‍යවස්ථාවේ ඉහත වගන්තිවල කුමක් සඳහන් වුවද ශ්‍රී ලංකාව තුල කවර හෝ ප්‍රදේශයක හෝ බල ප්‍රදේශයක් තුල නිරෝධායන හා රෝග වැලැක්වීමේ ආඥා පනත යටතේ හා ඒ යටතේ සාදන ලද රෙගුලාසි යටතේ ප්‍රකාශිත හෝ කිසියම් වසංගත රෝගයක් ව්‍යාප්ත වීමට කරුණු යෙදී ඇති විට හෝ එසේ වේයැයි සැකකිරීමට තරම් කරුණු යෙදී ඇති විටක සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී උපදෙස් පරිදි සභාපතිවරයා විසින් පහත සඳහන් ක්‍රියාමාර්ග සියල්ලම හෝ කිහිපයක් හෝ පරිශ්‍රය භාවිතා කරන්නන් විසින් අනුගමනය කල යුතු බවට නියම කිරීම නීත්‍යානුකූල විය යුතුය

(1). පරිශ්‍රය තුල විවිධ ස්ථානයන්හි වෙළදාමේ යෙදෙන්නන්ගේ හා පාරිභෝගිකයන්ගේ දැත් සෝදා ගැනීම සඳහා ජල සැපයුම් සිදුකල යුතු බවට.

(2). පරිශ්‍රය තුල පොදු වැසිකිලි සාමාන්‍ය පිරිසිදු කිරීම්වලට අතිරේකව විෂබීජ නාශක යොදා නිරන්තරයෙන් පිරිසිදු කිරීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක විය යුතු බවට හා පොදු වැසිකිළිවල දෑත් පිරිසිදු කර ගැනීමේ සබන් හා විෂබීජ නාශක ප්‍රමාණවත්ව තබා තිබිය යුතු බවට.

(3). පරිශ්‍රය තුල පොදු වැසිකිළි තාවකාලිකව වසා තැබිය යුතු බවට.

(4). පරිශ්‍රයට ඇතුළුවීම හා පිටවීම පිවිසුම් හා පිටවීම් කිහිපයක් පවත්වා ගත යුතු බවට.

(5). එකිනෙකා අතර තබාගත යුතු අවම දුරක් නියම කරමින් වෙළදුන් හා පාරිභෝගිකයන් අතර අදාල අවම දුර පවත්වාගත යුතු බවට.

(6). පරිශ්‍රය තුල වාතාශ්‍රය හොඳින් ලැබෙන ආකාරයට වාතාශ්‍රය හොඳින් ගලා යන ආකාරයට බාධාවකින් තොරව පවත්වා ගත යුතු බවට.

(7). පරිශ්‍රයටඇතුළු වීමේදී කාණ්ඩ වශයෙන් වරකට ඇතුල්විය හැකි සංඛ්‍යාව සීමා කරමින් ඇතුළුවීම සඳහා අවස්ථාව සැලසිය යුතු බවට.

(8). පරිශ්‍රය තුල ශ්වසන ආචාරවිධි පවත්වා ගත යුතු බව උණ හෝ ස්වසන රෝග හෝ එවැනි තත්ත්වයකට සැක කළ හැකි කිසිවකු පරිශ්‍රයට ඇතුළු වීමට තහනම් බවට.

(9). පරිශ්‍රය තුල වෙළදාමේ යෙදෙන්නන් හා පරිහරණය කරන්නන් මුහුණු ආවරණ පැළඳ සිටිය යුතු බවට හා වෙළදාමේ යෙදෙන්නන් මුහුණු ආවරණ හා අත්වැසුම් පැළඳ සිටිය යුතුය .

(10) පරිශ්‍රය තුල අනුගමනය කල යුතු උපදෙස් ඇතුලත් දැන්වීම් පළකිරීම හා අවශ්‍යා වෙනත් ප්‍රචාරණයන් නිරන්තරයෙන්ම පරිශ්‍රය තුල පවත්වාගත යුතු බවට.

(11) පරිශ්‍රය තුල මුදල් ගණු දෙණු කිරීමේදී එම කාර්ය කිරීමට සෑම වෙළඳ කුටියකම නිශ්චිත අයකු කටයුතු කල යුතු බව හා ඔහු විසින් නිරන්තරනේ විෂබීජ නාශක යොදා දෑත් පිරිසිදු කිරීම සිදුකල යුතු බවට.

(12) පරිශ්‍රය තුල කිසිදු ආකාරයකින් කවර තැනැත්තෙකු වුවද ආහාර පරිභෝජනය නොකළ යුතු බවට.

(13) පරිශ්‍රය කොටස් වශයෙන් වෙන්කර සීමිත වෙළදාමක් සඳහා ක්‍රියා කළ යුතු බවට.

(14) කිසියම් කාලසීමාවක් සඳහා පරිශ්‍රය වෙළඳාමේ කටයුතු සඳහා පවත්වා යාම නොකල බවට.

*නියමයන්ට අනුකූල විය යුතු බව*

23. සභාපතිවරයා විසින් ඉහත වගන්තිය යටතේ නියමයන් කර ඇති විටකදී ඊට අනුකූලව ක්‍රියාකිරීමට පරිශ්‍රය භාවිතාකරන සියළුම දෙනා විසින් ක්‍රියා කල යුතුය.

24. ප්‍රාදේශීය සභාව සතු සෑම පොදු වෙළඳ පොළක් පෞද්ගලික වෙළඳ පොළක් සම්බන්ධයෙන් වන භූමි ප්‍රමාණයට අදාලව මායිම් උපලේඛනගතව තිබිය යුතුය.

25. ප්‍රාදේශීය සභා සභාවට අයත් පොදු වෙළඳ පොළක් වන විටදී,

(1) මෙම අතුරු ව්‍යවස්ථාවේ නියමයන්ට අනුකූලව එය පවත්වා ගෙන යාම සඳහා ගතයුතු සෑම පියවරක්ම නිසිආකාරයෙන් ක්‍රියාත්මක වන බවට පොල භාරකරු විසින් වගබලාගත යුතුය.

(2) ප්‍රාදේශීය සභාව තීරණය කරන පරිදි සභාව වෙනුවෙන් පොදු වෙළඳ පොළ පවත්වාගෙන යාම සඳහා නිසි ටෙන්ඩර් ක්‍රියාපටිපාටිය යටතේ හඳුනාගත් දෙවන පාර්ශවයන් වෙත පවරා දිය හැකිය.

(3) ප්‍රාදේශීය සභාව වෙනුවෙන් ගිවිසුම්ගත පාර්ශවයන් පොදු වෙළඳ පොළ පවත්වාගෙන යනු ලබන විටදී, මෙම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානයන්ට අනුකූලව එය පවත්වාගෙන යන්නේද පිළිබඳව සභාපතිවරයා විසින් නිශ්චිතව ඒ සඳහා බලය පවරන ලද නිලධාරියෙකු විසින් අධීක්ෂණය කල යුතුය.

*ගාස්තු තීරණය කිරීම*

26. (1) ප්‍රාදේශීය සභාව විසින් පොදු වෙළඳ පොළ පවත්වාගෙන යනු ලබන විටදී පරිශ්‍රය තුල කරන වෙළදාම සම්බන්ධයෙන් අයකල යුතු ගාස්තු සභාව විසින් තීරණය කරන පරිදි විය යුතුය.

(2) ඉහත (1) උප වගන්තිය යටතේ නියම කරනු ලබන ගාස්තු හා පොදු වෙළඳ පොළ වෙළෙන්දන් සඳහා ඉඩ වෙන්කිරීම ආදී සියළු කරුණු ඊට අදාලව ප්‍රාදේශීය සභාව පත්කරන කමිටුවක නිර්දේශ සැලකිල්ලට ගනිමින් සභාව තීරණය කල යුතුය.

*පෞද්ගලික වෙළඳපොළ සඳහා බලපත්‍රය*

27. බල ප්‍රදේශය තුල පවත්වාගෙන යනු ලබන සෑම පෞද්ගලික වෙළඳ පොළක්ම සභාපතිවරයා වෙතින් ඒ සඳහා ලබාගත යුතු බලපත්‍රයක් යටතේ මිස පවත්වාගෙන යා නොහැක.

28. බල ප්‍රදේශය තුල පවත්වාගෙන යනු ලබන සෑම පෞද්ගලික වෙළඳ පොළක්ම මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධානයන්ට අනුකූලවන්නේ නම් මිස බලපත්‍රයක් නිකුත් කිරීම නොකල යුතුය.

*බලපත්‍රයන් සඳහා ඉල්ලුම් කිරීම*

29. 27 වන වගන්තිය යටතේ බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කරන සෑම තැනැත්තෙක් ම මෙම අතුරුව්‍යවස්ථාවේ උපලේඛනය යටතේ වූ ඉල්ලුම්පත්‍රයකට අනුකූලව සභාපතිවරයා වෙතින් ඒ සඳහා ඉල්ලුම් කළ යුතුය.

30. ප්‍රාදේශීය සභාව වෙතින් ලබාගන්නා ඉල්ලුම් පත්‍රයක් සම්බන්ධයෙන් අයකළ යුතු ගාස්තු සභාව විසින් කලින් කල යෝජනා සම්මුතියක් මඟින් තීරණය කිරීම නීත්‍යානුකූල විය යුතුය.

31. 27 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් මෙම අතුරුව්‍යවස්ථාවේ සඳහන් විධිවිධාන අනුව කලින් අවලංගු නොකළහොත්, බලපත්‍රයට අදාළ වර්ෂයෙහි දෙසැම්බර් 31 වන දින දක්වා වලංගු විය යුතුය.

*බලපත්‍රයක් සඳහා ගාස්තු*

32. (1) මෙම අතුරුව්‍යවස්ථාව යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රයක් සඳහා අයකළ යුතු ගාස්තු මූලික නීතියේ සඳහන් විධිවිධානයන්ට යටත්ව, සභාව විසින් තීරණය කර ප්‍රකාශයට පත් කරන ගාස්තු විය යුතුය.

(2) බලපත්‍රයක් නිකුත් කිරීමට අදාළව ස්ථාන පරීක්ෂාවක් සඳහා වන පරීක්ෂණ ගාස්තුවක් සභාව විසින් තීරණය කර අයකිරීම නීත්‍යානුකූල විය යුතුය.

*පරීක්ෂා කිරීමේ බලය*

33. මෙම අතුරු ව්‍යවස්ථාවෙහි විධිවිධානයන්ට අනුකූලව පරිශ්‍රය පවතින්නේ ද යන්න පරීක්ෂා කිරීම සඳහා, සභාපතිවරයා විසින් ඒ සඳහා බලය පවරන ලද නිලධාරියෙකු පරිශ්‍රයට ඇතුල්වීම සහ අවශ්‍ය නියදි ලබා ගැනීම නීත්‍යානුකූල වන්නේය.

*බලපත්‍රයෙහි කොන්දේසි උල්ලංඝනය*

34. (1) මෙම අතුරුව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලත් පරිශ්‍රයක් යටතේ මෙම අතුරුව්‍යවස්ථාවේ සඳහන් කොන්දේසි උල්ලංඝනය කරමින් හෝ ඊට පටහැනි වන පරිදි කටයුතු වන අවස්ථාවක අතුරුව්‍යවස්ථාවට අනුකූල වීම සඳහා දින තිහකට නොවැඩි නිශ්චිත කාලයක් දක්වමින් දැන්වීමක් සභාපතිවරයා විසින් බලපත්‍රලාභියා වෙත භාරදිය යුතුය.

(2) මෙම වගන්තිය යටතේ වූ දැන්වීමක් බලපත්‍රලාභියා වෙත භාරදීමෙන් පසු අදාළ දැන්වීමේ සඳහන් නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම සඳහා තවදුරටත් අතිරේක කාලයක් ලබාදෙන ලෙසට සාධාරණ හේතු දක්වමින් කරනු ලබන ඉල්ලීමක් මත සභාපතිවරයා විසින් අතිරේක කාලයක් ලබාදිය හැකිය. එසේ ලබාදෙන කාලය පළමු දැන්වීමේ සඳහන් කාලයට අතිරේකව දින දාහතරක උපරිම කාලයකට යටත් විය යුතුය.

35. ඉහත 34 වගන්තිය යටතේ ලබා දෙන කාල සීමාව තුළ හෝ අතිරේක කාල සීමාව තුළ දැන්වීමට අනුකූලව ක්‍රියා කිරීම බලපත්‍රලාභියා විසින් පැහැර හැර ඇති අවස්ථාවක සභාපතිවරයා විසින් අදාළ බලපත්‍රය අවලංගු කළ යුතුව ඇත.

*දණ්ඩනය*

36. මෙම අතුරු ව්‍යවස්ථාවේ කවර හෝ විධිවිධානයක් උල්ලංඝණය කරමින් කටයුතු කිරීම හෝ මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ලබාගත යුතු බලපත්‍රයක් ලබාගැනීමෙන් තොරව පෞද්ගලික වෙළඳපොළක් පවත්වාගෙන යාම වරදක් වන අතර එම වරද සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් වරදකරුවෙකු කිරීමෙන් පසු **1987 අංක 15 දරණ** ප්‍රාදේශීය සභා **ආඥා පනතේ 122(2)** උප වගන්තිය යටතේ දඬුවමකට යටත් විය යුතුය.

37. මෙම අතුරුව්‍යවස්ථාවෙහි පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ,
" සභාව " යන්නෙන් කළුතර ප්‍රාදේශීය සභාවද,
" සභාපති " යන්නෙන් කළුතර ප්‍රාදේශීය සභාවේ තත්කාලයෙහි සභාපති ධූරය දරන තැනැත්තා හෝ එම ධූරයේ කාර්යය කර්තව්‍ය ඉටුකරන පුද්ගලයාද අදහස් වේ.
" බලය ලත් නිලධාරියා " ප්‍රාදේශීය
සභාවෙ සභාපතිවරයා විසින් ලිඛිතව ලබය පවරන ලද යම් නිලධාරියෙකු ද,
" දූහනය " යන්නෙන් ආහාර හෝ ආහාර ......... දූහන ද්‍රව්‍යයන් ඇතුල්වීම හෝ හට ගැනීම ද,
" ස්වස්ථතාවය " යන්නෙන් ආහාර දාමයක සියළු අවස්ථා වලදී ආහාර වල සුරක්ෂිත බව සහ සුදුසුබව සහතික කිරීම සඳහා අවශ්‍ය සියළු තත්ත්වයන් හා පරිචය ද, අදහස් වේ.

*පාඨ අතර අනනුකූලතාව*

38. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල හා ඉංග්‍රීසි, දෙමළ පාඨ අතර අනනුකූලතාවයන් හටගතහොත් සිංහල පාඨය අනුව වෙයි.

**උපලේඛනය**

**.......................... වර්ෂය සඳහා වෙළඳ බලපත්‍රය ලබාගැනීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය.**

01. ඉල්ලුම්කරුගේ නම : -
02. පෞද්ගලික ලිපිනය : -
03. ජාතික හැඳුනුම්පත් අංකය : -
04. දුරකථන අංකය : -
05. පොල පවත්වාගෙන යන ස්ථානයෙහි ලිපිනය : -
06. ආරම්භක වර්ෂය : -
07. පොළ පවත්වන ස්ථානයේ ලිපිනය : -
08. ග්‍රාම නිලධාරී කොට්ඨාසය : -
09. වරිපනම් අංකය: -

ඉහත තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

ඉහත තොරතුරු සඳහන් කරුණු සැලකිල්ලට ගෙන පෞද්ගලික පොළ පවත්වාගෙන යන ස්ථානය සඳහා ........................... වර්ෂය වෙනුවෙන් වෙළඳ බලපත්‍රයක් මා වෙත නිකුත් කරන ලෙස ඉල්ලමි..

දිනය:- ......................................

ඉල්ලුම්කරුගේ අත්සන

---

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

ආදායම් පරීක්ෂක,

පසුපිටේ සඳහන් ඉල්ලුම්පත්‍රයට අදාළව බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා වන ඔබගේ නිරීක්ෂණ හා නිර්දේශ කඩිනමින් මා වෙත ලබා දෙන ලෙස කාරුණිකව ඉල්ලමි.

දිනය:- .................................

ලේකම්

---

ලේකම්,

බලපත්‍රය ලබා දීම නිර්දේශ කරමි./නොකරමි.

දිනය :- ...................................

ආදායම් පරීක්ෂක

---

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී,
පසුපිටේ සඳහන් ඉල්ලුම් පත්‍රයට අදාළව බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා වන ඔබගේ නිරීක්ෂණ හා නිර්දේශ කඩිනමින් ලබාදෙන මෙන් කාරුණිකව ඉල්ලමි.

දිනය :- .................................

ලේකම්

---

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී,
අතුරු ව්‍යවස්ථා හා අනෙකුත් නීති රීතිවලට අනුකූලව සුදුසුකම් සපුරා ඇත. බලපත්‍ර නිකුත් කිරීම නිර්දේශ කිරීම සඳහා වාර්තා කරමි.

දිනය :- .................................

මහජන සෞඛ්‍ය පරීක්ෂක

---

ලේකම්,
ඉහත ඉල්ලුම්පත්‍රයට අනුව අදාළ ස්ථානය සඳහා බලපත්‍රයක් නිකුත් කිරීම නිර්දේශ කරමි. / නොකරමි.
(නිර්දේශ නොකරන්නේ නම් ඊට අදාළ හේතුව සඳහන් කරන්න).

දිනය :- .................................

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී

## භෝජනාගාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1. මෙම අතුරු ව්‍යවස්ථාව කළුතර ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුල බේකරි හා වෙනත් ආහාර සකස් කරමින් අලෙවි කරන සහ පිසින ලද ආහාර තේ, කෝපි වැනි දෑ පරිභෝජනය සඳහා පහසුකම් සපයන භෝජනාගාර, හෝටල් , ආපන ශාලා ඇතුළු අවන්හල් විධිමත් කිරීම අධීක්ෂණය කිරීම සඳහා පනවනු ලබයි.

*ලුහුඬු නාමය* 2. මෙම අතුරු ව්‍යවස්ථාව කළුතර ප්‍රාදේශීය සභාවේ පිහිටි භොජනාගාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

3. මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීමට **1987 අංක 15 දරන** ප්‍රාදේශීය සභා **ආඥා පනතේ 126 (ix) වගන්තිය සමග කියවිය යුතු එම ආඥා පනතේ 122** උපවගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට බලය ලැබී ඇත.

*බලපත්‍රයක් ලබා ගත යුතු බව* 4. කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය (මෙහි මින්මතු බලප්‍රදේශය යනුවෙන් හඳුන්වනු ලබන) තුල කිසිදු තැනැත්තෙකු විසින් සභාපතිවරයා වෙතින් මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ලබාගත් බලපත්‍රයක් යටතේ මිස ( මෙහි ඇතැම් තැනෙක පරිශ්‍රය යනුවෙන් හඳුන්වනු ලබන) බේකරි හා වෙනත් ආහාර සකස් කරමින් අළෙවි කරන සහ පිසින ලද ආහාර තේ, කෝපි වැනි දෑ පරිභෝජනය සඳහා පහසුකම් සපයන භෝජනාගාර, හෝටල් , ආපන ශාලා, අවන්හල් පවත්වාගෙන යාම නොකළ යුතුය.

*බලපත්‍රයක් ඉල්ලුම් කිරීම* 5. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ඉල්ලුම් කරන සෑම තැනැත්තෙක්ම මෙම අතුරු ව්‍යවස්ථාවේ උපලේඛනයට සාරානුකූලව පිළියෙල කරන ලද ඉල්ලුම් පත්‍රයක් යටතේ ඒ සඳහා ඉල්ලුම් කළ යුතුය.

6. ඉහත වගන්තිය යටතේ වූ ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කිරීම, ඒ සඳහා අවශ්‍යතා සම්පූර්ණ කර ලියාපංදිචි තැපෑලෙන් සභාපති වෙත යොමු කිරීමෙන්, ගෙනවිත් භාර දීමෙන් , හෝ සභාව අවසර දී ඇති ප්‍රමාණයට විද්‍යුත් තැපෑලෙන් යොමු කිරීමෙන් ඉදිරිපත් කල හැකිය.

7. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ඉල්ලුම් කරන සෑම තැනැත්තෙකුම මෙහි පහත සදහන් කොන්දේසි සම්පූර්ණ කර ඇත්තේනම් මිස සභාපතිවරයා විසින් බලපත්‍රයක් නිකුත් කිරීම නොකල යුතුය.

බලපත්‍රයක් සඳහා කොන්දේසි

(1) පරිශ්‍රයට අදාල සියළු ඉදිකිරීම් අවස්ථාවෝචිත පරිදි 1978 අංක 41දරන නාගරික සංවර්ධන අධිකාරී පනත යටතේ හෝ නිවාස හා ප්‍රාදේශීය සංවර්ධන ආඥා පනතේ විධිවිධානයන්ට අනුකූලව කරන ලද ඉදිකිරීම් විය යුතු අතර එහි, (අ) සියලුම ඉදිකිරීම් සඳහා යොදාගෙන ඇති ද්‍රව්‍ය විෂ සහිත ද්‍රව්‍ය බාහිරට මුදා නොහැරෙන හා විෂ සහිත වායූන් ප්‍රේෂණය නොවන ලෙස මෙන්ම සියළුම ඉදිකිරීම් ජීවීන්ට පහසුවෙන් රැදී සිටිය නොහැකි මතුපිට පෘෂ්ඨයන්ගෙන් සමන්විත පරිදි සකස්කර තිබිය යුතුය.

(ආ) අභ්‍යන්තර පිරිසැකැස්ම බාධාවකින් තොරව සේවාවන් ඉටු කිරීමට හැකිවන පරිදි ප්‍රමාණවත් ඉඩ පහසුකම් සහිතව නිර්මාණය කර තිබිය යුතුය.

(ඇ) ආහාර අමුද්‍රව්‍ය හා පිසිනු ලබන ආහාර සඳහා දූෂක ද්‍රව්‍ය ඇතුල්වීම වැළැක්වෙන පරිදි ආරක්ෂිත පිරිසැකසුමක් සහිතව නිර්මාණය කර තිබිය යුතුය.

(ඈ) පරිශ්‍රයෙහි අභ්‍යන්තර ආහාර වල ස්වස්ථතා තත්වයන් පරික්ෂා කිරීමට හැකිවන පරිදි නිර්මාණය කර තිබිය යුතුය.

(ඉ) පරිශ්‍රයෙහි අභ්‍යන්තර පිරිසැකසුම් ක්‍රියාකාරකම් යටතේ බැහැර කරන දේ කිසිදු ආකාරයකින් ආපසු ගලා නොඑන පරිදි වූ යොමු කිරීම් සහිතව සකස්වී තිබිය යුතුය.

(2) පරිශ්‍රයෙහි ආහාර පිරිසැකසුම් ස්ථානයෙහි ,

(අ) බිම හා බිත්ති සේදිය හැකි , ලිස්සා නොයන හා ජලය අවශෝෂණය නොවන ද්‍රව්‍ය වලින් සකස් වී තිබිය යුතුය.

(ආ) සෑම මතුපිට පෘෂ්ඨයක්ම පහසුවෙන් පිරිසිදු කල හැකි සේදුම් කාරක ද්‍රව්‍යන්ට හා විෂබීජ නාශකවලට අක්‍රියව පැවතිය යුතුය.

(ඇ) සිවිලිම ඝණීභවනය අවම වන පරිදි හා පුස් සෑදීම, පතුරු ගැලවීම වැලැක්වෙන පරිදි ඉදිකරනු ලැබූවක් විය යුතුය.

(ඇ) ජනෙල් හා වෙනත් කවුළු ඇත්නම්, ඒවා කෘමීන්ට ඇතුළුවිය නොහැකි ආකාරයේ ආවරණයකින් ආවරණය කර තිබිය යුතුය.

(ඉ) පිටත වාතය පහසුවෙන් ගලා ඒමට හා අපහරිත වායුව පිටතට පහසුවෙන් ගලා යා හැකි පරිදි අවශෝෂක පංකා යොදා තිබිය යුතුය.

(3) පරිශ්‍රයෙහි පාරිභොගිකයින් සඳහා ආහාර පිළිගන්වන ස්ථානයට අදාළව ,

(අ) පාරිභෝගිකයින්ට තනි වශයෙන් හා සමූහ වශයෙන් අසුන්ගත හැකිවන පරිදි ප්‍රමාණවත් ඉඩකඩ සහිත විය යුතුය.

(ආ) ආහාර පරිභොජනයට අදාළ කොටස පරිසරයට විවෘත අවකාශයක් වන විටදී හොඳින් වාතය ගලා එනපරිදි හා පක්ෂීන් හා වෙනත් සතුන්ට ඇතුල් වීමට නොහැකිවන පරිදි සකස් වී තිබිය යුතුය.

(ඇ) පාරිභොගිකයින් සඳහා නිශ්චිත වැසිකිළි ඉදිකර තිබිය යුතු අතර ඒවා ස්වයංක්‍රීයව වැසීයන දොරවල් සහිතව ප්‍රමාණවත් දුරකින් හා වෙනත් දිසානතියකින් පිහිටා තිබිය යුතුය.

(ඈ) ආහාර පරිභොජනය සඳහා වන කොටස සංවෘත අවකාශයක් නම් වායු සමනය කර හෝ පහසුවෙන් වාතාශ්‍රය ගලා ඒමට හැකිවන පරිදි හා විදුලි පංකා මෙන්ම අවශෝෂක පංකා යොදා තිබිය යුතුය.

(ඉ) සේවාවන් සඳහා ආහාර එහා මෙහා ගෙන යා හැකි පරිදි ප්‍රමාණවත් ඉඩ පහසුකම් විය යුතුය.

(ඊ) ආහාර ගැනීමට පූර්වයෙන් හා පසුව අත් සේදිය හැකි පරිදි පහසුකම් සපයා තිබිය යුතු අතර, ඒ සඳහා උනන්දු කරවන දැන්වීම් හා මඟපෙන්වීම් සවිකර තිබිය යුතුය.

(උ) තබා ඇති මේස හා පුටු පහසුවෙන් පිරිසිදු කල හැකි හා අපාරගම්‍ය දෙයින් සකස් වී තිබිය යුතුය.

(4) පරිශ්‍රය තුලට ප්‍රමාණවත් වාතාශ්‍රයක් සැපයීම හෝ වායුසමනය කර ඇති විට වායු සමීකරණ යන්ත්‍ර ප්‍රමාණවත් උෂ්නත්වයෙන් ක්‍රියාත්මක වන බවට සහතික වීම සහ සියළුම වායු සමීකරණ පද්ධතිවල වාතය ආපසු ඒම වැළැක්වෙන පරිදි කටයුතු කර තිබිය යුතුය

(5) පරිශ්‍රයෙහි සේවයෙහි යෙදෙන්නන් සඳහා,

(අ) නේවාසිකයන් වශයෙන් සිටීනම් නවාතැන් සඳහ ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් සහිත කාමර පහසුකම් තිබිය යුතු අතර එය ආහාර පිළියෙල කිරීම ආහාර නිශ්පාදනය සඳහා හෝ අමුද්‍රව්‍ය ගබඩාකරන ස්ථානයෙන් වෙන් වූ ස්ථානයක විය යුතුය.

(ආ) නේවාසික සේවකයින් වන විටදී නිදා ගැනීමට එක් අයකුට වර්ග මීටර් හතරකට අවම වශයෙන් වූ ඉඩකඩක් වෙන්වී තිබිය යුතුය.

ඇ) ස්ත්‍රී හා පුරුෂ වශයෙන් දෙපක්ෂයට වෙන් වූ වැසිකිළි පහසුකම් සහ නාන කාමර පහසුකම් සපයා තිබිය යුතුය.

(6) අවශ්‍ය අවස්ථාවක ශාරීරික දුරස්ථභාවයකින් යුතුව ප්‍රමාණවත් වන ඉඩකඩක් සහිතව පාරිභොගිකයින්ට ආහාර ඇණවුම් කිරීමට හැකිවන පරිදි පරිශ්‍රයෙහි අභ්‍යන්තර ව්‍යුහය සකස් වී තිබිය යුතුය.

(7) ආබාධ ඇති අය සහ විශේෂ අවශ්‍යතා ඇති අය සඳහා නියමිත ප්‍රමිතීන්ට අනුකූලව ප්‍රවේශවීමට අදාළ පහසුකම් විය යුතුය.

(8) පාරිභොගිකයින්ගේ වාහන නවතා තැබීම සඳහා ප්‍රමාණවත් ඉඩ පහසුකම් තිබිය යුතුය.

(9) හදිසි විදුලි බිඳවැටීම් හා ජල සම්බන්ධතාවය බිඳවැටීම් සම්බන්ධයෙන් ප්‍රයෝජනයට ගත හැකි ප්‍රමාණවත් ධාරිතාවයකින් යුත් විදුලි බිඳ වැටීමකදී ස්වයංක්‍රීයව ක්‍රියා කරවන විදුලි ජනක යන්ත්‍ර හා ජලය ගබඩා කිරීමේ පහසුකම් තිබිය යුතුය.

(10) පරිශ්‍රයෙහි අභ්‍යන්තර කාණු හා අපද්‍රව්‍ය බැහැර කිරීම් පූතික වළකට හෝ උරා ගැනීමේ වලකට යොමු කර තිබිය යුතු අතර, එම පූතික වළ හෝ උරා ගැනීමේ වළ ජල මූලාශ්‍රයක ඇත්නම් එයට මීටර් 15.25 කට වඩා වැඩි දුරකින් විය යුතුය.

***බලපත්‍රයක් නිකුත් කිරීම***

8. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ වූ බලපත්‍රයක් සඳහා ඉදිරිපත් වන ඉල්ලුම් පත්‍රයකට අදාළව ඉල්ලුම් පත්‍රය ලැබී දින දහ හතරක් ඇතුලත සභාපති වරයා විසින් ;

(1) 7 වන වගන්තිය යටතේ වූ කොන්දේසි වලට අනුකූල විටදී පරිශ්‍රයට අදාළ බලපත්‍රයක් ඉල්ලුම්කරු වෙත නිකුත් කල යුතුය.

(2) 7 වන වගන්තියෙහි සඳහන් කොන්දේසිවලට අනුකූල නොවන්නේනම් හේතු දක්වා අදාළ ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කල යුතුය

*බලපත්‍රයක් සඳහා ගාස්තු*

9. (1) මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රයක් සඳහා අයකල යුතු ගාස්තු මූලික නීතියේ සඳහන් විධිවිධානයන්ට යටත්ව සභාව විසින් වාර්ෂිකව තීරණය කර ප්‍රකාශයට පත්කරන ගාස්තු විය යුතුය.

*පරීක්ෂණ ගාස්තු*

(2) බලපත්‍රයක් නිකුත් කිරීමට අදාලව ස්ථාන පරීක්ෂාවන් සඳහා වන පරීක්ෂන ගාස්තුවක් සභාව විසින් තීරණය කර අය කිරීම නීත්‍යානුකූල විය යුතුය

*වලංගු කාලය*

10. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන බලපත්‍රයක් මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධාන අනුව කලින් අවලංගු නොකලහොත් බලපත්‍රයට අදාළ වර්ෂයෙහි දෙසැම්බර් තිස්එක දින දක්වා වලංගු විය යුතුය.

*බලපත්‍රයකට අදාළ කොන්දේසි*

11. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලත් සෑම තැනැත්තෙක්ම මෙහි පහත සඳහන් කොන්දේසීන්ට අනුකූලව ක්‍රියා කල යුතුය.

(1) ශ්‍රී ලංකාව පුරාම හෝ ඉන් කොටසකට හෝ බල ප්‍රදේශයට අදාලව හෝ නිරෝධායක හා රෝග වැලැක්වීමේ ආඥා පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද රෙගුලාසි යටතට අදාළ වසංගත තත්ත්වයක් ප්‍රකාශයට පත්කර ඇති කවර හෝ අවස්ථාවක හෝ බල ප්‍රදේශය තුල යම් වසංගත තත්වයකට කරුණු යෙදී ඇති බවට සෑහීමට පත්වෙමින් එය පාලනය කිරීම සඳහා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී උපදෙස් මත සභාපතිවරයා කලින් කල නියම කරනු ලබන නියමයන් ඇත්නම් ඒ සෑම නියමයකටම යටත්ව පරිශ්‍රය පවත්වා ගත යුතුය.

(2) පරිශ්‍රයෙහි සේවය සඳහා යොදවා ඇති සෑම තැනැත්තෙකු විසින්ම නිරෝධායක හා රෝග වැලැක්වීමේ ආඥා පනත යටතේ සාදන ලද රෙගුලාසි යටතට අදාළ වන වසංගත තත්ත්වයක් ප්‍රකාශයට පත්කර ඇති කවර හෝ අවස්ථාවක ඊට අදාළව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී උපදෙස් මත සභාපතිවරයා විසින් කරනු ලබන සෑම නියමයකටම යටත්ව ක්‍රියා කල යුතුය.

(3) බල ප්‍රදේශය තුල වසංගත රෝගී තත්වයක් සඳහා අවදානමක් ඇති බවට සැක කිරීමට කරුණු යෙදී ඇති සෑම අවස්ථාවකම සේවා අපේක්ෂාවෙන් පරිශ්‍රයට පැමිණෙන සෑම තැනැත්තෙකුටම අදාළව, ඊට අදාළව නිකුත් කර ඇති සෞඛ්‍ය උපදෙස් වලට අනුකූලව පැමිණෙන්නේනම් මිස එම පරිශ්‍රයෙහි සේවා පහසුකම් සලසා නොදිය යුතුය.

(4) බල ප්‍රදේශය තුල කිසියම් වසංගත රෝගී තත්වයකට කරුණු යෙදී ඇති විට හෝ ඒ සඳහා අවදානමක් ඇති විට එයින් ආරක්ෂා වීම සඳහා අනුගමනය කල යුතුයැයි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක ජෙනරාල් හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් හෝ ඔවුන්ගේ උපදෙස් පරිදි සභාපතිවරයා විසින් හෝ නියම කර ඇති සෞඛ්‍ය ආරක්ෂිත උපදෙස් නිසියාකාරයෙන් පරිශ්‍රය තුල ක්‍රියාත්මක කල යුතුවා මෙන්ම , එසේ වන බවට බලපත්‍රලාභියා සෑහීමට පත් විය යුතුය.

(5) පරිශ්‍රය තුල සියළුම කාණු , පහසුවෙන් ජලය බැසයන ආකාරයට පවත්වාගත යුතු අතර, අපජලය, මළ අපද්‍රව්‍ය, අනුමත ක්‍රමවේදයන්ට අනුව පූනික වළවල්, උරා ගැනීමේ වළවල් හෝ මධ්‍ය ප්‍රතිකාර ඒකකයට යොමුකර තිබිය යුතු අතර ,එමගින් දූහනය වීම වැලැක්වීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන තිබිය යුතුය.

(6) පරිශ්‍රයෙහි සියළුම වැසිකිලි, දෙඅත් සෝදන ස්ථාන නිරන්තරයෙන් විෂබීජ නාශක යොදා පිරිසිදු කල යුතුඅතර, ඒ සියල්ල එසේ වන බවට සෑහීමට පත්වීම පිණිස සුදුසු වැඩ පිළිවෙලක් පවත්වාගත යුතුය.

(7) පරිශ්‍රයෙහි අභ්‍යන්තර පොළව පහසුවෙන් ලිස්සා නොයන පරිදි සකස්කර තිබිය යුතු අතර, පිරිසිදු කිරීම සිදු කිරීමේදි ඊට යම් තාක් පහසු වන තත්වයකට කරුණු යෙදේනම් එම ස්ථානයෙහි ඒ බව සඳහන් පුවරු පාරිභෝගිකයින්ට දැකගත හැකිවන පරිදි තබා තිබිය යුතුය.

(8) පරිශ්‍රය තුල පිහිටුවා ඇති කාණු ජලය රැදී නොසිටින පරිදි සකස් වී තිබිය යුතු අතරම එය සෑම දිනකම දෙවරක් විෂබීජ නාශක යොදා පිරිසිදු කල යුතුය.

(9) පරිශ්‍රය තුල කිසිදු කාණුවක්, අපද්‍රව්‍ය ගලා එන බටයක් ,හෝ කිසිදු ආකාරයකින් මාර්ගයෙහි පොදු කාණුවකට හෝ පිටත භූමියකට හෝ යොමු නොකල යුතුය.

(10) පරිශ්‍රය තුල අපජලය ගලායාම හේතුවෙන් හෝ අපද්‍රව්‍ය බැහැර කිරීම හේතුවෙන් බාහිරව කිසිදු දුර්ගන්ධයක් ඇති නොවන පරිදි පවත්වාගත යුතුය.

(11) ආහාර පිසීමේදී, ආහාර ශීත කිරීමේදී, ඒ සඳහා විය යුතු උෂ්ණත්වය නියාමනය කිරීම සඳහා ප්‍රමාණවත් පහසුකම් තිබිය යුතු අතර එය එසේ වන බවට වාර්තා පවත්වාගත යුතුය.

(12) ආහාර සකස් කිරීම සඳහා භාවිතා කරන සියළු උපකරණ හා මෙවලම් පහත සඳහන් අවශ්‍යතාවන්ට අනුකූලවන පරිදි පවත්වා ගත යුතුය.

(අ) ආහාර සකස් කිරීමේදී භාවිතාවන සියළුම උපකරණ මෙවලම් කිසිදු විෂ ද්‍රව්‍යයක් , රසක් හෝ දුගදක් ප්‍රේෂණය නොවන අවශෝෂණය කර නොගන්නා ද්‍රව්‍ය වලින් සකස් වී තිබිය යුතු අතරම එය මල නොබැඳෙන ද්‍රව්‍ය වලින් සාදා තිබිය යුතුය.

(ආ) සියළුම උපකරණ හා මෙවලම් පහසුවෙන් පිරිසිදු කල හැකි ආකාරයේ ඒවා විය යුතුය.

(ඇ) අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා යොදා ඇති භාජන ලෝහ හෝ කාන්දු නොවන ද්‍රව්‍යයන්ගෙන් සකස් කරන ලද පියන සහිත ඒවා විය යුතුය.

(ඈ) පවත්වාගනු ලබන සෑම උපකරණයක්ම, මෙවලක්ම භාවිතා කිරීමට උචිත තත්වයේ ඒවා විය යුතුය.

(13) පරිශ්‍රය තුල ආහාර නිපදවන අතරතුර බාහිරට බෙදා හැරීම සඳහා කටයුතු කරන්නේ නම් ඒ සඳහා නිශ්චිතව වෙන්කල ස්ථානයක් තිබිය යතුයි.

(14) පරිශ්‍රය තුල ආහාර නිපදවන අතරතුර බාහිරට බෙදා හැරීම සඳහා කටයුතු කරන්නේ නම් ආහාර බෙදා හැරීම සඳහා යොදාගනු ලබන දේ ආහාර වල රසයට හානි නොවන ආකාරයට බෙදා ගැනීම සිදු කිරීමට හැකිවන පරිදි වූ බහාලුම් විය යුතුය.

(15) පරිශ්‍රය තුල ආහාර සකස් කිරීම සඳහා භාවිතාවන දේ තැබීම සඳහා හා පිසින ලද ආහාර හෝ එවැනි දේ තබා ගැනීම සඳහා වෙන් වෙන් වශයෙන් ප්‍රමාණවත් ශීතකරණ පහසුකම් තිබිය යුතුය.

(16) පරිශ්‍රය සඳහා ජලය ගබඩාකර තබා ගැනීමේ පහසුකම් විය යුතු අතර ඊට අදාළ බහාලුම් මල නොබැඳෙන ආකාරයේ ඒවා විය යුතුය.

(17) ආහාර සකස් කිරීමට ගන්නා පළතුරු ,එළවළු වැනි දේ ඉතා හොඳින් සෝදා පිරිසිදු කොට භාවිතයට ගත යුතුය.

(18) පරිශ්‍රයෙහි භාවිතය සඳහා යොදා ගැනෙන ජලය උපද්‍රවකාරී නොවන භාජනවල දූහනයෙන් තොරව පවත්වාගත යුතුය.

(19) පරිශ්‍රයෙහි භාවිතයට ගැනෙන අයිස් පානීය ජලයෙන් නිෂ්පාදිත ඒවා විය යුතුය.

(20) පරිශ්‍රය තුල ජලය ගෙන යන නල මාර්ග වෙනත් වූ නල මාර්ගයකින් හෝ වෙන්කර හඳුනාගැනීමට හැකිවන පරිදි පවත්වා ගත යුතුය.

(21) පරිශ්‍රය තුල පිසින ලද සෑම ආහාර ද්‍රව්‍යක්ම උපද්‍රවයකින් තොරව පාරිභෝගිකයන් වෙත පත් කිරීම සඳහා නිශ්චිත අභ්‍යන්තරික වැඩ පිළිවෙලක් සකස්කර තිබිය යුතු අතර, එය නියාමනය කිරීම සඳහා නිශ්චිතව කාර්යය පවරන ලද අයද සේවයේ යොදවා තිබිය යුතුය.

(22) ආහාරයට රැගෙන එන මස් මාළු පරිශ්‍රයෙහි වෙනම ශීතකරණයක ගබඩා කර තැබිය යුතු අතර භාවිතයට ගන්නා තෙක් සෑමවිටම සෙන්ටිග්‍රේඩ් අංශක දෙකක උෂ්ණත්වයකින් යුතුව දූහනය නොවන පරිදි පවත්වාගත යුතුය.

(23) පරිශ්‍රය තුල විකිණීම සඳහා වන සෑම ආහාර ද්‍රව්‍යකටම අදාළ මිල සාම්පල් යටතේ හෝ වෙනත් ආකාරයකින් ප්‍රදර්ශනය කළ යුතුය.

(24) බල ප්‍රදේශය තුල නිරෝධායක හා රෝග වැලැක්වීමේ ආඥා පනත යටතේ හා ඒ යටතේ ගැනෙන රෙගුලාසි යටතට අදාළ වසංගත තත්වයක් ප්‍රකාශයට පත්වී ඇති හෝ බල ප්‍රදේශය තුල කිසියම් වසංගත රෝගී තත්වයක අවදානමක් හේතු කොටගෙන සියළුම පිරිස් සමාජගත වීමේදී මුඛ ආවරණ පැළද සිටිය යුතු බවට වූ නියමයක් ප්‍රකාශයට පත්වී ඇත්නම් මුඛ ආවරණ පැළඳ නොගත් කිසිදු තැනැත්තෙකු පරිශ්‍රයට ගණුදෙනු සඳහා ඇතුලත් වීමට අවසර නොදිය යුතුයි.

(25) පරිශ්‍රය තුල පවත්වාගනු ලබන සෑම ආහාර ද්‍රව්‍යයක්ම පරිශ්‍රයට බාහිරින් පැමිණෙන කවරෙකුගේ හෝ ස්පර්ශයට ලක් නොවන පරිදි ආරක්ෂිතව පවත්වාගත යුතු අතර ආහාර ඇණවුම් කිරීමෙන් පසු ඇණවුම් කරන ලද ආහාර පිළිගැන්විය යුතුය. එසේ පිළිගන්වන ලද කිසිදු ආහාරයක් හෝ ඉතිරියක් නැවත පිළිගැන්වීමක් සඳහා තබා නොගත යුතු අතර , පිළිගන්වන ලද ආහාරවල ඉතිරියක් ඇත්නම් ඇණවුම් කල අයට රැගෙන යාමට සැලැස්විය යුතුය.

(26) පරිශ්‍රයෙහි විකිණීමට තබා ඇති ආහාර කිසිදු ආකාරයකින් දූහනය වීමට හේතුවන පරිදි පවත්වා නොගත යුතු අතර , ආහාර පිළිගැන්වීම, රැගෙන යාම සඳහා එකලස් කිරීම, ආදී සියළු කටයුතු නියමිත අත් වැසුම් යොදා ගනිමින් ඒ සඳහාම වූ කාර්යාවලියක් යටතේ සිදුකල යුතුය.

(27) පරිශ්‍රය තුල ආහාර පිළිගැන්වීමේ හෝ පරිහරණය කිරීමේ හෝ එකලැස් කිරීමේ කාර්යයක නියැලී සිටින සෑම තැනැත්තෙකු විසින්ම ;

(අ) තම අත්ල හෝ ඇඟිලි විවෘත භාවයෙන් ආහාර ඇල්ලීම හෝ ස්පර්ශ කිරීම නොකල යුතුයි.

(ආ) කිසිදු අවස්ථාවක සේවයේ යෙදී සිටියදී මුදල් පරිහරණය කිරීමක් නොකළ යුතුය.

(ඇ) ආහාර ඇල්ලීම සඳහා භාවිතා කරන මෙවලම් හා අත්වැසුම් ආහාර සඳහා හිතකර භාවිතයක් විය යුතුය.

(ඈ) දෙඅත් පිසදමා ගැනීම සඳහා පිරිසිදු තුවායක් භාවිතයට ගත යුතුය.

(ඉ) භාවිතයට ගැනෙන පිඟානක කෝප්පයක හෝ වෙනත් භාජනයක යටිපැත්ත කිසිදු ආහාරයක නොගැවෙන ලෙස සැමවිටම පවත්වා ගත යුතුය.

(ඊ) ආහාර බෙදීම සඳහා භාවිතයට ගනුලබන සියළු උපකරණ මනා ලෙස පිරිසිදුව තබාගත යුතු අතර, ඒ සියල්ල වෙන් වෙන් වශයෙන් භාජනවල බහා තැබිය යුතුය.

(උ) කිසිදු ආකාරයකින් තම ක්‍රියාවකින්, භාවිතයකින් ආහාරයක් දූහනයට ලක්වීමට හෝ ක්ෂුද්‍ර ජීවීන් ව්‍යාප්ත වීමට හේතු නොවන පරිදි ආහාර පරිහරණය කිරීමට, එකලැස් කිරීමට පිළිගැන්වීමට එසේ සේවයේ යෙදී සිටින්නන් ක්‍රියා කල යුතුය.

(ඌ) ආහාර එතීම සඳහා ගනු ලබන දේ කිසිදු ආකාරයකින් ආහාර දූහන මූලාශ්‍ර නොවිය යුතුය.

(28) බල ප්‍රදේශය තුළ නිරෝධායක හා රෝග වැලැක්වීමේ ආඥා පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද රෙගුලාසි යටතට අදාළ වන වසංගත තත්වයක් ප්‍රකාශයට පත්කර හෝ බල ප්‍රදේශය තුල කිසියම් වසංගත රෝගී තත්වයකට අවදානමක් ඇති බවට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී උපදෙස් පරිදි සභාපතිවරයා විසින් ප්‍රකාශයට පත්කර ඇති අවස්ථාවක පරිශ්‍රය තුල ආහාර සකස් කිරීමේ, පරිහරණය ,පිළිගැන්වීම් කිරීමේ හෝ එකලැස් කිරීමේ කාර්යෙහි නියැලී සිටින සෑම තැනැත්තෙක්ම මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් සෑම නියමයකට අතිරේකව අවස්ථාවොචිත පරිදි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂක වරයෙකු හෝ ඔවුන්ගේ උපදෙස් පරිදි සභාපතිවරයා විසින් කරනු ලබන නියමයන්ට යටත්ව පරිශ්‍රය පවත්වාගත යුතුය.

(29) ආහාර කලින් ඇණවුම්කර රැගෙන යාමට හැකිතාක් පහසුකම් සලසා තිබිය යුතු අතර ඒ සඳහා පරිශ්‍රය තුළ වෙනමම කවුළුවක් පවත්වාගත යුතු අතරම මේස මතුපිට ආහාර පිළිබඳ වට්ටෝරු පොතක් තැබීම වෙනුවට හැකිතාක් තිරයක් මත ප්‍රදර්ශනය වන ආකාරයට පහසුකම් සලසා තිබිය යුතුය.

(30) (අ) පරිශ්‍රය තුල ආහාර නිෂ්පාදනයට අදාළ කිසිදු කාර්යයක් පොදු මාර්ගයකට හෝ මහජනයා සඳහා වන පොදු අවකාශයකට විවෘත වන පරිදි හෝ එවැනි පොදු මාර්ගකින් හෝ පොදු මහජනයා සඳහා වන විවෘත අවකාශයකින් වාතය පහසුවෙන් ගලා එන අවකාශයක සිදු නොකලයුතු අතර , පරිශ්‍රය අභ්‍යන්තරයෙහි ඒ සඳහාම වෙන්වූ සංවෘත අවකාශයක ආහාර නිශ්පාදන කටයුතු කල යුතුය.

(ආ) ආහාර නිශ්පාදනය සඳහා වන සංවෘත අවකාශයහි හටගනු ලබන උණුසුම් වාතය සහ හුමාලය පහසුවෙන් ගලා යා හැකි පරිදි විමිනි යොදා හා අවශෝෂක පංකා සවිකර තිබිය යුතුය.

(ඇ) ආහාර නිෂ්පාදනයෙහිලා අනුමත කරන කවර හෝ ක්‍රියාවකින් හටගන්නා ශබ්දය කිසිදු ආකාරයකින් මහජනතාවට හෝ පාරිභෝගිකයින්ට බාධාවක් ඇති නොවන ආකාරයට විය යුතුය.

(31) පරිශ්‍රය තුල ආහාර පිළිගැන්වීමේ හා පරිහරණය සඳහා වන මේස ඉතා පිරිසිදු තත්වයකින් විය යුතු අතර, සෑම පිළිගැන්වීමකින් හා පරිහරණයකින් පසු විෂබීජ නාශක යොදා පිරිසිදු කල යුතු අතර ඒ සඳහා භාවිතාවන තුවා පිරිසිදු තත්වයෙන් තිබිය යුතුය.

(32) පරිශ්‍රය තුල පාරිභෝගිකයින්ගේ අත ගැටෙන පෘෂ්ඨයක් නිතර විශබීජ නාශක යොදා පිරිසිදු කල යුතුය.

(33) පරිශ්‍රය තුල පිසින ලද ආහාර අතරින් පහසුවෙන් නරක්විය හැකි පිසින ලද සියළු ආහාර සෙන්ටිග්‍රේඩ් අංශක හතරක් නොඉක්මන උෂ්ණත්වයක නැතහොත් පහත සඳහන් අවස්ථා වලදී හැර සෙන්ටිග්‍රේඩ් අංශක හැටකට අඩු නොවන උෂ්ණත්වයක පවත්වාගත යුතුය. එසේ නොවන අවස්ථා පහත ආකාරයට විය යුතුය.

(අ) සමස්ථ එකතුව පැය දෙකකට වැඩි කාලයක් සඳහා ආහාර විකිණීම සඳහා නිරාවරණය කර නොමැති හෝ ප්‍රදර්ශනය කර නොමැති අවස්ථාවලදී හෝ

(ආ) පිළියෙල කිරීම හා පිළිගැන්වීම ආසන්න කාල පරාසයක් තුල සිදු කරන විටදී.

(34) පරිශ්‍රය තුල සාමාන්‍යයෙන් විකුණනු ලබන තත්වයෙන්ම අනුභව කරනු ලබන සියළු පිසින ලද මස් හෝ මාළු අඩංගු ප්‍රේස්ට්‍රි , පැටිස් , සේවරි, පීසා, හා ඒහා සමාන ආහාර ආවරණය සහිත බහාලුම් තුල පවත්වාගත යුතුය.

(35) පරිශ්‍රය තුල භාවිතය සඳහා වන කිරි සෙන්ටිග්‍රේඩ් අංශක හතකට වැඩි නොවන උෂ්නත්වයකින් ශීතකරණයක පවත්වා ගත යුතුය.
පරිශ්‍රයෙහි පිරිසැකසුම් ස්ථානයෙහි හා ආහාර පරිභෝජනය සඳහා වන කොටස්වල ප්‍රමාණවත් පරිදි විෂබීජ නාශක ද්‍රව්‍ය සමඟ අත්සේදීම් සඳහා, අත් වියලීම සඳහා ප්‍රමාණවත්

(36) පහසුකම් සලසා තිබිය යුතු අතර පරිශ්‍රය තුල ප්‍රමාණවත් ආලෝකයක් පවත්වාගත යුතුය.

(37) පරිශ්‍රය තුල පවත්වාගනු ලබන පලිබොධනාශක ද්‍රව්‍ය පරිශ්‍රයෙහි නිශ්චිත ස්ථානයක අගුළු දමන ලද බහාලුමක පවත්වාගත යුතුය.

(38) පරිශ්‍රය තුල සේවකයින්ගේ පහසුකම් සඳහා වන කොටස ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් වලින් හා ඉඩකඩින් යුක්ත විය යුතු අතර ස්ත්‍රී හා පුරුෂ යන දෙපක්ෂය සඳහා වන වැසිකිලි සනීපාරක්ෂක ප්‍රමිති වලට අනුව පවත්වාගත යුතුය.

(39) පරිශ්‍රය තුල ඒකරාශිවන අපද්‍රව්‍ය බැහැර කිරීමට පූර්වයෙන් රඳවා ගැනීමේදී කිසිදු ආකාරයකින් පරිශ්‍රයෙහි භාවිතයට ගැනෙන දේට බලපෑමක් ඇති නොවන පරිදි හා එමගින් ආහාර දූෂනයට කරුණු නොයෙදෙන පරිදි පවත්වාගත යුතුය.

(40) පරිශ්‍රයෙහි පිරිසුදු කිරීමේ කටයුතු නියමිත කාල සටහනකට අනුව පහත කරුණු වලට යටත්ව කල යුතුය.

(අ) ආයතනයේ සියළු අංශයන් ප්‍රමාණවත් පරිදි සිදු කිරීමට හා මෙම අතුරු ව්‍යවස්ථාවේ විස්තර කරන ලද නිශ්චිත ප්‍රදේශ ප්‍රමුඛව පිරිසුදු කිරීම සහ විෂබීජ නාශක ද්‍රව්‍ය යෙදීම වැනි කටයුතු සම්බන්ධයෙන් නිශ්චිත කාර්යය පැවරුමක් පවත්වාගත යුතුය.

(ආ) ඉහත (අ) යටතේ වන කාර්යය නිශ්චිතව සිදුවන බවට වගබලා ගැනීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

(ඇ) පරිශ්‍රය තුල ආහාර පිළියෙල කරන,පිළිගන්වන,එකලැස් කරන හා පරිභොජනය කරන අවස්ථාවල දූවිලි ඇති නොවන පරිදි අදාල පිරිසිදු කිරීමේ කාර්යන් සිදුකල යුතුය.

(ඈ) ආහාර පිළිගැන්වීමේදී හා පරිභෝජනය කිරීමේදී භාවිතා කරන සියළු උපකරණ කිසිදු ආකාරයකින් පිසින ලද ආහාරයන්හි කොටස් රැඳී නොසිටින පරිදි පවත්වා ගත යුතුය.

(ඉ) පිරිසිදු කිරීම් සඳහා යොදාගනු ලබන ජලය, සේදුම් කාරක විෂබීජ නාශක කිසිදු ආකාරයකින් භාජන මත ඉතිරි නොවන පරිදි සොදා හැර තිබිය යුතුය.

(ඊ) පරිශ්‍රය තුල සිවිලිම,බිත්ති, ආදී දේ කිසිදු කෘමී සතකු රැදී නොසිටින පරිදි පවත්වාගත යුතුය.

(41) පරිශ්‍රය තුල කිසිදු ආකාරයකින් බල්ලන් , පූසන් වැනි සුරතල් සතුන් ඇති නොකළ යුතුය.

(42) පරිශ්‍රයෙහි සේවය කරන පිරිස් සඳහා ආහාර වලට අදාල ස්වස්ථතා කටයුතු පිළිබඳ පුහුණුවක් ලබා තිබිය යුතු අතර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී නියම කරන කාල සීමාවක් යටතේ වෛද්‍ය පරීයේෂණයන්ට යොමුකර සුදුසු සෞඛ්‍ය තත්වයෙන් යුක්ත බවට පරික්ෂාකර ගත යුතුය.එසේම ඊට අදාළ වන වාර්තා පරිශ්‍රය තුල ඕනෑම අවස්ථාවක පරික්ෂා කිරීමට හැකිවන පරිදි පවත්වාගත යුතුය.තවද ඔවුන් සම්බන්ධයෙන් කරන සෞඛ්‍ය පරීක්ෂණ සායනික හා වසංගත යන දෙයාකාරයෙන්ම විය යුතුය.

(43) පරිශ්‍රයෙහි සේවයේ යොදවා ඇති සේවකයින් සම්බන්ධයෙන් සෞඛ්‍ය නරීක්ෂණ පද්ධතියක් පිහිටුවා ඔවුන්ට අවශ්‍ය සෞඛ්‍ය උපදෙස් ලබා ගැනීමට ක්‍රියාවලියක් ඇති කල යුතුය.

(44) පරිශ්‍රයෙහි ජනිත වන අපද්‍රව්‍ය සභාව ක්‍රියාත්මක කරන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහනට අනුව හා ඊට අදාළ වන්නා වූ ලිඛිත නීතීන්ට අනුව සිදු කිරීමට කටයුතු කල යුතුය.

(45) පරිශ්‍රය තුල ජනනය වන අපද්‍රව්‍ය බලපත්‍රලාභියා විසින්ම කළමනාකරණය කරගනු ලබන්නේ නම් , ඊට අදාළ ප්‍රදේශය භාර මහජන සෞඛ්‍ය පරීක්ෂක දැනුවත් කලයුතු අතර,ඔහු විසින් ඒ සඳහා ලබාදෙන උපදෙස් වලට අනුකූලව ඒ සම්බන්ධයෙන් ක්‍රියා කල යුතුය.

(46) පරිශ්‍රය තුල සේවය කරන සෑම අයෙක්ම එසේ වැඩ ආරම්භ කිරීමට පූර්වයෙන් , වැසිකිලි භාවිතයෙන් පසු හා අපද්‍රව්‍ය ස්පර්ශ වීමෙන් පසු ප්‍රමාණවත් පිරිසුදු වීමකින් තොරව ආහාර පිසීමේ එක්ලස් කිරීමේ, පිළිගැන්වීමේ හෝ කාර්යයක නොයෙදිය යුතු අතරම එසේ කාර්යයෙහි යෙදෙන සෑම අයෙක්ම පිරිසුදු හා සාක්කු නොමැති ඒප්‍රන් හැඳ සිටිය යුතුය.

(47) පරිශ්‍රයෙහි මුදල් අයකැම් වශයෙන් කටයුතු කරන අය තම දෙඅත් නිතර විෂබීජ නාශක යොදා ගනිමින් පිරිසුදු කරගත යුතුය.

(48) පරිශ්‍රය තුල ප්‍රමාණවත් ප්‍රථමාධාර පහසුකම් සපයා තිබිය යුතුය.

(49) පරිශ්‍රය තුල ආහාර පරිභොජනයට පහසුකම් ඇති සංඛ්‍යාව පරිශ්‍රයෙහි ප්‍රදර්ශනය කළ යුතුය.

(50) කිසියම් වසංගත තත්වයක් මත සමාජය තුල අත් වැසුම් මුඛ වැසුම් භාවිතා කිරීමට උපදෙස් ලබාදී තත්වයකදී, පරිශ්‍රයට පැමිණෙන කිසියම් තැනැත්තෙකු තමන් පැලඳ සිටින මුඛ වැස්මක් හෝ අත් වැස්මක් පරිශ්‍රය තුල බැහැර කරනු ලබන්නේ නම් එසේ බැහැර කරන මුඛ වැස්ම හෝ අත් වැසුම් ඒ සඳහාම පරිශ්‍රය තුල නිශ්චිතව තබා ඇති සංවෘත බඳුන්වලට බැහැර කිරීමට සැලැස්විය යුතු අතර, එසේ බැහැර කරන අපද්‍රව්‍ය වෙනත් අපද්‍රව්‍ය සමඟ මිශ්‍ර කිරීමකින් තොරව සභාව ඊට අදාළව ක්‍රියාත්මක කරන කසළ කලමනාකරන වැඩසටහනට හා උපදෙස්වලට අනුකූලව බැහැර කිරීමට සැලැස්විය යුතුය.

(51) ආහාර පරිහරණය සඳහා පරිශ්‍රයට ඇතුල්වන සෑම තැනැත්තෙක්ම පරිශ්‍රයෙහි ඒ සඳහා නිශ්චිතව වෙන්කල දෑත් පිරිසිදු කර ගැනීම සඳහා වන ස්ථානයෙන් දෑත් පිරිසිදු කර ගත යුතුය.

(52) පරිශ්‍රයෙහි ආහාර අනුභව කරන හා ආහාර රැගෙන යාමට පැමිණෙන සියළු දෙනාම නිසි දුරස්ථභාවයක් පවත්වා ගැනීමට ක්‍රියා කල යුතුය.

(53) පරිශ්‍රය තුල ආහාර පරිහරණයෙහි යෙදෙන සෑම අයෙක්ම එසේ ආහාර පරිහරණයෙහි යෙදීමේදී උපරිම පිරිසිදු භාවයකින් සිටිය යුතු අතර සෑම විටම හිස් ආවරණ අත් වැසුම් හා මුඛ ආවරණ, පාවහන් පැළඳ සිටිය යුතු අතර සුදුසු සෞඛ්‍ය ආරක්ෂිත ඇඳුමක් අද සිටිය යුතුය.

(54) කිසියම් බෝවන රෝගයකින් පෙලෙන හෝ එවැනි රෝගයක් වැලදී ඇති බවට සැක කරන හෝ එවැනි රෝගවාහකයකු හෝ ආසාදනය වී ඇති තුවාල, සමේ ආසාදන හෝ වෙනත් බෝවන රෝගයකින් පෙළෙන තැනැත්තෙකුව පරිශ්‍රයෙහි සේවය සඳහා යොදවා නොගත යුතුය.

(55) පරිශ්‍රය තුල ආහාර පරිහරණය කිරීම සම්බන්ධයෙන් කටයුතු කරන සෑම තැනැත්තෙක්ම ආහාර දූහනය වීමට හේතුවන ආකාරයට දුම්බීම , කෙළ ගැසීම, කැස්ස, කිවිසුම් යැවීම, නාසය ස්පර්ශ කිරීම, වැනි ක්‍රියාවල නොයෙදිය යුතුය.

(56) පරිශ්‍රයෙහි ආහාර පරිභොජනය සඳහා කිසිදු අවස්ථාවක යම් බෝවන රෝගී තත්වයකින් හෝ වසංගත රෝගී තත්වයකින් පෙලෙතැයි සිතිය හැකි තරම් කරුණු ඇති කවර හෝ තැනැත්තෙකු ඇතුලත් කර නොගත යුතුය.

(57) පරිශ්‍රයෙහි ආහාර පරිභොජනය සඳහා පැමිණෙන යම් තැනැත්තෙකුට හෝ පරිශ්‍රයෙහි සේවයෙහි යෙදෙන්නෙකුට බෝවන , ස්පර්ශයෙන් බෝවන , හෝ චර්මගත රෝගී තත්වයක් වැළදුනහොත් ඒ බව බලපත්‍රලාභියා විසින් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත දැනුම් දිය යුතු අතර , එසේ දැනුම් දීමෙන් පසු සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී හෝ ඔහු විසින් බලය පවරන ලද මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකු විසින් ලබාදෙන නිරෝධායක උපදෙස්වලට අනුකූලව පරිශ්‍රයට අදාළ සියළුම අය ක්‍රියාකල යුතුය.

(58) පරිශ්‍රය නිරෝධායක ක්‍රියාවලියට යටත්කර ඇති විටක එකී නිරෝධායක කාලය අවසන් බවට වූ සහතිකයක් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකයෙකු විසින් නිකුත් කරනු ලැබීමෙන් පසු හා පරිශ්‍රය සම්පූර්ණයෙන් විෂබීජ හරණය කරන තෙක් කිසිදු තැනැත්තෙකු ආහාර පරිභොජනය සඳහා ඇතුලත් කර නොගත යුතුය.

(59) ආහාර පරිහරනය කිරීමේදී ආහාර දූහනය වීමට හේතුවන ආකාරයේ කවර හෝ ක්‍රියාවක් නොකර හිඳීමටත් සිදු නොවන ආකාරයට පරිශ්‍රය පවත්වා ගැනීමට බලපත්‍රධාරියා විසින් සෑම පියවරක්ම ගෙන තිබිය යුතුය.

(60) පරිශ්‍රය තුල ආහාර පරිහරනයහි යෙදෙන හා ආහාර පරිභොජනයේ යෙදෙන සෑම තැනැත්තෙකුටම පරිශ්‍රය තුල ක්‍රියාත්මක වන සෞඛ්‍ය ආරක්ෂක පියවර සම්බන්ධව දැන ගැනීමට හැකිවන පරිදි , ඊට අදාළ උපදෙස් පරිශ්‍රය තුල ප්‍රකටව පෙනෙන පරිදි ප්‍රදර්ශනය කල යුතු අතර ඊට අනුකූලව ක්‍රියා කල යුතුය.

(61) පරිශ්‍රය තුල සේවයේ නියුතු සේවකයින් සම්බන්ධයෙන් සියලු තොරතුරු බලපත්‍රලාභියා විසින් සභාපතිවරයාට ඉදිරිපත් කර තිබිය යුතුය.

*පරිශ්‍රයන් ශ්‍රේණිගත කිරීම*

12\. (1) මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ වූ කොන්දේසි ඉටු කිරීමේදී ප්‍රශස්ථභාවය සැලකිල්ලට ගනිමින් මෙම අතුරු ව්‍යවස්ථාවට අදාළ පරිශ්‍රයක් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී නිර්දේශයන්ට අනුව සභාපතිවරයා විසින් ශ්‍රේණිගත කිරීමත් නීත්‍යානුකූල විය යුතුය.

(2) සභාපතිවරයා විසින් මෙම වගන්තිය යටතේ ශ්‍රේණිගතකර ඇති අවස්ථාවක බලපත්‍රයට අදාළ වර්ෂය සඳහා පරිශ්‍රයට හිමි ශ්‍රේණිය පිළිබඳව හා සභාපතිවරයා විසින් ඒ සඳහා නිකුත් කරනු ලබන සහතිකයක් මහජනයාට දැකගතහැකිවන පරිදි පරිශ්‍රය තුල ප්‍රදර්ශනය කල යුතුය

*ස්ථානපරික්ෂාව හා නියදි ලබාගැනීම*

13\. මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධානයන්ට අනුකූලව පරිශ්‍රය පවතින්නේද යන්න පරික්ෂා කිරීම සඳහා සභාපතිවරයා විසින් ඒ සඳහා බලය පවරන ලද මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකු හෝ වෙනත් යම් නිලධාරියෙකු ඕනෑම සාධාරණ වෙලාවක පරිශ්‍රයට ඇතුළු වීමට, අවශ්‍ය නියැදි ලබා ගැනීම නීත්‍යානුකූල වන්නේය.

14\. බලප්‍රදේශය තුල වසංගත තත්වයක් පැතිර යාමට හේතුවිය හැකි කරුණු සැලකිල්ලට ගනිමින් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී උපදෙස් පරිදි පරිශ්‍රය පවත්වාගෙන යාමට අදාළව බලපත්‍රලාභියා විසින් එකඟතා ප්‍රකාශයකට ඇතුලත් විය යුතුයැයි සභාපතිවරයා විසින් නියමකර ඇති විටකදී බලපත්‍රලත් තැනැත්තා සභාපතිවරයා සමඟ එකඟතා ප්‍රකාශයකට ඇතුලත් විය යුතු අතර සභාපතිවරයා විසින් එහි පිටපතක් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත යොමුකල යුතුය.

15\. බල ප්‍රදේශයට අදාලව කිසියම් වසංගත රෝගී තත්වයක් සම්බන්ධයෙන් නිරෝධායක හා රෝග වැලැක්වීමේ ආඥා පනත යටතේ නියෝගයක් බලපැවැත්වෙන අවස්ථාවක එම නියෝගයෝහි සඳහන් සෑම නියමයකටම අනුකූලව පරිශ්‍රය පවත්වා ගත යුතුය.

*පරිශ්‍රයට ඇතුළත් වීමේ බලය*

16\. මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධානයන්ට අනුකූලව පරිශ්‍රය පවතින්නේද යන්න පරික්ෂා කිරීම සඳහා සභාපතිවරයා විසින් ඒ සඳහා බලය පවරන ලද මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකු හෝ වෙනත් යම් නිලධාරියෙකු ඕනෑම සාධාරණ වෙලාවක පරිශ්‍රයට ඇතුළු වීමට, අවශ්‍ය නියැදි ලබා ගැනීම නීත්‍යානුකූල වන්නේය.

*බලපත්‍රය අවලංගු කිරීම*

17\. (1) මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක්ලත් පරිශ්‍රයක් යටතේ මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කොන්දේසි උල්ලනංගනය කරමින් හෝ ඊට පටහැනි වන පරිදි කටයුතු වන අවස්ථාවක අතුරු ව්‍යවස්ථාවට අනුකූල වීම සඳහා දින තිහකට නොවැඩි නිශ්චිත කාලයක් දන්වමින් දැන්වීමක් සභාපතිවරයා විසින් බලපත්‍රලාභියා වෙත භාරදිය යුතුය.

(2) මෙම වගන්තිය යටතේ වූ දැන්වීමක් බලපත්‍රලාභියා වෙත භාරදීමෙන් පසු ,අදාල දැන්වීමේ සඳහන් නියමයන්ට අනුකූලව ක්‍රියාකිරීම සඳහා තවදුරටත් අතිරේක කාලයක් ලබාදෙන ලෙසට සාධාරණ හේතු දක්වමින් කරනු ලබන ඉල්ලීමක් මත සභාපති වරයාවිසින් අතිරේක කාලයක් ලබාදිය හැකිය.එසේ ලබාදෙන කාලය පළමු දැන්වීමේ සඳහන් කාලයට අතිරේකව දින දහ හතරක උපරිම කාලයකට යටත්ව විය යුතුය.

18\. ඉහත 17 වගන්තිය යටතේ ලබාදෙන කාල සීමාව තුළ හෝ අතිරේක කාල සීමාව තුළ දැන්වීමට අනුකූලව ක්‍රියා කිරීම බලපත්‍රලාභියා විසින් පැහැර හැර ඇති අවස්ථාවක සභාපතිවරයා විසින් අදාල බලපත්‍රය අවලංගු කල යුතුය.

*දණ්ඩනය*

19\. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ලබා ගත යුතු බලපත්‍රයකින් තොරව හෝ අතුරු ව්‍යවස්ථාව යටතේ කරනු ලබන නියමයන් කඩකරමින් පරිශ්‍රයක් පවත්වාගෙන යාම වරදක් වන අතර එම වරද සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් වරදකරුවෙකු කිරීමෙන් **පසු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(2)** උප වගන්තිය යටතේ දඩුවමකට යටත් විය යුතුය.තවද එලෙස වරදකරුවෙකු වීමෙන් පසු තව දුරටත් එකී කඩකිරීම, උල්ලංඝණය නිරන්තරයෙන්ම කරගෙන යනු ලබන විට සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් දැන්වීමක් භාර දීමෙන් පසු උල්ලංඝණ තව දුරටත් නොකඩවා කරගෙන යන සෑම දිනකට ඉහතකී **1987 අංක 15 දරන** ප්‍රාදේශීය සභා **පනතේ 122(2)** උප වගන්තියේ සඳහන් අතිරේක දඩයකට යටත් විය යුතුය.

20 මෙම අතුරු ව්‍යවස්ථාවේ පද සම්බන්ධයෙන් අන්‍ය අර්ථයක් අවශ්‍ය වන්නේනම් මිස මෙම අතුරුව්‍යවස්ථාවේ, *අර්ථ නිරූපනය*

"සභාව" යන්නෙන් කළුතර ප්‍රාදේශීය සභාවද,

"සභාපති" යන්නෙන් කළුතර ප්‍රාදේශීය සභාවේ තත්කාලයෙහි සභාපති ධූරය දරන හෝ එම ධූරයේ කාර්යය කර්තව්‍ය ඉටුකරන අයද ,

"සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී" යන්නෙන් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අදාල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාසය සඳහා එම තනතුර දරන අයද,

"මහජන සෞඛ්‍ය පරීක්ෂක" යන්නෙන් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අදාලව සේවයේ යෙදෙන ප්‍රාදේශීය සභාවේ හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයට අනුයුක්තව මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුර දරන අයෙක්ද,

"බලපත්‍රලාභියා" යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලබාගත් ආයතනයක් ,තැනැත්තෙක් හෝ පුද්ගලයෙක්ද ,

"බලයලත් නිලධාරියා" යන්නෙන් තත්කාලයෙහි ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් බලය පවරන ලද නිලධාරීයාද,

"දූෂනය වීම" යන්නෙන් ආහාර ද්‍රව්‍යයකට කිසිදු දූෂක ද්‍රව්‍යයක් ඇතුල්වීම හෝ හටගැනීමද,

"විෂබීජ නාශක" යන්නෙන් ආහාරවල ආරක්ෂාව හෝ යෝග්‍යබව අඩුනොකරන මට්ටමකට පරිසරයෙහි ඇති ක්ෂුද්‍ර ජීවීන් ප්‍රමාණය රසායනික කාරකයන් මඟින් හෝ භෞතික ක්‍රමයකින් අඩු කිරීමද,

"ආහාර ස්වස්ථතාවය" යන්නෙන් ආහාර දාමයේ සියළු අවස්ථාවලදී ආහාරවල සුරක්ෂිතබව හා සුදුසු බව සහතික කිරීම සඳහා සියළු තත්වයන්, පියවර සහ පරිවයද,

"උපද්‍රව" යන්නෙන් අහිතකර සෞඛ්‍ය බලපෑමක් සිදු කිරීමේ ඉඩ ඇති යම් ජීව විද්‍යාත්මක , රසායනික විද්‍යාත්මක කාරකයක් හෝ තත්වයක්ද,

" ආහාර" යන්නෙන් මනුෂ්‍යයාගේ ආහාර හෝ පාන වශයෙන් ප්‍රයෝජනයට ගැනීම සඳහා පවත්වාගෙන යන ආයතනය තුල නිෂ්පාදනය කල විකිණීමට තබා ඇති දේ වෙනම ආහාර පිළියෙල කිරීමේදී යොදා ගැනෙන දේද,

සාධාරණ වෙලාව යන්නෙන් බලපත්‍රයක් කර්තව්‍ය හෝ ඊට අදාළ කාර්යෙහි නිරතවන ඔනෑම වෙලාවක්ද,

මූලික නීතිය යන්නේ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත අදහස් වෙයි.

21. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල හා ඉංග්‍රීසි,දෙමළ පාඨ අතර අනනුකූලතාවයන් හටගතහොත් එවිට සිංහල පාඨය ප්‍රමුඛ වෙයි. *පාඨ අතර අනනුකූලතාවය*

## උපලේඛනය

## ........................ වර්ෂය සඳහා වෙළඳ බලපත්‍රය ලබාගැනීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය.

01. ඉල්ලුම්කරුගේ නම : -
02. පෞද්ගලික ලිපිනය : -
03. ජාතික හැඳුනුම්පත් අංකය : -
04. දුරකථන අංකය : -
05. වෙළඳ ව්‍යාපාරයේ ස්වභාවය : -
06. ආරම්භක වර්ෂය : -
07. ව්‍යාපාරික ස්ථානයේ ලිපිනය : -
08. ග්‍රාම නිලධාරී කොට්ඨාසය : -
9. වරිපනම් අංකය: -
10. ව්‍යාපාරය ලියාපදිංචිය ලබාගෙන ඇත්නම් එහි යොමු අංකය : -
11. ව්‍යාපාරික ස්ථානයේ කළමනාකරුගේ හො නියෝජිතයාගේ

I. නම හා පුද්ගලික ලිපිනය: -
II. ජාතික හැඳුනුම්පත් අංකය: -
III. දුරකථන අංකය ජංගම : - ස්ථාවර : -

12. ව්‍යාපාරයට අදාළ ඉදිකිරීම් අනුමත කරන සැළැස්මේ අංකය හා දිනය
(පිටපත් ඇමිණිය යුතය)

ඉහත තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

ඉහත තොරතුරු සඳහන් කර්මාන්ත, වෙළඳාම පවත්වාගෙන යන ස්ථානය සඳහා ........................... වර්ෂය වෙනුවෙන් වෙළඳ බලපත්‍රයක් මා වෙත නිකුත් කරන ලෙස ඉල්ලමි. මේ පිළිබඳ නීති රීති වලට මම එකග වෙමි.

දිනය:- ..................................

ඉල්ලුම්කරුගේ අත්සන

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

ආදායම් පරීක්ෂක,

පසුපිටේ සඳහන් ඉල්ලුම්පත්‍රයට අදාළව බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා වන ඔබගේ නිරීක්ෂණ හා නිර්දේශ කඩිනමින් මා වෙත ලබා දෙන ලෙස කාරුණිකව ඉල්ලමි.

දිනය:- ................................

ලේකම්

---

ලේකම්,

බලපත්‍රය ලබා දීම නිර්දේශ කරමි./නොකරමි.

දිනය :- ...............................

ආදායම් පරීක්ෂක

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී,
පසුපිටේ සඳහන් ඉල්ලුම් පත්‍රයට අදාළව බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා වන ඔබගේ නිරීක්ෂණ හා නිර්දේශ කඩිනමින් ලබාදෙන මෙන් කාරුණිකව ඉල්ලමි.

දිනය :- .................................

ලේකම්

---

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී,
අතුරු ව්‍යවස්ථා හා අනෙකුත් නීති රීතිවලට අනුකූලව සුදුසුකම් සපුරා ඇත. බලපත්‍ර නිකුත් කිරීම නිර්දේශ කිරීම සඳහා වාර්තා කරමි.

දිනය :- .................................

මහජන සෞඛ්‍ය පරීක්ෂක

---

ලේකම්,
ඉහත ඉල්ලුම්පත්‍රයට අනුව අදාළ ස්ථානය සඳහා බලපත්‍රයක් නිකුත් කිරීම නිර්දේශ කරමි. / නොකරමි.
(නිර්දේශ නොකරන්නේ නම් ඊට අදාළ හේතුව සඳහන් කරන්න).

දිනය :- .................................

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී

---

**පොදු වැසිකිළි පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

1. මෙම අතුරු ව්‍යවස්ථාව කළුතර, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පවත්වාගෙන යනු ලබන පොදු වැසිකිළි විධිමත් කිරීම සඳහා පනවනු ලබයි.

*ලුහුඬු නාමය*

2. මෙම අතුරු ව්‍යවස්ථාව කළුතර ප්‍රාදේශීය සභාවේ පොදු වැසිකිළි පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වෙයි.

3. මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ **126(ix) වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 122** උප වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට බලය ලැබී ඇත.

4. කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය (මෙහි මින්මතු බල ප්‍රදේශය යනුවෙන් හඳුන්වනු ලබන ) තුල මහජනයා ගැවසෙන ස්ථානවල අවශ්‍ය පරිදි පොදු වැසිකිළි පහසුකම් පවත්වාගෙන යාම සභාවේ කාර්යය වන්නේය.

5. සභාව විසින් බල ප්‍රදේශය තුල පවත්වාගෙන යනු ලබන සියළු පොදු වැසිකිළි ප්‍රමානවත් සනීපාරක්ෂක පහසුකම් යටතේ නිසි හා යෝග්‍ය තත්වයෙන් පවත්වා ගත යුතුය.

*සභාව විසින් පොදු වැසිකිළි පහසුකම් පවත්වා ගත යුතු බව*

6. සභාව විසින් පවත්වාගෙන යනු ලබන සෑම පොදු වැසිකිළියක් සඳහාම ස්ත්‍රී , පුරුෂ හා ආබාධ සහිත අය සඳහා වෙන් වෙන්ව පහසුකම් පවත්වා ගත යුතුය.

7. බල ප්‍රදේශයේ මහජන සෞඛ්‍යයෙහි යහපත සඳහා පවත්වාගෙන යා යුතු බවට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් නියම කරනු ලබන කොන්දේසීන්ට අනුකූලව සෑම පොදු වැසිකිළියක්ම පවත්වා ගත යුතුය.

8. සෑම පොදු වැසිකිළියක් සඳහාම ප්‍රමානවත් ජල සැපයුමක් නිරන්තරයෙන් පවත්වාගත යුතු අතර ඒ සඳහා ජලය ගබඩාකරගත හැකි පහසුකම් වලින්ද සමන්විත විය යුතුය.

9. සෑම පොදු වැසිකිළියකටම ස්ත්‍රීන් හා පුරුෂයින් සඳහා මෙන්ම ආබාධ සහිත අය සඳහා පහසුවෙන් පිවිසිය හැකි ප්‍රවේශයක් සහිතව සකස් විය යුතුය.

10. සෑම වැසිකිළියක් සඳහාම නිශ්චිතව වෙන් කරන ලද ඉඩ ප්‍රමාණයක මනා ජල සම්බන්ධතාවයක් සහිත දෙඅත් සෝදා ගැනීම ආදී කාර්යයන් සඳහා ස්ථිර ලෙස සවිකරන ලද මල නොබැඳෙන ද්‍රව්‍යන්ගෙන් සකස්ව ජල බේසමි සවිකර තිබිය යුතු අතර ඒ සඳහා සෑම විටම ප්‍රමානවත් සනීපාරක්ෂක ද්‍රව්‍ය හා සේදුම් කාරක සබන් හා අත් වියලා ගැනීමේ පහසුකම්ද සපයා තිබිය යුතුය.

11. සෑම පොදු වැසිකිළියක එක් එක් කුටීරයන් තුල වෙන් වෙන්ව ඇඳුම් රඳවනයන් සවිකර තිබිය යුතු අතර අතරැදි දේ තැබිය හැකි පහසුකම් සපයා තිබිය යුතුය.

12. සෑම පොදු වැසිකිළියක සෑම කුටීරයක් තුලම හා පොදුවේ පරිහරණය සඳහා වන අවකාශය තුල පාදයෙන් විවෘත කල හැකි පරිදි වූ කසළ බඳුන් ප්‍රමාණවත්ව තබා තිබිය යුතුය.

13. පොදු වැසිකිළිය පරිහරණය කරන්නන් පැලඳ සිටින මුඛ ආවරණ හෝ අත්වැසුම් ඇත්නම් එවැනි දේ බැහැර කිරීම සඳහා ද පාදයෙන් විවෘත කල හැකි කසළ බඳුන් ඒ සඳහාම බව විශේෂයෙන් සඳහා කරමින් එහි තබා තිබිය යුතුය.

14. සෑම පොදු වැසිකිළියකම මතුපිට පෘෂ්ඨය ජලය රැදී නොසිටින සහ පහසුවෙන් ලිස්සා නොයන පරිදි සිමෙන්තියෙන් හෝ පිහන් ගඩොල් අල්ලා සකස් කර තිබිය යුතු අතර ජලය පහසුවෙන් ඉවත්වන පරිදි බිම සකස්කර තිබිය යුතුය.

15. (01) බල ප්‍රදේශයට අදාලව මහජන සෞඛ්‍ය ආරක්ෂා කර ගැනීම සඳහා පොදු වැසිකිළි පරිහරනය කරන්නන් අවස්ථානුකූලව ක්‍රියාත්මක කල යුතු විශේෂිත සෞඛ්‍ය පියවර පිළිබඳව උපදෙස් පහසුවෙන් තේරුම්ගත හැකි පරිදි පොදු වැසිකිළි පරිශ්‍රය තුළ ප්‍රදර්ශනය කර තිබිය යුතුය.

(02) පොදු වැසිකිළි භාවිතා කරන සෑම තැනැත්තෙක්ම ඊට අදාළ උපදෙස්වලට අනුකූලව ක්‍රියාකල යුතුය.

16. පොදු වැසිකිළි නිරන්තරයෙන් විෂබීජ නාශක යොදා පවිත්‍ර කල යුතු අතර එම කාර්යය ඉටු කිරීම සඳහා වන සේවකයින් යොදා තිබිය යුතු අතර එය එසේ වන බවටද වග බලා ගත යුතුය.

17. සෑම පොදු වැසිකිළියක ප්‍රමාණවත් පරිදි ආලෝකය පවත්වාගත යුතුය.

*ගාස්තු අය කිරීම*

18. බල ප්‍රදේශය තුල කිසියම් පොදු වැසිකිළි යටතේ පවත්වාගෙන යන සේවාවන්ට අදාල පහසුකම් සැලකිල්ලට ගනිමින් ඊට අදාලව ගාස්තුවක් අයකල යුතුයැයි සභාව තීරණය කරන්නේ නම් ඊට අදාලව පවත්වාගෙන යන පහසුකම් පිළිබඳ හා ගාස්තු සම්බන්ධයෙන් පැහැදිලිව සඳහා වන පුවරු භාෂා තුනෙන්ම සකස් කර සවිකර තැබිය යුතුය.

19. පොදු වැසිකිළි භාවිතයේදී ඒ තුළ ඒකරාශී වන අපද්‍රව්‍ය නිශ්චිත ක්‍රම වේදයකට අනුව බැහැර කිරීම සඳහා ක්‍රියා කල යුතු අතර භාවිතා කරන්නන් බැහැර කරන මුඛ ආවරණ හා අත් වැසුම් වැනි දේ සායනික අපද්‍රව්‍ය ලෙස සලකා ඊට අනුකූලව බැහැර කිරීම කල යුතුය.

20. පොදු වැසිකිළිය තුළ පරිහරණය කල දේ පරිහරනය කරන මෙවලම් භාවිතා කරන්නන් විසින් එසේ පරිහරණයෙන් පසු ජලය යොදා තව කෙනෙකුට පරිහරනය සඳහා පහසු වන ආකාරයට සූදානම් කර තැබිය යුතුය.

*දෙවන පාර්ශවයක සහය ලබා ගැනීම*

21. සභාව කිසියම් පොදු වැසිකිළියක සේවාව පවත්වාගෙන යාම සම්බන්ධයෙන් දෙවන පාර්ශවයක සහය ලබාගෙන ඇතිනම් ඊට අදාල දෙවන පාර්ශවයේ කටයුතු මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහා කොන්දේසීන්ට අනුකූලව පවත්වාගෙන යන්නේදැයි පිළිබඳ නිරන්තර අධීක්ෂණයට ලක් කල යුතු අතර ඒ සඳහා කාර්යය පවරණ ලද සේවකයින් සේවයේ යොදවා තිබිය යුතුය.

22. බල ප්‍රදේශය තුළ නිරෝධායක හා රෝග වැලැක්වීමේ ආඥා පනත හා ඒ යටතේ වූ රෙගුලාසි යටතේ නියම කර ඇති හෝ කවර හෝ වසංගත තත්වයකට කරුණු යෙදී ඇති විටදී පොදු වැසිකිළි භාවිතා කරන්නන් විසින් පිළිපැදිය යුතු බවට සඳහා කවර හෝ නියමයක් මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහා විධිවිධානයන්ට අතිරේකව බලාත්මක විය යුතුය.

23. බල ප්‍රදේශය තුළ මහජන සෞඛ්‍යයෙහි යහපත සඳහා කිසියම් පොදු වැසිකිළියක් භාවිතයට ගැනීම නිශ්චිත කාල සීමාවකට සීමා කිරීම, භාවිතය සීමා කිරීම, තාවකාලිකව වසා තැබීම යන කවර හෝ පියවරක් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී උපදෙස් පරිදි සභාපතිවරයා කරන නියමයන් යටතේ ක්‍රියාත්මක කිරීම නීත්‍යානුකූල විය යුතුය.

*වසංගත තත්වයක පොදු වැසිකිළි භාවිතය*

24. බල ප්‍රදේශය තුළ නිරෝධායක සහ රෝග වැලැක්වීමේ ආඥා පනතේ විධිවිධාන යටතේ පනවන ලද රෙගුලාසි මගින් ප්‍රකාශිත හෝ කිසියම් වසංගත රෝගී තත්වයක් පැතිර යාමට හේතුවිය හැකි කරුණු සැලකිල්ලට ගනිමින් පොදු වැසිකිළි භාවිතයට ගැනීමට පූර්වයෙන් අනුගමනය කල යුතු විශේෂිත උපදෙස් සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී විසින් නියම කර ඇති විටක එකී උපදෙස් වලට අනුකූලව පොදු වැසිකිළි භාවිතය සඳහා යෙදවීමට සභාපති විසින් සියලු පියවර ගත යුතුය.

25. ඉහත 24 වගන්තිය යටතේ වූ පියවර සම්බන්ධයෙන් පොදු වැසිකිළි භාවිතයට ඇතුලත්වීමට පූර්වයෙන් පරිහරණය කරන්නන්ට පහසුවෙන් ඇස ගැටෙන පරිදි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිගේ උපදෙස් පරිදි සභාපති වරයා විසින් ප්‍රදර්ශනය කරවා තිබිය යුතු අතරම ඒ සෑම උපදේශයකටම අනුකූල වෙමින් පොදු වැසිකිළි භාවිත කරන්නන් විසින් ක්‍රියා කල යුතුය.

26. සෑම පොදු වැසිකිළියක්ම කිසිදු දුර්ගන්ධයක් වහනය නොවන පරිදි නිශ්චිත දෛනික කාල සටහනකට අනුව විෂබීජ නාශක යොදා පිරිසිදු කල යුතු අතර එසේ පිරිසිදු කිරීමේ කටයුතු පිළිබඳ ඒ සඳහා පරිශ්‍රය තුළ නිශ්චිතව තබා ඇති වාර්තාවක සටහන් කල යුතුය. පවිත්‍රතා කටයුතු අඛණ්ඩව සිදුවන බවට නියාමනය කිරීම සඳහා වන සුදුසු වැඩපිළිවෙලක් සභාපති විසින් ක්‍රියාත්මක කල යුතුය.

27. මෙම අතුරු ව්‍යවස්ථාවේ ඉහත වගන්ති යටතේ කුමක් සඳහා වුවද බල ප්‍රදේශය සඳහා නිරෝධායන හා රෝග වැලැක්වීමේ ආඥා පනත යටතේ හෝ ඒ යටතේ සඳහා ලද රෙගුලාසියක විධිවිධාන ක්‍රියාත්මක කිරීමෙහිලා මෙම අතුරු ව්‍යවස්ථාවේ කවර හෝ විධිවිධානයක් මඟින් බාධාවක් නොවිය යුතුය.

28. සභාව වෙනුවෙන් දෙවන පාර්ශවයක පරිපාලනය යටතේ පොදු වැසිකිළියක් පවත්වාගෙන යන්නේ නම්, එසේ පවත්වාගෙන යනු ලබන සෑම පොදු වැසිකිළියක්ම සම්බන්ධයෙන්ම මෙම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන එලෙසින්ම අදාල විය යුතු අතර , සෑම විටම එය අදාල වූවාසේ සලකා ක්‍රියා කල යුතුය.

29. පොදු වැසිකිළිය භාවිතය සඳහා මුදලක් අය කරනු ලබන්නේ නම්, එසේ අය කරනු ලබන මුදලට අදාලව නිශ්චිත ලදුපතක් භාවිතා කරන්නා වෙත නිකුත් කරනු ලැබිය යුතුය.

30. කවර හෝ තැනැත්තෙකු විසින් මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහා නියම කර ඇති විධිවිධානයක් කඩකරමින් ක්‍රියා කරන්නේනම් එය වරදක් වන අතර එම වරද සම්බන්ධයෙන් බලයලත් අධිකරණයක් විසින් වරදකරුවෙකු කිරීමෙන් පසු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (2) උප වගන්තිය යටතේ වූ දඬුවමකට යටත් විය යුතුය. *දණ්ඩනය*

31. මෙම අතුරු ව්‍යවස්ථාවේ පද සම්බන්ධයෙන් අත්‍යාර්ථයන් අවශ්‍ය වන්නේ නම් මිස, මෙම අතුරු ව්‍යවස්ථාවේ,
"සභාව" යන්නෙන් කළුතර ප්‍රාදේශීය සභාවද,
"සභාපතිවරයා" යන්නෙන් කළුතර ප්‍රාදේශීය සභාවේ තත්කාලයේ සභාපති ධූරය දරන එම ධූරයේ කාර්යය කර්තව්‍ය ඉටුකරන අයද
"සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී" යන්නෙන් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අදාල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාසය සඳහා එම තනතුර දරන අයද අදහස් වෙයි.

32. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර අනනුකූලතාවයක් හටගතහොත් සිංහල පාඨ ප්‍රමුඛ වෙයි. *පාඨ අත අනනුකූලතාවය*

**මහජන සෞඛ්‍යයට අන්තරායක ලෙස අපද්‍රව්‍ය බැහැර කිරීම පාලනය සම්බන්ධයෙන් වන අතුරුව්‍යවස්ථාව**

1. මෙම අතුරුව්‍යවස්ථාව කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අදාලවන වසංගත තත්ත්වයක් යටතේ ජනතාව භාවිතයට ගන්නා ලද සෞඛ්‍ය ආරක්ෂිත මෙවලම් එසේ භාවිතයෙන් පසු මහජන සෞඛ්‍යයට අන්තරායක ලෙස පරිසරයට බැහැර කිරීම වළක්වමින් ඊට අදාල බැහැර කිරීම් ක්‍රමෝපායන් නියම කිරීම සඳහා මෙම අතුරුව්‍යවස්ථාව පනවන ලදී.

2. මෙම අතුරුව්‍යවස්ථාව කළුතර ප්‍රාදේශීය සභාවේ මහජන සෞඛ්‍යයට අන්තරායකර ලෙස අපද්‍රව්‍ය බැහැර කිරීම පාලනය කිරීම සඳහා වන අතුරුව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ. *ලුහුඬු නාමය*

3. මෙම අතුරුව්‍යවස්ථාව සෑදීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ **126 (ix) වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 122 උප** වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට බලය ලැබී ඇත.

4. ශ්‍රී ලංකාව පුරාම හෝ ඉන් කොටසකට හෝ බලප්‍රදේශයට අදාලව හෝ නිරෝධායන හා රෝග වැළැක්වීමේ ආඥා පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද රෙගුලාසි යටතට අදාලව වසංගත තත්ත්වයක් ප්‍රකාශයට පත්කර ඇති කවර හෝ අවස්ථාවක හෝ බලප්‍රදේශය තුල වසංගත තත්ත්වයකට කරුණු යෙදිය හැකි බවට සෑහීමකට පත්වෙමින් එය පාලනය කිරීම සඳහා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී උපදෙස් පරිදි සභාපතිවරයා නියම කරනු ලබන නියමයන්ට අනුව, බලප්‍රදේශයෙහි ජනතාව මුව වැසුම්, අත්වැසුම් කවර හෝ වෙනත් ආරක්ෂක පළඳනා ( මෙහි මින් මතු ඇතැම් තැනක මෙවලම් ලෙස ද හඳුන්වනු ලබන ) භාවිතයට ගැනෙන අවස්ථාවක, එවැනි දේ භාවිතයෙන් පසු ඒවා බැහැර කිරීමේ දී මෙහි මතු සඳහන් විධිවිධාන්ට යටත්ව සිදු කළ යුතුය. *අදාළ වීම*

*නිශ්චිත කසළ බඳුන් පවත්වාගත යුතු බව*

5. බලප්‍රදේශයට අදාලව ඉහත 4 වන වගන්තියෙහි සඳහන් තත්ත්වයකට කරුණු යෙදී ඇති කවර හෝ අවස්ථාවක හෝ සෞඛ්‍යාරක්ෂාව වෙනුවෙන් මහජනයා පරිහරණය කරන ලද අත්වැසුම්, මුව වැසුම් හෝ වෙනත් කවර හෝ සෞඛ්‍ය ආරක්‍ෂක පළඳනා බැහැර කිරීම සඳහා සෑම පොදු හෝ පෞද්ගලික පරිශ්‍රයකම ඊට අදාලව වෙන් කරන ලද සංවෘත අපද්‍රව්‍ය බහාලුම් පවත්වාගත යුතුය.

6. බලප්‍රදේශය තුල මෙම අතුරුව්‍යවස්ථාව යටතේ 4 වන වගන්තියේ සඳහන් තත්ත්වයකට කරුණු යෙදී ඇති විටකදී ඉහත 5 වන වගන්තිය යටතේ සඳහන් ඒ සඳහාම වෙන්කරන ලද අපද්‍රව්‍ය බහාලුමකට හැර කිසිදු තැනැත්තෙකු විසින් තවත් භාවිතයට ගන්නා ලද අත්වැසුම්, මුව වැසුම් හා වෙනත් එවැනි දේ පරිහරණයෙන් පසු බැහැර කිරීම නොකළ යුතුය.

*පොදු අධිකාරියෙහි වගකීම*

7. මෙම අතුරුව්‍යවස්ථා මෙහි 4 වන වගන්තිය යටතේ සඳහන් තත්වයකට කරුණු යෙදී ඇති අවස්ථාවක සෑම පොදු පරිශ්‍රයකට භාවිතයට ගන්නා ලද අත්වැසුම්, මුව වැසුම් හා වෙනත් එවැනි දේ බැහැර කිරීම සඳහා ප්‍රමාණවත් පරිදි අපද්‍රව්‍ය බහාලුම් පවත්වා ගෙන යාමට පරිශ්‍රයට අදාළ අධිකාරීත්වයෙහි වගකීම හා කාර්යය වන්නේය.

*මිශ්‍රවීම වැළැක්වීම*

8. කිසිදු තැනැත්තෙකු විසින් මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ වූ කාර්යය සඳහා පවත්වාගෙන යනු ලබන අපද්‍රව්‍ය බහාලුමකට, මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිශ්චිත කර ඇති අපද්‍රව්‍ය හැර වෙනත් කවර හෝ අපද්‍රව්‍ය බැහැර කිරීමක් හෝ ඒවා සමඟ මිශ්‍රවීමට සැළැස්වීමක් නොකළ යුතුය.

9. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ එක් රැස්වන අපද්‍රව්‍ය බැහැර කිරීම හෝ විනාශ කිරීම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී උපදෙස් පරිදි සභාපතිවරයා විසින් නියම කරන ක්‍රමවේදයට අනුකූලව පමණක් සිදුකළ යුතු අතර, ඒ සඳහා ප්‍රාදේශීය සභාව විසින් ක්‍රියාත්මක කරන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන පිළිබඳව බල ප්‍රදේශය තුළ ප්‍රසිද්ධ කළ යුතුය.

*දණ්ඩනය*

10. කවර හෝ තැනැත්තෙකු විසින් මෙම අතුරු ව්‍යවස්ථාවේ 6 සහ 8 වගන්ති යටතේ සඳහන් විධිවිධාන උල්ලංඝනය වන පරිදි ක්‍රියා කිරීම වරදක් වන අතර, එම වරද සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් අධිකරණය විසින් වරදකරු කිරීමෙන් පසු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (2) උපවගන්තිය යටතේ වූ දඬුවමකට යටත් විය යුතුය.

11. මෙම අතුරු ව්‍යවස්ථාවේ පද සම්බන්ධයෙන් අන්‍ය අර්ථයක් අවශ්‍ය වන්නේනම් මිස, මෙම අතුරු ව්‍යවස්ථාවේ

''සභාව'' යන්නෙන් කළුතර ප්‍රාදේශීය සභාවද
''සභාපති'' යන්නෙන් කළුතර ප්‍රාදේශීය සභාවේ තත්කාලයෙහි සභාපති ධූරය දරන හෝ එම ධූරයේ කාර්යය කර්තව්‍ය ඉටුකරණ අයද,

''සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී'' යන්නෙන් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අදාල අදාලෙ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාසය සඳහා එම තනතුර දරන අයද,

''මහජන සෞඛ්‍ය පරීක්ෂක'' යන්නෙන් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අදාලව සේවයේ යෙදෙන ප්‍රාදේශීය සභාවේ හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයට අනුයුක්තව මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුර දරන අයෙක්ද,

''බලප්‍රදේශය'' යන්නෙන් කළුතර ප්‍රාදේශීය බල ප්‍රදේශය ද, අදහස් වේ.

මෙම අතුරු ව්‍යස්ථාවේ සිංහල, ඉංග්‍රීසි හා දෙමළ පාඨ අතර අනනුකූලතාවයක් හටගත හොත් එවිට සිංහල පාඨය ප්‍රමුඛ වේ.

**පා􏰀වල් හා මංමාවත්වල සංදර්ශන පැවැත්වීම පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

1. මෙම අතුරු ව්‍යවස්ථාව කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල යම් පාරක, මංමාවතක, ඊට අදාල රක්ෂිතයක ජනතාව ඒකරාශී කරමින් සංදර්ශන පැවැත්වීම පාලනය කිරීම විධිමත් කිරීම ඇතුළු ඊට අනුෂාංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලබයි.

*ලුහුඬු නාමය*

2. මෙම අතුරු ව්‍යවස්ථාව කළුතර ප්‍රාදේශීය සභාවේ පාරවල් හා මංමාවත්වල සංදර්ශන පැවැත්වීම පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වෙයි.

3. මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීමට 1987 අංක 15 දරනප්‍රාදේශීය සභා පනතේ **126 (vii) වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 122** උප වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට බලය ලැබී ඇත.

*අවස􏰀 ලබා ගැනීම*

4. කළුතර ප්‍රාදේශීය සභා බලප්‍රදේශය (මෙහි මින්මතු බල ප්‍රදේශය යනුවෙන් හඳුන්වනු ලබන) තුල යම් පාරක මංමාවතක හෝ ඊට අදාල රක්ෂිතයක් උපයෝගී කර ගනිමින් කිසිදු තැනැත්තෙකු විසින් සභාපතිවරයා වෙතින් ලබාගත් පූර්ව ලිඛිත අවසරයක් ඇත්තේනම් මිස ජනතාව ඒකරාශීවන පරිදි යම් සංදර්ශනයක් පැවැත්වීම හෝ ඒ හා සමාන ක්‍රියාවක යෙදීම නොකළ යුතුය.

5. බල ප්‍රදේශය තුල යම් පාරක , මංමාවතක හෝ ඊට අදාළ රක්ෂිතයක යම් නිශ්චිත දිනක නිශ්චිත කාලසීමාවක් තුල සංදර්ශනයක් පැවැත්වීමෙහිලා හෝ ජනතාව ඒකරාශිවන පරිදි යම් ක්‍රියාවක යෙදීමට අදහස් කරන කවර හෝ තැනැත්තෙකු විසින් ඒ සඳහා වූ අවසරය සභාපතිවරයා වෙත පූර්වයෙන් ඉදිරිපත් කරන ඉල්ලුම් පත්‍රයක් මගින් ඉල්ලුම්කල යුතුය.

6. යම්කිසි තැනැත්තෙක් ජනතාව එක් රැස්කරමින් පාරක, මංමාවතක හෝ ඊට අදාල රක්ෂිතයක සංදර්ශනයක් පැවැත්වීම හෝ ජනතාව ඒකරාශී වන පරිදි වූ කවර හෝ ක්‍රියාවක යෙදීම සඳහා ඉල්ලුම්කර ඇති විටක එවැනි ජනතාව ඒකරාශී කිරීමක් බලප්‍රදේශයේ ඒවන විට පවතින මහජන සෞඛ්‍යයෙහි යහපතට කොතෙක් දුරට උචිතද යන්න පිළිබඳව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී නිර්දේශයකින් හා ඊට අදාලව ලබාදී ඇති කොන්දේසි ඇත්නම් එම කොන්දේසිවලට යටත් කිරීමකින් තොරව සභාපතිවරයා විසින් කිසිදු තැනැත්තෙකු වෙත ඒ සඳහා අවසරය ලබාදීම නොකළ යුතුය. **සභාපතිව□යා විසින් අවසරය ලබා දීම.**

7. ශ්‍රී ලංකාව පුරාම හෝ කොටසකට අදාලව නිරෝධායක හා රෝග වැලැක්වීමේ ආඥා පනත හා ඒ යටතේ සාදන ලද රෙගුලාසි මගින් හෝ කවර හෝ වසංගත තත්වයන් ප්‍රකාශයට පත්කර ඇති කවර අවස්ථාවක හෝ බල ප්‍රදේශය තුල වසංගත තත්වයක් ප්‍රකාශයට පත්ව ඇති කවර අවස්ථාවක වුවද කිසිදු පාරක , මංමාවතක හෝ ඊට අදාල රක්ෂිතයක් උපයොගී කර ගනිමින් ජනතාව ඒකරාශී වන පරිදි වූ ක්‍රියාවන්හි යෙදීම නොකළ යුතුය.

8. මෙම අතුරු ව්‍යවස්ථාව අදාල සංදර්ශන කාර්යයන් පැවැත්වීම සඳහා ඉල්ලුම් කරන සෑම තැනැත්තෙක්ම අදාල සංදර්ශනය පහත සඳහා කොන්දේසීන්ට යටත්ව පවත්වා ගත යුතුය. **කොන්දේසි**

(1) සංදර්ශනය පැවැත්වීමේදී එසේ පැවැත්වෙන සම්පූර්ණ කාල සීමාව තුල බල ප්‍රදේශයෙහි මහජන සෞඛ්‍යයේ යහපත සඳහා පවත්වාගත යුතු බවට නියමකර ඇති සෞඛ්‍ය ආරක්ෂණ ක්‍රමෝපායන්ට අනුගත වෙමින් අදාල ක්‍රියාවෙහි යෙදෙන බව,

(2) සංදර්ශනය සෑම විටම අහඹුලෙස ඒකරාශීවන ජනතාව සඳහා පමණක් පවත්වාගත යුතු බව හා අදාල සංදර්ශනය ඒ සම්බන්ධයෙන් කවර හෝ පූර්ව ප්‍රචාරණයක් සිදු නොකරන බව,

(3) සංදර්ශනය අරමුණුකර ගන්මින් කිසිදු මුදල් අය කිරීමක් සිදු නොකළ යුතු බව,

(4) කිසිදු අවස්ථාවක පැවැත්වෙන සංදර්ශනයේ දෘෂ්‍යපථය අවම වන පරිදි පිහිටීමක් පවත්වා ගන්මින් සංදර්ශනයේ නොයෙදෙන බව,

(5) සංදර්ශනකරු විසින් සංදර්ශනය පැවැත්වෙන ස්ථානයේ ප්‍රමාණවත් සංවෘත කසළ බඳුන් තබා තිබිය යුතු අතර,එක්රැස් වන්නන් බැහැර කරන දේ ඇතිනම් ඒ දේ කසළබඳුන් වලට දැමීමට සැලැස්විය යුතු අතරම ඒ සඳහා රැස්වන ජනතාව උනන්දු කරමින් සංදර්ශනය පවත්වන බව,

(6) සංදර්ශනය අවස්ථාවේදී සංදර්ශනය පවත්වන්නා වූ ස්ථානයේ තමා විසින් තබන ලද කසළ බඳුන් තුල එක් රැස්වූ කසළ , සංදර්ශනය අවසානයේදී සංදර්ශනකරු විසින් බලප්‍රදේශය තුල ක්‍රියාත්මක කසළ කළමනාකරණ වැඩසටහනට අනුකූලව බැහැර කිරීම කරන බව,

(7) සංදර්ශනය පැවැත්වෙන ස්ථානයේ ශබ්දවාහිණී යන්ත්‍ර හෝ වෙනත් දෘෂ්‍ය ප්‍රදර්ශන පුවරු පවත්වා ගන්නේනම් ඒ සම්බන්ධයෙන් ඊට අදාල වන්නා වූ ලිඛිත නීතිය යටතේ පූර්ව අනුමැතිය ලබා තිබිය යුතු බව හා එය පහසුවෙන් වැඩිමනක් දිසාවන්ට දෘෂ්‍යමාන වීමට හැකිවන පරිදි පවත්වාගත යුතු බව,

(8) අදාළ සංදර්ශනය පැවැත්වීමෙන් රථවාහන ගමනාගමනයට හෝ පදික ගමනාගමනයට කිසිදු බාධාවක් හෝ අවහිරයක් ඇති නොවන පරිදි සංදර්ශනය පවත්වාගෙන යන බව,

(9) අදාල සංදර්ශනය පැවැත්වීමෙහිලා හෝ ක්‍රියාවෙහි යෙදීමෙහිලා දෙන ලද අවසරය යටතේ එසේ එක් රැස්වන ජනතාව පිළිපැදිය යුතු මහජන සෞඛ්‍ය පිළිබඳ නියමයන් ඇත්නම් එම සෑම නියමයන්ම ඒ ආකාරයෙන් ඉටුවන බවට සෑහීමට පත් වෙමින් අදාල සංදර්ශනය පැවැත්වීම හෝ ක්‍රියාවෙහි යෙදෙන බව,

*ගමනාගමනයට බාධා නොවිය යුතු බව.*

9. සභාපතිවරයා විසින් පාරක, මංමාවතක හෝ ඊට අදාල රක්ෂිතයක කිසියම් සංදර්ශනයක් හෝ ඒ හා සමාන කාරණයක් සඳහා අවසර දීමේදී එය පවත්වාගෙන යාමට යෝජිත ස්ථානයේ එබඳු සංදර්ශනයක් පැවැත්වීමේදී පාර, මංමාවත හෝ ඊට අදාල රක්ෂිතය භාවිතා කරන පොදු මහජනතාවට හෝ රථවාහන ගමනාගමනයට එමගින් බාධාවක් ඇති නොවන බවට සෑහීමට පත් වීමෙන් පසු මෙම අතුරු ව්‍යවස්ථාවේ 4 වන වගන්තිය යටතේ වූ අදාල අවසරය ලබාදිය යුතුය.

10. ජනතාව ඒකරාශී කිරීමක් හෝ සංදර්ශන කාර්යයන් සඳහා සභාව මඟින් තීරණය කර නිශ්චිත පොදු ස්ථානයක් වෙන්කර ඇති අවස්ථාවක , එම ස්ථානයේ හැර පාරක මංමාවතක හෝ ඊට අදාල රක්ෂිතයක කිසිදු සංදර්ශන සඳහා සභාපතිවරයාගේ අවසර නොදිය යුතුය.

*ගාස්තු*

11. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ අවසර පත්‍රයක් ලබාදීමේදී ඒ සඳහා අයකල යුතු ගාස්තු සභාව විසින් කලින් කල යොජනා සම්මුතියක් මගින් තීරණය කර ප්‍රකාශයට පත් කරනු ලබන ගාස්තු විය යුතුය.

12. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ සභාපතිවරයා වෙතින් ලබාගත් අවසර පත්‍රයක් යටතේ කටයුතු කිරීම වුවද නිරෝධායක හා රෝග වැලැක්වීමේ ආඥා පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද රෙගුලාසි යටතේ වූ විධිවිධානයන්ට යටත්ව විය යුතුය

*අවසර පත්‍රය අවලංගු කිරීම*

13. බල ප්‍රදේශය තුල වසංගත තත්වයක් සඳහා හේතුවන කරුණු යෙදී ඇති බවට සභාපතිවරයා සෑහීමට පත්වන කවර අවස්ථාවක වුවද මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ලබා දී ඇති අවසර පත්‍රයක් සභාපතිවරයා විසින් අවලංගු කිරීම නීත්‍යානුකූල වන අතර, එසේ අවලංගු කිරීමේදී අවසර පත්‍රයක් සඳහා අයකරන ලද මුදල ඉල්ලුම්කරු වෙත නිදහස් කල යුතුය.

*දණ්ඩනය*

14. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ලබා ගත යුතු අවසර පත්‍රයකින් තොරව බල ප්‍රදේශය තුළ යම් පාරක මංමාවතක සංදර්ශනයක් පැවැත්වීම හෝ මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කොන්දේසි උල්ලංඝනය වන පරිදි ක්‍රියා කිරීම වරදක්වන අතර එම වරද සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් වරදකරුවෙකු කිරීමෙන් පසු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(2) උප වගන්තිය යටතේ වූ දඬුවමට යටත් විය යුතුය.

*අර්ථ නිරූපනය*

15. මෙම අතුරු ව්‍යවස්ථාවේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයන් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ,

"සභාව" යන්නෙන් කළුතර ප්‍රාදේශීය සභාවද,

"සභාපතිවරයා" යන්නෙන් කළුතර ප්‍රාදේශීය සභාවේ තත්කාලයේ සභාපති ධූරය දරන හෝ එම ධූරයේ කාර්යය කර්තව්‍ය ඉටුකරන අයද,

"සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි" යන්නෙන් ප්‍රදේශයට අදාල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාසය සඳහා එම තනතුර දරන අයද , අදහස් වෙයි.

*පාඨ අතර අනනුකූලතාවය*

16. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල , දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර අනනුකූලතාවයක් හටගතහොත් සිංහල පාඨය ප්‍රමුඛ වෙයි.

## ආහාර නිෂ්පාදන ස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1. මෙම අතුරු ව්‍යවස්ථාව කළුතර ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුල ආහාර නිෂ්පාදන ස්ථාන විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, පරීක්ෂා කිරීම සහ පාලනය කිරීම සඳහා පනවනු ලබයි.

*ලුහුඬු නාමය*

2. මෙම අතුරු ව්‍යවස්ථාව කළුතර ප්‍රාදේශීය සභාවේ ආහාර නිෂ්පාදන ස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

*නෛතික බලය*

3. මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීමට 1987 අංක 15 දරනප්‍රාදේශීය සභා **පනතේ 126(IX) වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 122 උපවගන්තිය** යටතේ ප්‍රාදේශීය සභාවට බලය ලැබී ඇත.

*බලපත්‍රයක් ලබා ගත යුතු බව*

4. කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය (මෙහි මින්මතු බලප්‍රදේශය යනුවෙන් හඳුන්වනු ලබන) තුල කිසිදු තැනැත්තෙකු විසින් සභාපතිවරයා වෙතින් මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ලබාගත් බලපත්‍රයක් යටතේ මිස මිනිස් පරිභෝජනය සඳහා ව්‍යාපාරික වශයෙන් ආහාර නිෂ්පාදනය කරන ස්ථානයන් (මෙහි ඇතැම් තැනෙක පරිශ්‍රය යනුවෙන් හඳුන්වනු ලබන) පවත්වාගෙන යාම නොකළ යුතුය.

5. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ඉල්ලුම් කරන සෑම තැනැත්තෙක්ම මෙම අතුරු ව්‍යවස්ථාවේ උපලේඛනයට සාරානුකූලව පිළියෙල කරන ලද ඉල්ලුම් පත්‍රයක් යටතේ ඒ සඳහා ඉල්ලුම් කළ යුතුය. බලපත්‍රයක් ඉල්ලුම් කිරීම

6. ඉහත වගන්තිය යටතේ වූ ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කිරීම, ඒ සඳහා අවශ්‍යතා සම්පූර්ණ කර ලියාපදිංචි තැපෑලෙන් සභාපති වෙත යොමු කිරීමෙන්, ගෙනවිත් භාර දීමෙන් , හෝ සභාව අවසර දී ඇති ප්‍රමාණයට විද්‍යුත් තැපෑලෙන් යොමු කිරීමෙන් ඉදිරිපත් කල හැකිය.

7. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ඉල්ලුම් කරන සෑම තැනැත්තෙකුම මෙහි පහත සඳහා කොන්දේසි සම්පූර්ණ කර ඇත්තේනම් මිස සභාපතිවරයා විසින් බලපත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතුය. බලපත්‍රයක් සඳහා කොන්දේසි

(1) පරිශ්‍රයට අදාල සියළු ඉදිකිරීම් අවස්ථාවෝචිත පරිදි 1978 අංක 41දරන නාගරික සංවර්ධන අධිකාරී පනත යටතේ හෝ නිවාස හා නගර සංවර්ධන ආඥා පනතේ විධිවිධානයන්ට අනුකූලව කරන ලද ඉදිකිරීම් විය යුතු අතර එහි,

(අ) සියලුම ඉදිකිරීම් සඳහා යොදාගෙන ඇති ද්‍රව්‍ය විෂ සහිත ද්‍රව්‍ය බාහිරට මුදා නොහැරෙන හා විෂ සහිත වායූන් ප්‍රේෂණය නොවන ලෙස මෙන්ම සියළුම ඉදිකිරීම් ජීවීන්ට පහසුවෙන් රැඳී සිටිය නොහැකි මතුපිට පෘෂ්ඨයන්ගෙන් සමන්විත පරිදි සකස්කර තිබිය යුතුය.

(ආ) අභ්‍යන්තර පිරිසැකැස්ම බාධාවකින් තොරව සේවාවන් ඉටු කිරීමට හැකිවන පරිදි , ප්‍රමානවත් ඉඩ පහසුකම් සහිතව නිර්මානය කර තිබිය යුතුය.

(ඇ) ආහාර අමුද්‍රව්‍ය හා පිසිනු ලබන ආහාර සඳහා දූහක ද්‍රව්‍ය ඇතුල්වීම වැලැක්වෙන පරිදි ආරක්ෂිත පිරිසැකසුමක් සහිතව නිර්මානය කර තිබිය යුතුය.

(ඈ) පරිශ්‍රයෙහි අභ්‍යන්තරය ආහාරවල ස්වස්ථතා තත්වයන් පරික්ෂා කිරීමට හැකිවන පරිදි නිර්මානය කර තිබිය යුතුය.

(ඉ) පරිශ්‍රයෙහි අභ්‍යන්තර පිරිසැකසුම් ක්‍රියාකාරකම් යටතේ බැහැර කරන දේ කිසිදු ආකාරයකින් ආපසු ගලා නොඑන පරිදි වූ යොමු කිරීම් සහිතව සකස්වී තිබිය යුතුය.

(2) පරිශ්‍රයෙහි ආහාර පිරිසැකසුම් ස්ථානයෙහි ,

(අ) බිම හා බිත්ති සේදිය හැකි , ලිස්සා නොයන හා ජලය අවශෝෂණය නොවන ද්‍රව්‍ය වලින් සකස් වී තිබිය යුතුය.

(ආ) සෑම මතුපිට පෘෂ්ඨයක්ම පහසුවෙන් පිරිසිදු කල හැකි සේදුම් කාරක ද්‍රව්‍යන්ට හා විෂබීජ නාශකවලට අක්‍රියව පැවතිය යුතුය.

(ඇ) සිවිලිම ඝණීභවනය අවම වන පරිදි හා පුස් සෑදීම, පතුරු ගැලවීම වැලැක්වෙන පරිදි ඉදිකරනු ලැබූවක් විය යුතුය.

(ඈ) ජනෙල් හා වෙනත් කවුළු ඇත්නම්, ඒවා කෘමීන්ට ඇතුළුවිය නොහැකි ආකාරයේ ආවරණයකින් ආවරණය කර තිබිය යුතුය.

(ඉ) පිටත වාතය පහසුවෙන් ගලා ඒමට හා අපහරිත වායුව පිටතට පහසුවෙන් ගලා යා හැකි පරිදි අවශෝෂක පංකා යොදා තිබිය යුතුය.

(3) පරිශ්‍රය තුලට ප්‍රමානවත් වාතාශ්‍රයක් සැපයීම හෝ වායුසමනය කර ඇති විට වායු සමීකරණ යන්ත්‍ර ප්‍රමානවත් උෂ්නත්වයෙන් ක්‍රියාත්මක වන බවට සහතික වීම සහ සියළුම වායු සමීකරණ පද්ධතිවල වාතය ආපසු ඒම වැලැක්වෙන පරිදි කටයුතු කර තිබිය යුතුය.

(4) පරිශ්‍රයෙහි සේවයෙහි යෙදෙන්නන් සඳහා,

(අ) නේවාසිකයන් වශයෙන් සිටීනම් නවාතැන් සඳහා ප්‍රමානවත් සනීපාරක්ෂක පහසුකම් සහිත කාමර පහසුකම් තිබිය යුතු අතර එය ආහාර පිළියෙල කිරීම ආහාර නිෂ්පාදනය සඳහා හෝ අමුද්‍රව්‍ය ගබඩාකරන ස්ථානයෙන් වෙන් වූ ස්ථානයක විය යුතුය.

(ආ) නේවාසික සේවකයින් වන විටදී නිදා ගැනීමට එක් අයකුට වර්ග මීටර් හතරකට අවම වශයෙන් වූ ඉඩකඩක් වෙන්වී තිබිය යුතුය.

(ඇ) ස්ත්‍රී හා පුරුෂ වශයෙන් දෙපක්ෂයට වෙන් වූ වැසිකිළි පහසුකම් සහ නාන කාමර පහසුකම් සපයා තිබිය යුතුය.

(5) අවශ්‍ය අවස්ථාවක ශාරීරික දුරස්ථභාවයකින් යුතුව ප්‍රමාණවත් වන ඉඩකඩක් සහිතව පාරිභොගිකයින්ට ආහාර ඇනවුම් කිරීමට හැකිවන පරිදි පරිශ්‍රයෙහි අභ්‍යන්තර ව්‍යුහය සකස් වී තිබිය යුතුය.

(6) පාරිභොගිකයින්ගේ වාහන නවතා තැබීම සඳහා ප්‍රමාණවත් ඉඩ පහසුකම් තිබිය යුතුය.

(7) හදිසි විදුලි බිඳවැටීම් හා ජල සම්බන්ධතාවය බිඳවැටීම් සම්බන්ධයෙන් ප්‍රයෝජනයට ගත හැකි ප්‍රමානවත් ධාරිතාවයකින් යුත් විදුලි බිඳ වැටීමකදී ස්වයංක්‍රීයව ක්‍රියා කරවන විදුලි ජනක යන්ත්‍ර හා ජලය ගබඩා කිරීමේ පහසුකම් තිබිය යුතුය.

(8) පරිශ්‍රයෙහි අභ්‍යන්තර කාණු හා අපද්‍රව්‍ය බැහැර කිරීම් පූතික වළකට හෝ උරා ගැනීමේ වලකට යොමු කර තිබිය යුතු අතර, එම පූතික වල හෝ උරා ගැනීමේ වල ජල මූලාශ්‍රයක ඇත්නම් එයට මීටර් 15.25 කට වඩා වැඩි දුරකින් විය යුතුය.

***බලපත්‍රයක් නිකුත් කිරීම***

8. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ වූ බලපත්‍රයක් සඳහා ඉදිරිපත් වන ඉල්ලුම් පත්‍රයකට අදාළව ඉල්ලුම් පත්‍රය ලැබී දින දහ හතරක් ඇතුලත සභාපති වරයා විසින් ;

(1) 7 වන වගන්තිය යටතේ වූ කොන්දේසි වලට අනුකූල විටදී පරිශ්‍රයට අදාළ බලපත්‍රයක් ඉල්ලුම්කරු වෙත නිකුත් කල යුතුය.

(2) 7 වන වගන්තියෙහි සඳහා කොන්දේසිවලට අනුකූල නොවන්නේනම් හේතු දක්වා අදාළ ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කල යුතුය.

***බලපත්‍රයක් සඳහා ගාස්තු***

9. (1) මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රයක් සඳහා අයකල යුතු ගාස්තු මූලික නීතියේ සඳහා විධිවිධානයන්ට යටත්ව සභාව විසින් වාර්ෂිකව තීරණය කර ප්‍රකාශයට පත්කරන ගාස්තු විය යුතුය.

***පරීක්ෂණ ගාස්තු***

(2) බලපත්‍රයක් නිකුත් කිරීමට අදාලව ස්ථාන පරීක්ෂාව සඳහා වන පරීක්ෂණ ගාස්තුවක් සභාව විසින් තීරනය කර අය කිරීම නීත්‍යානුකූල විය යුතුය

***වලංගු කාලය***

10. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන බලපත්‍රයක් මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධාන අනුව කලින් අවලංගු නොකළ හොත් බලපත්‍රයට අදාළ වර්ෂයෙහි දෙසැම්බර් තිස්එක දින දක්වා වලංගු විය යුතුය.

***බලපත්‍රයකට අදාළ කොන්දේසි***

11. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලත් සෑම තැනැත්තෙක්ම මෙහි පහත සඳහා කොන්දේසීන්ට අනුකූලව ක්‍රියා කල යුතුය.

(1) ශ්‍රී ලංකාව පුරාම හෝ ඉන් කොටසකට හෝ බල ප්‍රදේශයට අදාලව හෝ නිරෝධායක හා රෝග වැලැක්වීමේ ආඥා පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද රෙගුලාසි යටතට අදාළ වසංගත තත්ත්වයක් ප්‍රකාශයට පත්කර ඇති කවර හෝ අවස්ථාවක හෝ බල ප්‍රදේශය තුල යම් වසංගත තත්වයකට කරුණු යෙදී ඇති බවට සෑහීමට පත්වෙමින් එය පාලනය කිරීම සඳහා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී උපදෙස් මත සභාපතිවරයා කලින් කල නියම කරනු ලබන නියමයන් ඇත්නම් ඒ සෑම නියමයකටම යටත්ව පරිශ්‍රය පවත්වා ගත යුතුය.

(2) පරිශ්‍රයෙහි සේවය සඳහා යොදවා ඇති සෑම තැනැත්තෙකු විසින්ම නිරෝධායක හා රෝග වැලැක්වීමේ ආඥා පනත යටතේ සාදන ලද රෙගුලාසි යටතට අදාළ වන වසංගත තත්ත්වයක් ප්‍රකාශයට පත්කර ඇති කවර හෝ අවස්ථාවක ඊට අදාලව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී උපදෙස් මත සභාපතිවරයා විසින් කරනු ලබන සෑම නියමයකටම යටත්ව ක්‍රියා කල යුතුය.

(3) බල ප්‍රදේශය තුල වසංගත රෝගී තත්ත්වයක් සඳහා අවදානමක් ඇති බවට සැක කිරීමට කරුණු යෙදී ඇති සෑම අවස්ථාවකම සේවා අපේක්ෂාවෙන් පරිශ්‍රයට පැමිණෙන සෑම තැනැත්තෙකුටම අදාළව, ඊට අදාළව නිකුත් කර ඇති සෞඛ්‍ය උපදෙස් වලට අනුකූලව පැමිණෙන්නේනම් මිස එම පරිශ්‍රයෙහි සේවා පහසුකම් සලසා නොදිය යුතුය.

(4) බල ප්‍රදේශය තුල කිසියම් වසංගත රෝගී තත්ත්වයකට කරුණු යෙදී ඇති විට හෝ ඒ සඳහා අවදානමක් ඇති විට එයින් ආරක්ෂා වීම සඳහා අනුගමනය කල යුතුයැයි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක ජෙනරාල් හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් හෝ ඔවුන්ගේ උපදෙස් පරිදි සභාපතිවරයා විසින් හෝ නියම කර ඇති සෞඛ්‍ය ආරක්ෂිත උපදෙස් නිසියාකාරයෙන් පරිශ්‍රය තුල ක්‍රියාත්මක කල යුතුවා මෙන්ම , එසේ වන බවට බලපත්‍රලාභියා සෑහීමට පත් විය යුතුය.

(5) පරිශ්‍රය තුල සියළුම කාණු , පහසුවෙන් ජලය බැසයන ආකාරයට පවත්වාගත යුතු අතර, අපජලය, මළ අපද්‍රව්‍ය, අනුමත ක්‍රමවේදයන්ට අනුව පූතික වළවල්, උරා ගැනීමේ වළවල් හෝ මධ්‍ය ප්‍රතිකාර ඒකකයට යොමුකර තිබිය යුතු අතර ,එමඟින් දූහනය වීම වැලැක්වීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන තිබිය යුතුය.

(6) පරිශ්‍රයෙහි සියළුම වැසිකිලි, දෙඅත් සෝදන ස්ථාන නිරන්තරයෙන් විෂබීජ නාශක යොදා පිරිසිදු කල යුතුඅතර, ඒ සියල්ල එසේ වන බවට සැහීමට පත්වීම පිණිස සුදුසු වැඩපිළිවෙලක් පවත්වාගත යුතුය.

(7) පරිශ්‍රයෙහි අභ්‍යාන්තර පොළව පහසුවෙන් ලිස්සා නොයන පරිදි සකස්කර තිබිය යුතු අතර, පිරිසිදු කිරීම් සිදු කිරීමේදි ඊට යම් තාක් පහසු වන තත්වයකට කරුණු යෙදේනම් එම ස්ථානයෙහි ඒ බව සඳහා පුවරු පාරිභෝගිකයින්ට දැකගත හැකිවන පරිදි තබා තිබිය යුතුය.

(8) පරිශ්‍රය තුල පිහිටුවා ඇති කාණු ජලය රැඳී නොසිටින පරිදි සකස් වී තිබිය යුතු අතරම එය සෑම දිනකම දෙවරක් විෂබීජ නාශක යොදා පිරිසිදු කල යුතුය.

(9) පරිශ්‍රය තුල කිසිදු කාණුවක්, අපද්‍රව්‍ය ගලා එන බටයක් ,හෝ කිසිදු ආකාරයකින් මාර්ගයෙහි පොදු කාණුවකට හෝ පිටත භූමියකට හෝ යොමු නොකළ යුතුය.

(10) පරිශ්‍රය තුල අපජලය ගලායාම හේතුවෙන් හෝ අපද්‍රව්‍ය බැහැර කිරීම හේතුවෙන් බාහිරව කිසිදු දුර්ගන්ධයක් ඇති නොවන පරිදි පවත්වාගත යුතුය.

(11) ආහාර පිසීමේදී, ආහාර ශීත කිරීමේදී, ඒ සඳහා විය යුතු උෂ්නත්වය නියාමනය කිරීම සඳහා ප්‍රමානවත් පහසුකම් තිබිය යුතු අතර එය එසේ වන බවට වාර්තා පවත්වාගත යුතුය.

(12) ආහාර සකස් කිරීම සඳහා භාවිතා කරන සියළු උපකරණ හා මෙවලම් පහත සඳහා අවශ්‍යතාවන්ට අනුකූලවන පරිදි පවත්වා ගත යුතුය.

(අ) ආහාර සකස් කිරීමේදී භාවිතාවන සියළුම උපකරණ මෙවලම් කිසිදු විෂ ද්‍රව්‍යක් , රසක් හෝ දුගඳක් ප්‍රේෂණය නොවන අවශෝෂණය කර නොගන්නා ද්‍රව්‍ය වලින් සකස් වී තිබිය යුතු අතරම එය මල නොබැඳෙන ද්‍රව්‍ය වලින් සාදා තිබිය යුතුය.

(ආ) සියළුම උපකරණ හා මෙවලම් පහසුවෙන් පිරිසිදු කල හැකි ආකාරයේ ඒවා විය යුතුය.

(ඇ) අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා යොදා ඇති භාජන ලෝහ හෝ කාන්දු නොවන ද්‍රව්‍යයන්ගෙන් සකස් කරන ලද පියන සහිත ඒවා විය යුතුය.

(ඈ) පවත්වාගනු ලබන සෑම උපකරණයක්ම, මෙවලක්ම භාවිතා කිරීමට උචිත තත්වයේ ඒවා විය යුතුය.

(13) පරිශ්‍රය තුල ආහාර නිපදවන අතරතුර බාහිරට බෙදා හැරීම සඳහා කටයුතු කරන්නේ නම් ඒ සඳහා නිශ්චිතව වෙන්කල ස්ථානයක් තිබිය යුතුය.

(14) ආහාර බෙදා හැරීම සඳහා යොදාගනු ලබන දේ ආහාර වල රසයට හානි නොවන ආකාරයට බෙදා ගැනීම සිදු කිරීමට හැකිවන පරිදි වූ බහාලුම් විය යුතුය.

(15) පරිශ්‍රය තුල ආහාර සකස් කිරීම සඳහා භාවිතාවන දේ තැබීම සඳහා හා පිසින ලද ආහාර හෝ එවැනි දේ තබා ගැනීම සඳහා වෙන් වෙන් වශයෙන් ප්‍රමානවත් ශීතකරන පහසුකම් තිබිය යුතුය.

(16) පරිශ්‍රය සඳහා ජලය ගබඩාකර තබා ගැනීමේ පහසුකම් විය යුතු අතර ඊට අදාළ බහාලුම් මල නොබැඳෙන ආකාරයේ ඒවා විය යුතුය.

(17) ආහාර සකස් කිරීමට ගන්නා පළතුරු ,එළවළු වැනි දේ ඉතා හොඳින් සෝදා පිරිසිදු කොට භාවිතයට ගත යුතුය.

(18) පරිශ්‍රයෙහි භාවිතය සඳහා යොදා ගැනෙන ජලය උපද්‍රවකාරී නොවන භාජනවල දූහනයෙන් තොරව පවත්වාගත යුතුය.

(19) පරිශ්‍රයෙහි භාවිතයට ගැනෙන අයිස් පානීය ජලයෙන් නිශ්පාදිත ඒවා විය යුතුය.

(20) පරිශ්‍රය තුල ජලය ගෙන යන නල මාර්ග වෙනත් වූ නල මාර්ගයකින් හෝ වෙන්කර හඳුනාගැනීමට හැකිවන පරිදි පවත්වා ගත යුතුය.

(21) පරිශ්‍රය තුල පිසින ලද සෑම ආහාර ද්‍රව්‍යක්ම උපද්‍රවයකින් තොරව පාරිභෝගිකයන් වෙත පත් කිරීම සඳහා නිශ්චිත අභ්‍යාන්තරික වැඩ පිළිවෙලක් සකස්කර තිබිය යුතු අතර, එය නියාමනය කිරීම සඳහා නිශ්චිතව කාර්යය පවරන ලද අයද සේවයේ යොදවා තිබිය යුතුය.

(22) ආහාරයට රැගෙන එන මස් මාළු පරිශ්‍රයෙහි වෙනම ශීතකරණයක ගබඩා කර තැබිය යුතු අතර භාවිතයට ගන්නා තෙක් සෑමවිටම සෙන්ටිග්‍රේඩ් අංශක දෙකක උෂ්ණත්වයකින් යුතුව දූහනය නොවන පරිදි පවත්වාගත යුතුය.

(23) බල ප්‍රදේශය තුල නිරෝධායක හා රෝග වැලැක්වීමේ ආඥා පනත යටතේ හා ඒ යටතේ ගැනෙන රෙගුලාසි යටතට අදාළ වසංගත තත්ත්වයක් ප්‍රකාශයට පත්වී ඇති හෝ බල ප්‍රදේශය තුල කිසියම් වසංගත රෝගී තත්ත්වයක අවදානමක් හේතු කොටගෙන සියළුම පිරිස් සමාජගත වීමේදී මුඛ ආවරණ පැළඳ සිටිය යුතු බවට වූ නියමයක් ප්‍රකාශයට පත්වී ඇත්නම් මුඛ ආවරණ පැළඳ නොගත් කිසිදු තැනැත්තෙකු පරිශ්‍රයට ගණුදෙනු සඳහා ඇතුලත් වීමට අවසර නොදිය යුතුයි.

(24) ආහාර නිෂ්පාදනයේ යෙදෙන සෑම අයකුම හිස් ආවරණ යොදාගනිමින් නිෂ්පාදන කටයුතු වල යෙදිය යුතුය.

(25) පරිශ්‍රයෙහි විකිණීමට තබා ඇති ආහාර කිසිදු ආකාරයකින් දූෂනය වීමට හේතුවන පරිදි පවත්වා නොගත යුතු අතර , ආහාර පිළිගැන්වීම, රැගෙන යාම සඳහා එකලස් කිරීම, ආදී සියළු කටයුතු නියමිත අත් වැසුම් යොදා ගන්මින් ඒ සඳහාම වූ කාර්යාවලියක් යටතේ සිදුකල යුතුය.

(26) පරිශ්‍රය තුල ආහාර පිළිගැන්වීමේ හෝ පරිහරණය කිරීමේ හෝ එකලැස් කිරීමේ කාර්යයක නියැලී සිටින සෑම තැනැත්තෙකු විසින්ම ;

(අ) තම අත්ල හෝ ඇඟිලි විවෘත භාවයෙන් ආහාර ඇල්ලීම හෝ ස්පර්ශ කිරීම නොකළ යුතුයි.

(ආ) කිසිදු අවස්ථාවක සේවයේ යෙදී සිටියදී මුදල් පරිහරණය කිරීමක් නොකළ යුතුය.

(ඇ) ආහාර ඇල්ලීම සඳහා භාවිතා කරන මෙවලම් හා අත්වැසුම් ආහාර සඳහා හිතකර භාවිතයක් විය යුතුය.

(ඈ) දෙඅත් පිසදමා ගැනීම සඳහා පිරිසිදු තුවායක් භාවිතයට ගත යුතුය.

(ඉ) භාවිතයට ගැනෙන පිඟානක කෝප්පයක හෝ වෙනත් භාජනයක යටිපැත්ත කිසිදු ආහාරයක නොගෑවෙන ලෙස සැමවිටම පවත්වා ගත යුතුය.

(ඊ) ආහාර බෙදීම සඳහා භාවිතයට ගනුලබන සියළු උපකරණ මනා ලෙස පිරිසිදුව තබාගත යුතු අතර, ඒ සියල්ල වෙන් වෙන් වශයෙන් භාජනවල බහා තැබිය යුතුය.

(උ) කිසිදු ආකාරයකින් තම ක්‍රියාවකින්, භාවිතයකින් ආහාරයක් දූෂනයට ලක්වීමට හෝ ක්ෂුද්‍ර ජීවීන් ව්‍යාප්ත වීමට හේතු නොවන පරිදි ආහාර පරිහරණය කිරීමට, එකලැස් කිරීමට එසේ සේවයේ යෙදී සිටින්නන් ක්‍රියා කල යුතුය.

(ඌ) ආහාර එතීම සඳහා ගනු ලබන දේ කිසිදු ආකාරයකින් ආහාර දූෂන මූලාශ්‍ර නොවිය යුතුය.

(27) බල ප්‍රදේශය තුළ නිරෝධායක හා රෝග වැලැක්වීමේ ආඥා පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද රෙගුලාසි යටතට අදාළ වන වසංගත තත්ත්වයක් ප්‍රකාශයට පත්කර හෝ බල ප්‍රදේශය තුල කිසියම් වසංගත රෝගී තත්වයකට අවදානමක් ඇති බවට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී උපදෙස් පරිදි සභාපතිවරයා විසින් ප්‍රකාශයට පත්කර ඇති අවස්ථාවක පරිශ්‍රය තුල ආහාර සකස් කිරීමේ, පරිහරණය ,පිළිගැන්වීම් කිරීමේ හෝ එකලැස් කිරීමේ කාර්යයහි නියැලී සිටින සෑම තැනැත්තෙක්ම මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් සෑම නියමයකට අතිරේකව අවස්ථාවොචිත පරිදි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂක වරයෙකු හෝ ඔවුන්ගේ උපදෙස් පරිදි සභාපතිවරයා විසින් කරනු ලබන නියමයන්ට යටත්ව පරිශ්‍රය පවත්වාගත යුතුය.

(28) (අ) පරිශ්‍රය තුල ආහාර නිෂ්පාදනයට අදාළ කිසිදු කාර්යයක් පොදු මාර්ගයකට හෝ මහජනයා සඳහා වන පොදු අවකාශයකට විවෘත වන පරිදි හෝ එවැනි පොදු මාර්ගකින් හෝ පොදු මහජනයා සඳහා වන විවෘත අවකාශයකින් වාතය පහසුවෙන් ගලා එන අවකාශයක සිදු නොකළ යුතු අතර , පරිශ්‍රය අභ්‍යන්තරයෙහි ඒ සඳහාම වෙන්වූ සංවෘත අවකාශයක ආහාර නිෂ්පාදන කටයුතු කල යුතුය.

(ආ) ආහාර නිෂ්පාදනය සඳහා වන සංවෘත අවකාශයහි හටගනු ලබන උණුසුම් වාතය සහ හුමාලය පහසුවෙන් ගලා යා හැකි පරිදි විමිනි යොදා හා අවශෝෂක පංකා සවිකර තිබිය යුතුය.

(ඇ) ආහාර නිෂ්පාදනයෙහිලා අනුමත කරන කවර හෝ ක්‍රියාවකින් හටගන්නා ශබ්දය කිසිදු ආකාරයකින් මහජනතාවට හෝ පාරිභෝගිකයින්ට බාධාවක් ඇති නොවන ආකාරයට විය යුතුය.

(29) පරිශ්‍රය තුල ආහාර පිළිගැන්වීමේ හා පරිහරණය සඳහා වන මේස ඉතා පිරිසිදු තත්වයකින් විය යුතු අතර, සෑම පිළිගැන්වීමකින් හා පරිහරණයකින් පසු විෂබීජ නාශක යොදා පිරිසිදු කල යුතු අතර ඒ සඳහා භාවිතාවන තුවා පිරිසිදු තත්වයෙන් තිබිය යුතුය.

(30) පරිශ්‍රය තුල පාරිභෝගිකයින්ගේ අත ගැටෙන පෘෂ්ඨයක් නිතර විෂබීජ නාශක යොදා පිරිසිදු කල යුතුය.

(31) පරිශ්‍රය තුල පිසින ලද ආහාර අතරින් පහසුවෙන් නරක්විය හැකි පිසින ලද සියළු ආහාර සෙන්ටිග්‍රේඩ් අංශක හතරක් නොඉක්මන උෂ්ණත්වයක නැතහොත් පහත සඳහා අවස්ථා වලදී හැර සෙන්ටිග්‍රේඩ් අංශක හැටකට අඩු නොවන උෂ්ණත්වයක පවත්වාගත යුතුය. එසේ නොවන අවස්ථා පහත ආකාරයට විය යුතුය.

(අ) සමස්ථ එකතුව පැය දෙකකට වැඩි කාලයක් සඳහා ආහාර විකිණීම සඳහා නිරාවරණය කර නොමැති හෝ ප්‍රදර්ශනය කර නොමැති අවස්ථාවලදී හෝ

(ආ) පිළියෙල කිරීම හා පිළිගැන්වීම ආසන්න කාල පරාසයක් තුල සිදු කරන විටදී.

(32) පරිශ්‍රය තුල සාමාන්‍යයෙන් විකුණනු ලබන තත්වයෙන්ම අනුභව කරනු ලබන සියළු පිසින ලද මස් හෝ මාළු අඩංගු පේස්ට්‍රි , පැටිස් , සේවරි, පීසා, හා ඒහා සමාන ආහාර ආවරණය සහිත බහාලුම් තුල පවත්වාගත යුතුය.

(33) පරිශ්‍රය තුල භාවිතය සඳහා වන කිරි සෙන්ටිග්‍රේඩ් අංශක හතකට වැඩි නොවන උෂ්නත්වයකින් ශීතකරණයක පවත්වා ගත යුතුය.

(34) පරිශ්‍රය තුල පවත්වාගනු ලබන පළිබොධනාශක ද්‍රව්‍ය පරිශ්‍රයෙහි නිශ්චිත ස්ථානයක අගුළු දමන ලද බහාලුමක පවත්වාගත යුතුය.

(35) පරිශ්‍රය තුල සේවකයින්ගේ පහසුකම් සඳහා වන කොටස ප්‍රමානවත් සනීපාරක්ෂක පහසුකම් වලින් හා ඉඩකඩින් යුක්ත විය විය යුතු අතර ස්ත්‍රී හා පුරුෂ යන දෙපක්ෂය සඳහා වන වැසිකිළි සනීපාරක්ෂක ප්‍රමිති වලට අනුව පවත්වාගත යුතුය.

(36) පරිශ්‍රය තුල ඒකරාශිවන අපද්‍රව්‍ය බැහැර කිරීමට පූර්වයෙන් රඳවා ගැනීමේදී කිසිදු ආකාරයකින් පරිශ්‍රයෙහි භාවිතයට ගැනෙන දේට බලපෑමක් ඇති නොවන පරිදි හා එමගින් ආහාර දූහනයට කරුණු නොයෙදෙන පරිදි පවත්වාගත යුතුය.

(37) පරිශ්‍රයෙහි පිරිසුදු කිරීමේ කටයුතු නියමිත කාල සටහනකට අනුව පහත කරුණු වලට යටත්ව කල යුතුය.

(අ) ආයතනයේ සියළු අංශයන් ප්‍රමානවත් පරිදි සිදු කිරීමට හා මෙම අතුරු ව්‍යවස්ථාවේ විස්තර කරන ලද නිශ්චිත ප්‍රදේශ ප්‍රමුඛව පිරිසුදු කිරීම සහ විෂබීජ නාශක ද්‍රව්‍ය යෙදීම වැනි කටයුතු සම්බන්ධයෙන් නිශ්චිත කාර්යය පැවරුමක් පවත්වාගත යුතුය.

(ආ) ඉහත (අ) යටතේ වන කාර්යය නිශ්චිතව සිදුවන බවට වගබලා ගැනීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

(ඇ) පරිශ්‍රය තුල ආහාර පිළියෙල කරන, එකලැස් කරන අවස්ථාවල දූවිලි ඇති නොවන පරිදි අදාල පිරිසිදු කිරීමේ කාර්යන් සිදුකල යුතුය.

(ඈ) ආහාර සකස් කිරීමේදී භාවිතා කරන සියළු උපකරණ කිසිදු ආකාරයකින් පිසින ලද ආහාරයන්හි කොටස් රැදී නොසිටින පරිදි පවත්වා ගත යුතුය.

(ඉ) පිරිසිදු කිරීම් සඳහා යොදාගනු ලබන ජලය, සේදුම් කාරක විෂබීජ නාශක කිසිදු ආකාරයකින් භාජන මත ඉතිරි නොවන පරිදි සොදා හැර තිබිය යුතුය.

(ඊ) පරිශ්‍රය තුල සිවිලිම, බිත්ති, ආදී දේ කිසිදු කෘමී සතකු රැදී නොසිටින පරිදි පවත්වාගත යුතුය.

(38) පරිශ්‍රය තුල කිසිදු ආකාරයකින් බල්ලන් , පූසන් වැනි සුරතල් සතුන් ඇති නොකළ යුතුය.

(39) පරිශ්‍රයෙහි සේවය කරන පිරිස් සඳහා ආහාර වලට අදාල ස්වස්ථතා කටයුතු පිළිබඳ පුහුණුවක් ලබා තිබිය යුතු අතර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී නියම කරන කාල සීමාවක් යටතේ වෛද්‍ය පරීයේෂණයන්ට යොමුකර සුදුසු සෞඛ්‍ය තත්වයෙන් යුක්ත බවට පරික්ෂාකර ගත යුතුය.එසේම ඊට අදාළ වන වාර්තා පරිශ්‍රය තුල ඕනෑම අවස්ථාවක පරික්ෂා කිරීමට හැකිවන පරිදි පවත්වාගත යුතුය.තවද ඔවුන් සම්බන්ධයෙන් කරන සෞඛ්‍ය පරීක්ෂණ සායනික හා වසංගත යන දෙයාකාරයෙන්ම විය යුතුය.

(40) පරිශ්‍රයෙහි සේවයේ යොදවා ඇති සේවකයින් සම්බන්ධයෙන් සෞඛ්‍ය නිරීක්ෂණ පද්ධතියක් පිහිටුවා ඔවුන්ට අවශ්‍ය සෞඛ්‍ය උපදෙස් ලබා ගැනීමට ක්‍රියාවලියක් ඇති කල යුතුය.

(41) පරිශ්‍රයෙහි ජනිත වන අපද්‍රව්‍ය සභාව ක්‍රියාත්මක කරන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහනට අනුව හා ඊට අදාළ වන්නා වූ ලිඛිත නීතීන්ට අනුව සිදු කිරීමට කටයුතු කළ යුතුය.

(42) පරිශ්‍රය තුල ජනනය වන අපද්‍රව්‍ය බලපත්‍රලාභියා විසින්ම කළමනාකරණය කරගනු ලබන්නේ නම් , ඊට අදාළ ප්‍රදේශය භාර මහජන සෞඛ්‍ය පරීක්ෂක දැනුවත් කලයුතු අතර,ඔහු විසින් ඒ සඳහා ලබාදෙන උපදෙස් වලට අනුකූලව ඒ සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතුය.

(43) පරිශ්‍රය තුල සේවය කරන සෑම අයෙක්ම එසේ වැඩ ආරම්භ කිරීමට පූර්වයෙන් , වැසිකිළි භාවිතයෙන් පසු හා අපද්‍රව්‍ය ස්පර්ශ වීමෙන් පසු ප්‍රමානවත් පිරිසුදු වීමකින් තොරව ආහාර පිසීමේ එක්ලස් කිරීමේ, කාර්යයක නොයෙදිය යුතු අතරම එසේ කාර්යයෙහි යෙදෙන සෑම අයෙක්ම පිරිසුදු හා සාක්කු නොමැති ඒප්‍රන් හැඳ සිටිය යුතුය.

(44) පරිශ්‍රයෙහි මුදල් අයකැමි වශයෙන් කටයුතු කරන අය තම දෙඅත් නිතර විෂබීජ නාශක යොදා ගනිමින් පිරිසුදු කරගත යුතුය.

(45) පරිශ්‍රය තුල ප්‍රමානවත් ප්‍රථමාධාර පහසුකම් සපයා තිබිය යුතුය.

(46) කිසියම් වසංගත තත්වයක් මත සමාජය තුල අත් වැසුම් මුබ වැසුම් භාවිතා කිරීමට උපදෙස් ලබාදී තත්වයකදී, කිසියම් තැනැත්තෙකු තමන් පැළඳ සිටින මුබ වැස්මක් හෝ අත් වැස්මක් පරිශ්‍රය තුල බැහැර කරනු ලබන්නේ නම් එසේ බැහැර කරන මුබ වැස්ම හෝ අත් වැසුම් ඒ සඳහාම පරිශ්‍රය තුල නිශ්චිතව තබා ඇති සංවෘත බඳුන්වලට බැහැර කිරීමට සැලැස්විය යුතු අතර, එසේ බැහැර කරන අපද්‍රව්‍ය වෙනත් අපද්‍රව්‍ය සමඟ මිශ්‍ර කිරීමකින් තොරව සභාව ඊට අදාළව ක්‍රියාත්මක කරන කසළ කළමණාකරන වැඩසටහනට හා උපදෙස්වලට අනුකූලව බැහැර කිරීමට සැලැස්විය යුතුය.

(47) පරිශ්‍රය තුල ආහාර පරිහරණයෙහි යෙදෙන සෑම අයෙක්ම එසේ ආහාර පරිහරණයෙහි යෙදීමේදී උපරිම පිරිසිදු භාවයකින් සිටිය යුතු අතර සෑම විටම හිස් ආවරණ අත් වැසුම් හා මුබ ආවරණ, පාවහන් පැළඳ සිටිය යුතු අතර සුදුසු සෞඛ්‍ය ආරකෂිත ඇඳුමක් අඳ සිටිය යුතුය.

(48) කිසියම් බෝවන රෝගයකින් පෙලෙන හෝ එවැනි රෝගයක් වැලදී ඇති බවට සැක කරන හෝ එවැනි රෝගවාහකයකු හෝ ආසාදනය වී ඇති තුවාල, සමේ ආසාදන හෝ වෙනත් බෝවන රෝගයකින් පෙළෙන තැනැත්තෙකුව පරිශ්‍රයෙහි සේවය සඳහා යොදවා නොගත යුතුය.

(49) පරිශ්‍රය තුල ආහාර පරිහරණය කිරීම සම්බන්ධයෙන් කටයුතු කරන සෑම තැනැත්තෙක්ම ආහාර දූහනය වීමට හේතුවන ආකාරයට දුම්බීම , කෙල ගැසීම, කැස්ස, කිවිසුම් යැවීම, නාසය ස්පර්ශ කිරීම, වැනි ක්‍රියාවල නොයෙදිය යුතුය.

(50) කිසිදු අවස්ථාවක යම් බෝවන රෝගී තත්වයකින් හෝ වසංගත රෝගී තත්වයකින් පෙලෙතැයි සිතිය හැකි තරම් කරුණු ඇති කවර හෝ තැනැත්තෙකු පරිශ්‍රයට ඇතුලත් කර නොගත යුතුය.

(51) පරිශ්‍රයෙහි සේවයෙහි යෙදෙන්නෙකුට බෝවන , ස්පර්ශයෙන් බෝවන , හෝ චර්මගත රෝගී තත්වයක් වැළදුනහොත් ඒ බව බලපත්‍රලාභියා විසින් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත දැනුම් දිය යුතු අතර , එසේ දැනුම් දීමෙන් පසු සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී හෝ ඔහු විසින් බලය පවරන ලද මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකු විසින් ලබාදෙන නිරෝධායක උපදෙස්වලට අනුකූලව පරිශ්‍රයට අදාළ සියළුම අය ක්‍රියාකල යුතුය.

(52) ආහාර නිෂ්පාදනය කිරීමේදී ආහාර දූහනය වීමට හේතුවන ආකාරයේ කවර හෝ ක්‍රියාවක් නොකර හිදීමටත් සිදු නොවන ආකාරයට පරිශ්‍රය පවත්වා ගැනීමට බලපත්‍රධාරියා විසින් සෑම පියවරක්ම ගෙන තිබිය යුතුය.

(53) පරිශ්‍රය තුල සේවයේ නියුතු සේවකයින් සම්බන්ධයෙන් සියලු තොරතුරු බලපත්‍රලාභියා විසින් සභාපතිවරයාට ඉදිරිපත් කර තිබිය යුතුය.

*පරිශ්‍රයන් ශ්‍රේණිගත කිරීම*

12. (1) මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ වූ කොන්දේසි ඉටු කිරීමේදී ප්‍රසස්ථභාවය සැලකිල්ලට ගනිමින් මෙම අතුරු ව්‍යවස්ථාවට අදාළ පරිශ්‍රයක් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී නිර්දේශයන්ට අනුව සභාපතිවරයා විසින් ශ්‍රේණිගත කිරීමත් නීත්‍යානුකූල විය යුතුය.

(2) සභාපතිවරයා විසින් මෙම වගන්තිය යටතේ ශ්‍රේණිගතකර ඇති අවස්ථාවක බලපත්‍රයට අදාළ වර්ෂය සඳහා පරිශ්‍රයට හිමි ශ්‍රේණිය පිළිබඳව හා සභාපතිවරයා විසින් ඒ සඳහා නිකුත් කරනු ලබන සහතිකයක් මහජනයාට දැකගතහැකිවන පරිදි පරිශ්‍රය තුල ප්‍රදර්ශනය කල යුතුය.

*ස්ථානපරීක්ෂාව හා නියදි ලබාගැනීම*

13. මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහා විධිවිධානයන්ට අනුකූලව පරිශ්‍රය පවතින්නේද යන්න පරික්ෂා කිරීම සඳහා සභාපතිවරයා විසින් ඒ සඳහා බලය පවරන ලද මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකු හෝ වෙනත් යම් නිලධාරියෙකු ඕනෑම සාධාරණ වෙලාවක පරිශ්‍රයට ඇතුළු වීමට, අවශ්‍ය නියැදි ලබා ගැනීම නීත්‍යානුකූල වන්නේය.

14. බලප්‍රදේශය තුල වසංගත තත්වයක් පැතිර යාමට හේතුවිය හැකි කරුණු සැලකිල්ලට ගනිමින් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී උපදෙස් පරිදි පරිශ්‍රය පවත්වාගෙන යාමට අදාළව බලපත්‍රලාභියා විසින් එකඟතා ප්‍රකාශයකට ඇතුලත් විය යුතුයැයි සභාපතිවරයා විසින් නියමකර ඇති විටකදී බලපත්‍රලත් තැනැත්තා සභාපතිවරයා සමඟ එකඟතා ප්‍රකාශයකට ඇතුලත් විය යුතු අතර සභාපතිවරයා විසින් එහි පිටපතක් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත යොමුකල යුතුය.

15. බල ප්‍රදේශයට අදාලව කිසියම් වසංගත රෝගී තත්වයක් සම්බන්ධයෙන් නිරෝධායක හා රෝග වැලැක්වීමේ ආඥා පනත යටතේ රෙගුලාසියක බලපැවැත්වෙන අවස්ථාවක එම නියෝ්ගයෙහි සඳහා සෑම නියමයකටම අනුකූලව පරිශ්‍රය පවත්වා ගත යුතුය.

16. මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහා විධිවිධානයන්ට අනුකූලව පරිශ්‍රය පවතින්නේද යන්න පරික්ෂා කිරීම සඳහා සභාපතිවරයා විසින් ඒ සඳහා බලය පවරන ලද මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකු හෝ වෙනත් යම් නිලධාරියෙකු ඕනෑම සාධාරණ වෙලාවක පරිශ්‍රයට ඇතුළු වීමට, අවශ්‍ය නියැදි ලබා ගැනීම නීත්‍යානුකූල වන්නේය. *පරිශ්‍රයට ඇතුළත් වීමේ බලය*

17. (1) මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලත් පරිශ්‍රයක් යටතේ මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහා කොන්දේසි උල්ලනංගනය කරමින් හෝ ඊට පටහැනි වන පරිදි කටයුතු වන අවස්ථාවක අතුරු ව්‍යවස්ථාවට අනුකූල වීම සඳහා දින තිහකට නොවැඩි නිශ්චිත කාලයක් දන්වමින් දැන්වීමක් සභාපතිවරයා විසින් බලපත්‍රලාභියා වෙත භාරදිය යුතුය. *බලපත්‍රය අවලංගු කිරීම*

(2) මෙම වගන්තිය යටතේ වූ දැන්වීමක් බලපත්‍ර ලාභියා වෙත භාරදීමෙන් පසු ,අදාල දැන්වීමේ සඳහා නියමයන්ට අනුකූලව ක්‍රියාකිරීම සඳහා තවදුරටත් අතිරේක කාලයක් ලබාදෙන ලෙසට සාධාරණ හේතු දක්වමින් කරනු ලබන ඉල්ලීමක් මත සභාපති වරයාවිසින් අතිරේක කාලයක් ලබාදිය හැකිය.එසේ ලබාදෙන කාලය පළමු දැන්වීමේ සඳහා කාලයට අතිරේකව දින දහ හතරක උපරිම කාලයකට යටත්ව විය යුතුය.

18. ඉහත 17 වගන්තිය යටතේ ලබාදෙන කාල සීමාව තුළ හෝ අතිරේක කාල සීමාව තුළ දැන්වීමට අනුකූලව ක්‍රියා කිරීම බලපත්‍රලාභියා විසින් පැහැර හැර ඇති අවස්ථාවක සභාපතිවරයා විසින් අදාල බලපත්‍රය අවලංගු කල යුතුය.

19. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ලබා ගත යුතු බලපත්‍රයකින් තොරව හෝ අතුරු ව්‍යවස්ථාව යටතේ කරනු ලබන නියමයන් කඩකරමින් පරිශ්‍රයක් පවත්වාගෙන යාම වරදක් වන අතර එම වරද සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් වරදකරුවෙකු කිරීමෙන් පසු 1987 අංක 15දරන ප්‍රාදේශීය සභා පනතේ 122(2) උප වගන්තිය යටතේ දඬුවමකටයටත් විය යුතුය.තවද එලෙස වරදකරුවෙකු වීමෙන් පසු තව දුරටත් එකී කඩකිරීම, උල්ලංඝණය නිරන්තරයෙන්ම කරගෙන යනු ලබන විට සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් දැන්වීමක් භාර දීමෙන් පසු උල්ලංඝණ තව දුරටත් නොකඩවා කරගෙන යන සෑම දිනකට ඉහතකී 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(2) උප වගන්තියේ සඳහා අතිරේක දඩයකට යටත් විය යුතුය. *දණ්ඩනය*

20. මෙම අතුරු ව්‍යවස්ථාවේ පද සම්බන්ධයෙන් අන්‍ය අර්ථයක් අවශ්‍ය වන්නේනම් මිස මෙම අතුරුව්‍යවස්ථාවේ, *අර්ථනිරූපනය*

"සභාව" යන්නෙන් කළුතර ප්‍රාදේශීය සභාවද,

"සභාපති" යන්නෙන් කළුතර ප්‍රාදේශීය සභාවේ තත්කාලයෙහි සභාපති ධූරය දරන හෝ එම ධූරයේ කාර්යය කර්තව්‍ය ඉටුකරන අයද ,

"සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී" යන්නෙන් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අදාල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාසය සඳහා එම තනතුර දරන අයද,

"මහජන සෞඛ්‍ය පරීක්ෂක" යන්නෙන් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අදාලව සේවයේ යෙදෙන ප්‍රාදේශීය සභාවේ හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයට අනුයුක්තව මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුර දරන අයෙක්ද,

"බලපත්‍රලාභියා" යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලබාගත් ආයතනයක් ,තැනැත්තෙක් හෝ පුද්ගලයෙක්ද ,

"බලයලත් නිලධාරියා" යන්නෙන් තත්කාලයෙහි ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් බලය පවරන ලද නිලධාරීයාද,

"දූෂනය වීම" යන්නෙන් ආහාර ද්‍රව්‍යකට කිසිදු දූෂක ද්‍රව්‍යයක් ඇතුල්වීම හෝ හටගැනීමද,

"විෂබීජ නාශක" යන්නෙන් ආහාරවල ආරක්ෂාව හෝ යෝග්‍යබව අඩුනොකරන මට්ටමකට පරිසරයෙහි ඇති ක්ෂුද්‍ර ජීවීන් ප්‍රමාණය රසායනික කාරකයන් මගින් හෝ භෞතික ක්‍රමයකින් අඩු කිරීමද,

"ආහාර ස්වස්ථතාවය" යන්නෙන් ආහාර දාමයේ සියළු අවස්ථාවලදී ආහාරවල සුරක්ෂිත බව හා සුදුසු බව සහතික කිරීම සඳහා සියළු තත්වයන්, පියවර සහ පරිවයද,

"උපද්‍රව" යන්නෙන් අහිතකර සෞඛ්‍ය බලපෑමක් සිදු කිරීමේ ඉඩ ඇති යම් ජීව විද්‍යාත්මක , රසායනික විද්‍යාත්මක කාරකයක් හෝ තත්වයක්ද,

" ආහාර" යන්නෙන් මනුෂ්‍යයාගේ ආහාර හෝ පාන වශයෙන් ප්‍රයෝජනයට ගැනීම සඳහා පවත්වාගෙන යන ආයතනය තුල නිෂ්පාදනය කල විකිණීමට තබා ඇති දේ වෙනම ආහාර පිළියෙල කිරීමේදී යොදා ගැනෙන දේද,

" සාධාරණ වෙලාව" යන්නෙන් බලපත්‍රලත් කර්තව්‍ය හෝ ඊට අදාළ කාර්යයෙහි නිරතවන ඕනෑම වෙලාවක්ද,

" මූලික නීතිය" යන්නෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීයසභා පනත අදහස් වෙයි.

*පාය අත□ අනනුකූලතාවය* 21. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල හා ඉංග්‍රීසි,දෙමළ පාඨ අතර අනනුකූලතාවයන් හටගතහොත් එවිට සිංහල පාඨය ප්‍රමුඛ වෙයි.

**උපලේඛනය**

**.......................... වර්ෂය සඳහා ආහා□ නිෂ්පාදන ස්ථානයක් පවත්වා ගෙන යාම සඳහා බලපත්‍රය ලබාගැනීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය.**

01. ඉල්ලුම්කරුගේ නම : -
02. පෞද්ගලික ලිපිනය : -
03. ජාතික හැඳුනුම්පත් අංකය : -
04. දුරකථන අංකය : -
05. වෙළඳ ව්‍යාපාරයේ නම : -
06. ආරම්භක වර්ෂය : -
07. ව්‍යාපාරික ස්ථානයේ ලිපිනය : -
08. ග්‍රාම නිලධාරී කොට්ඨාසය : -
09. වරිපනම් අංකය: -
10. ව්‍යාපාරය නාම ලියාපදිංචිය ලබාගෙන ඇත්නම් එහි යොමු අංකය :-
11. ව්‍යාපාර ස්ථානයේ කළමනාකරුගේ හෝ නියෝජිතයාගේ,
    I. නම හා පෞද්ගලික ලිපිනය
    II. ජාතික හැඳුනුම්පත් අංකය
    III. දුරකථන අංකය ජංගම :- ස්ථාවර :-
12. ව්‍යාපාරයට අදාළ ඉදිකිරීම් අනුමත කරන සැළැස්මේ අංකය හා දිනය :-
    ( පිටපත් ඇමිණිය යුතුය )

ඉහත තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

ඉහත තොරතුරු සඳහන් ව්‍යාවාපාරය පවත්වාගෙන යන ස්ථානය සඳහා ............................ වර්ෂය වෙනුවෙන් බලපත්‍රයක් මා වෙත නිකුත් කරන ලෙස ඉල්ලමි.

දිනය:- ……………………………….

දිනය :- ඉල්ලුම්කරුගේ අත්සන

■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■■

<u>කාර්යාලීය ප්‍රයෝජනය සඳහා</u>

ආදායම් පරීක්ෂක,

පසුපිටේ සඳහන් ඉල්ලුම්පත්‍රයට අදාළව බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා වන ඔබගේ නිරීක්ෂණ හා නිර්දේශ කඩිනමින් මා වෙත ලබා දෙන ලෙස කාරුණිකව ඉල්ලමි.

දිනය:- .................................

ලේකම්

---

ලේකම්,

බලපත්‍රය ලබා දීම නිර්දේශ කරමි./නොකරමි.

දිනය :- ..................................

ආදායම් පරීක්ෂක

---

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී,

පසුපිටේ සඳහන් ඉල්ලුම් පත්‍රයට අදාළව බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා වන ඔබගේ නිරීක්ෂණ හා නිර්දේශ කඩිනමින් ලබාදෙන මෙන් කාරුණිකව ඉල්ලමි.

දිනය :- .................................

ලේකම්

---

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී,

අතුරු ව්‍යවස්ථා හා අනෙකුත් නීති රීතිවලට අනුකූලව සුදුසුකම් සපුරා ඇත. බලපත්‍ර නිකුත් කිරීම නිර්දේශ කිරීම සඳහා වාර්තා කරමි.

දිනය :- .................................

මහජන සෞඛ්‍ය පරීක්ෂක

---

ලේකම්,

ඉහත ඉල්ලුම්පත්‍රයට අනුව අදාළ ස්ථානය සඳහා බලපත්‍රයක් නිකුත් කිරීම නිර්දේශ කරමි. / නොකරමි.

(නිර්දේශ නොකරන්නේ නම් ඊට අදාළ හේතුව සඳහන් කරන්න).

දිනය :- .................................

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී

---

## එළවළු හා පලතුරු විකුණ ස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1. මෙම අතුරු ව්‍යවස්ථාව කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල එළවළු හා පලතුරු විකුණන ස්ථාන විධිමත් කිරීම අධීක්ෂණය කිරීම, පරීක්ෂා කිරීම හා පාලනය කිරීම සඳහා පනවනු ලබයි.

*ලුහුඬු නාමය* 2. මෙම අතුරු ව්‍යවස්ථාව කළුතර ප්‍රාදේශීය සභාවේ එළවළු හා පලතුරු විකුණන ස්ථාන පිළිබඳ අතුරුව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

3. මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (ix) වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 122 උප වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට බලය ලැබී ඇත.

4. කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ( මෙහි මින් මතු බල ප්‍රදේශය යනුවෙන් හඳුන්වනු ලබන ) කිසිදු තැනැත්තෙකු සභාපතිවරයා වෙතින් ලබාගත් බලපත්‍රයක් යටතේ මිස එළවළු හා පලතුරු විකිණීමේ මධ්‍යස්ථානයක් හෝ එසේ විකිණීම සඳහා ගබඩා කරන මධ්‍යස්ථානයක් (මෙහි මින් මතු පරිශ්‍රය යනුවෙන් හඳුන්වනු ලබන) පවත්වාගෙන යාම නොකළ යුතුය.

*බලපත්‍රයක් ඉල්ලුම් කිරීම* 5. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ඉල්ලුම් කරන සෑම තැනැත්තෙක්ම මෙම අතුරු ව්‍යවස්ථාවේ උපලේඛනයට සාරානුකූලව පිළියෙල කරන ලද ඉල්ලුම් පත්‍රයක් යටතේ ඒ සඳහා ඉල්ලුම් කළ යුතුය.

6. ඉහත වගන්තිය යටතේ වූ ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කිරීම, ඒ සඳහා අවශ්‍යතා සම්පූර්ණ කර ලියාපදිංචි තැපෑලෙන් සභාපති වෙත යොමු කිරීමෙන්, ගෙනවිත් භාර දීමෙන් , හෝ සභාව අවසර දී ඇති ප්‍රමාණයට විද්‍යුත් තැපෑලෙන් යොමු කිරීමෙන් ඉදිරිපත් කල හැකිය.

*බලපත්‍රයක් සඳහා කොන්දේසි* 7. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ඉල්ලුම් කරන සෑම තැනැත්තෙකුම මෙහි පහත සඳහා කොන්දේසි සම්පූර්ණ කර ඇත්තේනම් මිස සභාපතිවරයා විසින් බලපත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතුය.

(1) පරිශ්‍රයට අදාල ස්ථිර ඉදිකිරීම් නාගරික සංවර්ධන අධිකාරී පනත යටතේ හෝ නිවාස හා නගර සංවර්ධන ආඥා පනත යටතේ සඳහන් විධිවිධානයන්ට අනුකූල වූ ඉදිකිරීම් විය යුතුය.

(2) ඉදිකිරීම් සඳහා යොදාගෙන ඇති ද්‍රව්‍ය ජීවීන් රඳා නොසිටින ද්‍රව්‍යයන්ගෙන් සකස්කර තිබිය යුතු අතර, පරිශ්‍රය පලිබෝධකයන් හා දූහන ද්‍රව්‍ය ඇතුල්වීම හා රැඳී සිටීම වළක්වන පරිදි ස්ථිර ඉදිකිරීම සිදු කර තිබිය යුතුය.

(3) පරිශ්‍රය පහසුවෙන් පිරිසිදු කළ හැකි පරිදි සහ ජලය රැඳී නොසිටින පරිදි සකස්කර තිබිය යුතුය.

(4) සෑම විටම පළතුරු හා එලවළුවල ස්වභාවය පරීක්ෂා කිරීමට හැකිවන පරිදි පරිශ්‍රයෙහි අභ්‍යන්තරයෙහි පිරිසැකසුම් කර තිබිය යුතුය.

(5) පරිශ්‍රයෙහි ගොඩනැඟිල්ල, බිත්ති ජලාවරෝධක සහිත ජලය අවශෝෂණය නොවන පරිදි සේදිය හැකි ද්‍රව්‍ය යන්නෙ තනා තිබිය යුතුය.

(6) පරිශ්‍රයෙහි සෑම ඉදිකිරීමක්ම කෘමීන් රැඳී සිටීමට හේතුන පරිදි සිදුරු වලින් තොරවිය යුතුය.

(7) එළවළු හා පලතුරු රැස්කරන හා තබා තිබෙන පෘෂ්ඨයන් පහසුවෙන් විෂබීජ නාශක යොදා පිරිසිදු කිරීමට හැකි පෘෂ්ඨයක් විය යුතු අතර, එම පෘෂ්ඨයේ අවශෝෂණය නොවන ද්‍රව්‍යයන්ගෙන් තනා තිබිය යුතුය.

(8) එලවළු හා පලතුරු රැස්කරන හා තබා තිබෙන පෘෂ්ඨයන් විෂබීජනාශක හා සේදුම්කාරකයන්ට අක්‍රිය පෘෂ්ඨයන් විය යුතුය.

(9) පරිශ්‍රය තුල එළවළු හා පලතුරු ගබඩා කරයි නම් හෝ එසේ ගබඩාකර පවත්වා ගනී නම්;ඒ සඳහා වන නියමිත උෂ්ණත්වය පවත්වා ගත හැකි පරිදි ශීතකරණ පහසුකම් විය යුතුය.

(10) අලෙවිය සඳහා එළවළු හා පලතුරු තබා ගැනීමේදී අඩු උෂ්ණත්වයන් යටතේ එය පවත්වා ගැනීමට නම් ඒ සඳහා වූ ශීතකරණ පහසුකම් විය යුතුය.

(11) එළවළු හා පලතුරු රැස්කරන හෝ තිබෙන ස්ථානයට ඉහලින් සිවිලිමක හෝ කොන්ක්‍රීට් පෘෂ්ඨයක් විය යුතුය.

(12) පරිශ්‍රය වායු සමීකරණය කර තිබීම හෝ හොඳින් වාතය ගලා යා හැකි පරිදි ජනේල හා වෙනත් කවුළු තබා තිබිය යුතුය.

(13) පරිශ්‍රයෙහි අභ්‍යන්තර කොටස් පහසුවෙන් පිරිසිදු කල හැකි පරිදි තනා තිබිය යුතුය.

(14) පරිශ්‍රය සඳහා අවශ්‍ය ජලය පරිශ්‍රය තුලින්ම හෝ බාහිරින් සම්පාදනය කර තිබිය යුතු අතර අඛණ්ඩ ජල සැපයුමක් වෙනුවෙන් ජලය ගබඩා කර තබාගත හැකි පහසුකම්වලින් යුක්ත විය යුතුය.

(15) පරිශ්‍රයෙහි එළවළු හා පලතුරු සේදීම සඳහා වෙන්වූ ස්ථානයක් විය යුතු අතර පරිශ්‍රයෙහි ජලය රැඳී නොසිටින පරිදි ඉදිකර තිබිය යුතුය.

(16) පරිශ්‍රයෙහි අභ්‍යන්තර කාණු උරාගැනීම් වලකට හෝ පූතික වලකට යොමු කර තිබිය යුතු අතර අදාල පූතික වල හෝ උරාගැනීමේ වල පරිශ්‍රයෙහි ජල මූලාශ්‍රයක් ඇත්නම් එයට අවම වශයෙන් මීටර් 15.25 ක දුරකින් පිහිටුවා තිබිය යුතුය.

(17) පරිශ්‍රයෙහි සේවකයින් සඳහා;

(i) නේවාසිකයින් වශයෙන් සිටී නම් නවාතැන් සඳහා ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් සහිත කාමර තිබිය යුතුය.

(ii) අවස්ථාවෝචිත පරිදි වැසිකිළි පහසුකම් සපයා තිබිය යුතුය.

(18) පරිශ්‍රයෙහි එළවළු හා පලතුරු තබා තිබෙන හෝ රැස්කරන වේදිකා අවම වශයෙන් පොළවට සෙන්ටි මීටර් 28 ක පමන උසකින් පිහිටුවා තිබිය යුතුය.

8. ***බලපත්‍රයක් නිකුත් කිරීම*** මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ වූ බලපත්‍රයක් සඳහා ඉදිරිපත් වන ඉල්ලුම් පත්‍රයකට අදාළව ඉල්ලුම් පත්‍රය ලැබී දින දහ හතරක් ඇතුලත සභාපති වරයා විසින් ;

(1) 7 වන වගන්තිය යටතේ වූ කොන්දේසි වලට අනුකූල විටදී පරිශ්‍රයට අදාළ බල පත්‍රයක් ඉල්ලුම්කරු වෙත නිකුත් කල යුතුය.

(2) 7 වන වගන්තියෙහි සඳහන් කොන්දේසිවලට අනුකූල නොවන්නේනම් හේතු දක්වා අදාළ ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කල යුතුය.

9. (1) ***බලපත්‍රයක් සඳහා ගාස්තු*** මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රයක් සඳහා අයකල යුතු ගාස්තු මූලික නීතියේ සඳහන් විධිවිධානයන්ට යටත්ව සභාව විසින් තීරණය කර ප්‍රකාශයට පත්කරන ගාස්තු විය යුතුය.

(2) ***පරීක්ෂණ ගාස්තු*** බලපත්‍රයක් නිකුත් කිරීමට අදාලව ස්ථාන පරීක්ෂාවන් සඳහා වන පරීක්ෂණ ගාස්තුවක් සභාව විසින් තීරනය කර අය කිරීම නීත්‍යානුකූල විය යුතුය

10. වලංගු කාලය මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන බලපත්‍රයක් මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධාන අනුව කලින් අවලංගු නොකළහොත් බලපත්‍රයට අදාළ වර්ෂයෙහි දෙසැම්බර් තිස්එක දින දක්වා වලංගු විය යුතුය.

11. ***බලපත්‍රයකට අදාළ කොන්දේසි*** මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලත් සෑම තැනැත්තෙක්ම මෙහි පහත සඳහන් කොන්දේසීන්ට අනුකූලව ක්‍රියා කල යුතුය.

(1) ශ්‍රී ලංකාව පුරාම හෝ ඉන් කොටසකට හෝ බල ප්‍රදේශයට අදාලව හෝ නිරෝධායක හා රෝග වැලැක්වීමේ ආඥා පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද රෙගුලාසි යටතට අදාළ වසංගත තත්ත්වයක් ප්‍රකාශයට පත්කර ඇති කවර හෝ අවස්ථාවක හෝ බල ප්‍රදේශය තුල යම් වසංගත තත්වයකට කරුණු යෙදී ඇති බවට සෑහීමට පත්වෙමින් එය පාලනය කිරීම සඳහා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී උපදෙස් මත සභාපතිවරයා කලින් කල නියම කරනු ලබන නියමයන් ඇත්නම් ඒ සෑම නියමයකටම යටත්ව පරිශ්‍රය පවත්වා ගත යුතුය.

(2) පරිශ්‍රයෙහි සේවය සඳහා යොදවා ඇති සෑම තැනැත්තෙකු විසින්ම නිරෝධායක හා රෝග වැලැක්වීමේ ආඥා පනත යටතේ සාදන ලද රෙගුලාසි යටතට අදාළ වන වසංගත තත්ත්වයක් ප්‍රකාශයට පත්කර ඇති කවර හෝ අවස්ථාවක ඊට අදාළව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී උපදෙස් මත සභාපතිවරයා විසින් කරනු ලබන සෑම නියමයකටම යටත්ව ක්‍රියා කල යුතුය.

(3) බල ප්‍රදේශය තුල වසංගත රෝගී තත්ත්වයක් සඳහා අවදානමක් ඇති බවට සැක කිරීමට කරුණු යෙදී ඇති සෑම අවස්ථාවකම සේවා අපේක්ෂාවෙන් පරිශ්‍රයට පැමිණෙන සෑම තැනැත්තෙකුටම අදාළව, ඊට අදාළව නිකුත් කර ඇති සෞඛ්‍ය උපදෙස් වලට අනුකූලව පැමිණෙන්නේනම් මිස එම පරිශ්‍රයෙහි ගණුදෙණු සඳහා අදාල කර නොගත යුතුය.

(4) බල ප්‍රදේශය තුල කිසියම් වසංගත රෝගී තත්ත්වයකට කරුණු යෙදී ඇති විට හෝ ඒ සඳහා අවදානමක් ඇති විට එයින් ආරක්ෂා වීම සඳහා අනුගමනය කල යුතුයැයි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක ජෙනරාල් හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් හෝ ඔවුන්ගේ උපදෙස් පරිදි සභාපතිවරයා විසින් හෝ නියම කර ඇති සෞඛ්‍ය ආරක්ෂිත උපදෙස් නිසියාකාරයෙන් පරිශ්‍රය තුල ක්‍රියාත්මක කල යුතුවා මෙන්ම , එසේ වන බවට බලපත්‍රලාභියා සෑහීමට පත් විය යුතුය.

(5) පරිශ්‍රය තුල සියළුම කාණු , පහසුවෙන් ජලය බැසයන ආකාරයට පවත්වාගත යුතු අතර, අපජලය, මළ අපද්‍රව්‍ය, අනුමත ක්‍රමවේදයන්ට අනුව පූනික වළවල්, උරා ගැනීමේ වළවල් හෝ මධ්‍ය ප්‍රතිකාර ඒකකයට යොමුකර තිබිය යුතු අතර ,එමගින් දූහනය වීම වැලැක්වීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන තිබිය යුතුය.

(6) පරිශ්‍රය තුල කිසිදු කාණුවක්, අපද්‍රව්‍ය ගලා එන බටයක් ,හෝ කිසිදු ආකාරයකින් මාර්ගයෙහි පොදු කාණුවකට හෝ පිටත භූමියකට හෝ යොමු නොකළ යුතුය.

(7) පරිශ්‍රය තුල අපජලය ගලායාම හේතුවෙන් හෝ අපද්‍රව්‍ය බැහැර කිරීම හේතුවෙන් බාහිරව කිසිදු දූර්ගන්ධයක් ඇති නොවන පරිදි පවත්වාගත යුතුය.

(8) අලෙවිය සඳහා හෝ ගබඩා කර ඇති එළවළු සහ පලතුරු වලට ඉහලින් සවිකර ඇති විදුලිබුබුළු ආරක්ෂක තත්ත්වයේ ඒවා විය යුතු අතර, ඒ සියල්ල ආවරණය කර තිබිය යුතුය.

(9) පරිශ්‍රයෙහි එක් රැස් වන අපද්‍රව්‍ය බැහැර කිරීම ප්‍රාදේශීය සභාව ක්‍රියාත්මක කරන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහනඅනුකූලව සහ ඒ සම්බන්ධයෙන් අදාළ වන ලිඛිත නීතින්ට අනුකූලව කළ යුතුය.

(10) පරිශ්‍රයෙහි එක් රැස්වන අපද්‍රව්‍ය බලපත්‍රලාභියා විසින්ම කළමනාකරණය කරනු ලබයි නම්, එය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීගේ මහජන සෞඛ්‍ය පරීක්ෂක මගින් නියම කරනු ලබන ක්‍රමවේදයකට අනුකූලව විය යුතුය.

(11) පරිශ්‍රය තුළ එළවළු හා පලතුරු අලෙවිය සඳහා කිරුම් උපකරණ යොදා ගැනීමේදී එය නියමිත ප්‍රමිතීන්ට අනුකූලව සිදු කළ යුතුය.

(12) පරිශ්‍රය තුල පළතුරු කෑමට පහසු වන පරිදි සකස් කර දීමට ක්‍රියා කරයි නම් හෝ පළතුරු යුෂ සකස් කර දීමට ක්‍රියා කරයි නම් එසේ ක්‍රියා කරන සෑම තැනැත්තෙක්ම අත්වැසුම් සහ හිස් වැසුම් භාවිතා කිරීමකින් තොරව පලතුරු සකස් කිරීම; පලතුරු යුෂ සකස් කිරීම වැනි කිසිදු කාර්යයක නොයෙදිය යුතුය.

(13) පළතුරු පරිහරණය සඳහා සකස් කිරීමේදී සෑම විටම බීමට ගන්නා ජලය හා එම ජලය උපයෝගී කර ගෙන සකස් කරන ලද අයිස් භාවිතයට ගත යුතුය.

(14) පළතුරු පරිභෝජනය සඳහා සකස් කිරීම පාරිභෝගිකයන් ඉදිරියේ හැර පූර්වයෙන් සකස් කර තැබීමක් නොකළ යුතුය.

(15) එළවළු සහ පළතුරු විකිණීම සඳහා තැන්පත් කර තිබියදී නරක්වූ එළවළු සහ පළතුරු සමග මිශ්‍ර වීමක් සිදු නොවන පරිදි පවත්වා ගත යුතුය.

(16) පරිශ්‍රය නිරන්තරයෙන් පිරිසිදු තත්වයෙන් පනත්වා ගත යුතු අතර කවර හේතුවක් නිසා හෝ පරිශ්‍රය තුළ ඇති එළවළු හෝ පළතුරු දූහනයකට ලක්වන ආකාරයේ කිසිදු ක්‍රියාවක් පරිශ්‍රය තුල සිදු නොකළ යුතුය.

(17) බල ප්‍රදේශය තුළ නිරෝධායක හා රෝග වැලැක්වීමේ ආඥා පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද රෙගුලාසි යටතට අදාළ වන වසංගත තත්ත්වයක් ප්‍රකාශයට පත්කර හෝ බල ප්‍රදේශය තුල කිසියම් වසංගත රෝගී තත්වයකට අවදානමක් ඇති බවට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී උපදෙස් පරිදි සභාපතිවරයා විසින් ප්‍රකාශයට පත්කර ඇති අවස්ථාවක පරිශ්‍රය තුල කාර්යයෙහි නියැලී සිටින සෑම තැනැත්තෙක්ම මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් සෑම නියමයකට අතිරේකව අවස්ථාවෝචිත පරිදි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂක වරයෙකු හෝ ඔවුන්ගේ උපදෙස් පරිදි සභාපතිවරයා විසින් කරනු ලබන නියමයන්ට යටත්ව පරිශ්‍රය පවත්වාගත යුතුය.

(18) පරිශ්‍රය තුල ඒකරාශිවන අපද්‍රව්‍ය බැහැර කිරීමට පූර්වයෙන් රඳවා ගැනීමේදී කිසිදු ආකාරයකින් පරිශ්‍රයෙහි භාවිතයට ගැනෙන දේට බලපෑමක් ඇති නොවන පරිදි හා එළවළු හා පලතුරු දූහනයට කරුණු නොයෙදෙන පරිදි පවත්වාගත යුතුය.

(19) පරිශ්‍රය තුල කිසිදු ආකාරයකින් බල්ලන් , පූසන් වැනි සුරතල් සතුන් ඇති නොකළ යුතුය.

(20) පරිශ්‍රයෙහි සේවයේ යොදවා ඇති සේවකයින් සම්බන්ධයෙන් සෞඛ්‍ය නිරීක්ෂණ පද්ධතියක් පිහිටුවා ඔවුන්ට අවශ්‍ය සෞඛ්‍ය උපදෙස් ලබා ගැනීමට ක්‍රියාවලියක් ඇති කළ යුතුය.

(21) පරිශ්‍රයෙහි මුදල් අයකැමි වශයෙන් කටයුතු කරන අය තම දෙඅත් නිතර විෂබීජ නාශක යොදා ගනිමින් පිරිසුදු කරගත යුතුය.

(22) කිසියම් වසංගත තත්වයක් මත සමාජය තුල අත් වැසුම් මුඛ වැසුම් භාවිතා කිරීමට උපදෙස් ලබාදී ඇති තත්වයකදී, කිසියම් තැනැත්තෙකු තමන් පැළඳ සිටින මුඛ වැස්මක් හෝ අත් වැස්මක් පරිශ්‍රය තුල බැහැර කරනු ලබන්නේ නම් එසේ බැහැර කරන මුඛ වැස්ම හෝ අත් වැසුම් ඒ සඳහාම පරිශ්‍රය තුල නිශ්චිතව තබා ඇති සංවෘත බඳුන්වලට බැහැර කිරීමට සැලැස්විය යුතු අතර, එසේ බැහැර කරන අපද්‍රව්‍ය වෙනත් අපද්‍රව්‍ය සමඟ මිශ්‍ර කිරීමකින් තොරව සභාව ඊට අදාළව ක්‍රියාත්මක කරන කසළ කලමණාකරන වැඩසටහනට හා උපදෙස්වලට අනුකූලව බැහැර කිරීමට සැලැස්විය යුතුය.

(23) කිසියම් බෝවන රෝගයකින් පෙලෙන හෝ එවැනි රෝගයක් වැළඳී ඇති බවට සැක කරන හෝ එවැනි රෝගවාහකයකු හෝ ආසාදනය වී ඇති තුවාල, සමේ ආසාදන හෝ වෙනත් බෝවන රෝගයකින් පෙළෙන තැනැත්තෙකුව පරිශ්‍රයෙහි සේවය සඳහා යොදවා නොගත යුතුය.

(24) කිසිදු අවස්ථාවක යම් බෝවන රෝගී තත්වයකින් හෝ වසංගත රෝගී තත්වයකින් පෙලෙතැයි සිතිය හැකි තරම් කරුණු ඇති කවර හෝ තැනැත්තෙකු පරිශ්‍රයට ඇතුලත් කර නොගත යුතුය.

(25) පරිශ්‍රයෙහි සේවයෙහි යෙදෙන්නෙකුට බෝවන , ස්පර්ශයෙන් බෝවන , හෝ චර්මගත රෝගී තත්වයක් වැළඳුනහොත් ඒ බව බලපත්‍රලාභියා විසින් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත දැනුම් දිය යුතු අතර , එසේ දැනුම් දීමෙන් පසු සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී හෝ ඔහු විසින් බලය පවරන ලද මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකු විසින් ලබාදෙන නිරෝධායක උපදෙස්වලට අනුකූලව පරිශ්‍රයට අදාළ සියළුම අය ක්‍රියාකල යුතුය.

12. මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධානයන්ට අනුකූලව පරිශ්‍රය පවතින්නේද යන්න පරීක්ෂා කිරීම සඳහා සභාපතිවරයා විසින් ඒ සඳහා බලය පවරන ලද මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකු හෝ වෙනත් යම් නිලධාරියෙකු ඕනෑම සාධාරණ වෙලාවක පරිශ්‍රයට ඇතුළු වීමට, අවශ්‍ය නියැදි ලබා ගැනීම නීත්‍යානුකූල වන්නේය. *ස්ථාන පරීක්ෂාව හා නියදි ලබාගැනීම*

13. බලප්‍රදේශය තුල වසංගත තත්වයක් පැතිර යාමට හේතුවිය හැකි කරුණු සැලකිල්ලට ගන්මින් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී උපදෙස් පරිදි පරිශ්‍රය පවත්වාගෙන යාමට අදාළව බලපත්‍රලාභියා විසින් එකඟතා ප්‍රකාශයකට ඇතුලත් විය යුතුයැයි සභාපතිවරයා විසින් නියමකර ඇති විටකදී බලපත්‍රලත් තැනැත්තා සභාපතිවරයා සමඟ එකඟතා ප්‍රකාශයකට ඇතුලත් විය යුතු අතර සභාපතිවරයා විසින් එහි පිටපතක් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත යොමුකල යුතුය.

14. (1) මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලත් පරිශ්‍රයක් යටතේ මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහා කොන්දේසි උල්ලංඝනය කරමින් හෝ ඊට පටහැනි වන පරිදි කටයුතු වන අවස්ථාවක අතුරු ව්‍යවස්ථාවට අනුකූල වීම සඳහා දින තිහකට නොවැඩි නිශ්චිත කාලයක් දන්වමින් දැන්වීමක් සභාපතිවරයා විසින් බලපත්‍රලාභියා වෙත භාරදිය යුතුය. *බලපත්‍රය අවලංගු කිරීම*

(2) මෙම වගන්තිය යටතේ වූ දැන්වීමක් බලපත්‍ර ලාභියා වෙත භාරදීමෙන් පසු ,අදාල දැන්වීමේ සඳහා නියමයන්ට අනුකූලව ක්‍රියාකිරීම සඳහා තවදුරටත් අතිරේක කාලයක් ලබාදෙන ලෙසට සාධාරණ හේතු දක්වමින් කරනු ලබන ඉල්ලීමක් මත සභාපති වරයා විසින් අතිරේක කාලයක් ලබාදිය හැකිය.එසේ ලබාදෙන කාලය පළමු දැන්වීමේ සඳහා කාලයට අතිරේකව දින දහ හතරක උපරිම කාලයකට යටත්ව විය යුතුය.

15. ඉහත 14 වගන්තිය යටතේ ලබාදෙන කාල සීමාව තුළ හෝ අතිරේක කාල සීමාව තුළ දැන්වීමට අනුකූලව ක්‍රියා කිරීම බලපත්‍ර ලාභියා විසින් පැහැර හැර ඇති අවස්ථාවක සභාපතිවරයා විසින් අදාල බලපත්‍රය අවලංගු කල යුතුය.

*දණ්ඩනය*

16. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ලබා ගත යුතු බලපත්‍රයකින් තොරව හෝ අතුරු ව්‍යවස්ථාව යටතේ කරනු ලබන නියමයන් කඩකරමින් පරිශ්‍රයක් පවත්වාගෙන යාම වරදක් වන අතර එම වරද සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් වරදකරුවෙකු කිරීමෙන් පසු 1987 අංක 15දරන ප්‍රාදේශීය සභා පනතේ 122(2) උප වගන්තිය යටතේ දඩුවමකට යටත් විය යුතුය.තවද එලෙස වරදකරුවෙකු වීමෙන් පසු තව දුරටත් එකී කඩකිරීම, උල්ලංඝණය නිරන්තරයෙන්ම කරගෙන යනු ලබන විට සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් දැන්වීමක් භාර දීමෙන් පසු උල්ලංඝණ තව දුරටත් නොකඩවා කරගෙන යන සෑම දිනකට ඉහතකී 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(2) උප වගන්තියේ සඳහා අතිරේක දඩයකට යටත් විය යුතුය.

*අර්ථ නිරූපනය*

17. මෙම අතුරු ව්‍යවස්ථාවේ පද සම්බන්ධයෙන් අන්‍ය අර්ථයක් අවශ්‍ය වන්නේනම් මිස මෙම අතුරුව්‍යවස්ථාවේ,

"සභාව" යන්නෙන් කළුතර ප්‍රාදේශීය සභාවද,

"සභාපති" යන්නෙන් කළුතර ප්‍රාදේශීය සභාවේ තත්කාලයෙහි සභාපති ධූරය දරන හෝ එම ධූරයේ කාර්යය කර්තව්‍ය ඉටුකරන අයද ,

"සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී" යන්නෙන් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අදාල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාෂය සඳහා එම තනතුර දරන අයද,

"මහජන සෞඛ්‍ය පරීක්ෂක" යන්නෙන් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අදාලව සේවයේ යෙදෙන ප්‍රාදේශීය සභාවේ හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයට අනුයුක්තව මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුර දරන අයෙක්ද,

"බලපත්‍රලාභියා" යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලබාගත් ආයතනයක් ,තැනැත්තෙක් හෝ පුද්ගලයෙක්ද ,

"බලයලත් නිලධාරියා" යන්නෙන් තත්කාලයෙහි ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් බලය පවරන ලද නිලධාරියාද,

"දූහනය වීම" යන්නෙන් ආහාර ද්‍රව්‍යකට කිසිදු දූහක ද්‍රව්‍යයක් ඇතුල්වීම හෝ හටගැනීමද,

"විෂබීජ නාශක" යන්නෙන් ආහාරවල ආරක්ෂාව හෝ යෝග්‍යබව අඩුනොකරන මට්ටමකට පරිසරයෙහි ඇති ක්ෂුද්‍ර ජීවීන් ප්‍රමාණය රසායනික කාරකයන් මඟින් හෝ භෞතික ක්‍රමයකින් අඩු කිරීමද,

" සාධාරණ වෙලාව" යන්නෙන් බලපත්‍රලත් කර්තව්‍ය හෝ ඊට අදාළ කාර්යයෙහි නිරතවන ඕනෑම වෙලාවක්ද,

" මූලික නීතිය" යන්නෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීයසභා පනත අදහස් වෙයි.

*පාය අත *
*අනනුකූලතාවය*

18. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල හා ඉංග්‍රීසි,දෙමළ පාඨ අතර අනනුකූලතාවයන් හටගතහොත් එවිට සිංහල පාඨය ප්‍රමුඛ වෙයි.

**උපලේඛනය**

**.......................... වර්ෂය සඳහා එළවළු/පළතුරු වෙළඳ සැලක් පවත්වාගෙන යාමට අදාල බලපත්‍රය ලබාගැනීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය.**

01. ඉල්ලුම්කරුගේ නම : -
02. පෞද්ගලික ලිපිනය : -
03. ජාතික හැඳුනුම්පත් අංකය : -
04. දූරකථන අංකය : -
05. වෙළඳ ව්‍යාපාරයේ නම : -
06. ව්‍යාපාරික ස්ථානයේ ලිපිනය : -
07. ග්‍රාම නිලධාරී කොට්ඨාසය : -
08. වරිපනම් අංකය: -
09. ව්‍යාපාරය නාම ලියාපදිංචිය ලබාගෙන ඇත්නම් එහි යොමු අංකය :-
10. ව්‍යාපාර ස්ථානයේ කළමනාකරුගේ හෝ නියෝජිතයාගේ,

    I. නම හා පෞද්ගලික ලිපිනය

    II. ජාතික හැඳුනුම්පත් අංකය

    III. දූරකථන අංකය ජංගම :- ස්ථාවර :-

12. ව්‍යාපාරයට අදාළ ඉදිකිරීම් අනුමත කරන සැළැස්මේ අංකය හා දිනය :-

    ( පිටපත් ඇමිණිය යුතුය )

ඉහත තෙරෙතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

ඉහත තොරතුරු සඳහන් වෙළඳාම පවත්වාගෙන යන ස්ථානය සඳහා ............................ වර්ෂය වෙනුවෙන් බලපත්‍රයක් මා වෙත නිකුත් කරන ලෙස ඉල්ලමි.

දිනය:- .....................................

ඉල්ලුම්කරුගේ අත්සන

---

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

ආදායම් පරීක්ෂක,

පසුපිටේ සඳහන් ඉල්ලුම්පත්‍රයට අදාළව බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා වන ඔබගේ නිරීක්ෂණ හා නිර්දේශ කඩිනමින් මා වෙත ලබා දෙන ලෙස කාරුණිකව ඉල්ලමි.

දිනය:- .................................

ලේකම්

ලේකම්,

බලපත්‍රය ලබා දීම නිර්දේශ කරමි./නොකරමි.

දිනය :- ……………………………

ආදායම් පරීක්ෂක

---

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී,

පසුපිටේ සඳහන් ඉල්ලුම් පත්‍රයට අදාළව බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා වන ඔබගේ නිරීක්ෂණ හා නිර්දේශ කඩිනමින් ලබාදෙන මෙන් කාරුණිකව ඉල්ලමි.

දිනය :- ……………………………

ලේකම්

---

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී,

අතුරු ව්‍යවස්ථා හා අනෙකුත් නීති රීතිවලට අනුකූලව සුදුසුකම් සපුරා ඇත. බලපත්‍ර නිකුත් කිරීම නිර්දේශ කිරීම සඳහා වාර්තා කරමි.

දිනය :- ……………………………

මහජන සෞඛ්‍ය පරීක්ෂක

---

ලේකම්,

ඉහත ඉල්ලුම්පත්‍රයට අනුව අදාළ ස්ථානය සඳහා බලපත්‍රයක් නිකුත් කිරීම නිර්දේශ කරමි. / නොකරමි.

(නිර්දේශ නොකරන්නේ නම් ඊට අදාළ හේතුව සඳහන් කරන්න).

දිනය :- ……………………………

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී

---

**උත්සව ශාලා පිළිබඳ අතුරුව්‍යවස්ථාව**

1. මෙම අතුරු ව්‍යවස්ථාව කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල උත්සව ශාලා පවත්වාගෙන යාමේදී ඒවායේ සිදුවන ක්‍රියාකාරකම් යටතේ මහජනයාගේ සෞඛ්‍ය ආරක්ෂා කිරීම සඳහාත්, එවැනි ස්ථාන විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම සහ පාලනය කිරීම සඳහාත්, මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලබයි.

2. මෙම අතුරු ව්‍යවස්ථාව . කළුතර ප්‍රාදේශීය සභාවේ උත්සව ශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ. *ලුහුඬු නාමය*

3. මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 126 (IX) උපවගන්තිය යටතේ කළුතර. ප්‍රාදේශීය සභාවට බලය ලැබී ඇත. *නෛතික බලය*

4. කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය (මෙහි මින්මතු බල ප්‍රදේශය යනුවෙන් හඳුන්වනු ලබන) තුළ කිසිදු තැනැත්තෙකු විසින් සභාපතිවරයා වෙතින් මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ලබාගත් බලපත්‍රයක් යටතේ මිස උත්සව ශාලාවක් පවත්වාගෙන යාම නොකළ යුතුය.

5. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ඉල්ලුම් කරන සෑම තැනැත්තෙක්ම මෙම අතුරු ව්‍යවස්ථාවේ උපලේඛනයට සාරානුකූලව පිළියෙල කරන ලද ඉල්ලුම්පත්‍රයක් යටතේ ඒ සඳහා ඉල්ලුම් කළ යුතුය. *බලපත්‍රයක් ඉල්ලුම් කිරීම*

6. ඉහත වගන්තිය යටතේ වූ ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කිරීම ඒ සඳහා අවශ්‍යතා සම්පූර්ණ කර ලියාපදිංචි තැපෑලෙන් සභාපති වෙත යොමු කිරීමෙන්, ගෙනවිත් භාරදීමෙන් හෝ සභාව අවසර දී ඇති ප්‍රමාණයට විද්‍යුත් තැපෑලෙන් යොමු කිරීමෙන් කළ හැකිය.

7. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ඉල්ලුම් කරන සෑම තැනැත්තෙක්ම මෙහි පහත සඳහන් කොන්දේසි සම්පූර්ණ කර ඇත්තේ නම් මිස සභාපතිවරයා විසින් බලපත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතුය. *බලපත්‍රයක් සඳහා කොන්දේසි*

(1) පරිශ්‍රයට අදාළ සියළු ඉදිකිරීම් අවස්ථාවෝචිත පරිදි 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනත යටතේ හෝ නිවාස හා නගර සංවර්ධන ආඥා පනත යටතේ වූ විධිවිධානයන්ට අනුකූලව ඉදිකරන ලද ඉදිකිරීම් විය යුතු අතර එහි;

(අ) බල ප්‍රදේශය කලාපකරණයකට යටත්ව ඇත්නම් ඊට අනුකූලව අදාළ ඉදිකිරීම් පිහිටා තිබිය යුතුය.

(ආ) ඉදිකිරීම් භාවිතයට පූර්වයෙන් ඉදිකිරීම් පිළිබඳ අනුකූලතා සහතිකය ලබා තිබිය යුතුය.

(2) සියළු ඉදිකිරීම් ස්ථිර ඉදිකිරීම් ද්‍රව්‍යයන්ගෙන් මනා ලෙස තනා තිබිය යුතුය.

(3) උත්සව ශාලා තුළ හරස් දූහනය වැළැක්වීම සඳහා අවශ්‍ය වෙන්කිරීම්, බෙදීම්, ස්ථානගත කිරීම් සිදුකර තිබිය යුතු අතර, අභ්‍යන්තරය ප්‍රමාණවත් දුරස්ථභාවයක් පවත්වාගැනීමට හැකිවන පරිදි පිරිසැකසුම් කර තිබිය යුතුය.

(4) ශාලා අභ්‍යන්තරයෙහි බාධාවකින් තොරව මෙහෙයුම් කටයුතු සිදුකිරීමට හැකිවන පරිදි ප්‍රමාණවත් ඉඩ පහසුකම් පවත්වාගත යුතුය.

(5) පළිබෝධකයන් හා දූහන ද්‍රව්‍ය ඇතුල්වීම සහ රැඳී සිටීම වළක්වන පරිදි ගොඩනැගිලි ඇතුළු පරිශ්‍රය නිර්මාණය කර තිබිය යුතුය.

(6) පහසුවෙන් හා නිසි පරිදි පිරිසිදු කිරීම් සිදුකිරීමට හැකිවන පරිදි හා ආහාරවල ස්වස්ථතා තත්ත්වය නිසි පරිදි අධීක්ෂණය කිරීමට පහසුකම් සලස්වන පරිදි පරිශ්‍රය නිර්මාණය කර තිබිය යුතුය.

(7) පරිශ්‍රය තුළ තනා ඇති වේදිකා නිසි ප්‍රමිතියෙන් යුක්තව තනා තිබිය යුතු අතර, ශාලා අභ්‍යන්තර ශබ්දය අවශෝෂණය වන පරිදි සකසා තිබිය යුතුය.

(8) ශාලා අභ්‍යන්තරය වායු සමනය කර තිබීම හෝ ප්‍රමාණවත් වාතාශ්‍රයක් සඳහා අවකාශය ඉතිරිවන පරිදි ශාලාවේ වර්ගඵලයෙන් පහලොවෙන් එකකට නොඅඩු ප්‍රමාණයකට විවෘත කළ හැකි ජනේල යොදා තිබිය යුතුය.

(9) ශාලා තුළට ප්‍රමාණවත් අලෝකය ස්වභාවික හෝ කෘතීමව ලැබෙන පරිදි සකස් වී තිබිය යුතුය.

(10) දොරවල් සුමට සහ අවශෝෂණය නොවන මතුපිටක් සහිතව විය යුතු අතර, උචිත අවස්ථාවන්හීදී ස්වයංක්‍රීයව වැසි යන පරිදි වූ සවි කිරීම් විය යුතුය.

(11) පරිශ්‍රය තුළ සියළුම ශාලාවන්ට ගිණි ආරක්ෂණ උපකරණ සවිකර තිබිය යුතුය.

(12) පරිශ්‍රය තුළ සවිකර ඇති කිසිදු සවිකිරීමකින්, ව්‍යුහයකින් පුස් බැඳීම වර්ධනය විමක්, කාන්දුවිමක් සිදු නොවිය යුතුය.

(13) පරිශ්‍රය තුළ විවෘත වන ජනේල පහසුවෙන් පිරිසිදු කළ හැකි ආකාරයට විය යුතු අතර, කෘමීන්ට ඇතුල්විය නොහැකි පරිදි වූ දැල් සවිකර තිබිය යුතුය.

(14) පාරිභෝගිකයින් සහ සේවකයින් සඳහා වෙන් වූ වැසිකිළි පහසුකම් තිබිය යුතු අතර, එය ස්ත්‍රී හා පුරුෂ යන දෙපාර්ශවයට වෙන් වෙන් වශයෙන් පවත්වාගත යුතුය.

(15) පරිශ්‍රයෙහි ගොඩනැඟිලි ආබාධිත අයට පිවිසීමේ පහසුකම් සහිතව සකස්කර තිබිය යුතුය.

(16) අපජලය සහ මළ අපද්‍රව්‍ය බැවුම් සහිතව අපද්‍රව්‍ය රදා නොසිටින පරිදි ඉදිකළ සංවෘත කාණු හෝ යොදා තිබිය යුතු අතර, සියළුම කාණු අනුමත සැළැස්මකට අනුකූලව ඉදිකරන ලද පූතික වළකට උරාගැනීමේ වළකට හෝ මධ්‍ය පූතිකාකාර ඒකකයකට යොමු කර තිබිය යුතුය අතර, පරිශ්‍රය සහ අවසන් බැහැරකරලීම අතර දූහනය වැළැක්වීම සඳහා ජල උගුලක් හෝ සැළැස්මක් තුළ අනුමත කරන ලද ක්‍රමවේදයක් අනුගමනය කර තිබිය යුතුය.

(17) පරිශ්‍රය තුළ එක් රැස්වන අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාව ක්‍රියාත්මක කරන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහනකට අනුකූලව භාරදීමට හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් නියම කරන ක්‍රමවේදයකට අනුකූලව අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා නිශ්චිත වැඩපිළිවෙලක් සකස් කර තිබිය යුතුය.

(18) පරිශ්‍රයෙහි භාවිතය සඳහා පානීය ජලය ප්‍රමාණවත් ලෙස සම්පාදනය කර තිබීය යුතු අතර, එය නියමිත ප්‍රමිති යටතේ වූ බහාලුම් තුල ගබඩා කර තිබිය යුතුය.

(19) පරිශ්‍රයතුළ අත් සේදීම සඳහා මල නොබැඳෙන ලෝහයකින් හෝ වෙනත් සුදුසු ද්‍රව්‍යකින් තනන ලද පහසුකම් සපයා තිබිය යුතුය.

(20) පරිශ්‍රය තුල ආහාර පිසීම සහ පරිසැකසුම් ස්ථානයෙහි

(අ) බිම හා බිත්ති සේදිය හැකි හා ලිස්සා නොයන හා ජලය අවශෝෂණය නොවන ද්‍රව්‍යවලින් සකස් වී තිබීය යුතුය.

(ආ) සෑම මතුපිට පෘෂ්ඨයක්ම පහසුවෙන් පිරිසිදු කල හැකි සේදුම්කාරක ද්‍රව්‍යන්ට හා විෂබීජ නාශකවලට අක්‍රීයව පැවතිය යුතුය.

(ඇ) සිවිලිම ඝනීභවනය අවම වන පරිදි හා පුස් සෑදීම, පතුරු ගැලවීම වැලැක්වෙන පරිදි ඉදිකරනු ලැබුවන් විය යුතුය.

(ඈ) ජනේල හා වෙනත් කවුළු ඇත්නම් ඒවා කෘමීන්ට ඇතුළුවිය නොහැකි ආකාරයේ ආවරණයකින් ආවරණය කර තිබිය යුතුය.

(ඉ) පිටත වාතය පහසුවෙන් ගලා ඒමට හා අපහරිත වායුව පිටතට පහසුවෙන් ගලා යා හැකි පරිදි අවශෝෂක පංකා යොදා තිබිය යුතුය.

(21) පරිශ්‍රයෙහි පාරිභෝගිකයින් සඳහා ආහාර පිලිගන්වන ස්ථානයට අදාළව;

(අ) ප්‍රමාණවත් දුරස්ථභාවයක් ඇතිව ආහාර ලබා ගැනීමට හැකිවන පරිදි වැඩි ඉඩක් සහිතව ආහාර පිලිගැන්වීම සඳහා වන අවකාශය සකස් වී තිබිය යුතුය.

(ආ) ආහාර පරිභෝජනය සඳහා වන කොටස් විවෘත අවකාශයක් වන විටදී හොඳින් වාතය ගලා එන පරිදි හා පක්ෂීන් හා වෙනත් සතුන්ට ඇතුල් වීමට නොහැකි වන පරිදි සකස් වී තිබිය යුතුය.

(22) පරිශ්‍රයට පැමිණෙන්නන් සඳහා ප්‍රමාණවත් පරිදි වාහන නැවතුම් ස්ථාන සපයා තිබිය යුතුය.

(23) පරිශ්‍රයෙහි සේවක සේවිකාවන් සඳහා,

(අ) නේවාසිකයින් වශයෙන් සිටීනම් නවාතැන් සඳහා ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් සහිත කාමර පහසුකම් තිබිය යුතු අතර, එය ආහාර පිරිසැකසුම් හා ගබඩා කරන ස්ථානයෙන් වෙන් වූ ස්ථානයක විය යුතුය.

(ආ) සේවකයින් එක් අයෙකුට නිදාගැනීමට අවම වශයෙන් වර්ග මීටර හතරක ඉඩ ප්‍රමාණයක් වන පරිදි කාමර සකස් වී තිබිය යුතුය.

(ඇ) ප්‍රමාණවත් වැසිකිළි හා නාන කාමර පහසුකම් සපයා තිබිය යුතුය.

(24) පරිශ්‍රය තුල හදිසි විදුලි බිඳවැටීමකදී ප්‍රයෝජනයට ගතහැකි පරිදි ප්‍රමාණවත් ධාරිතාවයකින් යුත් විදුලි බිඳවැටීමකදී ස්වයංක්‍රීයව ක්‍රියාත්මක වන විදුලි ජනක යන්ත්‍ර සපයා තිබිය යුතුය.

8. *බලපත්‍රයක් නිකුත් කිරීම* මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ වූ බලපත්‍රයක් සඳහා ඉදිරිපත් වන ඉල්ලුම් පත්‍රයකට අදාළව ඉල්ලුම් පත්‍රය ලැබී දින දහ හතරක් ඇතුලත සභාපති වරයා විසින් ;

(1) 7 වන වගන්තිය යටතේ වූ තොරතුරු වලට අනුකූල විටදී පරිශ්‍රයට අදාළ බල පත්‍රයක් ඉල්ලුම්කරු වෙත නිකුත් කල යුතුය.

(2) 6 වන වගන්තියෙහි සඳහා කොන්දේසිවලට අනුකූලව නොවන්නේනම් හේතු දක්වා අදාළ ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කල යුතුය.

9. (1) *බලපත්‍රයක් සඳහා ගාස්තු* මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රයක් සඳහා අයකල යුතු ගාස්තු මූලික නීතියේ සඳහා විධිවිධානයන්ට යටත්ව සභාව විසින් තීරණය කර ප්‍රකාශයට පත්කරන ගාස්තු විය යුතුය.

(2) *පරීක්ෂණ ගාස්තු* බලපත්‍රයක් නිකුත් කිරීමට අදාලව ස්ථාන පරීක්ෂාවන් සඳහා වන පරීක්ෂණ ගාස්තුවක් සභාව විසින් තීරණය කර අය කිරීම නීත්‍යානුකූල විය යුතුය.

10. *වලංගු කාලය* මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන බලපත්‍රයක් මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධාන අනුව කලින් අවලංගු නොකළ හොත් බලපත්‍රයට අදාළ වර්ෂයෙහි දෙසැම්බර් තිස්එක දින දක්වා වලංගු විය යුතුය.

11. *බලපත්‍රයකට අදාළ කොන්දේසි* මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලත් සෑම තැනැත්තෙක්ම මෙහි පහත සඳහන් කොන්දේසීන්ට අනුකූලව ක්‍රියා කල යුතුය.

(1) ශ්‍රී ලංකාව පුරාම හෝ ඉන් කොටසකට හෝ බල ප්‍රදේශයට අදාලව හෝ නිරෝධායක හා රෝග වැලැක්වීමේ ආඥා පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද නියෝග යටතට අදාළ රෝගී තත්වයක් ප්‍රකාශයට පත්කර ඇති කවර හෝ අවස්ථාවක හෝ බල ප්‍රදේශය තුල යම් වසංගත තත්වයකට කරුණු යෙදී ඇති බවට සෑහීමට පත්වෙමින් එය පාලනය කිරීම සඳහා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී උපදෙස් මත සභාපතිවරයා කලින් කල නියම කරනු ලබන නියමයන් ඇත්නම් ඒ සෑම නියමයකටම යටත්ව පරිශ්‍රය පවත්වා ගත යුතුය.

(2) පරිශ්‍රයෙහි සේවය සඳහා යොදවා ඇති සෑම තැනැත්තෙකු විසින්ම නිරෝධායක හා රෝග වැලැක්වීමේ ආඥා පනත යටතේ සාදන ලද නියෝග යටතට අදාළ වන රෝගී තත්වයක් ප්‍රකාශයට පත්කර ඇති කවර හෝ අවස්ථාවක ඊට අදාලව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී උපදෙස් මත සභාපතිවරයා විසින් කරනු ලබන සෑම නියමයකටම යටත්ව ක්‍රියා කල යුතුය.

(3) බල ප්‍රදේශය තුල වසංගත රෝගී තත්වයක් සඳහා අවදානමක් ඇති බවට සැක කිරීමට කරුණු යෙදී ඇති සෑම අවස්ථාවකම සේවා අපේක්ෂාවෙන් පරිශ්‍රයට පැමිණෙන සෑම තැනැත්තෙකුටම අදාළව, ඊට අදාළ නිකුත් කර ඇති සෞඛ්‍ය උපදෙස් වලට අනුකූලව පැමිණෙන්නේනම් මිස එම පරිශ්‍රයෙහි සේවා පහසුකම් සලසා නොදිය යුතුය.

(4) බල ප්‍රදේශය තුල කිසියම් වසංගත රෝගී තත්වයකට කරුණු යෙදී ඇති විට හෝ ඒ සඳහා අවදානමක් ඇති විට එයින් ආරක්ෂා වීම සඳහා අනුගමනය කල යුතුයැයි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක ජෙනරාල් හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් හෝ ඔවුන්ගේ උපදෙස් පරිදි සභාපතිවරයා විසින් හෝ නියම කර ඇති සෞඛ්‍ය ආරක්ෂිත උපදෙස් නිසියාකාරයෙන් පරිශ්‍රය තුල ක්‍රියාත්මක කල යුතුවා මෙන්ම , එසේ වන බවට බලපත්‍රලාභියා සෑහීමට පත් විය යුතුය.

(5) පරිශ්‍රය තුල සියළුම කාණු , පහසුවෙන් ජලය බැසයන ආකාරයට පවත්වාගත යුතු අතර, අපජලය, මළ අපද්‍රව්‍ය, අනුමත ක්‍රමවේදයන්ට අනුව පූනික වළවල්, උරා ගැනීමේ වළවල් හෝ මධ්‍ය ප්‍රතිකාර ඒකකයට යොමුකර තිබිය යුතු අතර ,එමඟින් දූහනය වීම වැළැක්වීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන තිබිය යුතුය.

(6) පරිශ්‍රයෙහි සියළුම වැසිකිළි, දෙඅත් සෝදන ස්ථාන නිරන්තරයෙන් විෂබීජ නාශක යොදා පිරිසිදු කල යුතු අතර, ඒ සියල්ල එසේ වන බවට සෑහීමට පත්වීම පිණිස සුදුසු වැඩපිළිවෙලක් පවත්වාගත යුතුය.

(7) පරිශ්‍රයෙහි අභ්‍යන්තර පොළව පහසුවෙන් ලිස්සා නොයන පරිදි සකස්කර තිබිය යුතු අතර, පිරිසිදු කිරීම් සිදු කිරීමේදී ඊට යම් තාක් පහසු වන තත්වයකට කරුණු යෙදේනම් එම ස්ථානයෙහි ඒ බව සඳහන් පුවරු පාරිභෝගිකයින්ට දැකගත හැකිවන පරිදි තබා තිබිය යුතුය.

(8) පරිශ්‍රය තුල පිහිටුවා ඇති කාණු ජලය රැඳී නොසිටින පරිදි සකස් වී තිබිය යුතු අතරම එය සෑම දිනකම දෙවරක් විෂබීජ නාශක යොදා පිරිසිදු කල යුතුය.

(9) පරිශ්‍රය තුල කිසිදු කාණුවක්, අපද්‍රව්‍ය ගලා එන බටයක් ,හෝ කිසිදු ආකාරයකින් මාර්ගයෙහි පොදු කාණුවකට හෝ පිටත භූමියකට හෝ යොමු නොකළ යුතුය.

(10) පරිශ්‍රය තුල අපජලය ගලායාම හේතුවෙන් හෝ අපද්‍රව්‍ය බැහැර කිරීම හේතුවෙන් බාහිරව කිසිදු දුර්ගන්ධයක් ඇති නොවන පරිදි පවත්වාගත යුතුය.

(11) ආහාර පිසීමේදී, ආහාර ශීත කිරීමේදී, ඒ සඳහා විය යුතු උෂ්ණත්වය නියාමනය කිරීම සඳහා ප්‍රමාණවත් පහසුකම් තිබිය යුතු අතර එය එසේ වන බවට වාර්තා පවත්වාගත යුතුය.

(12) ආහාර සකස් කිරීම සඳහා භාවිතා කරන සියළු උපකරණ හා මෙවලම් පහත සඳහන් අවශ්‍යතාවන්ට අනුකූලවන පරිදි පවත්වා ගත යුතුය.

(අ) ආහාර සකස් කිරීමේදී භාවිතාවන සියළුම උපකරණ මෙවලම් කිසිදු විෂ ද්‍රව්‍යක්, රසක් හෝ දුගඳක් ප්‍රේෂණය නොවන අවශෝෂණය කර නොගන්නා ද්‍රව්‍ය වලින් සකස් වී තිබිය යුතු අතරම එය මල නොබැඳෙන ද්‍රව්‍ය වලින් සාදා තිබිය යුතුය.

(ආ) සියළුම උපකරණ හා මෙවලම් පහසුවෙන් පිරිසිදු කල හැකි ආකාරයේ ඒවා විය යුතුය.

(ඇ) අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා යොදා ඇති භාජන ලෝහ හෝ කාන්දු නොවන ද්‍රව්‍යයන්ගෙන් සකස් කරන ලද පියන සහිත ඒවා විය යුතුය.

(ඈ) පවත්වාගනු ලබන සෑම උපකරණයක්ම, මෙවලක්ම භාවිතා කිරීමට උචිත තත්වයේ ඒවා විය යුතුය.

(13) ආහාර බෙදා හැරීම සඳහා යොදාගනු ලබන දේ ආහාර වල රසයට හානි නොවන ආකාරයට බෙදා ගැනීම සිදු කිරීමට හැකිවන පරිදි වූ බහාලුම් විය යුතුය.

(14) පරිශ්‍රය තුල ආහාර සකස් කිරීම සඳහා භාවිතාවන දේ තැබීම සඳහා හා පිසින ලද ආහාර හෝ එවැනි දේ තබා ගැනීම සඳහා වෙන් වෙන් වශයෙන් ප්‍රමාණවත් ශීතකරණ පහසුකම් තිබිය යුතුය.

(15) ආහාර සකස් කිරීමට ගන්නා පළතුරු ,එළවළු වැනි දේ ඉතා හොඳින් සෝදා පිරිසිදු කොට භාවිතයට ගත යුතුය.

(16) පරිශ්‍රයෙහි භාවිතය සඳහා යොදා ගැනෙන ජලය උපද්‍රවකාරී නොවන භාජනවල දූහනයෙන් තොරව පවත්වාගත යුතුය.

(17) පරිශ්‍රයෙහි භාවිතයට ගැනෙන අයිස් පානීය ජලයෙන් නිෂ්පාදිත ඒවා විය යුතුය.

(18) පරිශ්‍රය තුල ජලය ගෙන යන නල මාර්ග වෙනත් වූ නල මාර්ගයකින් හෝ වෙන්කර හඳුනාගැනීමට හැකිවන පරිදි පවත්වා ගත යුතුය.

(19) පරිශ්‍රය තුල පිසින ලද සෑම ආහාර ද්‍රව්‍යක්ම උපද්‍රවයකින් තොරව පාරිභෝගිකයන් වෙත පත් කිරීම සඳහා නිශ්චිත අභ්‍යන්තරික වැඩ පිළිවෙලක් සකස්කර තිබිය යුතු අතර, එය නියාමනය කිරීම සඳහා නිශ්චිතව කාර්යය පවරන ලද අය සේවයේ යොදවා තිබිය යුතුය.

(20) ආහාරයට රැගෙන එන මස් මාළු පරිශ්‍රයෙහි වෙනම ශීතකරණයක ගබඩා කර තැබිය යුතු අතර භාවිතයට ගන්නා තෙක් සැමවිටම සෙන්ටිග්‍රේඩ් අංශක දෙකක උෂ්ණත්වයකින් යුතුව දූහනය නොවන පරිදි පවත්වාගත යුතුය.

(21) පරිශ්‍රය තුල ආහාර පිළිගැන්වීමේ හෝ පරිහරණය කිරීමේ හෝ එකලැස් කිරීමේ කාර්යයක නියැලී සිටින සෑම තැනැත්තෙකු විසින්ම ;

(අ) තම අත්ල හෝ ඇඟිලි විවෘත භාවයෙන් ආහාර ඇල්ලීම හෝ ස්පර්ශ කිරීම නොකළ යුතුයි.

(ආ) ආහාර ඇල්ලීම සඳහා භාවිතා කරන මෙවලම් හා අත්වැසුම් ආහාර සඳහා හිතකර භාවිතයක් විය යුතුය.

(ඇ) දෙඅත් පිසදමා ගැනීම සඳහා පිරිසිදු තුවායක් භාවිතයට ගත යුතුය.

(ඈ) භාවිතයට ගැනෙන පිගානක කෝප්පයක හෝ වෙනත් භාජනයක යටිපැත්ත කිසිදු ආහාරයක නොගෑවෙන ලෙස සැමවිටම පවත්වා ගත යුතුය.

(ඉ) ආහාර බෙදීම සඳහා භාවිතයට ගනුලබන සියළු උපකරණ මනා ලෙස පිරිසිදුව තබාගත යුතු අතර, ඒ සියල්ල වෙන් වෙන් වශයෙන් භාජනවල බහා තැබිය යුතුය.

(ඊ) කිසිදු ආකාරයකින් තම ක්‍රියාවකින්, භාවිතයකින් ආහාරයක් දූහනයට ලක්වීමට හෝ ක්ෂුද්‍ර ජීවීන් ව්‍යාප්ත වීමට හේතු නොවන පරිදි ආහාර පරිහරණය කිරීමට, එකලැස් කිරීමට පිළිගැන්වීමට එසේ සේවයේ යෙදී සිටින්නන් ක්‍රියා කල යුතුය.

(22) බල ප්‍රදේශය තුළ නිරෝධායක හා රෝග වැළැක්වීමේ ආඥාපනත යටතේ හෝ ඒයටතේ සාදන ලද නියෝග යටතට අදාළ වන රෝගී තත්වයක් ප්‍රකාශයට පත්කර හෝ බල ප්‍රදේශය තුල කිසියම් වසංගත රෝගී තත්වයකට අවදානමක් ඇති බවට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී උපදෙස් පරිදි සභාපතිවරයා විසින් ප්‍රකාශයට පත්කර ඇති අවස්ථාවක පරිශ්‍රය තුල ආහාර සකස් කිරීමේ, පරිහරණය ,පිළිගැන්වීම් කිරීමේ හෝ එකලැස් කිරීමේ කාර්යයහි නියැලී සිටින සෑම තැනැත්තෙක්ම මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහා සෑම නියමයකට අතිරේකව අවස්ථාවෝචිත පරිදි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂක වරයෙකු හෝ ඔවුන්ගේ උපදෙස් පරිදි සභාපතිවරයා විසින් කරනු ලබන නියමයන්ට යටත්ව පරිශ්‍රය පවත්වාගත යුතුය.

(23) පරිශ්‍රය තුල ආහාර පිළිගැන්වීමේ හා පරිහරණය සඳහා වන මේස ඉතා පිරිසිදු තත්වයකින් විය යුතු අතර, සෑම පිළිගැන්වීමකින් හා පරිහරණයකින් පසු විෂබීජ නාශක යොදා පිරිසිදු කළ යුතු අතර ඒ සඳහා භාවිතාවන තුවා පිරිසිදු තත්වයෙන් තිබිය යුතුය.

(24) පරිශ්‍රය තුල පාරිභෝගිකයින්ගේ අත ගැටෙන පෘෂ්ඨයක් නිතර විෂබීජ නාශක යොදා පිරිසිදු කල යුතුය.

(25) පරිශ්‍රයෙහි පිරිසැකසුම් ස්ථානයෙහි හා ආහාර පරිභෝජනය සඳහා වන කොටස්වල ප්‍රමාණවත් පරිදි විෂබීජ නාශක ද්‍රව්‍ය සමඟ අත්සේදීම් සඳහා, අත් වියලීම සඳහා ප්‍රමානවත් පහසුකම් සලසා තිබිය යුතු අතර පරිශ්‍රය තුල ප්‍රමානවත් ආලෝකයක් පවත්වාගත යුතුය.

(26) පරිශ්‍රය තුල ඒකරාශිවන අපද්‍රව්‍ය බැහැර කිරීමට පූර්වයෙන් රඳවා ගැනීමේදී කිසිදු ආකාරයකින් පරිශ්‍රයෙහි භාවිතයට ගැනෙන දේට බලපෑමක් ඇති නොවන පරිදි හා එමඟින් ආහාර දූහනයට කරුණු නොයෙදෙන පරිදි පවත්වාගත යුතුය.

(27) පරිශ්‍රය තුල කිසිදු ආකාරයකින් බල්ලන් , පූසන් වැනි සුරතල් සතුන් ඇති නොකළ යුතුය.

(28) පරිශ්‍රයෙහි සේවය කරන පිරිස් සඳහා ආහාර වලට අදාල ස්වස්ථතා කටයුතු පිළිබඳ පුහුණුවක් ලබා තිබිය යුතු අතර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී නියම කරන කාල සීමාවක් යටතේ වෛද්‍ය පර්යේෂණයන්ට යොමුකර සුදුසු සෞඛ්‍ය තත්වයෙන් යුක්ත බවට පරික්ෂාකර ගත යුතුය.එසේම ඊට අදාළ වන වාර්තා පරිශ්‍රය තුල ඕනෑම අවස්ථාවක පරික්ෂා කිරීමට හැකිවන පරිදි පවත්වාගත යුතුය.තවද ඔවුන් සම්බන්ධයෙන් කරන සෞඛ්‍ය පරීක්ෂණ සායනික හා වසංගත යන දෙයාකාරයෙන්ම විය යුතුය.

(29) පරිශ්‍රයෙහි සේවයේ යොදවා ඇති සේවකයින් සම්බන්ධයෙන් සෞඛ්‍ය නිරීක්ෂණ පද්ධතියක් පිහිටුවා ඔවුන්ට අවශ්‍ය සෞඛ්‍ය උපදෙස් ලබා ගැනීමට ක්‍රියාවලියක් ඇති කළ යුතුය.

(30) පරිශ්‍රයෙහි ජනිත වන අපද්‍රව්‍ය සහාව ක්‍රියාත්මක කරන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහනට අනුව හා ඊට අදාළ වන්නා වූ ලිඛිත නීතීන්ට අනුව සිදු කිරීමට කටයුතු කල යුතුය.

(31) පරිශ්‍රය තුල ජනනය වන අපද්‍රව්‍ය බලපත්‍රලාභියා විසින්ම කළමනාකරණය කරගනු ලබන්නේ නම්, ඊට අදාළ ප්‍රදේශය භාර මහජන සෞඛ්‍ය පරීක්ෂක දැනුවත් කලයුතු අතර, ඔහු විසින් ඒ සඳහා ලබාදෙන උපදෙස් වලට අනුකූලව ඒ සම්බන්ධයෙන් ක්‍රියා කල යුතුය.

(32) පරිශ්‍රය තුල ප්‍රමාණවත් ප්‍රථමාධාර පහසුකම් සපයා තිබිය යුතුය.

(33) කිසියම් වසංගත තත්වයක් මත සමාජය තුල අත් වැසුම් මුඛ වැසුම් භාවිතා කිරීමට උපදෙස් ලබාදී ඇති තත්වයකදී, පරිශ්‍රයට පැමිණෙන කිසියම් තැනැත්තෙකු තමන් පැළඳ සිටින මුඛ වැස්මක් හෝ අත් වැස්මක් පරිශ්‍රය තුල බැහැර කරනු ලබන්නේ නම් එසේ බැහැර කරන මුඛ වැස්ම හෝ අත් වැසුම් ඒ සඳහාම පරිශ්‍රය තුල නිශ්චිතව තබා ඇති සංවෘත බඳුන්වලට බැහැර කිරීමට සැලැස්විය යුතු අතර, එසේ බැහැර කරන අපද්‍රව්‍ය වෙනත් අපද්‍රව්‍ය සමඟ මිශ්‍ර කිරීමකින් තොරව සහාව ඊට අදාළව ක්‍රියාත්මක කරන කසළ කලමණාකරන වැඩසටහනට හා උපදෙස්වලට අනුකූලව බැහැර කිරීමට සැලැස්විය යුතුය.

(34) පරිශ්‍රය තුල ආහාර පරිහරණයෙහි යෙදෙන සෑම අයෙක්ම එසේ ආහාර පරිහරණයෙහි යෙදීමේදී උපරිම පිරිසිදු භාවයකින් සිටිය යුතු අතර සෑම විටම හිස් ආවරණ අත් වැසුම් හා මුඛ ආවරණ, පාවහන් පැළඳ සිටිය යුතු අතර සුදුසු සෞඛ්‍ය ආරක්ෂිත ඇඳුමක් ඇඳ සිටිය යුතුය.

(35) කිසියම් බෝවන රෝගයකින් පෙලෙන හෝ එවැනි රෝගයක් වැලදී ඇති බවට සැක කරන හෝ එවැනි රෝගවාහකයකු හෝ ආසාදනය වී ඇති තුවාල, සමේ ආසාදන හෝ වෙනත් බෝවන රෝගයකින් පෙළෙන තැනැත්තෙකුව පරිශ්‍රයෙහි සේවය සඳහා යොදවා නොගත යුතුය.

(36) උත්සව ශාලා පිහිටි පරිශ්‍රය තුල ආහාර පරිහරණය කිරීම සම්බන්ධයෙන් කටයුතු කරන සෑම තැනැත්තෙක්ම ආහාර දූහනය වීමට හේතුවන ආකාරයට දුම්බීම , කෙල ගැසීම, කැස්ස, කිවිසුම් යැවීම, නාසය ස්පර්ශ කිරීම, වැනි ක්‍රියාවල නොයෙදිය යුතුය.

(37) පරිශ්‍රයෙහි උත්සව අවස්ථා සඳහා කිසිදු අවස්ථාවක යම් බෝවන රෝගී තත්වයකින් හෝ වසංගත රෝගී තත්වයකින් පෙළෙනැයි සිතිය හැකි තරම් කරුණු ඇති කවර හෝ තැනැත්තෙකු ඇතුලත් කර නොගත යුතුය.

(38) උත්සව ශාලා පිහිටි පරිශ්‍රයෙහි ආහාර පරිභොජනය සඳහා පැමිණෙන යම් තැනැත්තෙකුට හෝ පරිශ්‍රයෙහි සේවයෙහි යෙදෙන්නෙකුට බෝවන , ස්පර්ශයෙන් බෝවන , හෝ චර්මගත රෝගී තත්වයක් වැළදුනහොත් ඒ බව බලපත්‍රලාභියා විසින් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත දැනුම් දිය යුතු අතර , එසේ දැනුම් දීමෙන් පසු සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී හෝ ඔහු විසින් බලය පවරන ලද මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකු විසින් ලබාදෙන නිරෝධායක උපදෙස්වලට අනුකූලව පරිශ්‍රයට අදාළ සියළුම අය ක්‍රියාකල යුතුය.

(39) උත්සව ශාලා පිහිටි පරිශ්‍රය නිරෝධායක ක්‍රියාවලියට යටත්කර ඇති විටක එකී නිරෝධායක කාලය අවසන් බවට වූ සහතිකයක් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකයෙකු විසින් නිකුත් කරනු ලැබීමෙන් පසු හා පරිශ්‍රය සම්පූර්ණයෙන් විෂබීජ හරණය කරන තෙක් කිසිදු උත්සව කටයුත්තක් සඳහා පරිශ්‍රය යොදා නොගත යුතුය.

(40) උත්සව ශාලා තුල ආහාර පරිහරනයහි යෙදෙන හා ආහාර පරිභොජනයේ යෙදෙන සෑම තැනැත්තෙකුටම පරිශ්‍රය තුල ක්‍රියාත්මක වන සෞඛ්‍ය ආරක්ෂක පියවර සම්බන්ධව දැන ගැනීමට හැකිවන පරිදි , ඊට අදාළ උපදෙස් පරිශ්‍රය තුල ප්‍රකටව පෙනෙන පරිදි ප්‍රදර්ශනය කල යුතු අතර ඊට අනුකූලව ක්‍රියා කල යුතුය.

(41) පරිශ්‍රය තුල සේවයේ නියුතු සේවකයින් සම්බන්ධයෙන් සියලු තොරතුරු බලපත්‍රලාභියා විසින් සභාපතිවරයාට ඉදිරිපත් කර තිබිය යුතුය.

12. බලප්‍රදේශය තුල වසංගත තත්වයක් පැතිර යාමට හේතුවිය හැකි කරුණු සැලකිල්ලට ගනිමින් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී උපදෙස් පරිදි පරිශ්‍රය පවත්වාගෙන යාමට අදාළව බලපත්‍රලාභියා විසින් එකඟතා ප්‍රකාශයකට ඇතුලත් විය යුතුයැයි සභාපතිවරයා විසින් නියමකර ඇති විටකදී බලපත්‍රලත් තැනැත්තා සභාපතිවරයා සමඟ එකඟතා ප්‍රකාශයකට ඇතුලත් විය යුතු අතර සභාපතිවරයා විසින් එහි පිටපතක් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත යොමුකළ යුතුය.

13. බල ප්‍රදේශයට අදාලව කිසියම් වසංගත රෝගී තත්වයක් සම්බන්ධයෙන් නිරෝධායක හා වසංගත රෝග ආඥා පනත යටතේ නියෝගයක් බලපැවැත්වෙන අවස්ථාවක එම නියෝගයෙහි සඳහන් සෑම නියමයකටම අනුකූලව පරිශ්‍රය පවත්වා ගත යුතුය.

14. *පරිශ්‍රයට ඇතුළත් වීමේ බලය* මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධානයන්ට අනුකූලව පරිශ්‍රය පවතින්නේද යන්න පරික්ෂා කිරීම සඳහා සභාපතිවරයා විසින් ඒ සඳහා බලය පවරන ලද මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකු හෝ වෙනත් යම් නිලධාරියෙකු ඕනෑම සාධාරණ වෙලාවක පරිශ්‍රයට ඇතුළු වීමට, අවශ්‍ය නියැදි ලබා ගැනීම නීත්‍යානුකූල වන්නේය.

15. *බලපත්‍රය අවලංගු කිරීම* (1) මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලත් පරිශ්‍රයක් යටතේ මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහා කොන්දේසි උල්ලංඝනය කරමින් හෝ ඊට පටහැනි වන පරිදි කටයුතු වන අවස්ථාවක අතුරු ව්‍යවස්ථාවට අනුකූල වීම සඳහා දින තිහකට නොවැඩි නිශ්චිත කාලයක් දන්වමින් දැන්වීමක් සභාපතිවරයා විසින් බලපත්‍රලාභියා වෙත භාරදිය යුතුය.

(2) මෙම වගන්තිය යටතේ වූ දැන්වීමක් බලපත්‍ර ලාභියා වෙත භාරදීමෙන් පසු ,අදාල දැන්වීමේ සඳහා නියමයන්ට අනුකූලව ක්‍රියාකිරීම සඳහා තවදුරටත් අතිරේක කාලයක් ලබාදෙන ලෙසට සාධාරණ හේතු දක්වමින් කරනු ලබන ඉල්ලීමක් මත සභාපති වරයා විසින් අතිරේක කාලයක් ලබාදිය හැකිය.එසේ ලබාදෙන කාලය පළමු දැන්වීමේ සඳහා කාලයට අතිරේකව දින දහ හතරක උපරිම කාලයකට යටත්ව විය යුතුය.

16. ඉහත 15 වගන්තිය යටතේ ලබාදෙන කාල සීමාව තුළ හෝ අතිරේක කාල සීමාව තුළ දැන්වීමට අනුකූලව ක්‍රියා කිරීම බලපත්‍ර ලාභියා විසින් පැහැර හැර ඇති අවස්ථාවක සභාපතිවරයා විසින් අදාල බලපත්‍රය අවලංගු කල යුතුය.

17. *දණ්ඩනය* මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ලබා ගත යුතු බලපත්‍රයකින් තොරව හෝ අතුරු ව්‍යවස්ථාව යටතේ කරනු ලබන නියමයන් කඩකරමින් පරිශ්‍රයක් පවත්වාගෙන යාම වරදක් වන අතර එම වරද සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් වරදකරුවෙකු කිරීමෙන් පසු 1987 අංක 15දරන ප්‍රාදේශිය සභා පනතේ 122(2) උප වගන්තිය යටතේ දඩුවමකට යටත් විය යුතුය.තවද එලෙස වරදකරුවෙකු වීමෙන් පසු තව දුරටත් එකී කඩකිරීම, උල්ලංඝණය නිරන්තරයෙන්ම කරගෙන යනු ලබන විට සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් දැන්වීමක් භාර දීමෙන් පසු උල්ලංඝණ තව දුරටත් නොකඩවා කරගෙන යන සෑම දිනකට ඉහතකී 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(2) උප වගන්තියේ සඳහා අතිරේක දඩයකට යටත් විය යුතුය.

18. මෙම අතුරු ව්‍යවස්ථාවේ පද සම්බන්ධයෙන් අන්‍ය අර්ථයක් අවශ්‍ය වන්නේනම් මිස මෙම අතුරුව්‍යවස්ථාවේ,

"සභාව" යන්නෙන් කළුතර ප්‍රාදේශීය සභාවද,

"සභාපති" යන්නෙන් කළුතර ප්‍රාදේශීය සභාවේ තත්කාලයෙහි සභාපති ධූරය දරන හෝ එම ධූරයේ කාර්යය කර්තව්‍ය ඉටුකරන අයද ,

"සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී" යන්නෙන් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අදාල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාසය සඳහා එම තනතුර දරන අයද,

"මහජන සෞඛ්‍ය පරීක්ෂක" යන්නෙන් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අදාලව සේවයේ යෙදෙන ප්‍රාදේශීය සභාවේ හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයට අනුයුක්තව මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුර දරන අයෙක්ද,

"බලපත්‍රලාභියා" යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලබාගත් ආයතනයක් ,තැනැත්තෙක් හෝ පුද්ගලයෙක්ද ,

"බලයලත් නිලධාරියා" යන්නෙන් තත්කාලයෙහි ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් බලය පවරන ලද නිලධාරීයාද,

*අර්ථ නිරූපනය*

"දූෂනය වීම" යන්නෙන් ආහාර ද්‍රව්‍යකට කිසිදු දූෂක ද්‍රව්‍යයක් ඇතුල්වීම හෝ හටගැනීමද,

"විෂබීජ නාශක" යන්නෙන් ආහාරවල ආරක්ෂාව හෝ යෝග්‍යබව අඩුනොකරන මට්ටමකට පරිසරයෙහි ඇති ක්ෂුද්‍ර ජීවීන් ප්‍රමාණය රසායනික කාරකයන් මගින් හෝ භෞතික ක්‍රමයකින් අඩු කිරීමද,

"ආහාර ස්වස්ථතාවය" යන්නෙන් ආහාර දාමයේ සියළු අවස්ථාවලදී ආහාරවල සුරක්ෂිත බව හා සුදුසු බව සහතික කිරීම සඳහා සියළු තත්වයන්, පියවර සහ පරිචයද,

"උපද්‍රව" යන්නෙන් අහිතකර සෞඛ්‍ය බලපෑමක් සිදු කිරීමේ ඉඩ ඇති යම් ජීව විද්‍යාත්මක , රසායනික විද්‍යාත්මක කාරකයක් හෝ තත්වයක්ද,

" ආහාරවේල ආරක්ෂාව" යන්නෙන් ආහාර සකස්කරන , පිරිසැකසුම් කරන, විකුණුම් කරන ගබඩා කරන ප්‍රවාහනය කරන, අවස්ථාවලදී හෝ අනුභව කරන විට පාරිභෝගිකයාට යම් උපද්‍රවයක් නොවීමේ වගකීමද,

" සාධාරණ වෙලාව" යන්නෙන් බලපත්‍රලත් කර්තව්‍ය හෝ ඊට අදාළ කාර්යයෙහි නිරතවන ඕනෑම වෙලාවක්ද,

" මූලික නීතිය" යන්නෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත අදහස් වෙයි.

*පාඨ අතර අනනුකූලතාවය*

20. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල හා ඉංග්‍රීසි,දෙමළ පාඨ අතර අනනුකූලතාවයන් හටගතහොත් එවිට සිංහල පාඨය ප්‍රමුඛ වෙයි.

**උපලේඛනය**

**.......................... වර්ෂය සඳහා වෙළඳ බලපත්‍රය ලබාගැනීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය.**

01. ඉල්ලුම්කරුගේ නම : -
02. පෞද්ගලික ලිපිනය : -
03. ජාතික හැඳුනුම්පත් අංකය : -
04. දූරකථන අංකය : -
05. ආරම්භක වර්ෂය : -
06. උත්සව ශාලාව පිහිටි ස්ථානයේ ලිපිනය : -
07. ග්‍රාම නිලධාරී කොට්ඨාසය : -
08. වරිපනම් අංකය: -
19. ව්‍යාපාරය නාම ලියාපදිංචිය ලබාගෙන ඇත්නම් එහි යොමු අංකය :-
10. ව්‍යාපාර ස්ථානයේ කළමනාකරුගේ හෝ නියෝජිතයාගේ,

    I. නම හා පෞද්ගලික ලිපිනය

    II. ජාතික හැඳුනුම්පත් අංකය

    III. දූරකථන අංකය ජංගම :- ස්ථාවර :-
11. ව්‍යාපාරයට අදාළ ඉදිකිරීම් අනුමත කරන සැළැස්මේ අංකය හා දිනය :-

    ( පිටපත් ඇමිණිය යුතුය )

ඉහත තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

දිනය:- ......................................

ඉල්ලුම්කරුගේ අත්සන

---

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

ආදායම් පරීක්ෂක,

පසුපිටේ සඳහන් ඉල්ලුම්පත්‍රයට අදාළව බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා වන ඔබගේ නිරීක්ෂණ හා නිර්දේශ කඩිනමින් මා වෙත ලබා දෙන ලෙස කාරුණිකව ඉල්ලමි.

දිනය:- ................................

ලේකම්

---

ලේකම්,

බලපත්‍රය ලබා දීම නිර්දේශ කරමි./නොකරමි.

දිනය :- ..................................

ආදායම් පරීක්ෂක

---

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී,

පසුපිටේ සඳහන් ඉල්ලුම් පත්‍රයට අදාළව බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා වන ඔබගේ නිරීක්ෂණ හා නිර්දේශ කඩිනමින් ලබාදෙන මෙන් කාරුණිකව ඉල්ලමි.

දිනය :- .................................

ලේකම්

---

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී,

අතුරු ව්‍යවස්ථා හා අනෙකුත් නීති රීතිවලට අනුකූලව සුදුසුකම් සපුරා ඇත. බලපත්‍ර නිකුත් කිරීම නිර්දේශ කිරීම සඳහා වාර්තා කරමි.

දිනය :- .................................

මහජන සෞඛ්‍ය පරීක්ෂක

---

ලේකම්,

ඉහත ඉල්ලුම්පත්‍රයට අනුව අදාළ ස්ථානය සඳහා බලපත්‍රයක් නිකුත් කිරීම නිර්දේශ කරමි. / නොකරමි.

(නිර්දේශ නොකරන්නේ නම් ඊට අදාළ හේතුව සඳහන් කරන්න).

දිනය :- .................................

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී

**රූපලාවණ්‍යාගාර මධ්‍යස්ථාන පිළිබඳ අතුරුව්‍යවස්ථාව**

1. මෙම අතුරු ව්‍යවස්ථාව කළුතර **ප්‍රාදේශීය** සභා බල ප්‍රදේශය තුල පවත්වාගෙන යනු ලබන රූපලාවණ්‍යාගාර මධ්‍යස්ථාන පවත්වාගෙන යාම පාලනය කිරීම හා විධිමත් කිරීම සඳහා පනවනු ලබයි.

2. මෙම අතුරුව්‍යවස්ථාව කළුතර **ප්‍රාදේශීය** සභාවේ රූපලාවණ්‍යාගාර මධ්‍යස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ. *ලුහුඩු නාමය*

3. මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීමට **1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126(xxiii) වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 122** උප වගන්තිය යටතේ **ප්‍රාදේශීය** සභාවට බලය ලැබී ඇත. *නෛතික බලය*

4. කළුතර **ප්‍රාදේශීය** සභා බල ප්‍රදේශය (මෙහි මින්මතු බල ප්‍රදේශය යනුවෙන් හඳුන්වනු ලබන ) තුළ කිසිදු තැනැත්තෙකු විසින් **සභාපතිවරයා** වෙතින් මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ලබාගත් බලපත්‍රයක් යටතේ මිස රූපලාවන්‍යාගාර මධ්‍යස්ථානයක් (මෙහි මින් මතු පරිශ්‍රය යනුවෙන් හඳුන්වනු ලබන) පවත්වාගෙන යාම නොකල යුතුය.

5. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ඉල්ලුම් කරන සෑම තැනැත්තෙක්ම මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ වූ උපලේඛනයට අනුව පිළියෙල කරන ලද ඉල්ලුම් පත්‍රයක් යටතේ ඒ සඳහා ඉල්ලුම් කල යුතුය. *බලපත්‍රය ඉල්ලුම් කිරීම*

6. ඉහත වගන්තිය යටතේ වූ ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කිරීම ඒ සඳහා වන අවශ්‍යතා සම්පූර්ණ කර ලියාපදිංචි තැපෑලෙන් **සභාපති** වෙත යොමුකිරීමෙන්, ගෙනවිත් භාරදීමෙන් හෝ සභාව අවසර දී ඇති ප්‍රමාණයට විද්‍යුත් තැපෑලෙන් යොමුකිරීමෙන් ඉදිරිපත් කල හැකිය.

7. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ඉල්ලුම්කරන සෑම තැනැත්තෙක්ම මෙහි පහත සඳහන් කොන්දේසි සම්පූර්ණ කර ඇත්තේ නම් මිස **සභාපතිවරයා** විසින් බලපත්‍රයක් නිකුත් කිරීම නොකල යුතුය. *බලපත්‍රයකට අදාල කොන්දේසි*

(1) පරිශ්‍රයට අදාල ඉදිකිරීම් 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනත යටතේ හෝ නිවාස හා නගර සංවර්ධන ආඥා පනතේ විධිවිධානයන්ට අනුකූලව ඉදිකරන ලද ඉදිකිරීම් විය යුතුය.

(2) පරිශ්‍රය සිය ව්‍යාපාර නාමය, යටතේ පවත්වා ගත යුතුය.

(3) පරිශ්‍රයෙහි සේවය පිණිස තෘතික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි පුහුණු ආයතනයක් විසින් පවත්වනු ලබන රූපලාවන්‍ය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් හෝ ඒ හා සමාන වෘත්තීමය නිපුණතා සහතිකලත් අයකු සේවය සඳහා යොදාගන්නා බවට බලපත්‍රලාභියා විසින් තහවුරු කල යුතුය.

(4) පරිශ්‍රය තුල ඉදිකිරීම් ස්ථිර ඉදිකිරීම් ද්‍රව්‍යයන්ගෙන් මනා ලෙස ඉදිකර තිබිය යුතු අතර එය යහපත් සහ සෞඛ්‍ය ආරක්ෂිත තත්ත්වයෙන් පැවතිය යුතුය.

(5) එක් සේවාලාභියෙකුට සේවා සැපයීම සඳහා වෙන් වෙන් වශයෙන් පොළවේ ඉඩ ප්‍රමාණය අවම වශයෙන් වර්ග මීටර් 2.25 කට නොඅඩු වන සේ එකවර සේවා සපයන සේවාලාභීන් සංඛ්‍යාවට අනුරූපීව ප්‍රමාණවත් ඉඩකඩ සපයා තිබිය යුතුය.

(6) සේවා සපයා ගැනීමේ අපේක්ෂාවෙන් පැමිණෙන කිසියම් සේවා ලාභියෙකුට; ඒ වන විටත් සේවය ලබමින් සිටින සේවා ලාභියා රැඳී සිටින ස්ථානයේ සිට අවම වශයෙන් මීටර් 1.5 ක් දුරින් වනසේ පහසුවෙන් අසුන්ගෙන සිටීමට ප්‍රමාණවත් ඉඩකඩ තිබිය යුතුය.

(7) පරිශ්‍රයට අදාල සියළු බිත්ති මීටර් 2.7 කට නොඅඩු උසකින් යුක්ත විය යුතු අතර එය තීන්ත ආලේප කරවා තිබිය යුතුය.

(8) පරිශ්‍රයෙහි සෑම කොටසකම සිවිලිමක් හෝ කොන්ක්‍රීට් තහඩුවකින් නිමවී තිබිය යුතු අතර එය පොළොව මට්ටමේ සිට අවම මීටර් 2.7 කට නොඅඩු උසකින් විය යුතුය.

(9) පරිශ්‍රය වායුසමීකරණය කර හෝ පිටතින් වාතය පහසුවෙන් ගලා ඒමට හැකිවන පරිදි ප්‍රමාණවත් ලෙස විවෘත කල හැකි පරිදි වූ ජනේල යොදා තිබිය යුතුය.

(10) පරිශ්‍රයට අදාල ආලෝකය හොඳින් ලැබෙන පරිදි නිමවා තිබිය යුතුය.

(11) පරිශ්‍රයෙහි භාවිතය සඳහා බීමට ගන්නා ජලය ප්‍රමාණවත් ලෙස සම්පාදන කර තිබිය යුතු අතර, ප්‍රමිත යටතේ වූ බහාලුම් තුල ජලය ගබඩා කර තිබිය යුතුය.

(12) සේවා ලාභීන්ගේ සේවා සැපයීමෙන් පසු ස්නානය අවශ්‍යවන විටදී ඒ සඳහා පහුසකම් සපයා තිබිය යුතුය.

(13) සේවා ලාභීන්ගේ පාවිච්චියට ගනු ලැබූ උපකරණ, භාජන සේදීම සඳහා පරිශ්‍රයෙහි වෙනම කොටසක් පවත්වාගත යුතුය.

(14) ආයතනයේ සේවකයින් හා පාරිභෝගිකයින් සඳහා ප්‍රමාණවත් පරිදි වැසිකිළි පහසුකම් විය යුතු අතර එය මනා ලෙස හා සෞඛ්‍ය ආරක්ෂිත ලෙස ස්ථිර ද්‍රව්‍යයන්ගෙන් තනා තිබිය යුතුය.

(15) පාරිභෝගිකයන්ගේ දෙඅත්,හිස හෝ මුහුණ සේදීම සඳහා නිශ්චිත උපකරණ සවිකර තිබිය යුතු අතර ඒවා එක් අයකුගේ පරිහරණයෙන් පසු තවත් කෙනෙකුගේ පරිහරණය සඳහා යෙදවීමට පෙර විෂබීජ නාශක යොදා පිරිසිදු කරමින් පවත්වාගත යුතු අතර එම උපකරණ මළ නොබැඳෙන ද්‍රව්‍යයන්ගෙන් තනා තිබිය යුතුය.

(16) පරිශ්‍රය තුලින් බැහැර කරන අපජලය පොදු කාණුවලට හෝ විවෘත භූමියකට ගලා නොයන පරිදි ප්‍රමාණවත් පියවර ගෙන තිබිය යුතු අතර, එය පූතික වලකට හෝ උරාගැනීමේ වලකට හෝ නිසිලෙස යොමුකර තිබිය යුතුය.

(17) පරිශ්‍රයට අදාල පූතික වලක් හෝ උරාගැනීමේ වලක් බාහිරට විවෘත නොවන පරිදි විය යුතු අතර, එය ජල මූලාශ්‍රයක් ඇත්නම් එයට අවම වශයෙන් මීටර් 15.25 ක දුරකින් ඉදිකර තිබිය යුතුය.

(18) පරිශ්‍රයෙන් රසායනික අපජලය බැහැර කිරීමක් වේනම්, මධ්‍යම පරිසර අධිකාරිය හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් නිර්දේශිත ක්‍රමවේදයකට අදාල බැහැර කිරීම් කල යුතුය.

(19) සේවා අපේක්ෂාවෙන් රැඳී සිටින පාරිභෝගිකයන් සඳහා රැඳී සිටීමට පරිශ්‍රයෙහි වෙන්වූ ස්ථානයක් ප්‍රමාණවත් පහසුකම් යටතේ පිහිටුවා තිබිය යුතුය.

(20) පරිශ්‍රය තුල විදුලි පරිපථය ඒ හා සම්බන්ධයෙන් වෘත්තීමය දැනුම ඇති අයකු විසින් පරීක්ෂා කර කාන්දුවීම් වලින් තොර ආරක්ෂිත තත්ත්වයෙන් පවතින බවට සහතික කර තිබිය යුතුය.

*බලපත්‍රයක් නිකුත් කිරීම*

8\. මෙම අතුරු ව්‍යවවස්ථාව යටතේ බලපත්‍රයක් සඳහා ඉදිරිපත් වන ඉල්ලුම් පත්‍රයකට අදාලව ඉල්ලුම්පත්‍රය ලැබී දින දාහතරක් ඇතුලත **සභාපතිවරයා** විසින්,

(1) 7 වන වගන්තිය යටතේ වූ කොන්දේසිවලට අනුකූල විටදී පරිශ්‍රයට අදාල බලපත්‍රයක් ඉල්ලුම්කරු වෙත නිකුත් කල යුතුය.

(2) 7 වන වගන්තිය යටතේ වූ කොන්දේසිවලට අනුකූල නොවන්නේ නම් හේතු දක්වා අදාල ඉල්ලුම්පත්‍රය ප්‍රතික්ෂේප කල යුතුය.

*බලපත්‍රක් සඳහා ගාස්තු*

9\. (1) මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රයක් සඳහා අයකල යුතු ගාස්තු මූලික නීතියේ සඳහන් විධිවිධානයන්ට යටත්ව සභාව විසින් තීරණය කර ප්‍රකාශයට පත්කරන ගාස්තු විය යුතුය.

(2) බලපත්‍රයක් නිකුත් කිරීමට අදාලව ස්ථාන පරීක්ෂණ සඳහා වන පරීක්ෂණ ගාස්තුවක් සභාව විසින් තීරණය කර අයකිරීම නීත්‍යානුකූල වන්නේය.

10. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන බලපත්‍රයක් මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධාන අනුව කලින් අවලංගු නොකලහොත් බලපත්‍රයට අදාල වර්ෂයෙහි දෙසැම්බර් තිස්එක දින දක්වා වලංගු විය යුතුය.

11. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලත් සෑම තැනැත්තෙක්ම මෙහි පහත සඳහන් කොන්දේසීන්ට අනුකූලව ක්‍රියාකල යුතුය.

(1) ශ්‍රී ලංකාව පුරාම හෝ ඉන් කොටසකට හෝ බල ප්‍රදේශයට අදාලව හෝ නිරෝධායක හා රෝග වැලැක්වීමේ ආඥාපනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද රෙගුලාසි යටතට අදාළ වසංගත තත්ත්වයක් ප්‍රකාශයට පත්කර ඇති කවර හෝ අවස්ථාවක හෝ බල ප්‍රදේශය තුල යම් වසංගත තත්වයකට කරුණු යෙදී ඇති බවට සෑහීමට පත්වෙමින් එය පාලනය කිරීම සඳහා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී උපදෙස් මත **සභාපතිවරයා** කලින් කල නියම කරනු ලබන නියමයන් ඇත්නම් ඒ සෑම නියමයකටම යටත්ව පරිශ්‍රය පවත්වා ගත යුතුය.

(2) පරිශ්‍රයෙහි සේවය සඳහා යොදවා ඇති සෑම තැනැත්තෙකු විසින්ම නිරෝධායක හා රෝග වැලැක්වීමේ ආඥාපනත යටතේ සාදන ලද රෙගුලාසි යටතට අදාළ වන වසංගත තත්ත්වයක් ප්‍රකාශයට පත්කර ඇති කවර හෝ අවස්ථාවක ඊට අදාළව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී උපදෙස් මත **සභාපතිවරයා** විසින් කරනු ලබන සෑම නියමයකටම යටත්ව ක්‍රියා කල යුතුය.

(3) බල ප්‍රදේශය තුල වසංගත රෝගී තත්ත්වයක් සඳහා අවදානමක් ඇති බවට සැක කිරීමට කරුණු යෙදී ඇති සෑම අවස්ථාවකම සේවා අපේක්ෂාවෙන් පරිශ්‍රයට පැමිණෙන සෑම තැනැත්තෙකුටම අදාළව, ඊට අදාළ නිකුත් කර ඇති සෞඛ්‍ය උපදෙස් වලට අනුකූලව පැමිණෙන්නේනම් මිස එම පරිශ්‍රයෙහි සේවා පහසුකම් සලසා නොදිය යුතුය.

(4) බල ප්‍රදේශය තුල කිසියම් වසංගත රෝගී තත්ත්වයකට කරුණු යෙදී ඇති විට හෝ ඒ සඳහා අවදානමක් ඇති විට එයින් ආරක්ෂා වීම සඳහා අනුගමනය කල යුතුයැයි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක ජෙනරාල් හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් හෝ ඔවුන්ගේ උපදෙස් පරිදි **සභාපතිවරයා** විසින් හෝ නියම කර ඇති සෞඛ්‍ය ආරක්ෂිත උපදෙස් නිසියාකාරයෙන් පරිශ්‍රය තුල ක්‍රියාත්මක කල යුතුවා මෙන්ම , එසේ වන බවට බලපත්‍රලාභියා සෑහීමට පත් විය යුතුය.

(5) පරිශ්‍රයට සේවා අපේක්ෂාවෙන් පැමිණෙන සෑම තැනැත්තෙකුටම අදාළව තොරතුරු ලේඛණයක් පවත්වාගත යුතුය.

(6) පාරිභෝගිකයන්ගේ හිස කෙස් කැපීම, හිස කෙස් සායම් කිරීම, රැවුල කැපීම සහ රෝම ඉවත්කිරීම යන කාර්යන්හි නියැලෙන සෑම අවස්ථාවකම, එසේ නියැලෙන සෑම තැනැත්තෙක්ම හැකිතාක් මුහුණු ආවරණය සහ අත්වැසුම් පැලඳ කාර්යන්හි නිරත විය යුතුය.

(7) පරිශ්‍රයෙහි උපකරණ හා මෙවලම් නඩත්තුව හා පවත්වාගෙන යාම සඳහා,

(අ) පාවිච්චි කරන ලද උපකරණ හා මෙවලම් ජීවානුහරණය කිරීම සඳහා ප්‍රමාණවත් වන පහසුකම්,
(ආ) පිළිගත් ජීවානුහරණ ක්‍රමයක් හා ජීවානුහරණය සඳහා භාවිතා කෙරෙන උපකරණ ප්‍රමාණවත් සංඛ්‍යාවක්,
(ඇ) ඇතුලත සේවා සපයන්නන්ට සේවා සැපයීමේදී අත් සෝදාගැනීමේ පහසුකම් සහිත සබන් හෝ සබන් දියර,
(ඈ) සේවාලාභීන්ගේ ප්‍රයෝජනය සඳහා සුදු පැහැයෙන් හෝ වෙනත් ලා පාටින් යුක්ත තුවා සහ උඩුකය ආවරණ, හිස් වැස්ම ප්‍රමාණවත් සංඛ්‍යාවක්,
(ඉ) විදුලියෙන් ක්‍රියාත්මක වන උපකරණ භාවිතයේදී එක් ගණුදෙණුකරුවෙකු සඳහා වන මේසයට ආරක්ෂිත ස්ථාවර විදුලි පේණු,
(ඊ) උපකරණ පාවිච්චි කරන එක් එක් වතාවට පසු ජීවානුහරණය කිරීමේ ක්‍රමයන්,
පවත්නා බවට බලපත්‍රලාභියා සහතික විය යුතුය.

(8) පරිශ්‍රයෙහි සේවය කරන සෑම සේවකයෙකුටම ආරක්ෂිත උපකරණ පරිහරණය, සේවා සැපයුම හා පරිශ්‍රයට අදාල අනෙකුත් කටයුතු පිළිබඳ පුහුණුවක් තිබිය යුතුය.

(9) පරිශ්‍රයට අදාල සේවාවන් වෙනුවෙන් අවශ්‍ය විට උණු හා සිසිල් ජලය සැපයීමට හැකිවන පරිදි පහසුකම් තිබිය යුතුය.

(10) රූපලාවන්‍ය කටයුතු සඳහා භාවිතා වන සියළු දේ අනුමත හා ලියාපදිංචි කරන ලද ප්‍රමිතිගත දේ විය යුතුය.

(11) පරිශ්‍රය තුල සිදුකරන සේවාවන් යටතේ අවශ්‍ය විට ලබාදිය යුතු ප්‍රථමාධාර කාර්යන් සඳහා සේවා සපයන්නන් මනා පුහුණුවක් ලබා තිබිය යුතුය.

(12) පරිශ්‍රය තුල වාතය හොඳින් සංසරණය වීම සඳහා ජනේල විවෘත කර පවත්වාගත යුතු අතර, වායු සමීකරණය කර ඇත්නම්, සෑම වායුසමීකරණ යන්ත්‍රයක්ම නියමිත උෂ්ණත්වය යටතේ නිරන්තරයෙන් පවත්වා ගත යුතුය.

(13) පරිශ්‍රය තුළ වායුසමීකරණ යන්ත්‍රයන්හි පෙරනයන් නිරන්තරයෙන් පිරිසිදු කර පවත්වාගත යුතුය.

(14) පාරිභෝගිකයෙකු සඳහා සේවා ලබාදීමට පූර්වයෙන් දෙඅත් සබන් හෝ විෂබීජනාශක යොදා පිරිසිදු කරගැනීමෙන් පසුව පමණක් අදාළ සේවාව ලබාදිය යුතුය.

(15) පරිශ්‍රය තුල සේවයෙහි යෙදීමේදී, සේවයේ යෙදීමට පූර්වයෙන් වැසිකිළි භාවිතයෙන් පසු, කිසියම් අපද්‍රව්‍ය ස්පර්ශ වීමකින් පසු ප්‍රමාණවත් පිරිසිදුවීමකින් තොරව පාරිභෝගිකයෙකු වෙත සේවාව ලබාදීම නොකළ යුතුය.

(16) පරිශ්‍රය තුල පාරිභෝගිකයින් සඳහා සේවාව ලබාදීමේදී, සෑම සේවා සපයන කෙනෙක්ම ඒප්‍රනයක් හැඳ සිටිය යුතු අතර, එය ඉතා පිරිසිදු තත්ත්වයෙන් විය යුතුය.

(17) පරිශ්‍රය සෑම සේවා සැපයීමකින් පසු දූවිලි සහ කපන ලද කෙස් හා රෝම අතුගා ඉවත් කළ යුතු අතර, ඒ සියල්ල සංවෘත කසල බඳුනකට තාවකාලිකව බැහැර කළ යුතුය.

(18) පරිශ්‍රයෙහි ගෙබිම, පුටු, සහ මේස සෑම දිනකම වැඩ ආරම්භ කිරීමට පෙර විෂබීජ නාශක යොදා පිරිසිදු කළ යුතුය.

(19) පරිශ්‍රයෙහි සේවා සපයන කොටසෙහි ආහාර ගැනීම හෝ වෙනත් කාර්යයක් සඳහා කවර අයෙකු විසින් හෝ යොදා නොගත යුතුය.

(20) පරිශ්‍රය තුළ රැස්වන අපද්‍රව්‍ය වෙන් වෙන්ව රැස්කිරීම සඳහා පාදයෙන් විවෘත කළ හැකි පියන් සහිත කසල බඳුන් තබා තිබිය යුතු අතර, ඒ සඳහාම අපද්‍රව්‍ය එක් රැස්කිරීම කළ යුතුය.

(21) පරිශ්‍රයට අදාළව එක් රැස්වන අපද්‍රව්‍ය කළමනාකරණයේදී පහත ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය.

(අ) ඉවත් වන හිස කෙස් කැබලි හෝ රෝම සෑම සේවා සැපයීමක් අවසානයේ එක්රැස් කර ඒ සඳහාම තබා ඇති කසල බඳුනකට දැමිය යුතුය.

(ආ) පරිශ්‍රය තුළ ක්‍රියාකාරකම් තුලින් ජනිත වන වෙනත් අපද්‍රව්‍ය, ඉවත්වන හිසකෙස් සමඟ මිශ්‍ර වීමකින් තොරව වෙන්වෙන් වශයෙන් එක් රැස් කළ යුතුය.

(ඇ) පරිශ්‍රයට අදාළ අපද්‍රව්‍ය **ප්‍රාදේශීය** සභාව ක්‍රියාත්මක කරන කසල කළමනාකරණ වැඩසටහනට අනුකූලව හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් එකඟවන බලපත්‍රලාභියා විසින් ක්‍රියාත්මක කරන අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රමෝපායකට අනුව බැහැර කිරීම කළ යුතුය.

(22) පරිශ්‍රයට අදාළ වැසිකිළි අවම වශයෙන් දිනකට දෙවරක් පිරිසිදු කර විෂබීජ නාශක යොදා දුර්ගන්ධයෙන් තොරව පවත්වා ගත යුතු අතර, බල ප්‍රදේශයෙහි වසංගත තත්ත්වයකට කරුණු යෙදී ඇති තත්ත්වයක හෝ එසේ වේ යැයි සැකසිතිය හැකි තත්ත්වයකට කරුණු යෙදී ඇති විට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී උපදෙස් පරිදි **සභාපතිවරයා** විසින් නියම කරනු ලබන උපදෙස් වලට අනුකූල වෙමින් පරිශ්‍රයෙහි වැසිකිළි පිරිසිදු කිරීම සහ පවත්වාගෙන යාම කළ යුතුය.

(23) කිසියම් ආසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතදී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තකු මෑතදී සාත්තු කිරීමේ යෙදී සිටි කවර හෝ තැනැත්තකුගේ එකී රෝග ආසාදන හා බීජෞෂණ කාල සීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස කවර හෝ බලපත්‍රලත් ස්ථානයක කවර හෝ කාර්යක හෝ කාර්ය සහයකයකු වශයෙන් හෝ නියුක්ත වීම හෝ නියුත්ක කරවීම නොකළ යුතුය.

(24) කිසියම් ආසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන තැනැත්තකු බවට හඳුනා ගනු ලබන කිසිදු තැනැත්තකු සේවා සැපයීම සඳහා සාමාන්‍ය වශයෙන් පරිශ්‍රයට ඇතුලත් කර නොගත යුතුය.

(25) බලපත්‍රලාභියා තීරණය කරන අවස්ථාවක හෝ එසේ කල යුතු යැයි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී උපදෙස් පරිදි සභාව විසින් හෝ වෙනත් නිසි අධිකාරයක් විසින් නියම කර ඇති අවස්ථාවක පරිශ්‍රයට සේවා අපේක්ෂාවෙන් පැමිණෙන සියළු අයවලුන්ගේ ශරීර උෂ්ණත්වය සාමාන්‍ය අගයක පවතින්නේද යන්න පරීක්ෂා කර පරිශ්‍රයට ඇතුළු කර ගත යුතු අතර, ඒ සඳහා ස්පර්ශයෙන් තොරව ශරීර උෂ්ණත්වය පරීක්ෂා කිරීම සඳහා අවශ්‍ය උෂ්ණත්වමාන පවත්වා ගත යුතුය.

(26) සෑම සේවාලාභියකුම පරිශ්‍රය තුල අනුගමනය කළ යුතු සෞඛ්‍ය උපදෙස් පරිශ්‍රය තුළ ප්‍රදර්ශනය කළ යුතු අතර එම උපදෙස් මාලාවට අනුකූලව සියළු කටයුතු සිදු වන බවට බලපත්‍රලාභියා සහතික විය යුතුය.

(27) පරිශ්‍රයෙහි සේවයේ නිතුත් කර ඇති සෑම අයෙකුටම අදාලව

(අ) කාර්යයයෙහි නිරත වීමේදී අඳින ඇඳුම පිරිසිදුව හා මනා සෞඛ්‍ය තත්වයෙන් පවතින බවට.

(ආ) තම නියපොතු හා පැලඳ සිටින ආභරණ සේවාලාභියාට අනතුරුදායක නොවන ලෙසට පවත්වා ගන්නා බවට.

(ඇ) සේවා සැපයීමට ප්‍රථම දෙඅත් විෂබීජ නාශක යොදා පිරිසිදු කර ගන්නා බවට, බලපත්‍ර ලාභිය සහතික විය යුතුය.

(28) පරිශ්‍රයෙහි සේවයේ යෙදෙන්නන් අවම වශයෙන් වසරකට වරක්වත් වෛද්‍ය පරීක්ෂණයන්ට භාජනය කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය වන්නේය.

(29) සෑම පරිශ්‍රයකම මෙම අතුරු ව්‍යවස්ථාවේ සහ බලපත්‍රයෙහි පිටපතක් ප්‍රදර්ශනය වන පරිදි පවත්වා ගත යුතුය.

12. බලප්‍රදේශය තුල වසංගත තත්වයක් පැතිර යාමට හේතුවිය හැකි කරුණු සැලකිල්ලට ගන්මින් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී උපදෙස් පරිදි පරිශ්‍රය පවත්වාගෙන යාමට අදාළව බලපත්‍රලාභියා විසින් එකඟතා ප්‍රකාශයකට ඇතුලත් විය යුතුයැයි **සභාපතිවරයා** විසින් නියමකර ඇති විටකදී බලපත්‍රලත් තැනැත්තා **සභාපතිවරයා** සමඟ එකඟතා ප්‍රකාශයකට ඇතුලත් විය යුතු අතර **සභාපතිවරයා** විසින් එහි පිටපතක් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත යොමුකල යුතුය.

13. බල ප්‍රදේශයට අදාලව කිසියම් වසංගත රෝගී තත්වයක් සම්බන්ධයෙන් නිරෝධායක හා රෝග වැලැක්වීමේ ආඥාපනත යටතේ නියෝගයක් බලපැවැත්වෙන අවස්ථාවක එම නියෝගයෙහි සඳහන් සෑම නියමයකටම අනුකූලව පරිශ්‍රය පවත්වා ගත යුතුය.

14. *පරිශ්‍රයට ඇතුළත් වීමේ බලය*

මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධානයන්ට අනුකූලව පරිශ්‍රය පවතින්නේද යන්න පරීක්ෂා කිරීම සඳහා **සභාපතිවරයා** විසින් ඒ සඳහා බලය පවරන ලද මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකු හෝ වෙනත් යම් නිලධාරියෙකු ඕනෑම සාධාරණ වෙලාවක පරිශ්‍රයට ඇතුළු වීමට, අවශ්‍ය නියැදි ලබා ගැනීම නීත්‍යානුකුල වන්නේය.

15. *බලපත්‍රය අවලංගු කිරීම*

(1) මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලත් පරිශ්‍රයක් යටතේ මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කොන්දේසි උල්ලංඝණය කරමින් හෝ ඊට පටහැනි වන පරිදි කටයුතු වන අවස්ථාවක අතුරු ව්‍යවස්ථාවට අනුකූල වීම සඳහා දින තිහකට නොවැඩි නිශ්චිත කාලයක් දන්වමින් දැන්වීමක් **සභාපතිවරයා** විසින් බලපත්‍රලාභියා වෙත භාරදිය යුතුය.

(2) මෙම වගන්තිය යටතේ වූ දැන්වීමක් බලපත්‍ර ලාභියා වෙත භාරදීමෙන් පසු ,අදාල දැන්වීමේ සඳහන් නියමයන්ට අනුකූලව ක්‍රියාකිරීම සඳහා තවදුරටත් අතිරේක කාලයක් ලබාදෙන ලෙසට සාධාරණ හේතු දක්වමින් කරනු ලබන ඉල්ලීමක් මත **සභාපතිවරයා** විසින් අතිරේක කාලයක් ලබාදිය හැකිය.එසේ ලබාදෙන කාලය පළමු දැන්වීමේ සඳහන් කාලයට අතිරේකව දින දහ හතරක උපරිම කාලයකට යටත්ව විය යුතුය.

16. ඉහත 15 වගන්තිය යටතේ ලබාදෙන කාල සීමාව තුළ හෝ අතිරේක කාල සීමාව තුළ දැන්වීමට අනුකූලව ක්‍රියා කිරීම බලපත්‍රලාභියා විසින් පැහැර හැර ඇති අවස්ථාවක **සභාපතිවරයා** විසින් අදාල බලපත්‍රය අවලංගු කල යුතුය.

*දණ්ඩනය*

17. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ලබා ගත යුතු බලපත්‍රයකින් තොරව හෝ අතුරු ව්‍යවස්ථාව යටතේ කරනු ලබන නියමයන් කඩකරමින් පරිශ්‍රයක් පවත්වාගෙන යාම වරදක් වන අතර එම වරද සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් වරදකරුවෙකු කිරීමෙන් පසු **1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 122(2)** උප වගන්තිය යටතේ දඩුවමකට යටත් විය යුතුය.තවද එලෙස වරදකරුවෙකු වීමෙන් පසු තව දුරටත් එකී කඩකිරීම, උල්ලංඝණය නිරන්තරයෙන්ම කරගෙන යනු ලබන විට **සභාපතිවරයා** විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් දැන්වීමක් භාර දීමෙන් පසු උල්ලංඝණ තව දුරටත් නොකඩවා කරගෙන යන සෑම දිනකට ඉහතකී **1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 122(2)** උප වගන්තියේ සඳහන් අතිරේක දඩයකට යටත් විය යුතුය.

*අර්ථ නිරූපණය*

18. මෙම අතුරු ව්‍යවස්ථාවේ පද සම්බන්ධයෙන් අන්‍ය අර්ථයක් අවශ්‍ය වන්නේනම් මිස මෙම අතුරුව්‍යවස්ථාවේ,

"සභාව" යන්නෙන් කළුතර **ප්‍රාදේශීය** සභාවද,

"**සභාපති**" යන්නෙන් කළුතර **ප්‍රාදේශීය** සභාවේ තත්කාලයෙහි **සභාපති** ධූරය දරන හෝ එම ධූරයේ කාර්යය කර්තව්‍ය ඉටුකරන අයද ,

"සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී" යන්නෙන් **ප්‍රාදේශීය** සභා බල ප්‍රදේශයට අදාල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාසය සඳහා එම තනතුර දරන අයද,

"මහජන සෞඛ්‍ය පරීක්ෂක" යන්නෙන් **ප්‍රාදේශීය** සභා බල ප්‍රදේශයට අදාලව සේවයේ යෙදෙන **ප්‍රාදේශීය** සභාවේ හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයට අනුයුක්තව මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුර දරන අයද,

19. " විෂබීජ නාශක " යන්නෙන් ආරක්ෂාව හෝ යොග්‍ය බව අඩු නොකරන මට්ටමකට පරිසරයේ ඇති ක්ෂුද්‍රජීවීන් ප්‍රමාණය රසායනික කාරකයක් මගින් භෞතික ක්‍රමයකින් අඩු කිරීමටද,

සාධාරණ වේලාව යන්නෙන් බලපත්‍රලත් කර්තව්‍ය හො ඊට අදාළ කාර්යයන්හි නිරවන වේලාවන්ද අදහස්වේ.

*පාඨ අතර අනනුකූලතාවය*

මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල හා ඉංග්‍රීසි, දෙමළ පාඨ අතර අනනුකූලතාවයන් හටගතහොත් එවිට සිංහල පාඨය ප්‍රමුඛ වෙයි.

## උපලේඛනය

**.......................... වර්ෂය සඳහා වෙළඳ බලපත්‍රය ලබාගැනීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය.**

01. ඉල්ලුම්කරුගේ නම : -
02. පෞද්ගලික ලිපිනය : -
03. ජාතික හැඳුනුම්පත් අංකය : -
04. දුරකථන අංකය : -
05. ආරම්භක වර්ෂය : -
06. රූපලාවන්‍යාගාරය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ ලිපිනය: -
07. ග්‍රාම නිලධාරී කොට්ඨාසය : -
08. වරිපනම් අංකය: -
09. ව්‍යාපාරය නාම ලියාපදිංචිය ලබාගෙන ඇත්නම් එහි යොමු අංකය :-
10. ව්‍යාපාර ස්ථානයේ කළමණාකරුගේ හෝ නියෝජිතයාගේ,
    I. නම හා පෞද්ගලික ලිපිනය
    II. ජාතික හැඳුනුම්පත් අංකය
    III. දුරකථන අංකය ජංගම :- ස්ථාවර :-
11. ව්‍යාපාරයට අදාළ ඉදිකිරීම් අනුමත කරන සැළැස්මේ අංකය හා දිනය :-
    ( පිටපත් ඇමිණිය යුතුය )

ඉහත තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

දිනය:- ………………………………….

ඉල්ලුම්කරුගේ අත්සන

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

ආදායම් පරීක්ෂක,

පසුපිටේ සඳහන් ඉල්ලුම්පත්‍රයට අදාළව බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා වන ඔබගේ නිරීක්ෂණ හා නිර්දේශ කඩිනමින් මා වෙත ලබා දෙන ලෙස කාරුණිකව ඉල්ලමි.

දිනය:- ................................

ලේකම්

ලේකම්,

බලපත්‍රය ලබා දීම නිර්දේශ කරමි./නොකරමි.

දිනය :- ……………………………….

ආදායම් පරීක්ෂක

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී,

පසුපිටේ සඳහන් ඉල්ලුම් පත්‍රයට අදාළව බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා වන ඔබගේ නිරීක්ෂණ හා නිර්දේශ කඩිනමින් ලබාදෙන මෙන් කාරුණිකව ඉල්ලමි.

දිනය :- ................................

ලේකම්

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී,

අතුරු ව්‍යවස්ථා හා අනෙකුත් නීති රීතිවලට අනුකූලව සුදුසුකම් සපුරා ඇත. බලපත්‍ර නිකුත් කිරීම නිර්දේශ කිරීම සඳහා වාර්තා කරමි.

දිනය :- ................................

මහජන සෞඛ්‍ය පරීක්ෂක

ලේකම්,

ඉහත ඉල්ලුම්පත්‍රයට අනුව අදාළ ස්ථානය සඳහා බලපත්‍රයක් නිකුත් කිරීම නිර්දේශ කරමි. / නොකරමි.

(නිර්දේශ නොකරන්නේ නම් ඊට අදාළ හේතුව සඳහන් කරන්න).

දිනය :- ................................

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී

**පෞද්ගලික අධ්‍යාපන ආයතන පිළිබඳ අතුරුව්‍යවස්ථාව**

1. මෙම අතුරුව්‍යවස්ථාව කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පෞද්ගලික අධ්‍යාපන ආයතන පවත්වාගෙන යන ස්ථානවල මහජන සෞඛ්‍යයට අදාළ කරුණු විධිමත් කිරීම, ඒ හා සම්බන්ධව අධීක්ෂණය කිරීම, පරීක්ෂා කිරීම සඳහා පනවනු ලබයි.

ලුහුඬු නාමය

2. මෙම අතුරුව්‍යවස්ථාව කළුතර ප්‍රාදේශීය සභාවේ පෞද්ගලික අධ්‍යාපන ස්ථාන පිළිබඳ අතුරුව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

3. මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ **126 (ix) වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 122** වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට බලය ලැබී ඇත.

4. කිසිදු තැනැත්තෙකු විසින් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගෙන් ලබාගත් බලපත්‍රයක් යටතේ මිස කළුතර ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ (මෙහි මින් මතු බලප්‍රදේශය යනුවෙන් හඳුන්වනු ලබන) කිසියම් ගොඩනැඟිල්ලක් පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් වශයෙන් පවත්වාගෙන යා නොහැක.

බලපත්‍රයක් ඉල්ලුම් කිරීම

5. මෙම අතුරුව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ඉල්ලුම් කරන සෑම තැනැත්තෙක්ම, මෙම් අතුරුව්‍යවස්ථාවේ උපලේඛනයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත්‍රයක් යටතේ ඒ සඳහා ඉල්ලුම් කළ යුතුය.

6. ඉහත වගන්තිය යටතේ ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කිරීම, ඒ සඳහා වන අවශ්‍යතා සම්පූර්ණ කර ලියාපදිංචි තැපෑලෙන් යොමුකිරිමෙන්, ප්‍රාදේශීය සභාව වෙත ගෙනවිත් භාරදීමෙන් හෝ ප්‍රාදේශීය සභාව අවසර දී ඇති ප්‍රමාණයට විද්‍යුත් තැපෑලෙන් යොමු කිරීමෙන් කළ හැකිය.

පරීක්ෂණ ගාස්තු

7. මෙම අතුරු ව්‍යස්ථාව යටතේ ඉදිරිපත් වන ඉල්ලුම් පත්‍රයට අදාළව බලපත්‍රයක් නිකුත් කිරීමට පූර්වයෙන් සිදුකළ යුතු ස්ථාන පරීක්ෂා කිරීම් සඳහා ස්ථාවර පරීක්ෂණ ගාස්තුවක් සභාව විසින් තීරණය කර අයකිරීම නීත්‍යානුකූල වන්නේය.

බලපත්‍රයක් සඳහා කොන්දේසි

8. මෙම අතුරුව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ඉල්ලුම් කරන සෑම තැනැත්තෙක් ම මෙහි පෞද්ගලික අධ්‍යාපන ආයතනයකට අදාළව (මෙහි මින්මතු පරිශ්‍රය යනුවෙන් හඳුන්වනු ලබන) පහත සඳහන් කොන්දේසි සම්පූර්ණ කර තිබිය යුතුය.

(1) පරිශ්‍රයට අදාළ වන සියළුම ස්ථිර ඉදිකිරීම් 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනත යටතේ හෝ නිවාස හා නගර සංවර්ධන අඥාපනත යටතේ අනුමත කරන ලද සැළැස්මකට අනුකූලව කරන ලද ඉදිකිරීම් විය යුතුය.

(2) ඉදිකර ඇති සියළුම ඉදිකිරීම් පරිශ්‍රය තුළ අධ්‍යාපන කාර්යයක් වෙනුවෙන් වූ පරමාර්ථයන්ට අනුකූල වන අනුකූලතාවය ලද ඉදිකිරීම් විය යුතුය.

(3) අදාළ සියලු ඉදිකිරීම් නිසි නිමාවකින් යුක්තව, පරිශ්‍රය තුළ කරනු ලබන අධ්‍යාපනික කාර්යයන්ට වඩාත් හිතකර අකාරයට හා අහිතකර බලපෑමක් ඇති නොවන පරිදි සකස් කර තිබිය යුතුය.

(4) පරිශ්‍රයෙහි අභ්‍යන්තර ව්‍යුහය, පිරිසැකැස්ම ප්‍රමාණවත් ඉඩ සහිතව සකස් වී තිබිය යුතුය

(5) පරිශ්‍රයෙහි සියළු තැන් නිසි පවිත්‍රතාවයෙන් යුතුව පවත්වාගැනීමට හැකිවන පරිදි සකස් වී තිබිය යුතුය.

(6) පරිශ්‍රයට නිසි පරිදි වාතය හා ආලෝකය ගලා එන පරිදි සකස් වී තිබිය යුතු අතර, නැතහොත් කෘතීමව ඒ සඳහා වන අවශ්‍යතා සම්පූර්ණ කර තිබිය යුතුය.

(7) පරිශ්‍රයෙහි සියළුම නිමවුම් ස්ථිර ලෙස සකස් කරන ලද ඒවා විය යුතුය.

(8) පරිශ්‍රය සඳහා ඇතුළු වීමට හා පිටවීමට වෙනම ප්‍රවේශයන් තිබිය යුතු අතර හදිසි තත්ත්වයකදී පරිශ්‍රයෙන් ඉවත්වීම සඳහා හදිසි දොරටු පැවතිය යුතුය.

(9) පරිශ්‍රය තුල දේශනශාලා වේදිකා සහිතව සකස් කර තිබිය යුතු අතර හොඳින් වාතාශ්‍රය ගලා යා හැකි පරිදි සකස් කරන ලද හෝ වායුසමනය කරන ලද ඒවා විය යුතුය.

(10) සෑම දේශන ශාලාවකටම ඇතුළුවීම හා පිටවීම වෙන් වෙන් වූ දොරටු හා ළමුන් සියයකට වඩා වැඩි ශිෂ්‍ය සංඛ්‍යාවක් සඳහා වන ශාලාවක් වන විටදී හදිසි පිටවීම් සඳහා අතිරේක දොරටුවකින් සමන්විත විය යුතුය.

(11) ළමුන් පනහකට වැඩි සංඛ්‍යාවක් සඳහා වන දේශනශාලාවක් වන විටදී ශබ්ද විකාශන පහසුකම් සපයා තිබිය යුතුය.

(12) දේශනශාලාවක අභ්‍යන්තර පිරිසැකැස්ම තුල එකිනෙකා අතර දුරස්ථභාවයක් සහිතව අසුන්ගැනීමට හැකිවන පරිදි අසුන් පිළියෙල කර තිබිය යුතු අතර සෑම ආසනයකටම අදාල අවම මීටර් 0.75 ක දිගකින් හා පළලකින් යුත් මේසයක් විය යුතුය.

(13) දේශනශාලාවක මේස හා අසුන් සාමූහිකව අසුන් ගැනීමට හැකි පරිදි සකස් කර ඇත්නම්, ඉහත 12 වන වගන්තියෙහි සඳහන් ප්‍රමාණයන් සහ දුරස්ථභාවයන් පවත්වාගත හැකි පරිදි ඉඩ වෙන් වී තිබිය යුතු අතර සමූහයක් සඳහා අසුන් පැනවීමකදී සිසුන් හය දෙනෙකුට නොවැඩි අසුන් ගැනීමක් වෙනුවෙන් අසුන් හා මේස සකස් වී තිබිය යුතුය.

(14) අසුන් හා මේස අතර ; එක් එක් අසුන් හා මේස කට්ටල අතරත් ප්‍රමාණවත් පරතරයක් විය යුතු අතර, තබා ඇති පරතරය පහසුවෙන් ගමන්කල හැකි ප්‍රමාණයට විය යුතුය.

(15) අසුන් සහ මේස පොලවට ස්ථිර ලෙස සවිකරන ලද ඒවා විය යුතු අතර ඒ සියල්ල මනා ලෙස තනන ලද හා භාවිතයට පහසුවන පරිදි සකස් කරන ලද ඒවා විය යුතුය.

(16) පරිශ්‍රය අභ්‍යන්තර බිත්ති ජීවීන් රඳා නොසිටින පරිදි සකස් කර තිබිය යුතු අතර සෑම බිත්තියක්ම නිසි ලෙස නිමවා තිබිය යුතුය.

(17) පරිශ්‍රය සඳහා ගිනි ආරක්ෂණ වැඩපිළිවෙලක් යොදා තිබිය යුතු අතර, අදාළ වන පරිදි ගිනි ආරක්ෂණ සහතිකය ලබා තිබිය යුතුය.

(18) පරිශ්‍රය තුල ඉදිකර ඇති සියළුම ශාලා අනෙකුත් ගොඩනැගිලි, ඉදිකිරීම් රහිත කොටස අනාරක්ෂිත බාධාවන්ගෙන් තොර විය යුතු අතර, අවදානම් රහිත තත්ත්වයෙන් විය යුතුය.

(19) පරිශ්‍රය තුළ කාණු අපජලය රැඳී නොසිටින පරිදි පහසුවෙන් ගලා යා හැකි ආකාරයට තනා තිබිය යුතු අතර, ඒ සියල්ල උරාගැනීමේ වළකට හෝ පූතික වළකට හෝ මධ්‍ය ප්‍රතිකාර ඒකකයකට යොමු කර තිබිය යුතුය.

(20) පරිශ්‍රය තුළ පිහිටුවා ඇති පූතික වළවල්, උරාගැනීමේ වළවල් අනුමත සැලැස්මකට අනුකූලව පිහිටුවා තිබිය යුතු අතර, එය ජල මූලාශ්‍රයක් ඇත්නම් එයට අවම වශයෙන් මීටර් 15.25 ක දුරකින් පිහිටුවා තිබිය යුතු අතරම, එය වාතයට නිරාවරණය නොවිය යුතුය.

(21) පරිශ්‍රය තුළ ප්‍රමාණවත් පරිදි වැසිකිළි පහසුකම් සපයා තිබිය යුතු අතර, සියළුම වැසිකිළි;

(අ) ස්ත්‍රී පුරුෂ යන දෙපක්ෂය සඳහා වෙන්ව පිහිටුවා තිබිය යුතුය.

(ආ) ප්‍රමාණවත් ජල සැපයුමක් නිරන්තරයෙන් පවත්වාගත හැකි පරිදි ජලය ගබඩාකර ගත හැකි පහසුකම්වලින් සමන්විත විය යුතුය.

(ඇ) සෑම වැසිකිළියක් සඳහාම නිශ්චිතව වෙන්කරන ලද ඉඩ ප්‍රමාණයක මනා ජල සම්බන්ධතාවයක් සහිතව දෙඅත් සෝදා ගැනීම ආදී කාර්යයන් සඳහා ස්ථිර ලෙස සවි කරන ලද හා මල නොබැඳෙන ද්‍රව්‍යයකින් සකස් කරන ජල බේසම් සවිකර තිබිය යුතුය.

***බලපත්‍රයක් නිකුත් කිරීම***

9. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රයක් සඳහා ඉදිරිපත් වන ඉල්ලුම්පත්‍රයකට අදාළව ඉල්ලුම්පත්‍රය ලැබී දින දහහතරක් ඇතුළත සභාපතිවරයා විසින්;

(1) 8 වන වගන්තිය යටතේ කොන්දේසි වලට අනුකූල විටදී පරිශ්‍රයට අදාළව බලපත්‍රයක් ඉල්ලුම්කරු වෙත නිකුත් කළ යුතුය.

(2) 8 වන වගන්තිය යටතේ කොන්දේසි වලට අනුකූල නොවන්නේ නම්, හේතු දක්වා අදාළ ඉල්ලුම්පත්‍රය ප්‍රතික්ෂේප කළ යුතුය.

*බලපත්‍රයක් සඳහා ගාස්තු*

10. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රයක් සඳහා අයකළ යුතු ගාස්තු මූලික නීතියේ සඳහන් විධිවිධානයන්ට යටත්ව සභාව විසින් තීරණය කර ප්‍රකාශයට පත් කරනු ලබන ගාස්තු විය යුතුය.

*බලපත්‍රයක වලංගු කාලය*

11. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධාන අනුව කලින් අවලංගු නොකළහොත් බලපත්‍රයට අදාළ වර්ෂයෙහි දෙසැම්බර් 31 දින දක්වා වලංගු විය යුතුය.

*බලපත්‍රයකට අදාළ තොරතුරු*

12. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලත් සෑම තැනැත්තෙක්ම මෙහි පහත සඳහන් කොන්දේසිවලට අනුකූලව ක්‍රියා කළ යුතුය.

(1) ශ්‍රී ලංකාව පුරාම හෝ ඉන් කොටසකට හෝ බලප්‍රදේශයකට අදාළව හෝ නිරෝධායන හා රෝග වැළැක්වීමේ ආඥාපනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද රෙගුලාසි යටතට අදාළ වන වසංගත තත්ත්වයක් ප්‍රකාශයට පත් කර ඇති හෝ කවර හෝ අවස්ථාවක හෝ බලප්‍රදේශය තුල වසංගත තත්ත්වයකට කරුණු යෙදිය හැකි බවට සෑහීමකට පත්වෙමින් එය පාලනය කිරීමසඳහා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී උපදෙස් මත සභාපතිවරයා විසින් කලින් කල නියම කරනු ලබන නියමයන් ඇත්නම්, ඒ සෑම නියමයකටම යටත්ව පරිශ්‍රය පවත්වා ගත යුතුය.

(2) පරිශ්‍රය තුල හොඳින් වාතාශ්‍රය ගලායාමට කරුණු යෙදී තිබිය යුතු අතර ; එසේ නොමැති තත්ත්වයක් යටතේ සියළුම දේශන ශාලා වායු සමනය කර තිබිය යුතු අතර අදාල වායු සමග යන්ත්‍ර නිසි උෂ්ණත්වයකින් පවත්වාගත හැකි පරිදි මනා ක්‍රියාකාරීත්වයෙන් යුක්ත විය යුතුය.

(3) දේශන ශාලා තුල පවත්වාගෙන යනු ලබන ශබ්දවාහිණී යන්ත්‍ර මඟින් නිකුත් කරන ශබ්දය; දේශනශාලාවට ප්‍රමාණවත් වන පරිදි පාලනයකින් යුක්ත විය යුතු අතර ජාතික පාරිසරික රෙගුලාසීන්ට අනුකූලව එය පවත්වාගත යුතුය.

(4) සෑම පරිශ්‍රයකම කිසියම් ආසාදිත රෝගී තත්ත්වයක් සහිත අයකු පැමිණියහොත්, ඒ අය තාවකාලිකව හුදකලා කිරීම සඳහා නිශ්චිත ස්ථානයක් තිබිය යුතුය.

(5) පරිශ්‍රයෙහි අධ්‍යනය ලබන සියළු අයවළුන්ගේ අනන්‍යතාවයන් පිළිබඳ නම්, ලිපිනයන්, දුරකථන අංකද ඇතුළුවීම ප්‍රමාණවත් තොරතුරු පවත්වාගත යුතු අතරම, දෛනිකව එදිනට පැමිණෙන්නන් පිළිබඳ තොරතුරු හඳුනාගත හැකි පරිදි පවත්වාගත යුතුය.

(6) පරිශ්‍රය තුල සියළුම වැසිකිළි නිරන්තයෙන් විෂබීජ නාශක යොදා පිරිසිදු කර පවත්වාගත යුතුය.

(7) පරිශ්‍රය තුල වූ සියළුම කාණු මනා ලෙස පිරිසිදු කර පවත්වාගත යුතු අතර ජලය හා දූහුවිලි රැඳී නොසිටින පරිදි පොළොව මතුපිට පවත්වා ගත යුතුය.

(8) අවශ්‍යතාවය මත පරිශ්‍රයට ඇතුල්වීමේදී දෙඅත් පිරිසිඳු කරගැනීමේ කරුණු යෙදූනහොත් ඒ සඳහා ප්‍රමාණවත් පරිදි වූ ජල සැපයුම් සහිත ජල බේසම් සවිකර තිබිය යුතු අතර ඒ සඳහා පිරිසිදු කාරක හා විෂබීජ නාශක ද්‍රව්‍ය සපයා තිබිය යුතුය.

(9) පරිශ්‍රයෙහි දේශණ පැවැත්වෙන අවස්ථාවන්හිදී දේශක පහසුවෙන් පෙනෙන හා දේශකට ශිෂ්‍යයින් පහසුවෙන් පෙනෙන ආකාරයට වූ දිසානිතියක් සහිතව අසුන් පනවා තිබිය යුතුය.

(10) අධ්‍යාපන කටයුතු සිදුවන සෑම දිනකම පරිශ්‍රයට පැමිණෙන අය සම්බන්ධයෙන් තොරතුරු වාර්තා ගතවන ක්‍රමයක් සකසා තිබිය යුතු අතර, පරිශ්‍රයෙහි සේවය නියුතු සියළුම අය සම්බන්ධයෙන් ද අනන්‍යතාවයට අදාල තොරතුරු වෙන් වෙන්ව පවත්වාගත යුතුය.

11. පරිශ්‍රය තුල සේවයෙහි නියුතු සේවකයින් ගැන,

(අ) නේවාසිකයින් වශයෙන් සේවයේ යොදවන්නේ නම් ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් නවාතැන් පහසුකම් තිබිය යුතුය.

(ආ) ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් මෙන්ම පිහිටුවා තිබිය යුතු අතර ස්ත්‍රී හා පුරුෂ වශයෙන් වෙනම පවත්වාගත යුතුය.

(12) පරිශ්‍රය තුල හදිසි අවශ්‍යතාවයක් සඳහා උපයෝගී කරගත හැකි පරිදි ප්‍රථමාධාර පහසුකම් සපයා තිබිය යුතු අතර; ඒ සඳහා කාර්යමණ්ඩලය පුහුණු කර තිබිය යුතුය.

(13) පරිශ්‍රය තුල දේශණ පැවැත්වීමේදී ජනනය වන ශබ්දය මධ්‍යම පරිසර අධිකාරියෙහි නියමයන්ට අනුකූලව පාලනය කර තැබිය යුතුය.

(14) පරිශ්‍රය තුල සියළු විදුලි රැහැන් සම්බන්ධතාවයන් නිසි නඩත්තුවක් යටතේ පවත්වාගත යුතු අතර ; එය එසේ වන බවට අවම වශයෙන් වර්ෂ දෙකකට වරක්වත් ඒ පිළිබඳව විදුලි ඉංජිනේරුවරයෙකුගෙන් හෝ වෘත්තීය සුදුසුකම් සපුරා ඇති අයකු වෙතින් වාර්ථාවක් ලබා ගත යුතුය.

(15) කිසියම් බෝවන රෝගයකින් පෙළෙන හෝ එවැනි රෝගයක් වැළදී ඇති බවට සැකකරනු ලබන හෝ එවැනි රෝග වාහකයෙකු හෝ ආසාදිත අයකු පරිශ්‍රය තුල සේවයෙහි නොයෙදිය යුතු අතර, එවැනි අයෙකු සේවයෙහි නොයෙදෙන බවට බලපත්‍රලාභියා සැහීමට පත්විය යුතුය.

(16) පරිශ්‍රය තුල එක්රැස්වන අපද්‍රව්‍ය ඒ සඳහා නිශ්චිතව පවත්වාගත යුතු සංවෘත කසළ බඳුන් තුළට බැහැර කල යුතු අතර ; පරිශ්‍රය තුල භාවිතයෙන් පසු ඉවත් කරන මුඛ වැසුම් ; අත්වැසුම් වේනම් ඒ සියල්ල ඒ සඳහාම පරිශ්‍රය තුල පවත්වාගත යුතු පාදයෙන් විවෘත කල හැකි බහාලුම් තුලට පමණක් බැහැර කල යුතුය.

(17) පරිශ්‍රයෙහි එක්රැස්වන අපද්‍රව්‍ය බැහැර කිරීම ප්‍රාදේශීය සභාව ක්‍රියාත්මක කරන නැතහොත් මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් නියම කර ඇති වැඩපිළිවෙලකට අනුව අදාල කසළ බැහැර කිරීම.

(18) බල ප්‍රදේශය තුල නිරෝධායන හා රෝග නිවාරන ආඥාපනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද රෙගුලාසියක් යටතේ වසංගත තත්ත්වයක් සම්බන්ධයෙන් ක්‍රියාත්මක විය යුතු බවට වූ නියමයන් කර ඇති විටදී හෝ බල ප්‍රදේශයට අදාලව වසංගත තත්ත්වයන් කරුණු යෙදී ඇති විට හෝ එසේ කරුණු යොදා ඇතැයි සැක කිරීමට තරම් කරුණු යෙදී ඇති බවට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී උපදෙස් පරිදි සභාපතිවරයා විසින් තීරණය කර ඇති විටක, පරිශ්‍රය තුල පහත සඳහන් ක්‍රියාමාර්ග හෝ ඒ අතරින් කිහිපයක් හෝ මහජන සෞඛ්‍යයෙහි යහපත සඳහා වෙනත් කවර නියමයන් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී උපදෙස් පරිදි සභාපති විසින් සිදු කිරීම නීත්‍යානුකූලය.

(අ) බලපත්‍ර යටතේ පරිශ්‍රයෙහි කටයුතු ඉටුකිරීම තාවකාලිකව කිසියම් කාලයක් සඳහා අත්හිටුවිය යුතු බව.

(ආ) පරිශ්‍රය තුල හදිසි ප්‍රතිවාරාත්මක සැලැස්මක් ක්‍රියාත්මක විය යුතු බව.

(ඇ) පරිශ්‍රය තුල සමූහ වශයෙන් ඒකරාශී වීම නැවැත්විය යුතු බව.

(ඈ) දේශන පත්‍රිකා අතින් අත බෙදා හැරීම නැවැත්විය යුතු බව.

(ඉ) පරිශ්‍රය තුල නියම කරනු ලබන දුර ප්‍රමාණයකින් දුරස්ථභාවය පවත්වාගත යුතු බව.

(ඊ) පරිශ්‍රයට ඇතුලුවීමේදී ශරීර උෂ්ණත්වය සාමාන්‍ය අගය යටතේ පවතින්නේද යන්න තහවුරු කර ගනිමින් පරිශ්‍රයට ඇතුලත් කර ගත යුතු බවට.

(උ) වායු සමීකරණ යන්ත්‍රයන් පෙරහන් සතියකට වරක් පිරිසිදු කල යුතු බව.

(ඌ) උපදෙස් මාලාවට අනුකූලව පරිශ්‍රය පවත්වාගෙන යාම සම්බන්ධව සභාපතිවරයා සමඟ එකඟතා ප්‍රකාශයට ඇතුලත් විය යුතු බව.

(එ) පරිශ්‍රය තුල ආහාර විකිණීම, බෙදා හැරීම, නොකල යුතු බව.

(ඒ) කැස්ස, කිවිසුම් යෑම වැනි අවස්ථාවන්හීදී ස්වසන ආචාර විධි අනුගමනය කල යුතු බව.

(ඔ) ආහාර පරිහරණය සඳහා නිශ්චිත ස්ථානයක් තිබිය යුතු බව හා එම ස්ථානයෙහි වෙන් වෙන් වශයෙන් ආහාර ගැනීම සිදු කල යුතු බව.

(ඕ) පරිශ්‍රය තුල පවත්වා ගත යුතු සෞඛ්‍ය නියමයන් පහසුවෙන් හඳුනාගත හැකි පරිදි ප්‍රචාරණය කල යුතු බව.

(ක) පරිශ්‍රයට ඇතුල් කර ගැනීම මෙන්ම පරිශ්‍රයෙන් පිටවීම කාණ්ඩ වශයෙන් සිදුකල යුතු බව.

(ග) පරිශ්‍රයෙහි සේවයේ යෙදෙන්නන් නිශ්චිත කාල ප්‍රාන්තරයන් යටතේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී නිර්දේශිත පරිදි සෞඛ්‍ය පරීක්ෂණ වලට ලක් කල යුතු බව.

13. පරිශ්‍රය තුල සකස් කරන ලද ආහාර විකිණීම සිදුකරයි නම් ඒ සම්බන්ධයෙන් වූ ලිඛිත නීතින්ට අනුකූලව ඊට අදාල පරිශ්‍රය පවත්වාගත යුතු අතර ඒ කිසිවක් මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ලබාගත් බලපත්‍රයක් මත යටපත් වූවා යැයි නොසැලකිය යුතුය.

*බලපත්‍රය ප්‍රදර්ශනය කළ යුතු බව.*

14. සෑම පරිශ්‍රයකට මෙම අතුරු ව්‍යවස්ථාව හා මේ යටතේ ලබා ගත් බලපත්‍රය හෝ එහි පිටපතක් ප්‍රදර්ශණය කර තිබිය යුතුය.

*පරිශ්‍රයට ඇතුල්වීමේ බලය*

15. මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධානයන්ට අනුකූලව පරිශ්‍රය පවතින්නේද යන්න පරීක්ෂා කිරීම සඳහා සභාපතිවරයා විසින් හෝ ඒ සඳහා බලය පවරන ලද මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකු හෝ වෙනත් යම් නිලධාරියෙකු ඕනෑම සාධාරණ වෙලාවක පරිශ්‍රයට ඇතුළු වීමට, අවශ්‍ය නියැදි ලබා ගැනීම නීත්‍යානුකූල වන්නේය.

16. (1) මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලත් පරිශ්‍රයක් යටතේ මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කොන්දේසි උල්ලනංඝනය කරමින් හෝ ඊට පටහැනි වන පරිදි කටයුතු වන අවස්ථාවක අතුරු ව්‍යවස්ථාවට අනුකූල වීම සඳහා දින තිහකට නොවැඩි නිශ්චිත කාලයක් දක්වමින් දැන්වීමක් සභාපතිවරයා විසින් බලපත්‍රලාභියා වෙත භාරදිය යුතුය.

(2) මෙම වගන්තිය යටතේ වූ දැන්වීමක් බලපත්‍රලාභියා වෙත භාරදීමෙන් පසු, අදාල දැන්වීමේ සඳහන් නියමයන්ට අනුකූලව ක්‍රියාකිරීම සඳහා තවදුරටත් අතිරේක කාලයක් ලබාදෙන ලෙසට සාධාරණ හේතු දක්වමින් කරනු ලබන ඉල්ලීමක් මත සභාපති වරයා විසින් අතිරේක කාලයක් ලබාදිය හැකිය.එසේ ලබාදෙන කාලය පළමු දැන්වීමේ සඳහන් කාලයට අතිරේකව දින දහ හතරක උපරිම කාලයකට යටත්ව විය යුතුය.

*බලපත්‍රය අවලංගු කිරීම*

17. ඉහත 16 වගන්තිය යටතේ ලබාදෙන කාල සීමාව තුළ හෝ අතිරේක කාල සීමාව තුළ දැන්වීමට අනුකූලව ක්‍රියා කිරීම බලපත්‍රලාභියා විසින් පැහැර හැර ඇති අවස්ථාවක සභාපතිවරයා විසින් අදාල බලපත්‍රය අවලංගු කල යුතුය.

*දණ්ඩනය*

18. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ලබා ගත යුතු බලපත්‍රයකින් තොරව හෝ අතුරු ව්‍යවස්ථාව යටතේ කරනු ලබන නියමයන් කඩකරමින් පරිශ්‍රයක් පවත්වාගෙන යාම වරදක් වන අතර එම වරද සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් වරදකරුවෙකු කිරීමෙන් පසු 1987 අංක 15දරන ප්‍රාදේශීය සභා පනතේ 122(2) උප වගන්තිය යටතේ දඩුවමකට යටත් විය යුතුය.තවද එලෙස වරදකරුවෙකු වීමෙන් පසු තව දුරටත් එකී කඩකිරීම, උල්ලංඝණය නිරන්තරයෙන්ම කරගෙන යනු ලබන විට සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් දැන්වීමක් භාර දීමෙන් පසු උල්ලංඝණ තව දුරටත් සිදු කරන්නේ නම් එසේ සිදු කරන සෑම දිනකට අදාළව එම උප වගන්තියේ සඳහන් අතිරේක දඩයකට යටත් විය යුතුය.

*අර්ථ නිරූපණය*

19. මෙම අතුරු ව්‍යවස්ථාවේ පද සම්බන්ධයෙන් අන්‍ය අර්ථයක් අවශ්‍ය වන්නේනම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ,

"සභාව" යන්නෙන් . කළුතර ප්‍රාදේශීය සභාවද,

"සභාපති" යන්නෙන් කළුතර ප්‍රාදේශීය සභාවේ තත්කාලයෙහි සභාපති ධූරය දරන හෝ එම ධූරයේ කාර්යය කර්තව්‍ය ඉටුකරන අයද ,

"සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී" යන්නෙන් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අදාල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශය සඳහා එම තනතුර දරන අයද,

"මහජන සෞඛ්‍ය පරීක්ෂක" යන්නෙන් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අදාලව සේවයේ යෙදෙන ප්‍රාදේශීය සභාවේ හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයට අනුයුක්තව මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුර දරන අයෙක්ද,

" මූලික නීතිය" යන්නෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත අදහස් වෙයි.

20. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල හා ඉංග්‍රීසි, දෙමළ පාඨ අතර අනනුකූලතාවයන් හටගතහොත් සිංහල පාඨය අනුව වෙයි. *පාඨ අතර අනනුකූලතාව*

**පළමුවන උපලේඛනය**

**.......................... වර්ෂය සඳහා වෙළඳ බලපත්‍රය ලබාගැනීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය.**

01. ඉල්ලුම්කරුගේ නම : -
02. පෞද්ගලික ලිපිනය : -
03. ජාතික හැඳුනුම්පත් අංකය : -
04. දූරකථන අංකය : -
05. ආරම්භක වර්ෂය : -
06. පෞද්ගලික අධ්‍යාපන ආයතනය පවත්වාගෙන යන ස්ථානයේ ලිපිනය : -
07. ග්‍රාම නිලධාරී කොට්ඨාසය : -
08. වරිපනම් අංකය: -
09. පෞද්ගලික අධ්‍යාපන ආයතනය ලියාපදිංචිය ලබාගෙන ඇත්නම් එහි යොමු අංකය :-
10. පෞද්ගලික අධ්‍යාපන ආයතනයේ කළමනාකරුගේ හෝ නියෝජිතයාගේ,
    I. නම හා පෞද්ගලික ලිපිනය
    II. ජාතික හැඳුනුම්පත් අංකය
    III. දූරකථන අංකය ජංගම :- ස්ථාවර :-
11. අනුමත ගොඩනැගිලි සැලැසුම් අංකය හා දිනය :-
12. අනුකූලතා සහතියේ අංකය හා දිනය :-

ඉහත තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බව සහතික වෙමි. ............................ වර්ෂය වෙනුවෙන් බලපත්‍රයක් මා වෙත නිකුත් කරන ලෙස ඉල්ලමි.

දිනය:- ......................................

ඉල්ලුම්කරුගේ අත්සන

<u>කාර්යාලීය ප්‍රයෝජනය සඳහා</u>

ආදායම් පරීක්ෂක,

පසුපිටේ සඳහන් ඉල්ලුම්පත්‍රයට අදාළව බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා වන ඔබගේ නිරීක්ෂණ හා නිර්දේශ කඩිනමින් මා වෙත ලබා දෙන ලෙස කාරුණිකව ඉල්ලමි.

දිනය:- ................................

ලේකම්

---

ලේකම්,

බලපත්‍රය ලබා දීම නිර්දේශ කරමි./නොකරමි.

දිනය :- ……………………………..

ආදායම් පරීක්ෂක

---

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී,

පසුපිටේ සඳහන් ඉල්ලුම් පත්‍රයට අදාළව බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා වන ඔබගේ නිරීක්ෂණ හා නිර්දේශ කඩිනමින් ලබාදෙන මෙන් කාරුණිකව ඉල්ලමි.

දිනය :- ................................

ලේකම්

---

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී,

අතුරු ව්‍යවස්ථා හා අනෙකුත් නීති රීතිවලට අනුකූලව සුදුසුකම් සපුරා ඇත. බලපත්‍ර නිකුත් කිරීම නිර්දේශ කිරීම සඳහා වාර්තා කරමි.

දිනය :- ................................

මහජන සෞඛ්‍ය පරීක්ෂක

---

ලේකම්,

ඉහත ඉල්ලුම්පත්‍රයට අනුව අදාළ ස්ථානය සඳහා බලපත්‍රයක් නිකුත් කිරීම නිර්දේශ කරමි. / නොකරමි.

(නිර්දේශ නොකරන්නේ නම් ඊට අදාළ හේතුව සඳහන් කරන්න).

දිනය :- ................................

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී

---

**පොදු සෞඛ්‍ය ආරක්ෂක පහසුකම් පාලනය සහ කළමණාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

1. මෙම අතුරු ව්‍යවස්ථාව කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙහි පොදු සෞඛ්‍ය ආරක්ෂක පහසුකම්වල පාලනය හා කළමනාකරණය සඳහා පනවනු ලබයි.

2. මෙම අතුරු ව්‍යවස්ථාව කළුතර ප්‍රාදේශීය සභාවේ පොදු සෞඛ්‍ය ආරක්ෂක පහසුකම් පාලනය සහ කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ. *ලුහුඬු නාමය*

3. මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ **126(IX) වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 122** උපවගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට බලය ලැබී ඇත. *නෛතික බලය*

4. කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල (මෙහි මින්මතු බලප්‍රදේශය යනුවෙන් හඳුන්වනු ලබන) ක්‍රියාත්මක කරනු ලබන පොදු සෞඛ්‍ය ආරක්ෂක පහසුකම් නිසි හා යෝග්‍ය ආකාරයෙන් පවත්වා ගැනීම සඳහා අවශ්‍ය විය හැකි සෑම ක්‍රියා මාර්ගයක්ම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විමසා සභාපති විසින් ක්‍රියාත්මක කල යුතුය.

5. සභාව මඟින් ක්‍රියාත්මක කරනු ලබන පොදු සෞඛ්‍ය පහසුකම් පාලනය හා කලමනාකරණය කිරීමේ කාර්යය ඉටු කිරීම සඳහා බල ප්‍රදේශයට අදාල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී හා සියළුම මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සභාවේ නිලධාරීන් ලෙස සැලකිය යුතුය. *සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී හා මහජන සෞඛ්‍ය පරීක්ෂක වරුන් සභාවේ නිලධාරීන් වශයෙන් සැළකිය යුතු බව*

6. බල ප්‍රදේශය තුල මහජන සෞඛ්‍යට අදාලව සෞඛ්‍ය ආරක්ෂක පහසුකම් පාලනය හා කළමනාකරණය කිරීමෙහිලා කවර හෝ ලිඛිත නීතියක් යටතේ සභාපති වෙත පිරිනැමී ඇති බලතල හා කාර්යය කිසිවක් අදාල ලිඛිත නීතියෙහි විධිවිධානයන්ට යටත්ව සභාපතිවරයා විසින් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂක වරුන් වෙත පවරා දිය හැකිය. *බලතල පැවරීම*

7. බල ප්‍රදේශය තුල සභාව විසින් ක්‍රියාත්මක කරන පහත සඳහන් සේවාවන්ට අදාල පොදු සෞඛ්‍ය ආරක්ෂක පහසුකම් කළමනාකරණය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී අධීක්ෂණයට යටත්ව සිදුකල යුතුය. *සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී අධීක්ෂණයට යටත් කිරීම*

(1) බල ප්‍රදේශය තුල කසළ කළමනාකරණ කටයුතු

(2) මාතෘ හා ළමා සෞඛ්‍ය සායන

(3) පොදු වැසිකිළි හා කැසිකිළි පහසුකම්

(4) පොදු වෙළඳපොළ සේවා

(5) ගෝඝාතකාගාර පවත්වාගෙන යාම

8. නිරෝධායක හා රෝග වැලැක්වීම් ආඥා පනතට හා ඒ යටතේ සාදන ලද රෙගුලාසි යටතට අදාල වන හෝ කවර හෝ වසංගත තත්වයක් බල ප්‍රදේශයටද අදාලව ප්‍රකාශයට පත්ව ඇති අවස්ථාවක හෝ එම ආඥාපනත යටතට අදාලවන වෙනත් කවර හෝ රෙගුලාසියක් බල ප්‍රදේශයට අදාලව ක්‍රියාත්මකවන අවස්ථාවක සභාව විසින් පවත්වාගෙන යනු ලබන පොදු සේවාවන් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් වූ සෑම නියමයක්ම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී නිර්දේශයන්ට අනුව සභාපති විසින් සිදුකල යුතුය. *නියමයන් කිරීම*

9. සභාව විසින් සපයනු ලබන පොදු සෞඛ්‍ය ආක්ෂක පහසුකම් විධිමත්ව පවත්වාගෙන යාමෙහිලා ඉදිරි මාසය සඳහා ක්‍රියාත්මක කල යුතු නිර්දේශ සම්බන්ධයෙන් පිළියල කරන ලද වාර්තාවක් සහ ගතවූ මාසයට අදාලව බල ප්‍රදේශයෙහි මහජන සෞඛ්‍ය කෙරෙහි අදාල වන්නා වූ පොදු සෞඛ්‍ය පහසුකම් කළමනාකරණයට අදාල ගත් ක්‍රියා මාර්ග සම්බන්ධයෙන් මාසික වාර්තාවක් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් සභාව වෙත සෑම මසකම ඉදිරිපත් කල යුතුය. මාසික වාර්තාව

10. ලිඛිත නීතියෙන් පිරිනමා ඇති මහජන සෞඛ්‍ය පිළිබඳ අධිකාරී බලතල බල ප්‍රදේශය තුල සභාව විසින් ක්‍රියාත්මක කිරීමේදී ඊට අදාල සෞඛ්‍ය ආරක්ෂක පහසුකම් පාලනය හා කළමනාකරණයට අදාල වන්නා වූ සෑම පියවරක් සම්බන්ධයෙන්ම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී නිර්දේශය සභාව වෙත ඉදිරිපත් කල යුතුය.

11. කිසියම් වසංගත රෝගී තත්වයක් බල ප්‍රදේශය තුල පවත්නා බවට සැහීමට පත්විය හැකි පමණට කරුණු ඇති වීමේදී හෝ නිරෝධායක හෝ රෝග වැලැක්වීමේ ආඥාපනත හා ඒ යටතේ සාදන ලද නියෝග යටතට අදාළ වන රෝගී තත්වයක් බල ප්‍රදේශයට අදාල වන විටදී ඊට අදාලව බල ප්‍රදේශයේ ක්‍රියාත්මක කල යුතු සෞඛ්‍ය ආරක්ෂක පියවර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විමසා සභාපති විසින් ක්‍රියාත්මක කල යුතුය.

තොරතුරු ලබා ගැනීම

12. නිරෝධායන හා රෝග වැලැක්වීම් ආඥාපනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද රෙගුලාසි අදාල වන වසංගත තත්වයක් හෝ කවර හෝ වසංගතයක් යැයි සැලකිය හැකි රෝගී තත්වයක් බල ප්‍රදේශය තුල ව්‍යාප්ත වීමට කරුණු යෙදී ඇති විට හෝ එවැනි වසංගත තත්වයක් ඇති වීම වලක්වා ගැනීමට හැකිවනු පිණිස රැස්කල යුතු තොරතුරු දත්ත තමා වෙත හෝ තමා විසින් නිශ්චිතව බලය පවරි ඇති නිලධාරියෙකු වෙත සපයන ලෙස සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් කවර හෝ තැනැත්තෙකු වෙත නියම කිරීම නීත්‍යානුකූල වන්නේය.

13. ඉහත 12 වන වගන්තිය යටතේ කරනු ලබන නියම කිරීමකදී එසේ නියම කරන ලද තොරතුරු දත්ත නියම කර ඇති කාලය තුල නියම කරන ලද අය වෙත නිසි ආකාරයෙන් ලබා දීම නියමය ලද තැනැත්තාගේ කාර්යය වන්නේය.

දණ්ඩනය

14. ඉහත 12 වන වගන්තිය යටතේ කරනු ලබන නියමයකට අනුව අදාල නියමය ලද කිසියම් තැනැත්තෙකු විසින් ඉහත 13 වන වගන්තියට අනුකූලව ක්‍රියා නොකරයිනම් එය වරදක් වන අතර එම වරද සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් වරදකරුවෙකු කිරීමෙන් පසු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(2) උප වගන්තිය යටතේ වූ දඩුවමකට යටත් විය යුතුය.

15. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නියම කර ඇති හා පවරා ඇති බලතල ක්‍රියාත්මක කිරීමේදී කාර්යය ඉටුකිරීමෙහිලා සුදුසු වැඩ පිළිවෙලක් සභාවේ ප්‍රධාන කාර්යාලය හා සෑම උප කාර්යාලයන් යටතේම පවත්වාගෙන යාම සභාපතිගේ කාර්යය වන්නේ ය.

16. මෙම අතුරු ව්‍යවස්ථාවේ පද සම්බන්ධයෙන් අන්‍ය අර්ථයක් අවශ්‍ය වන්නේනම් මිස, මෙම අතුරු ව්‍යවස්ථාවේ

"සභාව" යන්නෙන් කළුතර ප්‍රාදේශීය සභාවද

"සභාපති" යන්නෙන් කළුතර ප්‍රාදේශීය සභාවේ තත්කාලයෙහි සභාපති ධූරය දරන හෝ එම ධූරයේ කාර්යය කර්තව්‍ය ඉටුකරන අයද ,

"සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී" යන්නෙන් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අදාල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාසය සඳහා එම තනතුර දරන අයද,

"මහජන සෞඛ්‍ය පරීක්ෂක" යන්නෙන් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අදාලව සේවයේ යෙදෙන ප්‍රාදේශීය සභාවේ හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයට අනුයුක්තව මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුර දරන අයෙක්ද,

"තැනැත්තෙක්" යන්නෙන් යම් පුද්ගලයෙකු හෝ පුද්ගල නාමයෙන් පෙනී සිටින කිසියම් ආයතනයක් සම්බන්ධයෙන් වන විටදී ආයතනයෙහි කළමනාකාර අධ්‍යක්ෂකවරයා හෝ කළමනාකරුවෙකු හෝ එම ආයතනය වෙනුවෙන් ක්‍රියා කරන කවර හෝ අයකුද,

අදහස් වේ.

17. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර අනනුකූලතාවයන් හටගතහොත් එවිට සිංහල පාඨය ප්‍රමුඛ වෙයි.

**පෞද්ගලික වෙළෙඳපොළවල් හෝ පොළවල් සඳහා වූ සනීපාරක්ෂක අවශ්‍යතා සම්බන්ධයෙන් පිළිපැදිය යුතු ප්‍රමිති නියම කිරීම සඳහා වන අතුරු ව්‍යවස්ථාව.**

1. මෙම අතුරු ව්‍යවස්ථාව කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පෞද්ගලික වෙළෙඳපොළවල් හෝ පොළවල් සඳහා වූ සනීපාරක්ෂක අවශ්‍යතා සම්බන්ධයෙන් පිළිපැදිය යුතු ප්‍රමිති නියම කිරීම සඳහා පනවනු ලබයි.

2. මෙම අතුරු ව්‍යවස්ථාව කළුතර ප්‍රාදේශීය සභාවේ පොළවල් සඳහා සනීපාරක්ෂක ප්‍රමිති නියම කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ — ලුහුඬු නාමය

3. මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ **126 (xii) වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 122** වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට බලය ලැබී ඇත.

4. කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ (මෙහි මින්මතු බල ප්‍රදේශය යනුවෙන් හඳුවන්වනු ලබන) පිහිටියා වූ සෑම පොදු වෙළෙඳපොළක් හා පෞද්ගලික වෙළෙඳපොළක් ඇතුලු සෑම පොළක්ම (මෙහි මින්මතු පොළක් යනුවෙන් හඳුවනු ලබන) පවත්වාගෙන යනු ලබන භූමි ප්‍රමාණය (මෙහි මින්මතු පරිශ්‍රය යනුවෙන් හඳුන්වනු ලබන) නිශ්චිත විය යුතු අතර, එය ඒ සඳහා වන නාම පුවරුවක් යටතේ පවත්වාගනු ලබන හා ඒ සඳහාම සුදානම් කරන පරිශ්‍රයක් විය යුතුය

5. බල ප්‍රදේශය තුළ පිහිටියා වූ සෑම පොළක්ම නිසි සනීපාරක්ෂක තත්ත්වයන් ආරක්ෂා කරලීම සඳහා පහත සඳහන් ප්‍රමිතීන්ට අනුකූලව පවත්වාගත යුතුය. — පොළක් සනීපාරක්ෂක ප්‍රමිතීන්ට පඅනුකූලව තිබිය යුතු බව

(1) පරිශ්‍රය මස් හා මාළු, එළවළු හා පළතුරු සහ වෙනත් දේ විකිණීම සඳහා වාහනවලින් රැගෙන එන භාණ්ඩ හුවමාරු කිරීම, පළතුරු හා එළවළු සේදීම යන කාර්යයන් සඳහා ප්‍රධාන වශයෙන් කලාප කර පවත්වා ගත යුතුය.

(2) ඉහත (1) උප වගන්තියෙහි සඳහන් කලාපයන්ගෙන් පරිබාහිර වන පරිදි පරිශ්‍රය තුළ වැසිකිළි ස්ත්‍රීන් සහ පුරුෂයින් සඳහා ප්‍රමාණවත් වන පරිදි තිබිය යුතු අතර, කිසිදු ආකාරයකින් එහි භාවිතයට ගැනෙන ජලය පරිශ්‍රයෙහි කිසිදු කලාපයක් වෙත ගලා නොයන පරිදි නිශ්චිත කාණු මඟින් පූතික වලකට හෝ උරා ගැනීමේ වලකට යොමු කර තිබිය යුතුය.

(3) පරිශ්‍රය තුළ වූ කලාප අංක යොදා පරිශ්‍රයට පැමිණෙන්නන්ගේ පහසු අවධානයට යොමු වන පරිදි පරිශ්‍රයට ඇතුල්වන සීමාවේ ප්‍රවේශය පහසු කොට දැක්වෙන සිතියමක් මඟින් මඟ පෙන්වා තිබිය යුතුය.

(4) පරිශ්‍රය තුළ ස්ථිර ඉදිකිරීම් ඒ සඳහා වූ ලිඛිත නීතියෙහි සඳහන් විධිවිධානයන්ට අනුකූලව ඉදිකරන ලද ඉදිකිරීම් විය යුතුය.

(5) පරිශ්‍රය තුළ ඇති සෑම ඉදිකිරීමක්ම මනා ලෙස තනා තිබිය යුතු අතර, ඒ සඳහා භාවිතා කර ඇති කිසිදු දෙයකින් හෝ ද්‍රව්‍යයකින් ආහාරයක් දූෂනය විය හැකි කිසිදු දෙයක් මුදාහැරීමක් නොවිය යුතුය.

(6) පරිශ්‍රය තුළ හරස් දූෂනය වීම වැළැක්වෙන පරිදි අවශ්‍ය වෙන් කිරීම් සිදු කර තිබිය යුතුය.

(7) පරිශ්‍රය තුළ බල්ලන්, බළලුන් වැනි සතුන් ව්‍යාප්ත වීම වැළැක්වෙන පරිදි කටයුතු යොදා තිබිය යුතු අතර, සියලු ඉදිකිරීම් පෘෂ්ඨයන් ජීවීන් රඳා නොසිටින පෘෂ්ඨයන් වශයෙන් සකස් කර තිබිය යුතුය.

(8) පරිශ්‍රයට පැමිණෙන කිසිදු වාහනයකින් බැහැර වන හෝ කාන්දු වන ද්‍රව්‍යයකින්, ද්‍රවයකින්, වායුවකින් පරිශ්‍රය තුළට අලෙවිය සඳහා රැගෙන එන දේ, තබා ඇති දේ දූෂනය වීමකට ලක් නොවන පරිදි වාහන නවතා තැබීම සඳහා වන කලාපය පිහිටුවාලිය යුතුය.

(9) භාණ්ඩ බෑමට, ගෙනයාමට යොදවන පිරිස් හෝ ඒ සඳහා කටයුතු කරන පිරිස් එම කාර්යය සඳහා පූර්වයෙන් නිශ්චිතව හඳුනාගත් පිරිස් විය යුතු අතර, ඔවුන්ගේ අනන්‍යතාවයන් සඳහා තොරතුරු පොළ භාරකරු විසින් ලේඛනගත කර හා තොරතුරු යාවත්කාලීන කරමින් පවත්වාගත යුතුය.

(10) පරිශ්‍රයට වෙළෙඳාම සඳහා පැමිණෙන පිරිස් සහ ඔවුන්ගේ සහයට පැමිණෙන පිරිස් සම්බන්ධයෙන් වන අනන්‍යතාවයන් පොළ භාරකරු විසින් ලේඛනගත කර තොරතුරු යාවත්කාලීන කරමින් පවත්වාගත යුතුය.

(11) පරිශ්‍රයෙහි බිම ජලය රැඳී නොසිටින පරිදි සකස්කර තිබිය යුතු අතර, අභ්‍යන්තර කාණු ජලය පහසුවෙන් ගලා යන පරිදි සකස් කර තිබිය යුතුය.

(12) පරිශ්‍රය තුළ අපජලය ගලා යාම සඳහා පූතික වළවල්, උරාගැනීමේ වළවල් ප්‍රමාණවත් පරිදි ඉදිකර තිබිය යුතු අතර, පරිශ්‍රය තුළ ඇති සෑම පූතික වළක් හෝ උරාගැනීමේ වළක්ම බාහිරට විවෘත වීමකින් තොර ජල මූලාශ්‍රයක් ඇත්නම්, ඊට අවම මීටර් 15.25 ක වඩා වැඩිදුරකින් පිහිටුවා තිබිය යුතුය.

(13) පරිශ්‍රය තුළ වෙළෙඳාම සඳහා භාණ්ඩ තබා ගැනීමට සකසා ඇති සියලු වේදිකා ඡේදිය හැකි මතුපිටක් සහිත විය යුතු අතර, ඒ සෑම මතුපිටක්ම භාවිතයට පෙර විෂබීජ නාශක යොදා පිරිසිදු කර පවත්වා ගත යුතුය.

(14) පරිශ්‍රය තුළ අභ්‍යන්තර සැකැස්ම පහසුවෙන් හා නිසි දුරස්ථභාවයකින් ගමන් කළ හැකි පරිදි සකස් වී තිබිය යුතුය.

(15) පරිශ්‍රය තුළ අලෙවි කරන භාණ්ඩ හා ද්‍රව්‍ය ඍජුව පොලව හා ස්පර්ශ නොවන පරිදි පවත්වා ගත යුතු අතර, එය පොළවට වඩා යම් උසකින් යුත් රැඳවුමක් හෝ වේදිකාවක් මත තබා අලෙවි කළ යුතුය.

(16) පරිශ්‍රය තුළ එක් රැස් වන අපද්‍රව්‍ය තාවකාලිකව බැහැර කිරීම සඳහා ප්‍රමාණවත් වන පරිදි ඒ ඒ කලාප තුළ සංවෘත කසළ රැඳවුම් පිහිටුවා තිබිය යුතු අතර, අපද්‍රව්‍ය එහි ස්වභාවය අනුව බැහැරකල යුතු ඒ සඳහාම වූ කසළ රැඳවුමකට පමණක් බැහැර කළ යුතුය.

(17) පරිශ්‍රය තුළ වෙළඳාමේ යෙදෙන්නන් හෝ පාරිභෝගිකයන් පරිශ්‍රයෙහි කෙළ ගැසීම නොකළ යුතුය.

(18) පරිශ්‍රය තුළ ආහාර පිසීමක් හෝ ගිනි දැල්වීමක් නොකළ යුතු අතර පිසින ලද ආහාරයන් බැහැරින් රැගෙන විත් අලෙවි කරයි නම් ඒ සෑම ආහාරයක්ම අභ්‍යන්තරයට වාතය ගලා නොයන ආකාරයට සකස් කරන ලද බහාලුම්වල තබා අලෙවි කළ යුතු අතර ඒ සෑම ආහාරයක්ම විකිණීමේදී අත් වැසුම් යොදා ආහාර ඇල්ලීම සඳහා වන අල්ලුවකින් පමණක් අල්ලා එය අලෙවි කිරීම කළ යුතුය.

(19) පරිශ්‍රය තුළ භාවිතාවන අත්වැසුම්, මුව වැසුම් බැහැර කිරීමකදී ; එය බැහැර කිරීම සඳහා නිශ්චිත සංවෘත කසළ බඳුන් ප්‍රමාණවත් පරිදි තබා තිබිය යුතු අතර ; ඒ සඳහාම අදාල බැහැර කිරීම් කළ යුතුය.

(20) පරිශ්‍රයෙහි මාළු විකිණීම සිදුකරන කලාපය තුළ ;

(අ) මාළු අලෙවිය සඳහා වන වේදිකා ස්ථිර ද්‍රව්‍යයන්ගෙන් තනන ලද ඒවා විය යුතු අතර භාවිතයට පෙර සබන් හෝ විෂබීජ නාශක යොදා පිරිසිදු කර භාවිතය සඳහා යොදා ගත යුතුය.

(ආ) භාවිතයට ගනු ලබන ජලය නිසිපරිදි සකස් කරන ලද සංවෘත කාණු තුලින් පූතික වළකට හෝ උරාගැනීමේ වළකට යොමුකර තිබිය යුතුය.

(ඇ) මාළු ගබඩාකර තබා ගනීනම්, ඒ සඳහා ශීතකරණ පහසුකම් වලින් යුක්ත විය යුතු අතර මාළු ගබඩා කිරීම සෙන්ට්‍රිග්‍රේට් අංශක දෙකක හෝ ඊට අවම උෂ්ණත්වයක පවත්වා ගත යුතුය.

(ඈ) විකිණීමට තබා ඇති මාළුවලට ඉහළින් එල්ලා ඇති විදුලි බුබුළු හා ඊට අදාල සවිකිරීම් ආරක්ෂිතව විය යුතු අතර ඒවා ආවරණය කර තැබිය යුතුය.

(ඉ) මාළු විකිණීම සඳහා තබා ඇති ස්ථානයෙහි හා ඊට ඉහළින් ඇති කොටස් හා මාළු සමඟ ස්පර්ශ වන කොටස්වලින් කිසිදු ද්‍රව්‍යයක් ද්‍රවයක් හෝ වායුවක් කාන්දු නොවන තත්ත්වයෙන් විය යුතු අතර කිසිදු ආකාරයකින් තබා ඇති මාළු දූහනය වීමක් සිදු නොවිය යුතුය.

(ඊ) මාළු විකිණීමේදී එක්රැස්වන අපද්‍රව්‍ය, පරිශ්‍රයෙහි වෙනත්, අපද්‍රව්‍ය සමඟ මිශ්‍ර නොවන පරිදි සංවෘත කසළ රැඳවුම් තුළ තාවකාලිකව එක්රැස්කොට ප්‍රාදේශීය සභාව විසින් ක්‍රියාත්මක කරන කසළ කළමනාකරණ වැඩසටහනකට අනුකූලව හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ උපදෙස් අනුව බැහැර කළ යුතුය.

(උ) අලෙවිය සඳහා තබා ඇති ශීත කළ මාළු පරිසර උෂ්ණත්වය යටතේ නැවත ශීතකරණ තුලට ඇතුළත් කිරීම නොකළ යුතුය.

(ඌ) මාළු අලෙවියේදී ඇසුරුම් සඳහා භාවිතා කරන දේ මුද්‍රිත කඩදාසි හෝ මාළු සමඟ සෘජුව ගැටෙන ඇසුරුම් ද්‍රව්‍යයක් නොවිය යුතුය.

(එ) මාළු අලෙවියෙහි යෙදෙන සියලු දෙනා කිසිදු බෝවන රෝගයකින්, චර්මගත රෝගයකින් ආසාදිත අයකු නොවිය යුතුය.

(ඒ) මාළු අලෙවි කාර්යයෙහි යෙදෙන සියලු දෙනා මාළු අලෙවියේදී සුදුසු පිරිසිදු ඇඳුම් හැඳ සිටිය යුතුය.

(ඔ) කිරුම් උපකරණ නිසි ප්‍රමිතිගත ඒවා විය යුතු අතර ඒ සියල්ල විෂබීජ නාශක යොදා පිරිසිදු කරමින් පවත්වාගත යුතුය.

(21) පරිශ්‍රයෙහි මස් විකිණීම සිදුකරන කලාපය තුළ ;

(අ) මස් අලෙවිය සඳහා වන වේදිකා ස්ථිර ද්‍රව්‍යයන්ගෙන් තනන ලද ඒවා විය යුතු අතර භාවිතයට පෙර සබන් හෝ විෂබීජ නාශක යොදා පිරිසිදු කර භාවිතය සඳහා යොදා ගත යුතුය.

(ආ) භාවිතයට ගනු ලබන ජලය නිසි පරිදි සකස් කරන ලද සංවෘත කාණු තුලින් පූතික වළකට හෝ උරාගැනීමේ වළකට යොමුකර තිබිය යුතුය.

(ඇ) මස් ගබඩාකර තබා ගනීනම්, ඒ සඳහා ශීතකරණ පහසුකම් වලින් යුක්ත විය යුතු අතර මස් ගබඩා කිරීම සෙන්ටිග්‍රේට් අංශක දෙකක හෝ ඊට අවම උෂ්ණත්වයක පවත්වා ගත යුතුය.

(ඈ) විකිණීමට තබා ඇති මස්වලට ඉහළින් එල්ලා ඇති විදුලි බුබුළු හා ඊට අදාල සවිකිරීම් ආරක්ෂිතව විය යුතු අතර ඒවා ආවරණය කර තැබිය යුතුය.

(ඉ) මස් විකිණීම සඳහා තබා ඇති ස්ථානයෙහි හා ඊට ඉහළින් ඇති කොටස් හා මස් සමඟ ස්පර්ශ වන කොටස්වලින් කිසිදු ද්‍රව්‍යයක්, ද්‍රවයක් හෝ වායුවක් කාන්දු නොවන තත්ත්වයෙන් විය යුතු අතර කිසිදු ආකාරයකින් තබා ඇති මස් දූහනය වීමක් සිදු නොවිය යුතුය.

(ඊ) මස් විකිණීමේදී රැස්වන අපද්‍රව්‍ය, පරිශ්‍රයෙහි වෙනත්, අපද්‍රව්‍ය සමඟ මිශ්‍ර නොවන පරිදි සංවෘත කසළ රැඳවුම් තුළ තාවකාලිකව එක්රැස්කොට ප්‍රාදේශීය සභාව විසින් ක්‍රියාත්මක කරන කසළ කළමනාකරණ වැඩසටහනකට අනුකූලව හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ උපදෙස් අනුව බැහැර කළ යුතුය.

(උ) අලෙවිය සඳහා තබා ඇති ශීතකළ මස් පරිසර උෂ්ණත්වය යටතේ නැවත ශීතකරණ තුළට ඇතුළත් කිරීම නොකළ යුතුය.

(ඌ) මස් අලෙවියේදී ඇසුරුම් සඳහා භාවිතා කරන දේ මුද්‍රිත කඩදාසි හෝ මස් සමඟ සෘජුව ගැටෙන ඇසුරුම් ද්‍රව්‍යයක් නොවිය යුතුය.

(එ) මස් අලෙවියෙහි යෙදෙන සියලු දෙනා කිසිදු බෝවන රෝගයකින්, චර්මගත රෝගයකින් ආසාදිත අයකු නොවිය යුතුය.

(ඒ) මස් අලෙවි කාර්යයෙහි යෙදෙන සියලු දෙනා මස් අලෙවියේ දී සුදුසු පිරිසිදු ඇඳුම් හැඳ සිටිය යුතුය.

(ඔ) කිරුම් උපකරණ නිසි ප්‍රමිතිගත ඒවා විය යුතු අතර ඒ සියල්ල විෂබීජ නාශක යොදා පිරිසිදු කරමින් පවත්වාගත යුතුය.

(22) පරිශ්‍රයෙහි එළවළු හා පළතුරු විකිණීම සිදුකරන කාලාපය තුළ;

(අ) අලෙවිය සිදුවන ස්ථාන සඳහා හොඳින් වාතාශ්‍රය ලැබෙන පරිදි විය යුතු අතර කෘතිමව හෝ ස්වභාවිකව හොඳින් ආලෝකය සපයා තිබිය යුතුය.

(ආ) එළවළු, පළතුරු සේදීමක් එම ස්ථානයේම නොකළ යුතු අතර; ඒ සඳහා පරිශ්‍රය තුළ වෙන්වූ ස්ථානයේදී සෝදා පිරිසිදු කරන ලද එළවළු හා පළතුරු අලෙවිය සඳහා තබා ගත යුතුය.

(ඇ) නරක් වී ඇති එළවළු හෝ පළතුරු කිසිවක් හොඳ තත්වයේ එළවළු හා පළතුරු සමග මිශ්‍රවීමක් නොවිය යුතුය.

(ඈ) කවර හෝ බෝවන රෝගයකින් පෙලෙන අයෙකු හෝ ආසාදිතයකු හෝ චර්ම ගත රෝගයකින් පෙලෙන අයකු අලෙවි කාර්යයන්හි නොයෙදිය යුතුය.

(ඉ) නරක් වී ඇති පළතුරු හා එළවළු ඒ සඳහා නිශ්චිතව වෙන්කර ඇති බහාලුම් තුළට පමණක් බැහැර කළ යුතුය.

(ඊ) අලෙවියහි යෙදෙන කිසිදු තැනැත්තකු එළවළු හෝ පළතුරු දූෂනය වන ආකාරයට එම ස්ථානය තුළ ආහාර අනුභව කිරීම. දුම් බීම, කෙළ ගැසීම බුලත් හා වෙනත් දේ සැපයීම, කැස්ස, කිවිසුම් යැවීම, නාසය ස්පර්ශ කිරීම වැනි කටයුතු වල හෝ නොයෙදිය යුතු අතර එළවළු හා පළතුරුවල ස්වස්ථතාවය ආරක්ෂා වන පරිදි පවත්වා ගත යුතුය.

(උ) එළවළු හා පළතුරු වියළීම වළක්වා ගැනීම සඳහා යොදා ගනු ලබන ජලය බීමට ගන්නා ජලය විය යුතු අතර කිසිදු ආකාරයකට භාවිතය තහනම් රසායන ද්‍රව්‍යයක් පළතුරු හා එළවළු සඳහා භාවිතා කිරීම නොකළ යුතුය.

(23) බල ප්‍රදේශයකට අදාළව කිසියම් වසංගත තත්වයකට හේතුවන කරුණු උද්ගත වී ඇති බවට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී උපදෙස් පරිදි සභාපතිවරයා විසින් ඊට අදාළව නියමයක් කරනු ලැබ ඇති විටදී හෝ නිරෝධායක හා රෝග වැළැක්වීමේ ආඥා පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද රෙගුලාසි යටතට අදාළ කවර හෝ නියමයන් ක්‍රියාත්මක වන අවස්ථාවක එම නියමයන්හි සඳහන් ක්‍රියාමාර්ගයන්ට යටත්ව පහත සඳහන් ක්‍රියාමාර්ග නිසියාකරව ක්‍රියාත්මක විය යුතුය ;

(අ) පරිශ්‍රය තුළ නිශ්චිත ස්ථානයන්හි දෑත් පිරිසිදු කර ගැනීම සඳහා පහසුකම් සපයා ඇති බව හා ඒ අනුව කටයුතු සිදුවන බව.

(ආ) පරිශ්‍රය තුළ පවත්නා පොදු වැසිකිළි භාවිතය සම්බන්ධයෙන් බල පවත්නා කොන්දේසි හා නියමයන් නිසියාකාරව ක්‍රියාත්මක වන බව.

(ඇ) පරිශ්‍රය තුළ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂක උපදෙස් මත කළ යුතු විෂබීජ නාශක ක්‍රියාවලිය නියමිත කාල සටහනට අනුකූලව සිදුවන බව.

(ඈ) පරිශ්‍රය භාවිතයට ගන්නන් සමාජ දුරස්ථභාවයන් ආරක්ෂා කළ යුතු බවට උපදෙස් දී ඇති

(ඉ) පරිශ්‍රය තුළට වාහන ඇතුළත් කිරීම සීමා කර ඇති විටක ඊට අනුකූලව කටයුතු සිදුවන බව.

(ඊ) අවස්ථාවෝචිතව කළ යුතු සෞඛ්‍ය පිළිපැදීම් සම්බන්ධයෙන් දැන්වීම් පරිශ්‍රය තුළ ප්‍රසිද්ධ කර ඇති බව හා ඊට අනුකූලව කටයුතු සිදුවන බව.

(උ) පරිශ්‍රය තුළ භාවිතයට ගන්නා ලද මුව වැසුම්, අත් වැසුම් වෙනත් කසළ සමඟ මිශ්‍ර වීමකින් තොරව බැහැර කරන බව.

6. මෙම අතුරු ව්‍යවස්ථාවේ 5 වන වගන්තිය යටතේ වූ ප්‍රමිතීන්ට අනුකූලව පොළක් පවත්වාගෙන යාම සඳහා සියලු ක්‍රියා මාර්ග පොදු වෙළඳ පොළක් සම්බන්ධයෙන් වන විට පොදු වෙළඳපොළ භාරකරුවකු විසින්ද පෞද්ගලික පොළක් සම්බන්ධයෙන් වන විටදී බලපත්‍රලාභියා විසින්ද ගත යුතුය.

7. පරිශ්‍රයක් මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ වූ ප්‍රමිතීන්ට අනුකූලව පවත්වා ගනු ලබන්නේද යන්න සභාපතිවරයා හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකු හෝ බලයලත් නිලධාරියකු විසින් පරීක්ෂා කළ යුතුය. *පරීක්ෂා කිරීමේ බලය*

8. කිසියම් පොළක් ඉහත 5 වන වගන්තියේ සඳහන් ප්‍රමිතීන් උල්ලංඝනය කරමින් හෝ ප්‍රමිතීන්ට අනුකූල නොවන පරිදි පවත්වාගෙන යන විටකදී; සභාපතිවරයා විසින් ලිඛිතව කරනු ලබන දැන්වීමක් මගින් ප්‍රමිතීන්ට අනුකූල වීම සඳහා නිශ්චිත කාලයක් නියම කළ හැකිය. *දැන්වීමක් මඟින් නිශ්චිත කාලයක් ලබාදීම*

9. ඉහත 8 වන වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමකට අනුකූල නොවී ක්‍රියා කරයි නම් එසේ කිරීම එය වරදක් වන අතර එම වරද සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් වරදකරු කිරීමෙන් පසු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(2) උප වගන්තිය යටතේ වූ දඬුවමකට යටත් විය යුතුය. *දණ්ඩනය*

10. මෙම අතුරු ව්‍යවස්ථාවෙහි පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ, *අර්ථ නිරූපණය*

" සභාව " යන්නෙන් කළුතර ප්‍රාදේශීය සභාවද,

"සභාපති"යන්නෙන් කළුතර ප්‍රාදේශීය සභාවේ තත්කාලයෙහි සභාපති ධූරය දරන තැනැත්තා හෝ එම ධූරයේ කාර්යය කර්තව්‍ය ඉටුකරන නිලධාරියෙකුද අදහස් වේ.

"බලයලත් නිලධාරියා" ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් ලිඛිතව බලය පවරන ලද යම් නිලධාරියෙකු ද,

"දූහනය" යන්නෙන් ආහාර හෝ ආහාර දාමයේ දූහන ද්‍රව්‍යයන් ඇතුල්වීම හෝ හට ගැනීම ද,

"ස්වස්ථතාවය" යන්නෙන් ආහාර දාමයක සියලු අවස්ථාවලදී ආහාරවල සුරක්ෂිත බව සහ සුදුසුබව සහතික කිරීම සඳහා අවශ්‍ය සියලු තත්ත්වයන් හා පරිචය ද, අදහස් වේ.

11. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල හා ඉංග්‍රීසි, දෙමළ පාඨ අතර අනනුකූලතාවයන් හටගතහොත් සිංහල පාඨය අනුව වෙයි. *පාඨ අතර අනනුකූලතාව*

**පොදු ස්ථානවල විෂබීජ නාශනයට අදාළ විධිවිධාන සම්බන්ධයෙන් වූ අතුරුව ව්‍යයවස්ථාව**

1. මෙම අතුරු ව්‍යවස්ථාව කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මහජනයා රැස්වන ස්ථාන හා පූජනීය ස්ථානවල විෂබීජ නාශනය ඇතුළු ඊට අදාළ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස පනවනු ලබයි.

*ලුහුඬු නාමය*

2. මෙම අතුරු ව්‍යවස්ථාව කළුතර ප්‍රාදේශීය සභාවේ පොදු ස්ථානවල විෂබීජ නාශනයට අදාළ විධිවිධාන සම්බන්ධයෙන් වූ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

3. මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (ix) වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 122 වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට බලය ලැබී ඇත.

*විෂබීජ නාශනය කළ යුතු අවස්ථා*

4. කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල (මෙහි මින්මතු බල ප්‍රදේශය යනුවෙන් හඳුන්වනු ලබන) ආගමික ස්ථාන ඇතුළු පොදු වැදගත්කමින් යුත් කරුණු සඳහා හෝ නිශ්චිත අරමුණක් වෙනුවෙන් මහජනයා රැස්වන හෝ රැස්කරනු ලබන කවර හෝ ස්ථානයක්, පරිශ්‍රයක් පහත සඳහන් අවස්ථානුගත කාරණා යටතේ විෂබීජ නාශනය කිරීම හෝ එසේ කිරීමට සැළැස්වීම සභාපතිවරයා විසින් කළ යුතුය.

(1) නිරෝධායන හා රෝග වැළැක්වීමේ ආඥා පනත යටතේ හා ඒ යටතේ සාදන ලද රෙගුලාසි යටතේ වූ නියමයන්ට අනුව බල ප්‍රදේශය තුල පිහිටියාවූ පූජනීය ස්ථාන මහජනයා රැස්වන හෝ රැස්කරනු ලබන වෙනත් යම් ස්ථාන විෂබීජ නාශනය කළ යුතු තත්ත්වයකට කරුණු උද්ගත වී ඇති වී අවස්ථාවක.

(2) ශ්‍රී ලංකාව තුළ කවර හෝ ප්‍රදේශයක හෝ බල ප්‍රදේශය තුළ කිසියම් වසංගත තත්ත්වයක් ව්‍යාප්ත වීමට කරුණු යෙදී ඇති විටක හෝ බල ප්‍රදේශය තුළ කිසියම් වසංගත රෝගයක් ව්‍යාප්ත වේ යැයි සැක කිරීමට තරම් කරුණු යෙදී ඇති බවට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී උපදෙස් මත සභාපතිවරයා විසින් තීරණය කර ඇති විටක.

(3) බල ප්‍රදේශයක් තුළ කිසියම් නිශ්චිතව හඳුනා නොගත් රෝගයක් මත කෙනෙකු මිය යාමට කරුණු යෙදී ඇති විටක එසේ මිය ගිය අය ආව ගිය ස්ථාන වශයෙන් කිසියම් ස්ථාන හඳුනාගෙන ඇති විටක.

(4) කිසියම් ආගමික ස්ථානයක සිදුකරනු ලබන හෝ පවත්වනු ලබන ජනතාව විශාල වශයෙන් රැස්වන ආගමික උත්සවයක් පැවැත්වීමට කරුණු යෙදී ඇති විට හා එවැනි ආගමික උත්සවයක් පවත්වා අවසන් වී ඇති විටක එම පරිශ්‍රය විෂබීජ නාශනය කළ යුතු බවට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා තිරණය කර ඇති විටක.

(5) කිසියම් කාලයක් තුළ කිසියම් පරිශ්‍රයක් කිසිවකුගේ ක්‍රියාකාරීත්වයෙන් තොරව පවත්වාගෙන යාමෙන් පසු නැවත එම පරිශ්‍රයට ජනතාව රැස්කිරීම සඳහා කටයුතු කරන්නට යෙදී ඇති විටක.

(6) කිසියම් ආසාදිත හෝ ස්පර්ශයෙන්, ශ්වසනයෙන් බෝවිය හැකි හෝ එසේ විය හැකි බවට සැක කරන රෝගියෙකු හෝ එවැනි රෝගියෙකු සමඟ ඇසුරු කළ අයෙකු මහජනයා රැස්වන ස්ථානයකට පැමිණ ඇති බව හෝ කටයුතු කර ඇති බවට වාර්තා වී ඇති විටක.

(7) තම බලප්‍රදේශය තුළ හෝ ශ්‍රී ලංකාවේ කවර හෝ ප්‍රදේශයක හෝ කිසියම් වසංගත තත්ත්වයක් පැතිරෙමින් පවතින බවට වාර්තා වී ඇති අවස්ථාවක මහජනයා නිරන්තරයෙන් ගැවසෙන ස්ථාන වශයෙන් හඳුනාගත් ස්ථාන විෂබීජ නාශනය කළ යුතු බවට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් උපදෙස් දී ඇති විටක.

(8) කිසියම් පූජනීය ස්ථානයකට හෝ පොදු ස්ථානයක මහජනයා ඒකරාශී කිරීමට කරුණු යෙදී ඇති විටක ඔවුන්ගේ මහජන සෞඛ්‍යයෙහි යහපත සඳහා, ඊට අදාළ පරිශ්‍රය විෂබීජ නශනය කළ යුතු බවට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් උපදෙස් දී ඇති විටක.

(9) බල ප්‍රදේශය තුළ මහජන සෞඛ්‍ය ප්‍රරෝහනය කිරීමේ සහ ආරක්ෂා කිරීමේ කාර්යය සඳහා ක්‍රියාත්මක කරන සැළැස්මකට අනුකූලව කිසියම් පොදු ස්ථාන විෂබීජ නාශනය සඳහා කරුණු යෙදී ඇති විටක.

(10) වඩා නිවැරදි සෞඛ්‍ය ආරක්ෂිත පැවැත්මක් වෙනුවෙන් එය එසේ කළ යුතු බවට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී උපදෙස් පරිදි සභාපතිවරයා විසින් කිසියම් පොදු පරිශ්‍රයක් විෂබීජ නාශනය කිරීමට තීරණය කර ඇති කවර හෝ අවස්ථාවක් වන විටක.

5. බල ප්‍රදේශය තුළ වසංගත තත්ත්වයක් ව්‍යාප්ත වීමට කරුණු යෙදී ඇති විටක හෝ එසේ විය හැකි යැයි සැක කිරීමට තරම් කරුණු යෙදී ඇති අවස්ථාවක බල ප්‍රදේශය කවර හෝ පොදු පරිශ්‍රයක් කවර හෝ තැනැත්තෙකු විසින් මහජනයා රැස් කරවන කාර්යයක යොදවන්නේ නම්, එසේ යොදවන තැනැත්තා වෙත හෝ සංවිධායක වෙත සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී උපදෙස් පරිදි සභාපතිවරයා විසින් පහත සඳහන් නියමයන් අතරින් කවර හෝ නියමයන් කිරීම නීත්‍යානුකූල වන්නේය. *කිසියම් පාර්ශවයකට විෂබීජ නාශනය සඳහා නියම කිරීම*

(1) අදාළ පරිශ්‍රය තුළ ජනතාව ඒකරාශී කිරීමට පූර්වයෙන් පරිශ්‍රය විෂබීජ නාශනය කළ යුතු බව.

(2) අදාළ පරිශ්‍රය තුළ ජනතාව ඒකරාශී කර විසිර යාමෙන් පසු පරිශ්‍රය විෂබීජ නාශනය කළ යුතු බව.

(3) අදාළ පරිශ්‍රය භාවිතයට පෙර හා භාවිතයට පසු විෂබීජ නාශනය කළ යුතු බව.

6. සභාපතිවරයා විසින් ඉහත වගන්තිය යටතේ නියමයන් කරනු ලැබූ විට ඊට අනුකූලව ක්‍රියා කිරීම නියමය ලබන තැනැත්තාගේ වගකීම හා කාර්යය වන්නේය.

7. සභාපතිවරයා විසින් පොදු මහජනයාගේ යහපත සඳහා බල ප්‍රදේශය තුළ පිහිටියාවූ ආගමික ස්ථාන, පොදු ස්ථාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් උපදෙස් පරිදි සකස් කරන ලද නිශ්චිත කාල සටහනකට අනුව විෂබීජ නාශනය සඳහා ක්‍රියා කළ හැකිය.

8. සභාපතිවරයා විසින් ඉහත 5 වගන්තිය යටතේ නියමයන් කරනු ලැබූ තැනැත්තෙකු විසින් ඊට අනුකූලව ක්‍රියා නොකරයි නම් එය වරදක් වන අතර, එම වරද සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් වරදකරු කිරීමෙන් පසු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (2) උප වගන්තිය යටතේ වූ දඬුවමකට යටත් විය යුතුය. *දණ්ඩනය*

9. සභාපතිවරයා විසින් 5 වගන්තිය යටතේ කරනු ලැබූ නියමයන් පැහැර හරිමින් ක්‍රියා කරනු ලැබුවේ නම්, එකී නියමයට අදාළ පරිශ්‍රය සභාපතිවරයා විසින් විෂබීජ නාශනය කර, ඒ සඳහා ගිය වියදම පැහැරහරින්නා වෙතින් අය කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

10. මෙම අතුරු ව්‍යවස්ථාවේ පද සම්බන්ධයෙන් අන්‍ය අර්ථයක් අවශ්‍ය වන්නේනම් මිස, මෙම අතුරු ව්‍යවස්ථාවේ *අර්ථ නිරූපණය*

"සභාව" යන්නෙන් කළුතර. ප්‍රාදේශීය සභාවද,

"සභාපති" යන්නෙන් කළුතර. ප්‍රාදේශීය සභාවේ තත්කාලයෙහි සභාපති ධූරය දරන හෝ එම ධූරයේ කාර්යය කර්තව්‍ය ඉටුකරණ අයද ,

"සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී" යන්නෙන් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අදාල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාෂය සඳහා එම තනතුර දරන අයද,

"මහජන සෞඛ්‍ය පරීක්ෂක" යන්නෙන් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අදාලව සේවයේ යෙදෙන ප්‍රාදේශීය සභාවේ හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයට අනුයුක්තව මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුර දරන අයෙක්ද,

"තැනැත්තෙක්" යන්නෙන් යම් පුද්ගලයෙකු හෝ පුද්ගල නාමයෙන් පෙනී සිටින කිසියම් ආයතනයක් සම්බන්ධයෙන් වන විටදී ආයතනයෙහි කළමනාකාර අධ්‍යක්ෂකවරයා හෝ කළමනාකරුවෙකු හෝ එම ආයතනය වෙනුවෙන් ක්‍රියා කරන කවර හෝ අයකුද, අදහස් වේ.

11. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර අනනුකූලතාවයන් හටගතහොත් එවිට සිංහල පාඨය ප්‍රමුඛ වෙයි. *පාඨ අතර අනනුකූලතාව*

**වෙළඳපොළ පත්කර සිටින භාරකරුවන් හා අනෙකුත් නියුක්තිකයන්ට අදාළ කාර්යය නිසියාකාරව ඉටුකිරීමට අදාළ නියමයන් පිළිබඳ අතුරුව්‍යවස්ථාව**

1. මෙම අතුරුව්‍යාවස්ථාව **කළුතර ප්‍රාදේශීය** සභාව සතු වෙළඳ පොළ සඳහා පත්කර සිටින භාරකරුවන් හා අනෙකුත් නියුක්තිකයන්ට අදාළ කාර්යය නිසිආකාරව ඉටුකිරීමට අදාළ නියමයන් නිෂ්චිත කිරීම සඳහා පනවනු ලබයි.

*ලුහුඬු නාමය* 2. මෙම අතුරුව්‍යාවස්ථාව කළුතර **ප්‍රාදේශීය** සභාවේ වෙළඳ පොළ භාරකරුවන්ට අදාළ කාර්යය නිෂ්චිත කිරීම සම්බන්ධයෙන් වූ අතුරුව්‍යාවස්ථාව යනුවෙන් හැඳින්වේ.

3. මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීමට **1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126(xii) වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 122** වගන්තිය යටතේ **ප්‍රාදේශීය** සභාවට බලය ලැබී ඇත.

*පත්කිරීම* 4. කළුතර **ප්‍රාදේශීය** සභාවට අදාළ සෑම වෙළඳ පොළක් සඳහාම වෙළඳ පොළ භාරකරු නමින් තනතුරක් විය යුතු අතර, එම තනතුර සඳහා සුදුසු අයෙකු තනතුරට අදාළ නිසි පත්කිරීම් බලධාරීත්වය විසින් පත් කළ යුතුය.

5. වෙළඳ පොළ භාරකරු තනතුරට අදාළ පත්කිරීම් සම්බන්ධයෙන් 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32 වන වගන්තියෙහි විධිවිධාන මෙන්ම අවස්ථානෝචිත පරිදි **1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19(1)** උපවගන්තියෙහි සඳහන් විධිවිධාන අදාළ විය යුතුය.

*සහය තනතුරු ඇති කිරීම* 6. වෙළඳ පොළ භාරකරුගේ කාර්යය නිසි හා යෝග්‍ය ආකාරයෙන් ඉටුකිරීම සඳහා අවශ්‍ය සහය තනතුරු සභාව විසින් තීරණය කර ඊට අදාළ පටිපාටීන්ට අනුව ඇති කළ යුතුය.

*වෙළඳපොළ භාරකරුගේ කාර්යය* 7. වෙළඳ පොළ භාරකරු විසින් පහත සඳහන් කාර්යයන් තමා විසින්ම හෝ සහයකයින් මඟින් හෝ පොදු වෙළඳ පොළ පරිශ්‍රය තුළ ( මෙහි මින් මතු පරිශ්‍රය ලෙස හඳුන්වනු ලබන ) ක්‍රියාත්මක කළ යුතුය.

(1) පරිශ්‍රය තුළ වෙළඳාමේ යෙදෙන සියළු දෙනා ලියාපදිංචිකර ලේඛනගත කර පවත්වාගෙන යාම.

(2) පරිශ්‍රය තුළ ක්‍රියාත්මකවන කලාපකරණය සැළකිල්ලට ගනිමින් වෙළඳාම සඳහා වන වෙළඳුන් ස්ථානගත කිරීම.

(3) ස්ථිර ලෙස වෙළඳසැල් පැවත්වාගෙන යාමක් සිදුවේ නම්, ඒ හා සම්බන්ධයෙන් වන ගිවිසුම් කොන්දේසීන්ට අනුකූලව ඒ ඒ පරිශ්‍ර යටතේ වෙළඳාම පවත්වාගෙන යන්නේ ද පිළිබඳ නිරන්තර අවධානයෙන් ක්‍රියාකිරීම.

(4) පරිශ්‍රය තුළ ඇති වැසිකිළි පවිත්‍රතාවය සහ පොදු වැසිකිළි සම්බන්ධයෙන් වූ අතුරු ව්‍යාස්ථාවට අනුකූල වන පරිදි අදාළ වැසිකිළි පවත්වාගෙන යනු ලබන්නේ ද යන්න පිළිබඳ නිරන්තර අධීක්ෂණයකින් ක්‍රියා කළ යුතු අතර ම, තවද ඊට අදාළව සේවකයින් මෙහෙයවීම සඳහා ක්‍රියා කිරීම.

(5) පරියේශ්‍රයහි එක්රැස්වන අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාව ක්‍රියාත්මක කරන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහනට අනුකූල වන පරිදි බැහැර කිරීමට සැළැස්වීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම.

(6) පරිශ්‍රය තුළ පොළොව දූහුවිලි පැතිරයාම වැලැක්වෙන පරිදි පිරිසිදුකොට පවත්වා ගැනීම සහ එහි කාණු පද්ධතිය ජලය පහසුවෙන් ගලා යාහැකි පරිදි පවත්වා ගැනීම.

(7) පරිශ්‍රය තුළ අපජලය ගලායන කාණු තුළ ජලය පිටතට බැහැර නොවන පරිදි අදාළ පූනික වල හෝ උරාගැනීමේ වල වෙත යොමුවීමට සැළැස්වීම.

(8) පරිශ්‍රය තුළ සිදුකරන වෙළඳාම් සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවේ පොදු වෙළඳ පොළ හා පෞද්ගලික වෙළඳ පොළ සම්බන්ධයෙන් වූ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානයන්ට අනුකූලව පවත්වාගෙන යාම සඳහා සියළු පියවර ගැනීම.

(9) පොදු වෙළඳ පොළ පරිශ්‍රයෙහි විෂබීජ නාශක ක්‍රියාවලිය නිසි කාල සටහනකට අනුකූලව සිදුකිරීම.

(10) පරිශ්‍රය තුළ මත්පැන්, මත්ද්‍රව්‍ය භාවිතය හෝ වෙනත් කවර හෝ නීතිවිරෝධී ක්‍රියා සිදු නොවන බවට වගලබා ගැනීම.

(11) පරිශ්‍රය මහජන සෞඛ්‍යයට හිතකර පරිශ්‍රයක් ලෙස පවත්වාගෙන යාම සඳහා ගතයුතු සියළු පියවර ගැනීම.

(12) පරිශ්‍රයෙහි ඇති රථවාහන නැවතුම් යටතේ හැර වෙනත් ස්ථානයන්හි රථවාහන නවතා තැබීම වැළැක්වීම සහ පරිශ්‍රයට පැමිණීමට සහ පිටවීමට ඇති ප්‍රවේශයන් නිසි ලෙස භාවිතයට ගැනීමට අවශ්‍ය මෙහෙයවීම.

(13) පරිශ්‍රයෙහි නිරන්තර පවිත්‍රතාවය සඳහා භාවිතයට ගන්නන් විසින් පිළිපැදිය යුතු කරුණු පිළිබඳව දිය යුතු උපදෙස් දීම හා මහපෙන්වීම් සිදුකිරීම සහ ඒ හා සම්බන්ධව අධීක්ෂණය කිරීම.

(14) පරිශ්‍රය අභ්‍යන්තරයෙහි සිහමන් යැදීම, තාවකාලික නවාතැන් ගැනීම හා අනවසර භාවිතය වැළැක්වීම.

(15) සුනඛයින්, බළලුන් වැනි සතුන් පරිශ්‍රයෙහි ව්‍යාප්ත වීම වැළැක්වීම සඳහා අදාළ ක්‍රියාමාර්ග ගැනීම.

(16) පරිශ්‍රය තුළ වෙළඳාමෙහි නියුක්තවීමෙන් ප්‍රාදේශීය සභාවට අයවිය යුතු ගාස්තු, කුළී නිසි ආකාරයෙන් ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම.

8. පොදු වෙළඳ පොළ භාරකරු විසින් මෙම අතුරුව්‍යවස්ථාවෙහි ඉහත 7 වන වගන්තිය යටතේ තමන් වෙත පැවරී ඇති කාර්යය නිසි ආකාරයෙන් ඉටු කිරීම සඳහා සහය සේවා නියුක්තිකයන් වෙත කාර්යය පවරා දිය හැකි අතර, එසේ පවරා දෙනු ලබන කාර්යය නිසි හා යෝග්‍ය ආකාරයෙන් සිදුවන බවට ඔහු විසින් වගබලා ගත යුතුය.

*වසංගත තත්ත්වයකදී උපදෙස් නිසිආකාරයට ක්‍රියත්මක කිරීම*

9. ශ්‍රී ලංකාව තුළ කවර හෝ ප්‍රදේශයක හෝ බල ප්‍රදේශය තුළ කිසියම් වසංගත රෝගයක් ව්‍යාප්ත වීමට කරුණු යෙදී ඇති විටක හෝ බල ප්‍ර දේශය තුළ කිසියම් වසංගත රෝගයක් ව්‍යාප්ත වේ යැයි සැක කිරීමට තරම් කරුණු යෙදී ඇති විටක ඒ හා සම්බන්ධයෙන් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීගේ උපදෙස් මත **සභාපතිවරයා** විසින් පරිශ්‍රය තුළ අනුගමනය කළ යුතු බවට ලබාදී ඇති පහත සඳහන් උපදෙස් හෝ ඒ හා සම්බන්ධව වෙනත් කවර හෝ උපදෙසක් පරිශ්‍රය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා සියළු පියවර ගැනීම, එසේ වන බවට වගබලා ගැනීම වෙළඳ පොළ භාරකරුගේ කාර්යය වන්නේය.

(1) පරිශ්‍රය භාවිතා කරන්නන් සඳහා පරිශ්‍රය තුළ විවිධ ස්ථානයන්හි තබා ඇති දෑත් සෝදා ගැනීම සඳහා වන ජල සැපයුම් ආරක්ෂිතව පවතින බව හා ඒවා නිරන්තර භාවිතයෙහි පවත්නා බව.

(2) පරිශ්‍රය තුළ ඇති පොදු වැසිකිළි භාවිතයේ දී ඒ හා සම්බන්ධයෙන් වූ කොන්දේසි නිසිආකාරව සිදුවන බව හා ඊට අදාළ සෞඛ්‍ය උපදෙස් අනුගමනය වීම නිසිආකාරව සිදු වන බව.

(3) පරිශ්‍රය තුළ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂක උපදෙස් මත කළ යුතු විෂබීජ නාශක ක්‍රියාවලිය නියමිත කාල සටහනකට අනුකූලව සිදුවන බව.

(4) පරිශ්‍රය භාවිතයට ගන්නන් සමාජ දුරස්ථභාවයත් ආරක්ෂා තල යුතු බවට උපදෙස් දී ඇති විටක ඊට අනුකූලව සියළු මෙහෙයුම් පරිශ්‍රය තුල සිදුවන බව.

(5) පරිශ්‍රය තුලට වාහන ඇතුල්වීම සීමා කරමින් පවත්වා ගත යුතු බවට උපදෙස් දී ඇති විටෙක ඊට අනුකූලව කටයුතු සිදුවන බව.

(6) පරිශ්‍රය තුල අනුගමනය කල යුතු සෞඛ්‍ය උපදෙස් සම්බන්ධයෙන් පරිශ්‍රය තුල දැන්වීම් මඟින් හා වෙනත් ප්‍රචාරක ක්‍රම යටතේ ප්‍රචාරණය කර ඇති බව

(7) පරිශ්‍රයෙහි අපද්‍රව්‍ය බැහැර කිරීම තුල භාවිතයට ගන්නා ලද මුව වැසුම්, අත්වැසුම්, ආදී දේ සායනික අපද්‍රව්‍ය වශයෙන් සලකා වෙනත් අපද්‍රව්‍ය සමඟ මිශ්‍ර කිරීමකින් තොරව බැහැර කිරීම සිදුවන බව.

(8) මහජන සෞඛ්‍ය ආරක්ෂාව වෙනුවෙන් සභාපතිවරයා විසින් පරිශ්‍රයෙහි වෙළඳ කටයුතු තාවකාලික නතර කර ඇති අවස්ථාවක කිසිදු වෙළඳ කාර්යයක් හෝ මහජන ගැවසීමක් පරිශ්‍රය තුල සිදු නොවන බව.

(9) පරිශ්‍රය තුල සෑම වෙළඳ කුටියක් අශ්‍රිතව මුදල් ගණුදෙණු සම්බන්ධයෙන් නිශ්චිත අයකු පත්කර ඇති බව.

(10) මහජන සෞඛ්‍ය යහපත සඳහා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී උපදෙස් පරිදි සභාපතිවරයා විසින් ලබා දී ඇති කවර හෝ උපදෙස් පරිශ්‍රය තුල නිසිආකාරයට ක්‍රියාත්මක වන බව.

10. මෙම අතුරු ව්‍යවස්ථාවේ තමන් වෙත පැවරී ඇති කාර්ය නිසියාකාරව ඉටුකිරීමට හා, සෙසු සේවා නියුක්තිකයන් වෙතින් ඉටුකරවාලීම වෙළඳපොළ භාරකරුගේ වගකීම කාර්ය වන්නේය.

*වාර්තා තබා ගැනීම*

11. වෙළඳ පොළ භාරකරු විසින් පරිශ්‍රයෙහි සේවා නියුක්තිකයන්ගේ දෛනික කටයුතු පිළිබඳ වාර්තා පවත්වාගත යුතු අතර ; පසු අධීක්ෂණය සඳහා පැමිණෙන්නන්ගේ සටහන් වෙනුවෙන් දෛනික සටහන් පොතක් පරිශ්‍රෙයහි පවත්වා ගත යුතුය.

*අධීක්ෂණය කිරීම*

12. **සභාපතිවරයා** හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් පොදු වෙළඳපල හා පවත්වාගෙන යාම හා සම්බන්ධ ලිඛිත නීතින්ට අනුකූලව සියළු කටයුතු සිදුවන්නේද යන්න පිළිබඳව නිරන්තරයෙන් අධීක්ෂණය කළ යුතු අතර එසේ අධීක්ෂණය කිරීමෙන් පසු ලබා දෙන උපදෙස් නිසි ආකාරයෙන් ක්‍රියාත්මක කිරීම වෙළඳ පොළ භාරකරුගේ වගකීම හා කාර්යය වන්නේය.

*සභාපතිගේ හා ලේකම්ගේ පොදු පරිපාලනයට යටත්ව කටයුතු කළ යුතු බව*

13. වෙළඳපොල භාරකරු සෑම විටම **සභාපතිවරයාගේ** හා සභාවේ **ලේකම්ගේ** පොදු පරිපාලනයට යටත්ව ක්‍රියා කළ යුතුය.

*අර්ථ නිරූපණය*

14. මෙම අතුරු ව්‍යවස්ථාවේ පද සම්බන්ධයෙන් අන්‍ය අර්ථයක් අවශ්‍ය වන්නේනම් මිස මෙම අතුරුව්‍යවස්ථාවේ,

"සභාව" යන්නෙන් කළුතර **ප්‍රාදේශීය** සභාවද

"**සභාපති**" යන්නෙන් කළුතර **ප්‍රාදේශීය** සභාවේ තත්කාලයෙහි **සභාපති** ධූරය දරන හෝ එම ධූරයේ කාර්යය කර්තව්‍ය ඉටුකරන අයද ,

"සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී" යන්නෙන් **ප්‍රාදේශීය** සභා බල ප්‍රදේශයට අදාල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශය සඳහා එම තනතුර දරන අයද,

"මහජන සෞඛ්‍ය පරීක්ෂක" යන්නෙන් **ප්‍රාදේශීය** සභා බල ප්‍රදේශයට අදාලව සේවයේ යෙදෙන **ප්‍රාදේශීය** සභාවේ හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයට අනුයුක්තව මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුර දරන අයෙක්ද,

*පාඨ අතර අනනුකූලතාව*

15. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල හා ඉංග්‍රීසි, දෙමළ පාඨ අතර අනනුකූලතාවයන් හටගතහොත් සිංහල පාඨය අනුව වෙයි.

EOG 02-0133

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.